328 වන කාණ්ඩය - 03 වන කලාපය
தொகுதி 328 - இல. 03
Volume 328 - No. 03

2026 ජූලි 09වන බ්‍රහස්පතින්දා
2026 யூலை 09, வியாழக்கிழமை
Thursday, 09th July, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 374-419]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ළමා අපයෝජන නඩු කඩිනම් කිරීම [තීරුව 420]
යාපනය සහ වවුනියාව බන්ධනාගාරවල වෛද්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම [තීරුව 423]

**ක්‍රිප්ටෝ මුදල් සහ ඩිජිටල් වත්කම් ගනුදෙනු නියාමනය:**
මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 427]

**විදේශ විනිමය ගනුදෙනුවලදී ගෝලීය වශයෙන් පිළිගත් ඩිජිටල් ගෙවීම් වේදිකා භාවිතය:**
මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 432]

**හමුදාව විසින් අත්පත් කරගත් උතුරු ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම:**
ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 436]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) – [ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා] පළමුවන වර කියවන ලදී [තීරුව 441]

**මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 442-555]

**මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී [තීරු 556]

**ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 559]

**කල්තැබීමේ ප්‍රශ්න** [තීරු 561-564]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 565-576]


# பிரதான உள்ளடக்கம்


**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 374-419]

**தனி அறிவித்தல் மூல வினா:**
சிறுவர் உரிமைகளைப் பாதுகாத்தலும் சிறுவர் துஷ்பிரயோக வழக்குகளை விரைவுபடுத்தலும் [ப: 420]
யாழ்ப்பாணம் மற்றும் வவுனியா சிறைச்சாலைகளில் மருத்துவ வசதிகளை மேம்படுத்தல் [ப: 423]

**CRYPTOCURRENCY மற்றும் டிஜிட்டல் சொத்து பரிவர்த்தனைகளின் ஒழுங்குமுறை:**
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 427]

**வெளிநாட்டுப் பரிவர்த்தனைகளின்போது உலகளவில் அங்கீகரிக்கப்பட்ட டிஜிட்டல் கட்டண தளங்களைப் பயன்படுத்துதல்:**
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 432]

**வடக்கில் இராணுவத்தால் கையகப்படுத்தப்பட்டிருக்கின்ற தனியார் காணிகளை விடுவித்தல்:**
பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று [ப: 436]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
இலங்கை கல்வாரி தேவஸ்தானம் (கூட்டிணைத்தல்) (திருத்தம்) - [மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 441]

**பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 442- 555]

**நிதிசார் கொடுக்கல்வாங்கல்களை அறிக்கையிடல் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது [ப: 556]

**பயங்கரவாதி நிதியளிப்பை ஒடுக்குதல் மீதான சமவாய (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 559]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 561-564]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 565-576]


# PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Cols. 374-419]

QUESTION BY PRIVATE NOTICE:
Safeguarding Children's Rights and Expedition of Child Abuse Cases [Col. 420]
Improvement of Medical Facilities in Jaffna and Vavuniya Prisons [Col. 423]

REGULATION OF CRYPTOCURRENCY AND DIGITAL ASSET TRANSACTIONS:
Statement by Deputy Minister of Finance and Planning [Col. 427]

USE OF GLOBALLY RECOGNIZED DIGITAL PAYMENT PLATFORMS IN FOREIGN EXCHANGE TRANSACTIONS:
Statement by Deputy Minister of Finance and Planning [Col. 432]

RELEASE OF PRIVATE LANDS IN THE NORTH ACQUIRED BY THE MILITARY:
Statement by Deputy Minister of Defence [Col. 436]

PRIVATE MEMBERS' BILLS:
Calvary Church of Sri Lanka (Incorporation) (Amendment) - [The Hon. G.G. Ponnambalam] - Read the First time [Col. 441]

PREVENTION OF MONEY LAUNDERING (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Cols. 442-555]

FINANCIAL TRANSACTIONS REPORTING (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended [Col. 556]

CONVENTION ON THE SUPPRESSION OF TERRORIST FINANCING (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed [Col. 559]

ADJOURNMENT QUESTIONS [Cols. 561-564]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 565-576]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජූලි 09වන බ්‍රහස්පතින්දා***
*2026 யூலை 09, வியாழக்கிழமை*
*Thursday, 09th July, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

Hon. Speaker, on behalf of the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education, I present the -

(i) Annual Performance Report of the Sri Lanka Customs for the year 2025;
(ii) Performance Report of the Department of Fiscal Policy for the year 2025;
(iii) Performance Report of the Department of Development Finance for the year 2025;
(iv) Performance Report of the Department of Legal Affairs for the year 2025;
(v) Performance Report of the Excise Department of Sri Lanka for the year 2025;
(vi) Performance Report of the Department of Public Enterprises for the year 2025;
(vii) Performance Report of the Department of Management Audit for the year 2025; and
(viii) Annual Performance Report of the Department of Census and Statistics for the year 2025.

I move that these Reports be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;
(ii) 2025 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;
(iii) 2025 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;
(iv) 2025 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ වාරිමාර්ග අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
(v) 2025 වර්ෂය සඳහා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉඩම් අංශයේ කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා කම්කරු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
(ii) 2025 වර්ෂය සඳහා ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2025 වර්ෂය සඳහා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2025 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
ගරු කථානායකතුමනි, වැලිගම, සමගි මාවත, අංක 35/1 යන ලිපිනයෙහි පදිංචි එම්.එන්.එෆ්. නස්හා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රාගම, කඩවත පාර, අංක 803/1 යන ලිපිනයෙහි පදිංචි ජී. විජේසූරිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගෙලිඔය, මුරුතගහමුල, දස්කර, අංක 7 ඊ1 යන ලිපිනයෙහි පදිංචි එම්.බී. ජයසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -1543/2025- (2), ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -1642/2025- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1740/2025- (1), ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ගම්මාන: විස්තර
## இரத்தினபுரி மாவட்டத்திலுள்ள தோட்டக் கிராமங்கள்: விபரம்
## ESTATE VILLAGES IN RATNAPURA DISTRICT: DETAILS

1789/2025

**4. ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ඇති වතු ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම වතු ගම්මානවල ජීවත්වන පවුල් සංඛ්‍යාව එක් එක් ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ගම්මානවල යටිතල පහසුකම් ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரிடம் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்திலுள்ள தோட்டக் கிராமங்களின் எண்ணிக்கை யாது;

(ii) அவற்றின் பெயர்கள் யாவை;

(iii) மேற்படி தோட்டக் கிராமங்களில் வாழும் குடும்பங்களின் எண்ணிக்கை கிராமங்கள் வாரியாக வெவ்வேறாக யாது;

(iv) அந்தக் கிராமங்களின் உட்கட்டமைப்பு வசதிகளை மேம்படுத்துவதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House the -

(i) number of estate villages in the Ratnapura District;

(ii) names of those estate villages;

(iii) number of families living in those estate villages, separately in respect of each village; and

(iv) measures that will be taken to improve the infrastructure facilities in those estate villages?

(b) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයට අයත් වතු ගම්මාන ගණන 50කි. එය පහත ඇමුණුම මඟින් දක්වා ඇත.

ඇමුණුම

| | Region | RPC | Estate | Resident Families | Resident Population |
|---|---|---|---|---|---|
| 1 | Galle | Maturata Plantation PLC | Heyes | 457 | 2151 |
| 2 | Galle | Maturata Plantation PLC | Lankaberiya | 141 | 511 |
| | | | | **598** | **2662** |
| 1 | Rathnapura | Hapugastenna Plantation PLC | Aigburth | 566 | 1971 |
| 2 | Rathnapura | Hapugastenna Plantation PLC | Alupolla | 568 | 2502 |
| 3 | Rathnapura | Hapugastenna Plantation PLC | Depedene , | 141 | 553 |
| 4 | Rathnapura | Hapugastenna Plantation PLC | Galaboda | 632 | 2701 |
| 5 | Rathnapura | Hapugastenna Plantation PLC | Hatherleigh | 959 | 4056 |
| 6 | Rathnapura | Hapugastenna Plantation PLC | Hapugastenna R | 443 | 1665 |
| 7 | Rathnapura | Hapugastenna Plantation PLC | Hapugastenna T | 2559 | 8713 |
| 8 | Rathnapura | Hapugastenna Plantation PLC | Madampe | 894 | 3719 |
| 9 | Rathnapura | Hapugastenna Plantation PLC | Springwood | 524 | 2123 |
| | | | | **7286** | **28003** |
| 10 | Rathnapura | Balangoda Plantation PLC | Agarsland | 224 | 766 |
| 11 | Rathnapura | Balangoda Plantation PLC | Balangoda | 877 | 3637 |
| 12 | Rathnapura | Balangoda Plantation PLC | Cecilton | 407 | 1367 |
| 13 | Rathnapura | Balangoda Plantation PLC | Galutura | 695 | 2293 |
| 14 | Rathnapura | Balangoda Plantation PLC | Meddakande | 654 | 2508 |
| 15 | Rathnapura | Balangoda Plantation PLC | Mahawela | 568 | 1883 |
| 16 | Rathnapura | Balangoda Plantation PLC | Mutwagalla | 340 | 1167 |
| 17 | Rathnapura | Balangoda Plantation PLC | Millawitiya | 155 | 537 |
| 18 | Rathnapura | Balangoda Plantation PLC | Non Peril | 233 | 996 |
| 19 | Rathnapura | Balangoda Plantation PLC | Palmgarden | 994 | 3873 |
| 20 | Rathnapura | Balangoda Plantation PLC | Pettiagala | 536 | 1901 |
| 21 | Rathnapura | Balangoda Plantation PLC | Rambukkande | 228 | 921 |
| 22 | Rathnapura | Balangoda Plantation PLC | Rassagalla | 525 | 2124 |
| 23 | Rathnapura | Balangoda Plantation PLC | Rye/Wikiliya | 648 | 2835 |
| 24 | Rathnapura | Balangoda Plantation PLC | Walaboda | 208 | 736 |
| 25 | Rathnapura | Balangoda Plantation PLC | Wewila | 118 | 486 |
| | | | | **7410** | **28030** |
| 26 | Rathnapura | Kahawatte Plantation PLC | Ekkarella | 264 | 825 |
| 27 | Rathnapura | Kahawatte Plantation PLC | Endane | 960 | 4790 |
| 28 | Rathnapura | Kahawatte Plantation PLC | Houpe | 937 | 3075 |
| 29 | Rathnapura | Kahawatte Plantation PLC | Hunuwella | 621 | 1914 |
| 30 | Rathnapura | Kahawatte Plantation PLC | Opata | 844 | 3503 |
| 31 | Rathnapura | Kahawatte Plantation PLC | Pelmadulla | 1083 | 3914 |
| 32 | Rathnapura | Kahawatte Plantation PLC | Poranuwa | 794 | 2297 |
| 33 | Rathnapura | Kahawatte Plantation PLC | Rilhena | 735 | 2371 |
| 34 | Rathnapura | Kahawatte Plantation PLC | Wellandura | 682 | 2351 |
| | | | | **6920** | **25040** |
| 35 | Rathnapura | Agalawatte Plantation PLC | Doloswella | 857 | 3279 |
| 36 | Rathnapura | Agalawatte Plantation PLC | Kiribathgalla | 388 | 1233 |
| 37 | Rathnapura | Agalawatte Plantation PLC | Kiriwanaketiya | 90 | 301 |
| 38 | Rathnapura | Agalawatte Plantation PLC | Mohamedi | 550 | 1890 |
| 39 | Rathnapura | Agalawatte Plantation PLC | Niriella/Neriwatta | 510 | 1428 |
| 40 | Rathnapura | Agalawatte Plantation PLC | Noragalla | 281 | 1269 |
| 41 | Rathnapura | Agalawatte Plantation PLC | Pimbura | 76 | 286 |
| 42 | Rathnapura | Agalawatte Plantation PLC | Peenkande | 535 | 2041 |
| 43 | Rathnapura | Agalawatte Plantation PLC | Watapotha | 246 | 936 |
| | | | | **3533** | **12663** |
| 44 | Rathnapura | Pussellawa Plantation PLC | Durampitiya | 229 | 934 |
| 45 | Rathnapura | Pussellawa Plantation PLC | Eheliyagoda | 302 | 894 |
| 46 | Rathnapura | Pussellawa Plantation PLC | Hemingford | 559 | 1826 |
| 47 | Rathnapura | Pussellawa Plantation PLC | Keragala | 257 | 888 |
| 48 | Rathnapura | Pussellawa Plantation PLC | Pussella | 192 | 729 |
| 49 | Rathnapura | Pussellawa Plantation PLC | Pambegama | 387 | 1189 |
| 50 | Rathnapura | Pussellawa Plantation PLC | Sunderland | 104 | 386 |
| | | | | **2030** | **6846** |
| | | | | | |
| | Rathnapura District Total | | | **27777** | **103244** |

(ii) ඇමුණුම මඟින් දක්වා ඇත.

(iii) ඇමුණුම මඟින් දක්වා ඇත.

(iv) ඔව්.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ව්‍යාපෘති යෝජනා වාර්ෂිකව කැඳවන අතර, පවතින ප්‍රතිපාදන හා ප්‍රමුඛතාව මත අදාළ යෝජනා අනුමත කර දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම මඟින් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබයි.

2025 වර්ෂයේදී ගනු ලැබූ ක්‍රියාමාර්ග

- **දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

  දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කළ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් යටතේ වැවිලි ප්‍රදේශවල ජනතාවගේ දෛනික ජීවිතයට අවශ්‍ය මූලික පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. එමඟින් පානීය ජලය, සෞඛ්‍ය සහ ගමනාගමන පහසුකම් වර්ධනය ඇතුළු ප්‍රජා යටිතල පහසුකම් ශක්තිමත් කිරීමේ කටයුතු හා වතු ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට දායකත්වය ලබා දී ඇත.

  දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් ක්‍රියාත්මක කළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 250ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර, 2025 වර්ෂය තුළ නව ජල සැපයුම් ව්‍යාපෘති 20ක් සහ අමතර ජල ව්‍යාපෘති 1ක්, ලැයිම් කාමර සෙවිලි කිරීමේ - reroofing - ව්‍යාපෘති 28ක්, සනීපාරක්ෂක ව්‍යාපෘති 57ක්, CDC සහ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘති 6ක් සහ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 54ක් සම්පූර්ණ කර ඇත. තවද, ආගමික ස්ථාන 21ක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර, පොදු පහසුකම් ව්‍යාපෘති 11ක් සම්පූර්ණ කිරීම හා ප්‍රජාශක්ති සංවර්ධන මධ්‍යස්ථානයක් ප්‍රතිසංස්කරණය කිරීමද මේ වනවිට සිදු කර ඇත.

  මීට අමතරව 2025 වර්ෂයේදී සෞඛ්‍යාරක්ෂිත පානීය ජල ව්‍යාපෘති ඇති කරලා තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා එක්ව වැවිලි මානව සංවර්ධන භාරය විසින් ප්‍රජා යටිතල පහසුකම් අංශය මඟින් ලබා දෙන නව නිවාස සඳහාද සෞඛ්‍යාරක්ෂිත පානීය ජල පහසුකම් ලබා දීමට කටයුතු කර තිබෙනවා.

  රත්නපුර දිස්ත්‍රික්කයට අදාළව මෙම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 23ක ප්‍රතිපාදන වෙන් කළ අතර - ඒ කියන්නේ, ව්‍යාපෘති 22ක් සඳහා - ඉන් ව්‍යාපෘති 21ක් 2025 වර්ෂයේ අවසන් කර තිබෙනවා. ඒ සඳහා වැය වුණු මුළු වියදම රුපියල් මිලියන 19කි.

- **වතු ප්‍රජාව සඳහා ඩිජිටල් දත්ත පද්ධතිය සංවර්ධනය**

  වතු ප්‍රජාව සඳහා ඩිජිටල් දත්ත පද්ධතිය සංවර්ධනය කිරීම අරමුණු කර ගත් මෙම වැඩසටහන, වැවිලි ප්‍රජාව පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන තොරතුරු එක්රැස් කර සැලසුම්කරණය, ව්‍යාපෘති තීරණ ගැනීම සහ සේවා සැපයීම වඩාත් කාර්යක්ෂම කිරීමට හඳුන්වා දෙන ලද තාක්ෂණික පියවරකි. ඒ අනුව, ජංගම යෙදුම සංවර්ධනය කර පරීක්ෂණ අදියරට ගෙන ගොස් ඇති අතර PCCF නිලධාරින් පුහුණු කිරීම හරහා වතු ප්‍රදේශ ආවරණය වන පරිදි ක්ෂේත්‍ර මට්ටමේ දත්ත එකතු කිරීමට පියවර ගනිමින් පවතී. මෙම ක්‍රියාවලිය මඟින් වතු ප්‍රජාවට අදාළ විශ්වාසදායී දත්ත පද්ධතියක් ස්ථාපිත කර අනාගත සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම ශක්තිමත් කිරීමට අපේක්ෂා කරයි.

2026 වර්ෂයේ මුදල් වෙන් කළ ව්‍යාපෘති

1. ඉන්දීය නිවාස ව්‍යාපෘතිය
   - නිවාස 4,000 වැඩසටහන: ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතිරිව ඇති නිවාස 14ක වැඩ අවසන් කිරීම සහ මහනුවර හා ගාල්ල වතු ප්‍රදේශවල එම නිවාස සඳහා ජලය හා විදුලිය ලබා දීම.

     (ඇස්තමේන්තුගත පිරිවැය: රුපියල් මිලියන 60)
   - නිවාස 10,000 වැඩසටහන: දැනට ඉදිවෙමින් පවතින නිවාස 1,300 අවසන් කිරීම.
     * පළමු අදියර - 2025 වර්ෂයේ රත්නපුර දිස්ත්‍රික්කයේ නිවාස 25ක් සම්පූර්ණ කර ඇත.
     * දෙවන අදියර - 2026 වර්ෂයේ සිදු කරනු ලබන දෙවන අදියරේදී රත්නපුර දිස්ත්‍රික්කයේ නිවාස 362ක අවශ්‍යතාවක් හඳුනාගෙන ඇත.
2. වතු නිවාස වැඩසටහන (ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන)
   - 2025 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ නිවාස (carry-over) අවසන් කිරීම.
   - නිවාස සඳහා ජලය හා විදුලිය ලබා දීම.
     * 2026 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයට වතු නිවාස 31ක ඉදිකිරීම් කටයුතු - carry-over - ක්‍රියාත්මක වෙමින් පවතී.
3. ආපදා සහන නිවාස වැඩසටහන - Disaster Housing Programme
   - ස්වාභාවික ආපදාවලින් පීඩාවට පත් පවුල් වෙනුවෙන් දිස්ත්‍රික්ක 7ක (බදුල්ල, මාතලේ, කළුතර, නුවරඑළිය, මාතර, රත්නපුර සහ කෑගල්ල) ඉදිවෙමින් පවතින නිවාස වැඩ අවසන් කිරීම සහ අවශ්‍ය ජල හා විදුලි පහසුකම් ලබා දීම.
     * 2026 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයට අදාළව ආපදා සහන නිවාස වැඩසටහන සඳහා රුපියල් මිලියන 14ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

       (වැවිලි වත්ත - නිවාස 03, මල්වතු වත්ත - නිවාස 02)

4. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති

   - බදුල්ල, රත්නපුර, කෑගල්ල, නුවරඑළිය, මාතලේ සහ මහනුවර යන දිස්ත්‍රික්කවල 2025 වසරේ සිට අඛණ්ඩව ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සහ විශේෂ මාර්ග ව්‍යාපෘති අවසන් කිරීම.

     * 2026 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයට අදාළව සංවර්ධන ව්‍යාපෘති 4ක් සඳහා රුපියල් මිලියන 11ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

       i. පනිල්කන්ද - වහල සෙවිලි කිරීමේ ව්‍යාපෘතිය

       ii. ඕපාත වත්ත - ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම

       iii. මස් ඉඹුල, ඩෙල්වින් B කොටස - මාර්ග සංවර්ධන ව්‍යාපෘති

       iv. බල්ලපානතැන්න - මාර්ග සංවර්ධන ව්‍යාපෘති

5. වහල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති - Reroofing Projects

   - වතුකරයේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් ගාල්ල, රත්නපුර, බදුල්ල, කෑගල්ල, මහනුවර සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල තෝරා ගත් වතු නිවාස සඳහා ඒකක 735ක් - roofing units - වෙනුවෙන් 2025 වසරේ සපයන ලද වහල තහඩු සවි කර අවසන් කිරීමේ කටයුතු සිදු කිරීම.

     * 2026 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයට අදාළව වහල තහඩු - roofing units - 53 සවි කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු ඇමතිතුමනි, ඔබතුමා වතු ආශ්‍රිත දිස්ත්‍රික්කයක් නියෝජනය කරන ඇමතිවරයෙක් බව අපි දන්නවා. අපේ රටේ රත්නපුර දිස්ත්‍රික්කය වාගේම වතු ආශ්‍රිත දිස්ත්‍රික්ක තවත් තිබෙනවා. වතුකරයේ තිබෙන ඒ නිවාසවල පවුල් විශාල ප්‍රමාණයක් ජීවත් වනවා. ඒ වාගේම වතුකරය අවට සිංහල සහ දමිළ ජනතාවත් විශාල ප්‍රමාණයක් ජීවත් වනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව පත් වෙලා මේ වනකොට අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගත වී තිබෙනවා. නමුත්, වතුකරයේ තිබෙන මාර්ග පද්ධතිය, ජල පහසුකම් පිළිබඳව අවධානය යොමු කර නැහැ. ඒවායේ වසර 200කට වඩා පැරණි වතු නිවාස තිබෙන්නේ. රත්නපුර දිස්ත්‍රික්කය ගත්තාම, විශේෂයෙන්ම බලංගොඩ, රක්වාන, කොලොන්න හා රත්නපුර කියන ආසනවල වතු නිවාස රාශියක් තිබෙනවා. ඒ අයට අවශ්‍ය පහසුකම් සංවර්ධනය වෙලා තිබෙන බවක් අපට මේ වනකොට පෙනෙන්නේ නැහැ. අපි වතු නිවාසවලට යනකොට ඒ අයගේ ප්‍රශ්න ඒ ආකාරයෙන්ම තිබෙන බව තමයි අපට පෙනෙන්නේ. ඔබතුමන්ලා ආණ්ඩුව ගන්නකොට නම් කිව්වේ මේ අයට කඩිනමින් විසඳුම් දෙනවාය කියලායි. ඒ වාගේම වතු ආශ්‍රිත කුඩා තේ වතු හිමියන්ට තේ වතු සඳහා රුපියල් 18,000කට තමයි පොහොර හොණ්ඩරයක් ලබා ගන්න වෙන්නේ. එහෙම වුණාම ඔවුන් පොහොර යොදන්නේ නැහැ. දැන් තේ අස්වැන්න අඩු වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* රුපියල් 18,000කට තමයි පොහොර හොණ්ඩරයක් මිලදී ගන්න වෙන්නේ. කුඩා තේ වතු හිමියන්ට ලැබෙන ආදායම අනුව පොහොර මිලදී ගැනීමේ හැකියාවක් ඒ අයට නැහැ. මේ වනකොට අපේ රටේ තේ අස්වැන්න විශාල වශයෙන් අඩු වෙලා තිබෙනවා. තේ ෆැක්ටරිවල අයිතිකරුවන් අපට කියනවා, දලු ගොඩක් අඩුවෙන් තමයි එන්නේ කියලා. මේ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියා මේ අවස්ථාවේදී මම අහන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එතුමා අහපු අතුරු ප්‍රශ්නය තුළ ප්‍රශ්න ගණනාවක් තිබුණා. එතුමා අවසන් කරපු තැනින් පටන් ගත්තොත්, කුඩා තේ වතු හිමියන් සඳහා පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළ ගැන මම කියන්නම්. අපි බලයට එනවිට පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබුණා. නමුත්, ඒ පොහොර ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව සකස් කරලා තිබුණේ නැහැ. ඒ නිසා 2024 වර්ෂයේදී කුඩා තේ වතු හිමියන්ට ලබා දීලා තිබුණේ පොහොර මෙට්‍රික් ටොන් 13,000ක් වාගේ ප්‍රමාණයක්. කුඩා තේ වතු හිමියන් 84,000ක් වාගේ තමයි ඒ මෙට්‍රික් ටොන් 13,000 බෙදා ගෙන තිබුණේ. අපි බලයට ආවාට පසුව ලංකාවේ පළමුවැනි වතාවට කුඩා තේ වතු හිමියන්ට QR කේතයක් මඟින් පොහොර ලබා දීමේ වැඩසටහන ආරම්භ කළා. ඒ අනුව පසුගිය මාසය අවසන් වනකොට QR කේතය මඟින් ගොවීන් 191,000කට අපි පොහොර ලබා දීලා තිබෙනවා. අපි බලයට එන්න පෙර ගොවීන් 84,000යි පොහොර අරගෙන තිබුණේ. හැබැයි, අපි QR කේතය මඟින් 191,000කට තේ පොහොර ලබා දීලා තිබෙනවා. අපි ලබා දුන් තේ පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 22,000කට ආසන්නයි. අපි බලයට එන්න පෙරාතුව ඒ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 13,000යි. අපි සහනාධාරය විධියට තේ පොහොර මෙට්‍රික් ටොන් 22,000ක් ලබා දීලා තිබෙනවා. ඊට පස්සේ ජනාධිපතිතුමා මේ සභාවටම ඇවිල්ලා මැද පෙරදිග ඇති වුණු යුද වාතාවරණය හේතුවෙන් පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් සහන පැකේජයක් හඳුන්වා දුන්නා. විවිධ කොටස්වලට එම සහන පැකේජය හඳුන්වා දෙන අතරේ, කුඩා තේ වතු ගොවීන්ටත් ඒ සහන පැකේජයෙන් සහනයක් ලබා දුන්නා. සාමාන්‍යයෙන් රජය වසරකට එක් වතාවයි තේ පොහොර සහනාධාරය දුන්නේ. මැද පෙරදිග යුද්මය තත්ත්වය නිසා මේ වසරට පමණක් තේ පොහොර සහනාධාරයක් අතිරේකව ලබා දෙන්න තීන්දු කළා. ඒ සඳහා මහා භාණ්ඩාගාරයෙන් අපට රුපියල් මිලියන 2,500ක් ලබා දීලා තිබෙනවා. ඒ අනුව, මේ මාසයේ සිට අපි තේ පොහොර මිටියකට සහනයක් හැටියට රුපියල් 5,000ක වටිනාකමක් රජයෙන් ලබා දෙනවා. ඉතිරි කොටස ගොවියා දරා ගන්න ඕනෑ. ඒ සඳහා රුපියල් මිලියන 2,500ක් වෙන් කරලා තිබෙනවා. දෙවැනි වරටත් අපි තේ පොහොර සහනාධාරයක් ලබා දෙනවා. මේ රටේ පළමු වතාවට තමයි එය ක්‍රියාත්මක වෙන්නේ.

ඊළඟට, ඔබතුමා තවත් ප්‍රශ්නයක් ඇහුවා, වතුකරයේ ජීවත් වන මලෛයහම් ප්‍රජාවට පහසුකම් ප්‍රමාණවත් නැහැ, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා. මම පිළිගන්නවා, දැනටත් අපි ලබා දෙන පහසුකම් ප්‍රමාණවත් නැහැ කියලා. අපි බලයට ඇවිල්ලා තවම අවුරුද්දයි මාස 8යි වෙන්නේ. ඔබතුමන්ලා ඇතුළු කණ්ඩායම් වසර 76ක් මේ රට පාලනය කළා. ඔබතුමන්ලාත් යමක් නොදුන්නා නොවෙයි, දුන්නා. නමුත්, තවමත් ඔවුන්ට නොලැබුණු අයිතිවාසිකම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි කවුරුත් පිළිගන්නවා, 2023 වසරේ තමයි මලෛයහම් ජනතාව ලංකාවට ඇවිල්ලා වසර 200ක් පිරුණේ. ඒ වෙනකොටත් ඔවුන්ට තමන්ටම කියලා බිම් කඩක්

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

තිබුණේ නැහැ, තමන්ට කියලා නිවසක් තිබුණේ නැහැ, සමහර විට තමන්ට කියලා ලිපිනයක් තිබුණේත් නැහැ. ගරු කථානායකතුමනි, අපි දැන් ඒවා ලබා දීමේ වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව ආරම්භ කරලා තිබෙනවා. ගිය අවුරුද්දේ විතරක් Clean Sri Lanka වැඩසටහන යටතේ වතු නිවාස 3,000කට ආසන්න ප්‍රමාණයක් පිළිසකර කරලා, තහඩු ටික දාලා, ලිපින ලබා දීලා, ඒ ජනතාවට අයිතිවාසිකම් ලබා දීමක් කළා.

ඊට අමතරව ගිය අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ ජනාධිපතිතුමාගේ මූලිකත්වයෙන් අපි බණ්ඩාරවෙලදී, නවීන නිවසක් වතුකරයේ ජනතාවට ලබා දෙන වැඩ පිළිවෙළ ආරම්භ කළා. මම ස්තුතිවන්ත වෙනවා, ඉන්දියානු රජයට. ඉන්දියානු ආධාරත්, ලංකාවේ ආධාරත් ඒකාබද්ධ කරලායි ඒ වැඩ පිළිවෙළ ආරම්භ කළේ. ලංකා ඉතිහාසයේ පළමු වතාවට මලෙයෙහම් ප්‍රජාවට වැඩිම නිවාස ප්‍රමාණයක් ලබා දුන්නේ පසුගිය ඔක්තෝබර් මාසයේ. අපි ඒ අයට හිමිකම් පත්‍රය ලබා දුන්නා; පවුල් 2,026ක් සඳහා ගෙවල් හදලා දෙන්න හිමිකම් පත්‍ර ලබා දුන්නා. දැන් ඒ ගෙවල්වල වැඩ ආරම්භ වෙමින් තිබෙන්නේ. අපි බලයට එනකොට කියා තිබුණේ, ඒ අයට පර්චස් හතක් දෙනවා කියලායි. ඒකත් හරියට දීලා තිබුණේ නැහැ. අපි ඇවිල්ලා ඒක පර්චස් 10ක් කරලා දැන් අපි ඔවුන්ට පර්චස් 10ක ඉඩම තුළ නවීන ගෙයක් හදලා දෙනවා. ඒ ගෙදර වටිනාකම ගත්තොත්, ලක්ෂ 32ක්. ඒක නැවත අය කරන එකක් නොවෙයි. ඉඩමත් එක්ක එහි වටිනාකම බැලුවොත් ලක්ෂ 60ක්, 70ක්, කෝටියක් වාගේ වෙනවා. එක් එක් ප්‍රදේශ අනුව මේක වෙනස් වෙනවා. ඒ අනුව 2026 අවුරුද්ද ගත්තාම, අපේ අමාත්‍යාංශය මඟින් අපේ රජයේ මුදල් දාලා වෙනමත් ආපදා නිවාස හදනවා. නිවාස පන්දාහකට වැඩි ප්‍රමාණයක් මේ වෙනකොට ඉදි වෙමින් තිබෙනවා කියන එක මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි. මේ ජනතාවගේ ප්‍රශ්න එක පාරට විසඳීමේ හැකියාවක් නැහැ. මම හිතනවා, ඒක රටේ කවුරුත් පිළිගනීවි කියලා. නමුත් වෙනදාට වඩා වේගවත් සංවර්ධන වැඩ පිළිවෙළක් මලෙයෙහම් ප්‍රජාව වෙනුවෙන් දියත් වෙමින් තිබෙන බව මම ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)
ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපේ දිස්ත්‍රික්කයේ රක්වාන, හුණුවල ප්‍රදේශ ගත්තොත් ඒ වතු අක්කර දහස් ගණන් මුඩු ඉඩම් බවට පත් වෙලා තිබෙනවා. පොඩි ප්‍රමාණයක් නොවෙයි. ඒවා වතු සමාගම්වලින් සංවර්ධනය වෙන්නේත් නැහැ. ඒවායේ අවුරුදු සිය ගණනක සිට අක්කරයකට තේ ගස් දහයයි, දොළහයි තිබෙන්නේ. එහෙම නැත්නම් කැළය සම්පූර්ණයෙන් වැවිලා තිබෙනවා. ඒ වතු ආශ්‍රිත ප්‍රදේශයේ එක ලැයිම් කාමරයක විශාල පිරිසක් ජීවත් වෙනවා.

එක ලැයිම් කාමරයක පවුල් දෙක, තුන ඉන්නවා, හොඳ තරුණ පිරිස් ඉන්නවා. ඒ සියලුදෙනා කුලී වැඩවලට යන්නේ. අපි දකින විධියට බොහෝදෙනා කුලී වැඩවලට යන්නේ. වතුකරයේ තිබෙන මේ ඉඩම් කොටස් කරලා තේ ටිකක් සිටුවා ගන්න, කුරුඳු ගස් ටිකක් සිටුවා ගන්න, එහෙම නැත්නම් ගම්මිරිස් ටිකක් සිටුවා ගන්න යම් ක්‍රමයකින් අක්කරය අක්කරය හරි ඒ අයට ලබා දුන්නොත් ඒ අයට විශාල ආදායමක් ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඔබතුමාම කිව්වා, ගම්මිරිස් අක්කරයකින් අවුරුද්දකට රුපියල් ලක්ෂ 21ක් ගන්න පුළුවන් කියලා. එතකොට ඒ වාගේ ගම්මිරිස් හරි වෙනත් මොනවා හරි වවලා ඒ අයගේ ජීවන තත්ත්වය නඟාසිටුවා ගන්න ඒ අයටම පුළුවන් වෙනවා. එතකොට රජයකින් කියලා උදව් කරන්න අවශ්‍ය වන්නේ නැහැ. අවුරුදු සිය ගණනක් තිස්සේ මේවා මුඩු බිම් බවට පත් වෙලා තිබෙනවා. අපේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඉස්සර ප්‍රකාශ කළා, "අපේ ආණ්ඩුවක් තුළ අපි මේවා ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවට දීලා අපිට අපනයන ආදායමක් ලබාගන්න පුළුවන් විධියට සකස් කරනවා" කියලා. ඉතින් මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ගන්න පියවර මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු කථානායකතුමනි, මෙතුමා කියන කාරණයේ යම් කොටසක සත්‍යයක් තිබෙනවා. මොකද, පසුගිය ඉතිහාසයේ වතු කම්කරු ජනතාවට වතුවලින් ඈත් වෙලා කුලී වැඩවලට යන්න සිද්ධ වුණා. ඒක යම් මට්ටමකින් දැනටත් සිදු වෙන බව මම පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ප්‍රධාන වශයෙන්ම ඒක සිදු වුණේ වතු කම්කරු ජනතාවට ජීවත් වෙන්න සරිලන වැටුපක් ලබා නොදීමේ හේතුව නිසා. අපි දන්නවා, මලෙයෙහම් ප්‍රජාව නියෝජනය කරන මන්ත්‍රීවරු ඔබතුමන්ලාගේ පාර්ශ්වයේ ඉන්න බව. එතුමන්ලාටයි, ඔබතුමන්ලාටයි එක්කහු වෙලා ඔවුන්ට ජීවත් වෙන්න සරිලන වැටුපක් දෙන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. අපි දන්නවා, ලංකා ඉතිහාසයේ වතු කම්කරුවන්ගේ වැටුපක් වැඩි කරගන්න අවශ්‍ය වුණාම මේ රටේ ආර්ථිකයත් යම් විධියක බලපෑමකට ලක් කරලා, ආර්ථිකය දුර්වල කරලා, ඒ කියන්නේ එක්කෝ දලු නෙළන එක නවත්වලා, උද්ඝෝෂණවලට ගිහිල්ලා, කර්මාන්තශාලාවල වැඩ නවත්වලා - එහෙම සටන් කරලා - තමයි සමහර විට වතු කම්කරුවෝ වැටුපක් වැඩි කරගනු ලැබුවේ. එහෙම සටන් කළා වුණත් සමහර වෙලාවට ඒ අයට හිස් අතින් තමයි ගෙදර යන්න සිදු වුණේ. සමහර වෙලාවට රුපියල් 10කින්, 50කින්, 100කින් වතු කම්කරුවාගේ වැටුප වැඩි කරලා දුන්නා. නමුත්, ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට රාජ්‍ය සේවකයන් ගත්තත්, වතු කම්කරුවන් ගත්තත් උද්ඝෝෂණයක් නොකර, පෙත්සමක් ගහන්නේ නැතිව, වැඩ වර්ජනය නොකර, පාසල් වහන්නේ නැතිව, රෝහල් වහන්නේ නැතිව, දලු කඩන එක නවත්වන්නේ නැතිව, කර්මාන්තශාලාවල වැඩ නවත්වන්නේ නැතිව, ආර්ථිකය බිඳ වට්ටන්නේ නැතිව තමන්ගේ අයිතිවාසිකම් දිනා ගත හැකි රජයක් මේ රටේ ඇවිල්ලා තිබෙනවා. වැඩ කරන ජනතාවගේ ආණ්ඩුවක් ආපු එකේ වටිනාකම වතු කම්කරුවාත් හඳුනා ගෙන තිබෙනවා. ලංකාවේ පළමුවැනි වතාවට වැඩිම ගණනකින් වතු කම්කරුවාගේ වැටුප වැඩි කළේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ රජය යටතේයි. ඒ අනුව තමයි ජනවාරි මාසයේ ඉඳන් ඔවුන්ගේ දෛනික වැටුප අපි රුපියල් 400කින් වැඩි කරලා තිබෙන්නේ. පළමුවැනි වතාවට රජයත් දිරි දීමනාවක් හැටියට ඒ වෙනුවෙන් රුපියල් 200ක් ලබා දෙනවා. මම සමහර වතු කම්කරුවන් හමු වුණා. ඒ අය අතර ඉන්නවා, මේ වැටුප් වැඩි කිරීම නිසා සාමාන්‍යයෙන් මාසයකට රුපියල් 12,000කට වැඩි වැටුපක් ලබන කණ්ඩායමක්. ඒ හින්දා කම්කරුවන් වෙනදාට වඩා වත්තේ වැඩ කරන්න යන ප්‍රවණතාවක් දැන් පෙනෙන්නට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයේ එක කොටසකටයි මම ඒ උත්තර දුන්නේ.

ඊළඟට ඔබතුමා ඇහුවේ, වතුකරයේ තිබෙන ඌන උපයෝජිත ඉඩම්වලට මොකද කරන්නේ කියලායි. ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවටම ඇවිල්ලා පැහැදිලි කළා, "ඌන උපයෝජිත ඉඩම්" කියලා ඉඩම් ජාතියක් ලංකාවේ තිබෙන්න බැරි බව. ඉඩම් කියන්නේ අපේ රටේ තිබෙන වටිනාම ප්‍රාග්ධනයක්, වටිනාම සම්පතක් හැටියට හඳුනා ගෙන තිබෙනවා. එක්කෝ, ඒ ඉඩම්වල වගා කරන්න ඕනෑ. එහෙම නැත්නම්, ඒවා සංචාරක ව්‍යාපාරයට

යොදා ගන්න ඕනෑ, එහෙමත් නැත්නම් කර්මාන්තවලට යොදා ගන්න ඕනෑ. ඒ ප්‍රතිපත්තියට අනුව අපි දැන් කටයුතු කරමින් ඉන්නවා.

මගේ අමාත්‍යාංශය යටතේ ජනවසම, රාජ්‍ය වැවිලි සංස්ථාව, Elkaduwa Plantations Limited වාගේ වැවිලි සමාගම් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ ඒවායේ ඌන උපයෝජිත ඉඩම් තිබුණා, ගරු මන්ත්‍රීතුමනි. ඉස්සර වාගේ දැන් අපි ඒවා තියාගෙන ඉන්නේ නැහැ, දේශපාලන හිතවත්කමට, ඥාතිකම්වලට දෙන්නේත් නැහැ. ඒ හින්දා අපේ අමාත්‍යාංශය ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් දාලා වට දෙකක් ආයෝජකයන් කැඳෙව්වා. අපි පසුගිය 30වැනි දා අක්කර 12,500කට අදාළව ආයෝජන කැඳවා අවසන් කළා. මේ රටේ ආයෝජනය කරන්න කැමැති අපේ තරුණ තරුණියන්, පුරවැසියන් ඒවාට ඉල්ලුම් කරලා තිබෙනවා. ඒ අනුව ඒ අයගේ සුදුසුකම් බලා අපි ඒ ඉඩම් ලබා දෙනවා. මා ළඟ වාඩි වෙලා ඉන්න ගරු කර්මාන්ත ඇමතිතුමා නිතරම වද කරමින් කියන දෙයක් තමයි, කර්මාන්තවලට ඉඩම් ලබා දෙන්න, මැණික් ව්‍යාපාරය සඳහා ඔබතුමන්ලාගේ ප්‍රදේශවල ඉඩම් ලබා දෙන්න කියන එක. එතුමන්ලාත් ආයෝජකයන්ට පෙන්වා දී තිබෙනවා, අපේ ඉඩම් ගන්න පුළුවන් කියලා. ඒ අනුව අපි ඒ ඉඩම් ඇත්තටම වගා කරන්න පුළුවන්, යම් කර්මාන්තයකට යොදවන්න පුළුවන්, ආයෝජනයක් කරන්න පුළුවන් අයට ලබා දෙමින් තිබෙනවා. අපි කෙටි කාලයක් තුළ තවත් ඉඩම් ලබා දෙන්න බලාපොරොත්තු වෙනවා. පසුගිය 30වන දායින් අවසන් වුණේ හෙක්ටෙයාර 20ට වැඩි ඉඩම් ලබා දීමයි. අක්කර 10ට අඩු ඉඩම් කොටස් ලබා දීමේ පුවත්පත් දැන්වීමත් අපි තව කෙටි කාලයක් තුළ පළ කරනවා. එතකොට අපේ විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්ට තමන් හම්බ කර ගත්තු මුදල් අක්කර 10ක, අක්කර 5ක වගාවක්, ව්‍යාපෘතියක්, කර්මාන්තයක්, සංචාරක අංශයේ ව්‍යාපාරයක් සඳහා යොදවන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඔවුන්ටත් ඉඩම් ලබා දෙන වැඩ පිළිවෙළක්, ඒ ඉඩම් ඵලදායි ලෙස යෙදවීමේ වැඩ පිළිවෙළක් අප සතුව තිබෙනවා. ඔබතුමන්ලාගේ පක්ෂයේත් එවැනි ප්‍රතිපත්තියක් තිබෙනවා කියලා ඔබතුමා කිව්වා, ගරු මන්ත්‍රීතුමනි. ඒ හින්දා එය ක්‍රියාත්මක කරන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා කියලාත් කිව්වා. හැබැයි ජනතාව වරමක් දුන්නොත් තමයි ඒක කරන්න පුළුවන් වෙන්නේ. අපට නම් පෙනෙන්නේ නැහැ, එහෙම වරමක් ඔබතුමන්ලාට හිමි වෙයි කියලා.

බොහොම ස්තුතියි.

## බොලිවේරියානු ගම්මානයේ නිවාස යෝජනා ක්‍රම: ප්‍රතිසංස්කරණය

### பொலிவேரியன் கிராமத்திலுள்ள வீடமைப்புத் திட்டங்கள்: மீள்நிர்மாணம்

### HOUSING SCHEMES IN BOLIVARIAN VILLAGE: RECONSTRUCTION

1888/2026

**5. ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බොලිවේරියන් ගම්මානයේ පිහිටි EHED සුනාමි නැවත පදිංචි කිරීමේ, ඉස්ලාමාබාද් සහ පෙරියනීලාවනෙයි යන නිවාස යෝජනා ක්‍රම පරිහානියට පත්ව මූලික පහසුකම් අක්‍රිය තත්ත්වයට පත් වීමෙන් පදිංචිකරුවන් දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින බවත්;

(ii) නිරන්තර ගංවතුර හේතුවෙන් රැඳෙන ජලය, වැසිකිළි සහ අපජල පද්ධතිය සමඟ මිශ්‍ර වීමෙන් මදුරුවන් බෝ වීම සහ රෝග පැතිර යාම ඇතුළුව සෞඛ්‍ය ගැටලු ඇති වී ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් වැඩිහිටියන්, කාන්තාවන්, දරුවන් සහ රෝගීන් පීඩාවට පත් වී ඇති බවත්;

(iv) ඉහත නිවාස යෝජනා ක්‍රමවල ක්‍රියාත්මක වූ සහාධිපත්‍ය දේපළ කමිටු දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත නිවාස යෝජනා ක්‍රමවල පවතින සෞඛ්‍ය, කානු පද්ධති සහ ගංවතුර ගැටලු විසඳීමට ගනු ලබන ක්ෂණික පියවර කවරේද;

(ii) මෙම නිවාස යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම හෝ යළි ගොඩනැගීම සඳහා ප්‍රායෝගික සහ ස්ථිර විසඳුමක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා යෝජිත කාල වකවානු කවරේද;

(iv) මේ වන විට අක්‍රියව පවතින සහාධිපත්‍ය දේපළ කමිටු සක්‍රිය කිරීම සඳහා ගත වන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பொலிவேரியன் கிராமத்தில் அமைந்துள்ள EHED சுனாமி மீள்குடியேற்றல், இஸ்லாமாபாத் மற்றும் பெரியநீலாவணை ஆகிய வீடமைப்புத் திட்டங்கள் மிக மோசமான நிலையில் இருப்பதுடன், அங்கு அடிப்படை வசதிகளும் செயலிழந்த நிலையில் காணப்படுவதால் குடியிருப்பாளர்கள் பெரும் சிரமங்களை எதிர்கொண்டுள்ளனர் என்பதையும்;

(ii) தொடர்ச்சியாக ஏற்படுகின்ற வெள்ளம் காரணமாக தேங்கி நிற்கும் நீர், கழிப்பறை மற்றும் கழிவுநீர் கட்டமைப்புடன் கலப்பதால் நுளம்புப் பெருக்கம் மற்றும் நோய்கள் பரவுதல் உட்பட பல சுகாதாரச் சீர்கேடுகள் ஏற்பட்டுள்ளன என்பதையும்;

(iii) அதன் காரணமாக வயோதிபர்கள், பெண்கள், பிள்ளைகள் மற்றும் நோயாளிகள் பாதிக்கப் பட்டுள்ளனர் என்பதையும்;

(iv) மேற்படி வீடமைப்புத் திட்டங்களில் இயங்கிய கூட்டு ஆதனக் குழுக்கள் நீண்டகாலமாகச் செயலிழந்து காணப்படுகின்றன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வீடமைப்புத் திட்டங்களில் நிலவும் சுகாதார, வடிகாலமைப்பு மற்றும் வெள்ளநீர் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு மேற்கொள்ளப் படும் துரித நடவடிக்கைகள் யாவை என்பதையும்;

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

(ii) மேற்படி வீடமைப்புத் திட்டங்களை மீள் நிர்மாணிப்பதற்காக அல்லது மீளக் கட்டியெழுப்புவதற்காக நடைமுறை ரீதியான மற்றும் நிலையான தீர்வொன்றை நடைமுறைப் படுத்துவதற்கு முன்மொழியப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கான உத்தேச காலப்பகுதி யாது என்பதையும்;

(iv) தற்போது செயலிழந்த நிலையில் காணப்படும் கூட்டு ஆதனக் குழுக்களைச் செயற்படுத் துவதற்கு எடுக்கும் காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House whether he is aware that -

(i) the residents of the EHED Tsunami Resettlement, Islamabad and Periyanilawanai Housing Schemes in the Bolivarian Village are experiencing significant difficulties due to their dilapidated condition, where basic amenities have become non-operational;

(ii) persistent flooding has led to serious health concerns, including mosquito breeding and the spread of diseases, as stagnant water is mixed with toilet pits and sewage systems;

(iii) as a consequence, vulnerable groups, including the elderly, women, children and those with health conditions have been adversely affected; and

(iv) the condominium property committees that functioned in the said housing schemes have remained dormant for a considerable period?

(b) Will he also inform this House -

(i) the immediate measures that will be taken to address the prevailing health, drainage and flooding issues in the above-mentioned housing schemes;

(ii) whether a practical and permanent solution has been proposed for the renovation or reconstruction of the said housing schemes;

(iii) if so, the proposed time period for the same; and

(iv) the period of time that will be taken for reactivating the currently dormant condominium property committees?

(c) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සයින්දමරුදු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය ඉදි කර ඇති අතර, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෙෙ සුනාමි නිවාස යෝජනා ක්‍රම ඉදි කර ඇත. පෞද්ගලික ආයතන මඟින් ඉස්ලාමාබාද් සුනාමි නිවාස ඉදි කර ඇති අතර, පෙරියනීලාවනෙෙ සුනාමි නිවාස යෝජනා ක්‍රමය ඉස්ලාමික් රිලීෆ් ලෙස හඳුන්වනු ලබන රාජ්‍ය නොවන සංවිධානය මඟින් ඉදි කර ඇත. මෙම නිවාසයන්හි මූලික පහසුකම් අක්‍රිය තත්ත්වයේ පවතින බව වාර්තා වී ඇත.

(ii) ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෙෙ සුනාමි නිවාස ක්‍රමය තුළ ඉදි කරන ලද අපවහන පද්ධතිය හා අපජල පද්ධතිය දැනට අක්‍රිය තත්ත්වයට පත් වී ඇති බැවින් සෞඛ්‍ය ගැටලු මතු වී ඇති අතර, ජලය රඳා පැවතීම නිසා මදුරුවන් බෝවීමේ අවදානම වැඩි වී ඇත. බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය තුළ ගංවතුර ප්‍රශ්න වාර්ෂික වර්ෂාපතනය හේතුවෙන් වාර්තා වන අතර, මෙම යෝජනා ක්‍රමය අක්කර 50ක කුඹුරු ඉඩම් ගොඩ කර ඉදි කර ඇති බැවින්, මෙවැනි තත්ත්වයක් උද්ගතව ඇති අතර, ජලය එක් රැස් වීම හේතුවෙන් රෝග පැතිර යෑම, මදුරුවන් බෝ වීම හා සෞඛ්‍ය ගැටලු මතු වී ඇති බව වාර්තා වී ඇත.

(iii) ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෙෙ සුනාමි නිවාස ක්‍රමය තුළ සෞඛ්‍ය ගැටලු පැවතීම හේතුවෙන් විටින් විට රෝගී තත්ත්වයන් වාර්තා වී ඇති බව කල්මුණේ ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත. බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය තුළ ගංවතුර තත්ත්වය හේතුවෙන් වැඩි කාලයක් ජලය රැඳී තිබීම නිසා ඩෙංගු සහ ජලය මඟින් බෝවන රෝගී තත්ත්වයන් වාර්තා වී ඇති බවත් ළමුන්, කාන්තාවන් හා වැඩිහිටියන් මේ නිසා පීඩාවට පත්ව ඇති බවත් වාර්තා වී ඇත.

(iv) බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය තුළ තනි නිවාස ඉදි කර ඇති බැවින් සහාධිපත්‍ය දේපළ කමිටුව අදාළ නොවන අතර, අක්‍රියව පැවැති ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෙෙ සුනාමි නිවාස ක්‍රමවල සහාධිපත්‍ය දේපළ කමිටු මේ වන විට සක්‍රිය කර රැස්වීම් පව ත්වා ඇත.

(ආ) (i) බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය තුළ වර්ෂාපතනය ඇති වන කාල වකවානු තුළ කල්මුණේ මහ නගර සභාව මඟින් සියලුම කානු පද්ධති ශුද්ධ පවිත්‍ර කරමින් කිඩා මූලෙයි ගඟට ජලය බැහැර කිරීම සඳහා කටයුතු කර ඇති අතර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මඟින් මදුරු නාශක දුම් ගැසීම ඇතුළු මදුරුවන් බෝවන ස්ථාන පවිත්‍ර කිරීමට මෙන්ම සැල්වීනියා හා ජපන් ජබර ඉවත් කර ජලය බැස යෑම ක්‍රමවත් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කරයි.

ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෛ සුනාමි නිවාස ක්‍රමයෙහි අපවහන පද්ධතිවල ද ගැටලු පවතින අතර, තාවකාලික විසඳුම් ලෙස කල්මුණේ මහ නගර සභාව විසින් අධිකරණ නියෝග අනුව රුපියල් මිලියන 5කට ආසන්න මුදලක් වැය කරමින් වෙනම වැසිකිළි ටැංකි ඉදි කර ඇති බවත්, සුද්ධ පවිත්‍ර කිරීම සඳහා රුපියල් 75,000.00ක මුදල් ලබා දී ඇති බවත් දන්වා ඇත. තවද පෙරියනීලාවනෛ නිවාස යෝජනා ක්‍රමය තුළ විමධ්‍යගත අය වැය වැඩසටහන මඟින් වැසිකිළි ටැංකි 8ක් පමණ ඉදි කර ඇත.

(ii) බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය ප්‍රතිසංස්කරණය හෝ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ තාක්ෂණික ඇගැයීම් කමිටුව මඟින් දිස්ත්‍රික් ප්‍රධාන ඉංජිනේරු පත් කර වාර්තා කැඳවීමට කටයුතු කර ඇත. ඒ අනුව, මේ සම්බන්ධව තවදුරටත් කටයුතු කරනු ඇත.

ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෛ සුනාමි නිවාස යෝජනා ක්‍රම සඳහා මේ ආකාරයෙන් තාක්ෂණික කමිටු පත් කරමින් සුදුසු පියවර ගැනීමට තීරණය වී ඇත.

(iii) තවදුරටත් තාක්ෂණික විෂය සම්බන්ධව සැලකිල්ලට ගත යුතු කරුණු පවතින බැවින් අවශ්‍ය ඉදි කිරීම් වසර 2ක කාලයක් තුළ අවසන් කිරීමට හැකි බව.

(iv) බොලිවේරියන් ගම්මානයේ EHED නිවාස යෝජනා ක්‍රමය තුළ මෙය අදාළ නොවන අතර, ඉස්ලාමාබාද් හා පෙරියනීලාවනෛ සුනාමි නිවාස යෝජනා ක්‍රම සඳහා මේ වන විට සභාධිපත්‍ය දේපළ කමිටු රැස්වීම් 2026.06.12 හා 2026.06.13 වන දින පවත්වා සක්‍රි කිරීමට කටයුතු කර ඇති බව කල්මුණේ ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු අබුබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ அமைச்சர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். கல்முனை மாநகர சபைக்குரிய பிரதேசம் பெருமளவு மக்கள் தொகையைக் கொண்ட ஒரு பிரதேசமாகும். கடந்த கால ஆட்சியில் கல்முனை மாநகர சபையில் பல்வேறுபட்ட ஊழல், மோசடி சம்பவங்கள் நடைபெற்று இருக்கின்றன. அந்த விடயங்கள் இப்போது நீதிமன்றத்தில் விசாரணையில் உள்ளது. கடந்த கால ஆட்சியாளர்கள் கல்முனை மாநகர சபையின் நிருவாகம் தொடர்பில் எந்தவிதமான நடவடிக்கையும் எடுக்காததால், அங்கிருக்கின்ற மக்கள் பல இன்னல்களை அனுபவித்து வருகின்றனர். அங்கு மாநகர ஆணையாளர் இல்லை. பதிற்கடமை புரியும் மாநகர ஆணையாளரே காணப் படுகின்றார். அதேபோல், பதிற்கடமை புரியும் பிரதி ஆணையாளரே காணப்படுகின்றார். அத்தோடு, சுகாதார அதிகாரியும் இல்லை. கல்முனை தெற்கு முஸ்லிம் பிரதேச செயலகப் பிரிவிலும் பதிற்கடமை புரியும் பிரதேச செயலாளரே காணப்படுகின்றார். இவ்வாறு பல வெற்றிடங்கள் அங்கு காணப்படுவதால் கல்முனை மாநகர சபைக்குட்பட்ட மக்கள் பல்வேறு இன்னல்களை அனுபவிக்கின்றார்கள். இது தொடர்பில் எதிர்காலத்தில் எடுக்கவிருக்கும் நடவடிக்கைகள் என்ன என்பதைக் கூற முடியுமா?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය විෂය භාර ගරු අමාත්‍යතුමාට අපි යොමු කරන්නම්. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයෙන් එම ප්‍රශ්නය අදාළ ඇමතිතුමාට ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු අබුබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)

கௌரவ அமைச்சர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். உயர் நீதிமன்றத் தீர்ப்பின் பிரகாரம், சாய்ந்தமருது நகர சபை மற்றும் கல்முனை மாநகர சபைக்கான எல்லைகள், வட்டார எல்லைகள் மற்றும் அவற்றுக்கான இலக்கங்கள் தொடர்பான விடயங்கள் அடங்கிய அறிக்கை இரண்டு மாதங்களுக்குள் சமர்ப்பிக்கப் பட்டு, சாய்ந்தமருது நகர சபை மற்றும் கல்முனை மாநகர சபைக்கான தேர்தல்கள் நடத்தப்பட வேண்டும். இப்போது இரண்டு மாதங்கள் நிறைவுபெற்றுள்ள நிலையில், எல்லை நிர்ணயம் தொடர்பான விடயத்தின் தற்போதைய நிலை என்ன? மேலும், இச்சபைகளுக்கான தேர்தல்கள் எப்போது நடத்தப்படுவதற்கு சாத்தியம் உள்ளது? எனக் கேட்கின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයත් අපි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාට වාර්තා කරන්නම්. එතුමා අහපු මුල් ප්‍රශ්නය ගත්තොත්, ඒ කාරණයේ යම් කොටසක් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී මතු වුණා. මේවා ඉතාම අවිධිමත් විධියට ගොඩනහපු නිවාස පද්ධති. ඒවායෙන් සුවිශාල ලෙස සමාජ ගැටලු ඇතිවෙලා තිබෙනවා. මේ වෙනුවෙන් මහජන මුදල් නාස්ති කරලා තිබෙනවා. ඒ වාගේම මේ නිසා ජනතාව පීඩාවට පත්වෙමින් තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් මේ කරුණ ඉදිරිපත් කළාට පස්සේ අපි ඒකට යම් මැදිහත්වීමක් කළා. ඉතුරු ප්‍රශ්න ටික අපි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාට වාර්තා කරන්නම්.

## හඟුරන්කෙත, පල්ලේමළුව ග්‍රා.නි. වසමේ පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයේ ජීවත් වන පවුල්: හිමිකම් ඔප්පු ලබාදීම

ஹங்குரன்கெத்த, பல்லேமளுவ கிராம அலுவலர் பிரிவில் தொல்பொருள் பாதுகாப்பு வலயத்தில் வசிக்கும் குடும்பங்கள்: உரித்து உறுதிகள் வழங்குதல்

FAMILIES LIVING IN ARCHAEOLOGICAL CONSERVATION ZONE IN PALLEMALUWA GN DIVISION, HANGURANKETHA: ISSUANCE OF TITLE DEEDS

1906/2026

**6. ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේමළුව ග්‍රාම නිලධාරි වසමේ පවුල් 43ක් පදිංචිව සිටින ප්‍රදේශය පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයක් ලෙස ගැසට් කර ඇති බව දන්නේද;

[ගරු ආර්.ජී. විජේරත්න මහතා]

(ii) ඒ හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට බාධා සිදුවී ඇති බව පිළිගන්නේද;

(iii) එම ඉඩම් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ඔප්පු ලබා දීම ප්‍රමාද වී ඇත්තේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ එකඟතාව නොමැති වීම හේතුවෙන් බව දන්නේද;

(iv) මෙම කාරණය සම්බන්ධයෙන් යම් සහනදායි පියවරක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹங்குரன்கெத்த பிரதேச செயலாளர் பிரிவின் பல்லேமளுவ கிராம அலுவலர் பிரிவில் 43 குடும்பங்கள் வசித்துவரும் பிரதேசமானது தொல்பொருள் பாதுகாப்பு வலயமாக வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) அதன் காரணமாக அப்பிரதேச மக்களின் இயல்பு வாழ்க்கையில் தடைகள் ஏற்பட்டுள்ளன என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சின் இணக்கம் கிடைக்காமை காரணமாக மேற்படி காணிகளுக்கு காணி மறுசீரமைப்பு ஆணைக்குழுவால் உறுதிகள் வழங்கப்படுவது தாமதமாகியுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(iv) இந்த விடயம் தொடர்பாக ஏதேனும் நிவாரண நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that the area where 43 families reside in the Pallemaluwa Grama Niladhari Division of the Hanguranketha Divisional Secretary's Division has been gazetted as an archaeological conservation zone;

(ii) whether he accepts that the ordinary life of the people in that area has been disrupted due to the matter in question;

(iii) whether he is aware that the delay in issuing the deeds for those lands by the Land Reform Commission is attributable to the lack of consent from the Ministry of Buddhasasana, Religious and Cultural Affairs; and

(iv) whether any remedial action will be taken in this regard?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) නැත.

(iii) ඔව්.

ගරු මන්ත්‍රීතුමනි, පුරාවිද්‍යා ස්මාරක සහිත භූමියක් තුළ පදිංචිව සිටින අනවසර පදිංචිකරුවන්ට ස්ථිර ලෙස මෙම භූමිය බෙදා වෙන්කර දීම ගැටලුසහගත මෙන්ම, පුරාවිද්‍යා ආඥාපනත ප්‍රකාරව එසේ කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත නෛතික බලයක් ද නොමැත.

(iv) මෙම සංරක්ෂිත භූමියේ පදිංචි ජනතාවගේ මානුෂික අවශ්‍යතා මත දැනට පවතින ඉදිකිරීම්වල ප්‍රතිසංස්කරණ සහ නවාංග එකතු කිරීම වැනි කාර්යයන් සඳහා පුරාවස්තු ආඥා පනත යටතේ අනුමැතිය ලබා දෙනු ලැබේ.

එම භූමියේ නව ඉදිකිරීම්, පතල් කැණීම්, ගල් කැඩීම් සහ පිපිරවීම් යන කාර්යයන් සඳහා පුරාවස්තු ආඥා පනත යටතේ අවසර ලබා දීමට හැකියාවක් නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ගරු කථානායකතුමනි, මෙම පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේ ප්‍රශ්නය මෑත කාලීනව ඇතිවෙච්ච එකක් නොවෙයි, පරම්පරා දෙකක විතර අතීතයට විහිදෙන ප්‍රශ්නයක්. ගැටලුව තමයි, පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන්න පෙරාතුව තමයි ඒ පුද්ගලයන් එහි පදිංචි වෙලා තිබෙන්නේ. ඒ කාලයේ පැවැති රජයන් ඒ ගැන කල්පනා නොකර තමයි ඒක පුරාවිද්‍යා සංරක්ෂිත කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කළේ. ඇත්තටම, ඒ සඳහා මොකක් හරි විකල්ප විසඳුමක් ලබා දෙන්න තිබුණා. ඒ වකවානුව තුළ ඔවුන් වෙන ස්ථානයක පදිංචි කරවීම හෝ මොනම කටයුත්තක්වත් කළේ නැහැ. අඩුම ගණනේ අත්‍යවශ්‍ය පහසුකම් සඳහා වැසිකිළි වළක් හාරා ගැනීම පවා ඔවුන්ට අහිමි වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තීන්දුවක් ගත්තා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට එම ඉඩම් අයිති නිසා ඔවුන්ට යම් බලපත්‍රයක් ලබා දුන්නොත්, මින් ඉදිරියට මොනවා හෝ සහනදායී වැඩ පිළිවෙළක් කරනකොට අඩු ගණනේ හිමිකමක් හෝ තිබෙනවා කියන එක ගැන හිතලා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විධියට යම් එකඟතාවක් දක්වන්න පුළුවන්ද කියන එක තමයි මම පළමුවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, එම අතුරු ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම, ගරු මන්ත්‍රීතුමා විමසන්නේ තමන්ගේ ප්‍රදේශයේ තිබෙන ඇත්ත ප්‍රශ්නයක් පිළිබඳව; පොළොවේ තිබෙන, ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයක් පිළිබඳව. අපි පනත් කෙටුම්පත් එක්ක තර්ක කරමින්, සංශෝධන ගෙන එමින් මේවාට විසඳුම් සොයා ගන්න තමයි උත්සාහ කරන්නේ. පොඩි කරුණක් පැහැදිලි කරන්න මට අවසර දෙන්න. ඔබතුමා පැහැදිලි කළා, එහි ජනතාව පදිංචි වෙලා හිටියා, මෑත කාලයක තමයි ඒක පුරාවිද්‍යා ප්‍රදේශයක්

බවට ගැසට් මඟින් පළ කළේ කියන එක. ඒවා එහෙම තමයි සිද්ධ වෙන්නේ. ඒකට හේතුව, ශ්‍රී ලංකාවේ තිබෙන සමස්ත පුරාවස්තු ප්‍රමාණය ගවේෂණය කරලා ස්මාරක හඳුනා ගැනීම තවම අවසන් කරලා නැහැ. ඒ ප්‍රදේශවල කටයුතු කරනකොට එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සිද්ධ වෙනවා, පුරාවස්තු ස්මාරක මුණ ගැහුණාට පස්සේ පනත ප්‍රකාරව ගැසට් කරලා ඒවා කෙබඳු තැන්ද කියලා නම් කරන්න. මේ ස්මාරක පෙනෙන්නට තිබියදී පවා ජනතාවට මේ ප්‍රදේශවල පදිංචි වෙන්න ඉඩ දීලා, නීති රීති නොතකා කටයුතු කළා කියලා ඔබතුමා පැහැදිලි කළා. මේ, 1940 පුරාවස්තු ආඥා පනත. මේක ඊයේ පෙරේදා එකක් නොවෙයි. එසේ තිබියදී තමයි මේ වියවුල හදලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, හඟුරන්කෙත පල්ලේමළුවට විතරක් නොවෙයි විශේෂයෙන්ම අනුරාධපුරය ඇතුළු නුවර, උඩමළුව ප්‍රදේශවල හැම තැනම මේ ගැටලු ඔඩු දුවලා තිබෙනවා. නමුත් අපි දැන් මේකට අභිමුඛ වෙලා තිබෙනවා. ජන ජීවිතය සහ ආඥා පනත අතර ඝර්ෂණය තේරුම් ගනිමින්, සංකීර්ණතාව තේරුම් ගනිමින් ජනතාවට සහනයක් ලැබෙන විධියට මේ ගැටලු විසඳන්නේ කොහොමද කියලා අපි සොයා බලනවා. සම්බන්ධීකරණ කමිටුවෙන් ගත් තීරණය ඔබතුමා අපට දැනුම් දෙන්න. එතකොට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ නීති අංශය සමඟ සාකච්ඡා කරලා, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපට පුළුවන්. ගරු කථානායකතුමනි, පුරාවස්තු ආඥාපනත සහ අපේ දෙපාර්තමේන්තුවට අදාළ පනත කැබිනට් මණ්ඩල අනුමැතියෙන් දැන් සංශෝධනයට බඳුන් වෙමින් තිබෙනවා. ඒ නිසා මේවා විමසන්න හොඳම කාලය මේ කාලය කියලායි මමත් හිතන්නේ.

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)

ඇත්තටම ජනතාවාදී රජයක් විධියට ජනතාවගේ ප්‍රශ්න සැබැවින්ම හඳුනාගෙන ඒ සඳහා සාර්ථක පිළිතුරක් ලබා දීම පිළිබඳව ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වනවා. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

මේ විධියට ගත්තාම ඇත්තටම බොහෝ පුරාවිද්‍යා සංරක්ෂිත ප්‍රදේශවල එක්කෝ අනවසරයෙන් පදිංචි වෙලා ඉන්නවා, එහෙම නැත්නම් ඒ ඉඩම් පිළිබඳව තවම නිරවුල්භාවයක් නැහැ. ඒ නිසා වර්තමාන රජය විධියට ඒ සඳහා පොදුවේ යම් වැඩ පිළිවෙළක් අරගෙන තිබෙනවාද කියන එක මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, පොදුවේ අරගෙන තිබෙන වැඩ පිළිවෙළේ ප්‍රධානම පියවර තමයි, පනත සංශෝධනය කරන්න කැබිනට් මණ්ඩල අනුමැතිය අරගෙන විද්වත් පිරිසක් අතට ඒක පත් කරලා, ඉන් පසුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවටත්, නීතිපති දෙපාර්තමේන්තුවටත් යොමු කරලා, නැවතත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. ඒ වාගේම අපේ දෙපාර්තමේන්තුවට අදාළ පනතත්, ආනුෂංගිකව එතැනටම ගැළපෙන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතත් කියන පනත් දෙකම මේ දිනවල සංශෝධනයට බඳුන් වෙමිනුයි තිබෙන්නේ. ඒක තමයි ප්‍රධානම ප්‍රවේශය විය යුත්තේ, මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න. මොකද, අනවසර ඉදිකිරීම් කියන්නේම ටිකක් හිත් රිදවන යෙදුමක්. ඒවා අනවසර වෙලා තිබෙන්නේම, නුසුදුසු තැනක ජනතාව පදිංචි කරපු නිසායි. ඒ බව දැන දැනම අපරීක්ෂාකාරීව, ඇතැම් දේශපාලන වාසි තකා ඒ දේවල් සිද්ධ වන්න ඉඩ හැරලා බලා සිටීම තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. දැන් ඒ සංකීර්ණත්වය අප අභිමුව තිබෙන නිසා අපි ඒකට මුහුණ දෙමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා විමසන මේ පල්ලේමළුව රජමාළිගා භූමිය මොන තරම් ඓතිහාසික භූමියක්ද කියනවා නම්, එය අදින් වසර 430කට පමණ පෙර මහනුවර යුගයේ රජවරුන් දසදෙනෙක් වසර 200ක් පමණ භාවිත කළ භූමියක්. එතකොට ඒක අපි මීට වසර කිහිපයකට කලින් හඳුනාගෙන නම් ගැසට් කරන්නේ, ඒ වනකොට විශාල ජනතාවක් එතැනට ඇවිල්ලා තිබෙනවා නම්, කොහොමද ඒක වුණේ කියන එක අපි විමසන්න ඕනෑ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු මීට කලිනුත් දිගටම ඒ ප්‍රදේශවල ක්‍රියාත්මක වුණා. නිවාස 34ක්, අනවසරයෙන් භුක්ති විඳින ඉඩම් 11ක් එතැන තිබෙනවා. ඒ ඔක්කෝටම අදාළ ලිපිලේඛන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපේ ප්‍රවේශයක් තිබෙනවා, එබඳු ස්ථාන සියල්ල හඳුනාගෙන, ජනතාවට ගැටලුවක් ඇති නොවන විධියට නිසි පරිදි නැවත පදිංචි කරවන්න. උදාහරණයක් හැටියට අනුරාධපුරයේ ඇතුළුනුවර ගත්තොත්, අපි ලෝලුගස්වැව ප්‍රදේශයෙන් ඉඩම් තෝරාගෙන, නිවාස ව්‍යාපෘති හදාගෙන, ජනතාවත් එක්ක සංවාද කරමින්, ඔවුන්ට ගැළපෙන විධියට, විරසකයක් ඇති නොවන විධියට, නීතිය ආරක්ෂා වන විධියට, ඓතිහාසිකත්වයත් රැකෙන විධියට කටයුතු කරන්න බලාපොරොත්තු වනවා. හඟුරන්කෙත ප්‍රදේශයටත් ඒ පිළියමම තමයි යෝජනා කරන්න වෙන්නේ.

## ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම: ක්‍රමවේදය සහ ප්‍රජා සහභාගිත්වය
### சமுதாய நீர் வழங்கல் கருத்திட்டங்களை நடைமுறைப்படுத்தல்: முறைமை மற்றும் சமுதாய பங்குபற்றல்
### IMPLEMENTATION OF COMMUNITY WATER SUPPLY PROJECTS: METHODOLOGY AND COMMUNITY PARTICIPATION

1940/2026

7. **ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම ව්‍යාපෘති ආරම්භ කිරීමේදී රජයේ මැදිහත්වීම හා ග්‍රාමීය ප්‍රජා දායකත්වය කවරේද;

(iii) එම ව්‍යාපෘති පවත්වාගෙන යනු ලබන ප්‍රජා ජල කමිටුවල/සමිතිවල ව්‍යුහය සහ වගකීම කවරේද;

(iv) එම ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන ඇතුළුව රජයේ ආයතනයන්ට මැදිහත්වීම සඳහා ක්‍රමවේදයක් තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය සහ විගණනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) මේ දක්වා සිදු කරන ලද විගණනවලින් අනාවරණය වූ කරුණු සම්බන්ධයෙන් පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமுதாய நீர் வழங்கல் கருத்திட்டங்களைச் செயற்படுத்துவதற்குப் பின்பற்றப்படும் முறைமை யாது என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டங்களை ஆரம்பிக்கும்போது அரசாங்கத்தின் தலையீடும் கிராமிய சமுதாயப் பங்களிப்பும் யாது என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டங்களை முன்னெடுக்கும் சமுதாய நீர் குழுக்களின்/ சங்கங்களின் கட்டமைப்பும் பொறுப்பும் யாது என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களில் பிரதேச செயலகங்கள் மற்றும் உள்ளூர் அதிகாரசபைகள் உள்ளிட்ட அரச நிறுவனங்கள் தலையீடு செய்வதற்கான ஒரு முறைமை காணப் படுகின்றதா என்பதையும்;

(v) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சமுதாய நீர் கருத்திட்டங்களின் ஒழுங்குறுத் துகைக்கும் கணக்காய்வுக்கும் பயன்படுத் தப்படும் முறைமை யாது என்பதையும்;

(ii) இதுவரை மேற்கொள்ளப்பட்ட கணக்காய்வு களின்மூலம் அறியக்கிடைத்த விடயங்கள் தொடர்பில் நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) the methodology adopted in implementing community water supply projects;

(ii) the Government's intervention and the contribution of rural communities in initiating such projects;

(iii) the structure and responsibilities of the community water committees/ societies that maintain such projects;

(iv) whether there is a mechanism for the intervention of government institutions, including Divisional Secretariats and local authorities in those projects; and

(v) if not, the reasons therefor?

(b) Will he also inform this House -

(i) the methodology followed to regulate and audit community water supply projects;

(ii) whether measures have been taken regarding the findings revealed by the audits conducted thus far; and

(iii) if so, such measures taken?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා. එතුමාගේ ප්‍රශ්නයේ අනු ප්‍රශ්න 8ක් තිබෙනවා. සමහර ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු තිබෙන නිසා ටික වෙලාවක් ගතවෙයි.

(අ) (i) දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2025 මාර්ගෝපදේශ අංක 05 යටතේ දක්වා ඇති ක්‍රමවේද අනුගමනය කරමින් ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව යෝජිත ක්‍රමවේදය මෙසේය.

1. නව ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා ප්‍රජාව විසින් ඉල්ලුම් කිරීම.
2. අදාළ ප්‍රදේශය අවම වසර 10ක් තුළ ආවරණය නොවන බවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් සහතික කර ගැනීම හෝ වෙනත් රාජ්‍ය නොවන සංවිධාන මඟින් හෝ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන බවට තහවුරු කර ගැනීම.
3. අදාළ ප්‍රදේශය අවම වසර 10ක් තුළ ආවරණය නොවන බවට පළාත් පාලන කොමසාරිස්ගේ සහතිකය ලබා ගැනීම.
4. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම.
5. අවශ්‍යතාව තහවුරු කිරීම.
6. සමාජ සිතියම නිර්මාණය කිරීම.
7. දෙපාර්තමේන්තුව විසින් ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කිරීමෙන් අනතුරුව හඳුනාගැනීමේ වාර්තාව සකස් කිරීම.
8. ජල මූලාශ්‍රය හඳුනාගැනීම සඳහා රජයේ පිළිගත් ආයතනයක් මඟින් භූ ජල විද්‍යා පරීක්ෂණයක් සිදු කිරීම.
9. ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගැනීම සහ බෙදා හැරීම් කලාපය නිර්ණය කිරීම.
10. ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම සහ ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ලබා ගැනීම.
11. ඉදිකිරීම් සඳහා අවශ්‍ය පරිදි (ශ්‍රම හා මූල්‍ය) ප්‍රජා දායකත්වය ලබා ගැනීම.
12. මෙහෙයුම් හා නඩත්තු වියදම සලකා මූල්‍ය ශක්‍යතාව තහවුරු කිරීම.
13. ප්‍රජා මූල සංවිධානයක් පිහිටුවීම හා ඒ මඟින් අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

(ii)

- **රජයේ මැදිහත්වීම:**

  මූලික ප්‍රාග්ධන වියදම - Capital Cost - දැරීම, තාක්ෂණික සැලසුම් සැපයීම සහ මූලික යටිතල පහසුකම් ඉදිකිරීමට මූල්‍ය සහාය ලබා දීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- **ග්‍රාමීය ප්‍රජා දායකත්වය:**

  ශ්‍රමය - labour - සැපයීම, ව්‍යාපෘති පිරිවැයෙන් යම් ප්‍රතිශතයක් මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලබා දීම සහ ව්‍යාපෘතිය නිම වූ පසු එහි මෙහෙයුම් හා නඩත්තු වගකීම භාර ගැනීම. මෙය දළ වශයෙන් ව්‍යාපෘති වියදමින් උපරිම වශයෙන් සියයට 20කි.

(iii) • **ව්‍යුහය:**

සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු නිලධාරි මණ්ඩලයක් සහ විධායක කමිටුවකින් සමන්විත වේ. මොවුන් ප්‍රජාව විසින් ප්‍රජාතන්ත්‍රවාදීව තෝරා ගනු ලබයි.

• **වගකීම:**

ජල ගාස්තු අය කිරීම, පද්ධතිය නඩත්තු කිරීම, ජල ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම, ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීම සහ විනිවිදභාවයකින් යුතුව ගිණුම් තැබීම හා දෙපාර්තමේන්තුව සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගනිමින් රජයේ පවතින සුරක්ෂිත පානීය ජලය සැපයීම පිළිබඳ වන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සහාය වීම.

(iv) ඔව්, සාමාන්‍යයෙන් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හරහා මෙම සම්බන්ධීකරණය සිදුවේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ පළාත් පාලන ආයතන මඟින් ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් නිරවුල් කිරීම, ලියාපදිංචි කිරීම සහ නීතිමය සහාය ලබා දීම සිදු කරයි. දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා සහභාගි වන අතර යම් තීරණ ගැනීම ඒ හරහා සිදු කරනු ලබයි.

(v) අදාළ නොවේ.

(ආ) (i) • **ප්‍රජා ජල ව්‍යාපෘති නියාමනය:**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් මෙම සංවිධාන අධීක්ෂණය කෙරේ.

• **විගණනය:**

සෑම ප්‍රජා මූල සංවිධානයක්ම වාර්ෂිකව මහා සභා රැස්වීමක් පවත්වා පරීක්ෂා කරන ලද ගිණුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය. මේ සඳහා වන මාර්ගෝපදේශ දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත.

(ii) ඔව්, විගණනවලදී මූල්‍ය අක්‍රමිකතා හෝ පරිපාලන දුර්වලතා අනාවරණය වුවහොත් ඒ පිළිබඳව පරීක්ෂණ සහ විමර්ශන පවත්වනු ලැබේ.

(iii) • අදාළ නිලධාරි මණ්ඩලය විසුරුවා හැරීම හෝ අලුතින් පත් කිරීම.

• අයථා ලෙස පරිහරණය කළ මුදල් අය කර ගැනීම.

• අවශ්‍ය අවස්ථාවලදී නීතිමය පියවර ගැනීම සඳහා පොලිසියට හෝ අදාළ ආයතන වෙත යොමු කිරීම.

• මූල්‍ය කළමනාකරණය පිළිබඳව කමිටු සාමාජිකයින්ට පුහුණුව ලබා දීම.

(ඇ) අදාළ නොවේ.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු අමාත්‍යතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය ඔබතුමාගේ දෙවැනි පිළිතුර එක්ක සම්බන්ධයි. ඉතාම වැදගත් ජල ව්‍යාපෘතියක් තමයි මේ ප්‍රජා ජල ව්‍යාපෘතිය. හැබැයි, මෙම ප්‍රජා ජල ව්‍යාපෘතිය අපේ ප්‍රදේශවල ක්‍රියාත්මක වන ආකාරය ගැන මම කියන්න ඕනෑ. මේක ඉතිහාසයේ ඉඳලා දිග හැරෙන ක්‍රියාවලියක්. ඒ ක්‍රියාවලිය තුළ පසුගිය කාල සීමාවේ අන්ත දූෂිත වැඩකටයුතු විශාල ප්‍රමාණයක් සිද්ධ වෙලා තිබෙනවා. වර්තමානයේ මේක අපි වෙනස් කරගෙන යමින් පවතිනවා. නමුත්, අපේ බලප්‍රදේශය තුළ සම්බන්ධීකරණ කමිටුවලට සහභාගි වෙද්දි අපට දකින්න තිබෙන කාරණයක් තමයි, සමහර ප්‍රජා ජල ව්‍යාපෘති ඉතාම අසාර්ථක තත්ත්වයට, අසතුටුදායක තත්ත්වයට පත්ව තිබීම. ඒකට හේතුව මේකයි. පසුගිය කාල සීමාවේ හිටපු දේශපාලන අධිකාරිය ඒවාට අත ගහලා, ඒවා ඔවුන්ගේ පෞද්ගලික බූදලයක් බවට පත් කරගත් අවස්ථා තිබෙනවා. මේවා ගැන අපි සම්බන්ධීකරණ කමිටුවලදී කථා කරලා, සමහර දේවල් විගණනයට ලක් කරන්න කිව්වාට එම වාර්තා තවම ලැබී නැහැ. සමහර තැන්වල වාර්තා අස්ථානගත වෙලා තිබෙනවා. ඒ කියන්නේ, වාර්තා ගිනි තබලා. මේ විධියට විවිධ දේවල් සිදු වෙලා තිබෙනවා.

මේ ව්‍යාපෘති සම්බන්ධව රුපියල් ලක්ෂ ගණනින් මුදල් ගනුදෙනු සිද්ධ වනවා වාගේම මේ මුදල් ගනුදෙනු අවිධිමත් විධියට සිද්ධ වනවා කියන එකත් අපට පෙනෙන්න තිබෙනවා. එම නිසා මම ඒ සම්බන්ධව ඔබතුමාගෙන් විමසීමක් කරනවා. ඔබතුමා කිව්වා, ඒකට ක්‍රමවේදයක් තිබෙනවා කියලා. නමුත්, පසුගිය සම්බන්ධීකරණ කමිටු රැස්වීමට පෙර සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදීත් අපි ප්‍රශ්න කළා, යම් ජල ව්‍යාපෘතියක් සම්බන්ධයෙන්. එම ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්න වැඩකටයුතු කරලා නැහැ. ආපසු ඒක ක්‍රියාත්මක වන ආකාරය ප්‍රශ්නකාරී වෙලා තිබෙනවා. ඒ නිසා මගේ පළමුවන අතුරු ප්‍රශ්නය විධියට මම අහනවා, මේ පටන් ගත්ත පැරණි ජල ව්‍යාපෘති ක්‍රියාත්මක වීමේදී සිදු වන දුර්වලතාවලට වර්තමානයේ ගන්නා වූ පියවර මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සහ රට පුරා තිබෙන ග්‍රාමීය ජල ව්‍යාපෘතිවල ක්‍රියාකාරිත්වය පිළිබඳවයි එතුමා ප්‍රශ්නය අහන්නේ. අපි ඉදිරි වසර තුන ඇතුළත ජනතාවට පානීය ජලය ලබා දෙන ජල සැපයුම් ක්ෂේත්‍රයේ ලොකු වෙනසක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා දැනටමත් අපි බොහෝ වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. එහිදී මේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ අනිවාර්ය වෙනස්කම් කළ යුතුයි. ගරු මන්ත්‍රීතුමා කියන කථාව ඇත්ත. අපේ රටේ ග්‍රාමීය ප්‍රජා ජල ව්‍යාපෘති 4,000ක් විතර තිබෙනවා. සමහර ඒවා දැන් දෙපාර්තමේන්තුවෙන් ගිලිහිලා. සමහර ඒවා අක්‍රියයි. ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව යටතේ දැනට යම් මට්ටමකින් හෝ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 3,800ක් විතර තිබෙනවා.

මෙතැන ගැටලුවක් තිබෙනවා. මේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව හදලා තිබෙන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතුව තිබුණු ග්‍රාමීය ජල ඒකකය කඩලා. එහෙම හැදුවාට ඇත්තටම ඒක දෙපාර්තමේන්තුවක් නොවෙයි. ඒ නිසා මේ දෙපාර්තමේන්තුවට පනතක්, ආයතන ව්‍යුහයක් වාගේම අදාළ නිලධාරින් ඕනෑ. එහි මූලික වැඩ කටයුත්තක් විධියට ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට අදාළ පනත් කෙටුම්පතට දැන් කැබිනට් අනුමැතිය ලැබිලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඒ පනත් කෙටුම්පත කඩිනමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සම්මත කර ගන්න. එය සම්මත කළාට පසුව තමයි දෙපාර්තමේන්තුවට හැකි වෙන්නේ ප්‍රජා ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රජා ජල සමිතිවල ක්‍රියාකාරිත්වය නියාමනය කරන්න, ඒවා විගණනය කරන්න සහ ඒවාට නිලධාරින් පත් කරන කටයුතු සිද්ධ වෙනවාද කියලා බලන්න. දැනට දෙපාර්තමේන්තුවට නෛතික බලයක් නැහැ, මේ ප්‍රජා ජල

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

සමිතිවලට මැදිහත් වෙන්න. ඒක සීමාසහිතයි. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, දිස්ත්‍රික් කාර්යාල තිබුණාට ඒවා දෙපාර්තමේන්තුවකට අදාළ ව්‍යුහයකට නොවෙයි හදලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙනුත් අපි දැන් තීන්දු තීරණ අරගෙන තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණා බොහෝ ප්‍රජා ජල ව්‍යාපෘතිවලට අදාළව නිවැරදියි. නමුත් අපට යම් කාලයක් ගන්න වෙනවා, මේ දෙපාර්තමේන්තුවේ නෛතික පසුබිම හදා ගන්න. ඒත් එක්කම අපි බලාපොරොත්තු වෙනවා, දෙපාර්තමේන්තුව ශක්තිමත් කරලා, අයාලෙ යන ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නියාමනය කරන්න. ඇත්තටම මේවා ගම්වල මිනිස්සුන්ට වතුර දෙන ව්‍යාපෘති. ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති නියාමනය කරලා මිනිස්සුන්ට හොඳ සේවාවක් සැපයීම සඳහා කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා, විශේෂයෙන්ම ඒ පනත් කෙටුම්පත සම්මත කරගෙන.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ඔබතුමා මේ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක සිටීම පිළිබඳව අපි සතුටු වෙනවා. ඇත්තටම ප්‍රජා ජල ව්‍යාපෘති ජාලයම ඉතාම දූෂිත තත්ත්වයට පත් වෙලා තිබෙනවා, පසුගිය කාල සීමාවේදී දේශපාලන අධිකාරිය ඒවා සමඟ සම්බන්ධ වීම තුළ. ගරු ඇමතිතුමනි, ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා පළාත් පාලන ආයතනවල මැදිහත්වීම පිළිබඳව ඔබතුමාගෙන් මම ඇහුවා. අපි සම්බන්ධීකරණ කමිටුවලදී ඒ ගැන විමසීමක් කළාම එම ක්‍රියාවලියට රාජ්‍ය ආයතන විධියට පළාත් පාලන ආයතන හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සෘජුව සම්බන්ධ වෙන්නේ නැහැ. සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක වන ආකාරය සම්බන්ධයෙන් අඩුම වශයෙන් ගමේ ඉන්න ග්‍රාම නිලධාරිවරයාටවත් දැනුමක් නැහැ. ඔබතුමා මේ කාරණය අවබෝධ කරගෙන තිබෙන බව පෙනෙනවා.

ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනය දැනට තිබෙන්නේ වියුක්ත වුණු ආයතනයක් විධියට. එහි වගකීමෙන් කොටසක් රජය දරනවා. ඒ කියන්නේ, ඒකට රජයෙන් ආධාර ලැබෙනවා. අනෙක් වගකීම් කොටස ප්‍රජාව දරනවා. ඒක දැන් ප්‍රජාවට අයිති වුණු ආයතනයක් බවට පත් වෙලා තිබෙනවා. ඔබතුමා ඒ වෙනුවෙන් ක්‍රමවේදයක් හදනවාය කිව්වා. ඒ ක්‍රියාවලියට පළාත් පාලන ආයතනත් සම්බන්ධ කර ගන්නවාද කියන එකයි මම අහන්නේ. මොකද, ඉඩම් ගන්නේ ඒගොල්ලන්ගෙන්, අවසර ගන්නේ ඒගොල්ලන්ගෙන්.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාමීය ජල ව්‍යාපෘති නියාමනය කරද්දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, එහෙම නැත්නම් ප්‍රාදේශීය ලේකම්තුමාට හෝ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට තිබෙන සම්බන්ධය බොහෝ දුරට අඩුයි. ඒක මම මුලින් කිව්වා වාගේ මේ දෙපාර්තමේන්තුවේ තිබෙන ගැටලුවක්, ව්‍යුහයේ තිබෙන ගැටලුවක්. ඒ නිසා දිස්ත්‍රික් මට්ටමේ ඉන්න සංවර්ධන නිලධාරින් දිස්ත්‍රික් කාර්යාලවල තියා ගන්නවා වෙනුවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන්න කියලා දැනට කැබිනට් මණ්ඩලය තීරණයක් අරගෙන තිබෙනවා. එම නිසා ඉදිරියේදී දැනට දෙපාර්තමේන්තුව යටතේ ඉන්න සංවර්ධන නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරයි. එතකොට ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ප්‍රජා ජල ව්‍යාපෘති කීයක් තිබෙනවාද, ඒවා අධීක්ෂණය වෙන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටත්, ප්‍රාදේශීය ලේකම්තුමාටත් අදහසක් ගන්න පුළුවන්. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කියන වපසරිය ඇතුළේ මිනිසුන්ගේ පානීය ජල සැපයුම සම්බන්ධයෙන් සැලැස්මක් හදා ගන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්ව කාරණය නිවැරදියි. දිස්ත්‍රික් කාර්යාලයක් වෙනම තිබෙනවා. දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරින් කියලා වෙනම ඉන්නවා. නමුත්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්මානවලට ජල සැපයුම කොහොමද සිද්ධ වෙන්නේ, ඒකේ වැඩකටයුතු කොහොමද කෙරෙන්නේ කියන කාරණය සම්බන්ධයෙන් අවබෝධයක් නැහැ. එතැන ගැටලුවක් තිබෙනවා. එම නිසා තමයි කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තේ එම නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරන්න. සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අනුයුක්ත කරන්න දෙපාර්තමේන්තුවේ නිලධාරින් නැහැ. එම නිසා අපි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරලා තිබෙනවා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැනට සේවය කරන සංවර්ධන නිලධාරි කෙනෙක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ වැඩ බැලීමට - වැඩ ආවරණය කිරීමට - යොදවන්න කියලා. ඔහොම තමයි අපට ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ල ආවරණය කර ගන්න වෙන්නේ. සරලව ගත්තාම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාමීය ජල ව්‍යාපෘති කීයක් තිබෙනවාද, ඒවායෙහි වැඩ කටයුතු සිද්ධ වෙන්නේ කොහොමද කියන එක ප්‍රාදේශීය ලේකම්තුමා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව කියන යන්ත්‍රණයට එන්න ඕනෑ. එතැන සැලසුම් හැදෙන්න ඕනෑ. ඒ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමත වෙලා තමයි අපට අලුත් ව්‍යාපෘති ගැන හෝ තිබෙන ව්‍යාපෘතිවල අලුත්වැඩියා කටයුතු හෝ වෙනස් කිරීම සඳහා අනුමැතිය එන්න ඕනෑ.

පළාත් පාලන ආයතන ගත්තාම, පළාත් පාලන ආයතන සමහර ඒවායින් ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා. ඒවා අපට නියාමනය කරන්න බැහැ. ඒවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ තිබෙන්නේ. ඒ සඳහා අපට මැදිහත්වීමට විධියක් නැහැ. ඉඩම් ගැටලුව සම්බන්ධයෙන් ගත්තාම, අදාළ පරිදි සම්බන්ධීකරණ කමිටුවේ තීරණ අරගෙන තමයි මේ ඉඩම් වෙන් කර ගැනීම සහ අත්පත් කර ගැනීමේ කටයුතු සිද්ධ කරන්න වෙන්නේ.

## ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය: සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවරා ගැනීම
## சர்வதேச சுகாதார மதிப்பீட்டு நிலையம்: சுகாதார அமைச்சினால் பொறுப்பேற்றல்
## INTERNATIONAL HEALTH ASSESSMENT CENTRE: TAKEOVER BY MINISTRY OF HEALTH

2025/2026

**8. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නේවාසික වීසා මත ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා 2018/2019 වර්ෂයේදී සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය විසින් ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය පිහිටුවන ලද බවත්;

(ii) මූලික ස්ථාපන පිරිවැය අයකර ගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් එම මධ්‍යස්ථානය පවරා ගනු ලබන බවට ඇති අවබෝධය මත එය ස්ථාපනය කරන ලද බවත්;

(iii) කොවිඩ්-19 වසංගතය හේතුවෙන් එම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වූ බවත්;

(iv) 2025 සහ 2026 වර්ෂවලදී ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය පවරා ගන්නා බවට සහතික වීම් ලබා දුන්නද, ඒ සම්බන්ධ කිසිදු ප්‍රගතියක් අත් වී තිබෙන බවක් නොපෙනෙන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ජාත්‍යන්තර සෞඛ්‍ය තක්සේරු මධ්‍යස්ථානය පවරා ගැනීම සඳහා නිශ්චිත සැලැස්මක් සහ කාල රාමුවක් තිබේද;

(ii) එම මධ්‍යස්ථානය හරහා උපයනු ලබන වාර්ෂික ආදායම අයකර ගැනීම අත්හැරීමට අමාත්‍යාංශය අදහස් කරන්නේද;

(iii) එකී ආදායමෙන් අමාත්‍යාංශයට ලැබුණු 15%ක කොටස මේ දක්වා භාවිත කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வதிவிட விசாக்களில் இலங்கைக்கு வருகைதரும் வெளிநாட்டவர்களின் சுகாதார நிலையை மதிப்பிடுவதற்கு, 2018/2019ஆம் ஆண்டுகளில் புலம்பெயர்வுக்கான சர்வதேச அமைப்பால் சர்வதேச சுகாதார மதிப்பீட்டு நிலையம் தாபிக்கப்பட்டது என்பதையும்;

(ii) ஆரம்ப தாபிப்புச் செலவுகளை மீளப்பெற்றதன் பின்னர், குறித்த நிலையம் சுகாதார அமைச்சினால் பொறுப்பேற்கப்படும் என்ற புரிந்துணர்வின் அடிப்படையில் அது தாபிக்கப்பட்டது என்பதையும்;

(iii) 'கொவிட்-19' பெருந்தொற்று இந்தப் பொறுப்பேற்கும் செயன்முறையை தாமதமடையச் செய்தது என்பதையும்;

(iv) 2025 மற்றும் 2026ஆம் ஆண்டுகளில் சர்வதேச சுகாதார மதிப்பீட்டு நிலையத்தைப் பொறுப்பேற்பதற்கான உத்தரவாதங்கள் வழங்கப்பட்டபோதிலும், அது தொடர்பில் எந்தவித முன்னேற்றமும் இடம்பெற்றதாகத் தெரியவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) சர்வதேச சுகாதார மதிப்பீட்டு நிலையம் தொடர்பான பொறுப்பேற்றலுக்காக சுகாதார அமைச்சிடம் தெளிவான திட்டம் மற்றும் காலச்சட்டகமொன்று காணப்படுகின்றதா என்பதையும்;

(ii) குறித்த நிலையத்தின் ஊடாக ஈட்டப்படும் வருடாந்த வருமானத்தை அமைச்சு கைவிடுவதற்கு உத்தேசித்துள்ளதா என்பதையும்;

(iii) அமைச்சினால் பெறப்பட்ட 15% வருமானப் பங்கு இதுவரை பயன்படுத்தப்பட்ட விதம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Is he aware that -

(i) the International Health Assessment Centre (IHAC) was established by the International Organization for Migration (IOM) in 2018/2019 to assess the health of foreigners arriving in Sri Lanka on resident visas;

(ii) the said Centre was established on the understanding that it would be taken over by the Ministry of Health after the recovery of the initial set-up costs;

(iii) the COVID-19 pandemic delayed the takeover process; and

(iv) despite assurances to take over the IHAC in 2025 and 2026, no progress appears to have been made?

(b) Will he inform this House -

(i) whether a definite plan and timeline exist for the takeover of the IHAC by the Ministry of Health;

(ii) whether the Ministry intends to forgo the annual revenue generated through the said Centre; and

(iii) the manner that the 15 per cent revenue share received by the Ministry has been utilized thus far?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) නේවාසික වීසා මත ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා, 2018.03.20 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය - IOM - සමඟ අවබෝධතා ගිවිසුමක් - MoU එකක් - අත්සන් කරන ලදී. එම ගිවිසුම 2018.05.04 දින අත්සන් කර ඇති අතර, පළමු සංශෝධන එකඟතාව 2018.09.19 දින අත්සන් කරන ලදී. ඒ අනුව, ආගමනික සෞඛ්‍ය ඇගැයීම් මධ්‍යස්ථානයේ - IHAC - මෙහෙයුම් කටයුතු 2019 ජූනි 10 දින ආරම්භ කර ඇති අතර අදාළ තොරතුරු ඇමුණුම් 01, 02 සහ 03 මඟින් දක්වා ඇත.

(ii) අවබෝධතා ගිවිසුමෙහි 3(i) වගන්තිය යටතේ IHAC ආයතනයේ මූලික පිරිවැය හා බැඳීම් ප්‍රතිපූරණය කර ගැනීම සමඟ වසර 2 1/2ක කාලයක් තුළදී මෙම ආයතනය සෞඛ්‍ය අමාත්‍යාංශයට පවරා ගැනීමේ එකඟතාවට යටත්ව තමයි මේක ක්‍රියාත්මක කර තිබෙන්නේ. එය ඇමුණුම 02 මඟින් දක්වා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

(iii) කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් ආගමනික සෞඛ්‍ය ඇගැයීම් මධ්‍යස්ථානයේ කටයුතු 2020.03.16 සිට 2020.05.26 දක්වා තාවකාලිකව අත්හිටුවන ලද අතර, එම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. ඒ අනුව, 2021.10.13 දින අත්සන් කරන ලද දෙවන සංශෝධන එකඟතාව මඟින් අවබෝධතා ගිවිසුමේ වලංගු කාලය 2023.05.03 දක්වා දීර්ඝ කරමින් සෞඛ්‍ය ඇගැයීම් වැඩසටහන ආරම්භ කළ දින සිට IOM ආයතනයට වසර තුනකට පස්සේ ශ්‍රී ලංකා ආණ්ඩුවට ඒක පවරනවාය කියන එකඟතාවට ඇවිල්ලා තිබෙනවා. විස්තර ඇමුණුම් 04, 05 සහ 06 මඟින් දක්වා ඇත.

(iv) 2026.01.23 දින ගරු සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් මෙම ආයතනය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වූ අතර, ඒ සඳහා අතිරේක ලේකම් (වෛද්‍ය සේවා)ගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවක් පත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2026.02.09 දින අදාළ කමිටුව පත් කළ අතර, 2026.02.12 දින එහි පළමු රැස්වීම පවත්වා මෙම මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අදාළ මූලික කටයුතු පිළිබඳ විමර්ශනයක් කරලා තිබෙනවා. විස්ත ඇමුණුම් 07 සහ 08 මඟින් දක්වා ඇත.

(ආ) (i) සිව්වන සංශෝධන එකඟතාව අනුව අවබෝධතා ගිවිසුමේ වලංගු කාල සීමාව අවසන් වනවිට IHAC මධ්‍යස්ථානය සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට සැලසුම් කරලා තිබෙනවා. ඒ සඳහා පත් කළ කමිටුවේ නිර්දේශ ලබා ගෙන පවරා ගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යෑමට තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික හා මෙහෙයුම් සහාය ලබා දීමට IOM ආයතනය එකඟ වෙලා තිබෙනවා. තවද, අවශ්‍ය නීතිමය හා පරිපාලනමය කටයුතු සම්පූර්ණ කිරීම සඳහා අවබෝධතා ගිවිසුමේ කාල සීමාව 2026.12.31 සිට මාස 4ක් දක්වා දීර්ඝ කොට පවරා ගැනීමේ කටයුතු නිම කිරීමට නියමිතව තිබෙනවා. විස්තර ඇමුණුම 09 මඟින් දක්වා ඇත.

(ii) IHAC වැඩසටහන ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වූ අමාත්‍යාංශයට හිමි මූල්‍ය කොටස, අවබෝධතා ගිවිසුමේ - MOU - විධිවිධාන අනුව අදාළ ආයතනය විසින් දැනටමත් අමාත්‍යාංශය වෙත පවරා තිබෙනවා. එබැවින්, මෙම ආදායම් මාර්ගය අත්හැර දැමීමක් සිදු වෙලා නැහැ.

(iii) පහත වගුවේ දක්වා ඇති පරිදි දෙවන සංශෝධන එකඟතාවයේ - Addendum 2 - සඳහන් ප්‍රතිශත අනුපාතයන් අනුව ගණනය කරන ලද අමාත්‍යාංශයට හිමි කොටස සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත බැර කර ඇත.

| අයදුම්කරු කාණ්ඩය | **IOM සඳහා සේවා ගාස්තුව (ඇමෙරිකානු ඩොලර්)** | **සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා (ඇමෙරිකානු ඩොලර්)** |
|---|---|---|
| වයස අවුරුදු 11 සහ ඊට වැඩි | 62 | 13 |
| වයස අවුරුදු 11ට අඩු | 35 | 40 |

මෙම වගුවට අනුව වයස අවුරුදු 11 සහ ඊට වැඩි එක් පුද්ගලයෙකුගෙන් IMO සඳහා සේවා ගාස්තුව වශයෙන් ඇමෙරිකානු ඩොලර් 62ක් අය කරගෙන තිබෙනවා. එක් අයෙකුගෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇමෙරිකානු ඩොලර් 13ක් ලබාගෙන තිබෙනවා. ඒ වාගේම වයස අවුරුදු 11ට අඩු අයකුගෙන් ඇමෙරිකානු ඩොලර් 35ක් ගන්නා අතර, එයින් යම් කොටසක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ලැබිලා තිබෙනවා. ඒ සඳහා වූ සියලු වාර්තා සහ මූල්‍යමය විස්තර මෙහි දක්වා තිබෙනවා.

මෙම වැඩසටහන යටතේ ලැබුණු ආදායම නියමිත පරිදි ලංකා බැංකුවේ තැපෝබේන් ශාඛාවේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 7141244 දරන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සාමාන්‍ය තැන්පතු ගිණුම වෙත බැර කරලා තිබෙනවා. ඒ සම්බන්ධ විස්තර මෙහි අමුණා තිබෙනවා. අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ තෝරා ගත් භාණ්ඩ හා සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම් නොමිලයේ නිකුත් කර තිබෙනවා. ඒ කියන්නේ, රෝගියෙක් detect වුණොත් අපි ඒ රෝගියාට අවශ්‍ය ප්‍රතිකාර ලබා දීම මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් නොමිලයේ සිදු කර තිබෙනවා.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම් 01, 02, 03, 04, 05, 06, 07, 08 සහ 09 **සභාගත*** කරමි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Hon. Speaker, I will speak in English because this is relevant to foreigners migrating to Sri Lanka.

First of all, thank you for your comprehensive Answer, Hon. Deputy Minister. You know that this institution has played a very crucial role in preventing diseases from coming into the country, and I think we also need to appreciate the support given by the International Organization for Migration.

My first Supplementary Question to you, Hon. Deputy Minister, is this. You said that you all established a Committee on the 09th of February, 2026 and that you are to take over the responsibilities by May, 2027. Could you kindly tell me what the ToR is and what kind of future operational model you envisage? Particularly, I want to ask you whether you are looking at a whole-of-Government model, a public-private partnership model or a private-sector operational model. I will tell you why I am asking you that question. It is because, even though at the political level there seems to be some need to take it over, during your Government and previously as well, there have been issues at the official level, whether you have the capacity and so on. Hon. Deputy Minister, that is my first question to you.

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

We are considering the PPP model and discussions are now in progress. The final reports have not yet been submitted.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Then, you have already concluded that it would be the PPP model. So, there is no need for a Committee recommendation.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

Actually, the Committee will make the final decision and that final decision would be forwarded to the relevant authorities; then, they will obtain permission from the relevant authorities.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

Okay.

My second Question is this. You said that you charge US Dollars 63 for a kid under the age of 11 years. The Government gets US Dollars 13 out of it, which means roughly 20 per cent. But, you did not tell us how much you charge for adults. We assume that it is also about 20 per cent. Now, the issue is, a lot of the migrants are not subjected to this test. We see that about 50,000 migrant visas are issued annually, but diplomats, clerics and consultants are not subjected to it. Therefore, about half of the people who come here are not subjected to this test, whereas for others, every six months, it is mandatory to get it done. And, my Question has two parts. One is, why do you not look at migrants irrespective of what their occupation is? Because, if you contract a disease, it does not matter whether you are a cleric, a diplomat or a normal private sector employee. The second part of the Question is this. About 500 people of Sri Lankan origin pass away in foreign countries annually. So, actually, if you take this money that is coming to you, which you are not taking and is about US Dollars 2 million a year at the minimum, you could use that money to ensure the health of our migrant workers and if they, unfortunately, pass away, use that money to bring back their remains.

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

If I may reply to the first part of your Question, actually, we want to amend all the circulars because those decisions were taken only on political and some personal grounds. So, we want to amend all the circulars related to that. The suggestion you made by the second part of your Question, we will consider.

## ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය: කාර්යභාරය, සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු
## இலங்கை ஆசிரிய ஆலோசகர் சேவை: பணிப்பொறுப்புகள், ஆளணி மற்றும் வெற்றிடங்கள்
## SRI LANKA TEACHER ADVISORS' SERVICE: ROLE, CADRE AND VACANCIES

2035/2026

**9.** ගරු සුනිල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය සඳහා සේවා ව්‍යවස්ථාවක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එම සේවා ව්‍යවස්ථාව අනුව තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iii) සේවා ව්‍යවස්ථාව අනුව ගුරු උපදේශකවරුන්ගේ කාර්යභාරය කවරේද;

(iv) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී ගුරු උපදේශකවරුන්ට විශේෂ කාර්යභාරයක් පවරා තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ගුරු උපදේශක සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් පළාත සහ විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගුරු උපදේශක සේවයේ පුරප්පාඩු පවතින තත්ත්වයක් තුළ අදාළ රාජකාරි ආවරණය කිරීම සඳහා යොදා ඇති වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை ஆசிரிய ஆலோசகர் சேவைக்கான சேவைப் பிரமாணமொன்று நடைமுறைப்படுத் தப்பட்டுள்ளதா என்பதையும்;

(ii) மேற்படி சேவைப் பிரமாணத்தின்படி பதவிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி சேவைப் பிரமாணத்தின்படி ஆசிரிய ஆலோசகர்களின் பணிப்பொறுப்புகள் யாவை என்பதையும்;

(iv) புதிய கல்வி மறுசீரமைப்பை நடைமுறைப் படுத்துகையில் ஆசிரிய ஆலோசகர்களுக்கு விஷேட பணிப்பொறுப்பு கையளிக்கப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஆசிரிய ஆலோசகர் சேவையில் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை, ஒவ்வொரு மாகாணம் மற்றும் பாடத்துக்கு ஏற்ப வெவ் வேறாக யாது என்பதையும்;

(ii) ஆசிரிய ஆலோசகர் சேவையில் வெற்றிடங்கள் காணப்படும் நிலையில், குறிப்பிட்ட கடமைகளை நிறைவேற்றுவதற்காக மேற் கொள்ளப்பட்டுள்ள வேலைத்திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether a Service Minute is in force for the Sri Lanka Teacher Advisors' Service;

(ii) the cadre strength prescribed under the said Service Minute;

(iii) the role of Teacher Advisors in terms of the said Service Minute; and

(iv) whether a special role has been assigned to Teacher Advisors in the implementation of the new education reforms?

(b) Will she also inform this House -

(i) the number of vacancies in the Teacher Advisors' Service disaggregated by province and subject; and

(ii) the arrangements that have been made to cover the relevant duties in view of the existing vacancies in the Teacher Advisors' Service?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) තනතුරු සංඛ්‍යාව 4,471කි.

(iii) ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ 04 වන ඡේදය යටතේ "ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව වන පරිදි රේඛීය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයන්හි පාලනය යටතේ අධ්‍යාපන කලාපයේ/කොට්ඨාසයේ අදාළ විෂය පිළිබඳ විශේෂඥයින් ලෙස කටයුතු කරමින් විෂය නිර්දේශ හා පෙළපොත් ආශ්‍රිතව ගුරුවරුන් දිශාභිමුඛ කිරීම, කලාපයේ/කොට්ඨාසයේ ගුරු පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අවශ්‍ය කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ජාතික පර්යේෂණ හා ඇගයීම් කටයුතු ක්‍රියාවලියේදී සක්‍රියව දායක වීම හා කලාපයේ/කොට්ඨාසයේ තම විෂයයට අදාළ අධ්‍යාපන ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා සුසාධ්‍යකරණය කිරීම." ලෙස පොදු කාර්යභාරය දක්වා ඇත.

සවිස්තරාත්මක කාර්යභාරය පහත ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ගුරු උපදේශකවරුන්ගේ පොදු කාර්යභාරය ලෙස ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කරමි.

1. ආයතන හා පරිපාලන කටයුතුවලට අදාළ රාජකාරි
2. විෂය සංවර්ධනයට අදාළ රාජකාරි
3. ගුරු සුසාධ්‍යකරණයට අදාළ රාජකාරි
4. තක්සේරුකරණය, ඇගයීම් හා නියාමනයට අදාළ රාජකාරි

(iv) ගුරු උපදේශකවරුන්ගේ ප්‍රධාන කාර්යය සහාය ඉගැන්වීම වන අතර කලාප හා කොට්ඨාස අධීක්ෂණ කාර්යය සඳහා ඔවුන්ගේ සහාය ලබා ගනී. මීට අමතරව,

තම විෂය පිළිබඳ ගුරුවරුන් පුහුණු කිරීමේදී සම්පත් දායකත්වය ලබා දීම.

විශේෂයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සම්පත් දායකත්වය සැපයීමට ගුරු උපදේශකවරුන් යොදා ගන්නවා.

- ඇගයීම් හා තක්සේරු ක්‍රියාවලිය පිළිබඳ ගුරුවරුන් දැනුවත් කිරීම, නියාමනය හා මඟපෙන්වීම.
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරු භවතුන්ට මතුවන ගැටලු ආදිය සඳහා මැදිහත්වීම හා මඟපෙන්වීම.
- පාසල් නියාමන කටයුතු සඳහා දායක වීම.

මේ ආදී බොහෝ කාර්යයන් සඳහා ගුරු උපදේශකවරුන්ගේ සේවය ලබාගන්නා අතර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළද එම සේවය තමාගේ රාජකාරී කටයුත්තක් ලෙස ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා.

(ආ) (i) ගුරු උපදේශක සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව, ඒ ඒ පළාත සහ විෂය අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මඟින් දක්වා ඇත. ඇමුණුම 02හි දීර්ඝ ලැයිස්තුවක් තිබෙනවා.

(ii) ඒ සම්බන්ධයෙන් මෙන්න මෙහෙම කාරණාවක් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. දැනට ගුරු උපදේශක සේවයේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇති වී තිබෙන මෙම සේවාවේ නිලධාරීන්ගේ දැඩි අවශ්‍යතාවට පිළියමක් ලෙස ගුරු උපදේශක සේවයට නව නිලධාරීන් බඳවා ගන්නා තෙක් දැනට පළාත් හා ජාතික පාසල් ගුරු සේවයේ නියුතු, ඇමුණුම 02හි සඳහන් නිර්ණායක ආවරණය වන හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ සහිත ගුරුවරුන් ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ බඳවා ගැනීමේ සුදුසුකම් මත රාජකාරී ආවරණය සඳහා පත් කිරීමට අනුමැතිය ලබා දෙන ලෙස අංක ED/02/29/18/03/01 අන්තර් - ඌව (I වෙළුම) හා 2026.06.04දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී දැනට රාජකාරි ආවරණය කරමින් යම්කිසි පිරිසක් ඉන්නවා. ඒ රාජකාරී ආවරණය කරන්නේ ගුරු සේවය මඟින්. ඊට අමතරව, වැඩිමනත්ව ඒ සඳහා අනුමැතිය පිණිස ඉල්ලීමක් කර තිබෙනවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන්.

ඊට අමතරව පවතින පුරප්පාඩු අතරින් සියයට 75ක ප්‍රමාණයක්, එනම් තනතුරු 2,000ක් පමණ

බඳවා ගැනීමට අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබෙනවා. එතැනදී එකඟතාව සලකා බලා ඒ සම්බන්ධයෙන් අපට තීරණයක් ගන්න පුළුවන් වෙයි. එකඟතාවක් ලැබුණොත් මේ අවුරුද්දේම අපිට ඒ තනතුර සඳහා විභාගය පැවැත්වීමේ හැකියාව තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, ගුරු උපදේශක ධුරයේ ඉන්න කට්ටිය තමයි අධ්‍යාපන තාක්ෂණයේ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේ සිදු වෙන සෑම වෙනස් වීමක්ම පන්ති කාමරයේ උගන්වන ගුරුවරයා වෙත සම්ප්‍රේෂණය කරන්නේ කියලා. ඒ නිසා ඒ කාර්යභාරයේ වටිනාකම අපිට ලඝු කරන්න පුළුවන්කමක් නැහැ. මෑත කාලයේ අවුරුදු ගණනාවක් එක දිගට බඳවා ගැනීම් සිදු නොවුණු නිසා මා දන්නා විධියට ගුරු උපදේශක සේවාවේ අවශ්‍ය ප්‍රමාණයෙන් හතරෙන් එකක් පමණ තමයි දැන් ඉන්නේ. මේකට විකල්පයක් විධියට ගුරු සේවයේ I ශ්‍රේණියේ, නැත්නම් ඉහළ මට්ටමේ ඉන්න ගුරුවරුන්ගෙන් සම්පත් දායකයන් බඳවා ගැනීම කෙරෙනවා. මම සොයා බැලුවාම දැනගන්නට ලැබුණා, එක්තරා කලාපයක එක්තරා විෂයකට 20දෙනෙකු ඉල්ලුම් කළාම ඒ 20දෙනාම බඳවා ගෙන තිබෙන බව. එහෙම කළාම, ඒ බඳවා ගන්නා අයගේ ගුණාත්මකභාවය පිළිබඳ විශ්වාසය, එහෙම නැත්නම් ඒ ක්‍රමවේදය පිළිබඳ විශ්වසනීයභාවය නැතිව යනවා. ඒ නිසා මේ සම්පත් දායකයන් බඳවා ගන්නා නිර්ණායක පිළිබඳවත්, එහි ගුණාත්මකභාවය සහ විශ්වාසය තහවුරු කිරීම සඳහාත් වෙනම වැඩ පිළිවෙළක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, එම අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔව්, මෙතැන ගැටලුවක් තිබෙනවා. මෙතැනදී අපි නිශ්චිතව කියන්න ඕනෑ, "ගුරු උපදේශක සේවය" කියන්නේ සේවාවක් බව. එහි යම්කිසි පුරප්පාඩුවක් තිබෙනවා නම් වැඩ ආවරණය කිරීමට තමයි හැකියාව තිබෙන්නේ. නමුත්, පළාත් මට්ටමින් සහ කලාප මට්ටමින් ගුරු උපදේශක සේවයේ වැඩ ආවරණය කිරීමට නොව, සම්පත් දායකයන් ලෙස පත් කිරීමක් කර තිබෙනවා. ඒක තමයි තත්ත්වය. ඒ නිසා තමයි මා කලින් සඳහන් කරපු 2026.06.04 දිනැති ලිපිය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරලා තිබෙන්නේ, "නිශ්චිත ක්‍රමවේදයක් මඟින් වැඩ බැලීම සඳහා පත් කරන තුරු" කියලා. ඒ කියන්නේ, මේක තාවකාලිකයි. පිළිතුර ලබා දෙමින් මම කිව්වා, පවතින පුරප්පාඩුවලින් සියයට 75ක් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා දැනටමත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමු කර තිබෙනවා කියලා. එතෙක් නිශ්චිත ක්‍රමවේදයක් අවශ්‍යයි. මෙතැනදී අර කියන දෙයට අමතරව, සේවා ව්‍යවස්ථාවට අදාළ කරුණු ගළපා වැඩ ආවරණය කිරීමට අවශ්‍ය සුදුසුකම් සහිත පිරිස වැඩ ආවරණය කරාවි. එම නිසා අර කියපු ගැටලුව ඇති නොවේවි කියලා අපි හිතනවා. ඔව්, ඔබතුමා කියන කාරණාව ඇත්ත, ගරු මන්ත්‍රීතුමනි. සමහර කලාපවල එහෙම පිරිසක් ඉන්නවා. ඒ පිරිසට දැන් පුළුවන්, වැඩ ආවරණය කිරීම සඳහා අනුමැතිය ලබා ගන්න.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, "පාසල්වල බාහිර ඇගයීම් ක්‍රමවේදය" නමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළක් තිබෙනවා. කලාප අධ්‍යාපන කාර්යාලයේ, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් බාහිර ඇගයීම් කරන්න ඒ අදාළ තැන්වලට යනවා. ඒ බාහිර ඇගයීම්වලදී ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ සුවිශේෂ පුහුණුවක් සහිත පුද්ගලයන් තමයි පන්ති කාමරයේ උගන්වන ගුරුවරයා ඇගයීම කළ යුත්තේ. නමුත් මේ වන කොට පද්ධතියේ තිබෙන භාවිතයක් තමයි, ගුරු උපදේශකවරුන්ගේ අඩුපාඩුව නිසා ඇතැම් අවස්ථාවල ඒ ඒ කොට්ඨාසයේ, ඒ ඒ කලාපයේ ඉන්න විදුහල්පතිවරුන්ගෙන් යම් පිරිසක් මේ බාහිර අධීක්ෂණ ක්‍රියාවලියට සහභාගි කරවා ගැනීම. තමන්ගේ පාසලේ ඇගයීම් ක්‍රියාවලිය සංවිධානය කර ගන්නේ කොහොමද කියන එකට අත්දැකීමක් ලබා ගැනීම සඳහා විදුහල්පතිවරයෙකු එතැනට සම්බන්ධ කර ගත්තාට කිසි වැරැද්දක් නැහැ. ඒ කියන්නේ, තමන්ගේ පාසලේ ඇගයීම් ක්‍රියාවලිය සකසා ගැනීමට යම් උපදේශයක්, ආදර්ශයක් ලබා ගැනීම සඳහා වෙනත් ඉස්කෝලයක විදුහල්පතිවරයකු නිරීක්ෂණ මට්ටමින් සහභාගි වුණාට කිසි ගැටලුවක් ඇති වන්නේ නැහැ. හැබැයි, කිසියම් වෙලාවක ඒ අය පන්ති කාමර අධීක්ෂණයකට, එහෙම නැත්නම් විෂයානුබද්ධ අධීක්ෂණයකට ගියොත් ගැටලුවක් මතු වෙනවා, ඒ විදුහල්පතිවරුන්ට ඒ අදාළ විෂය සම්බන්ධව යම් පරිචයක් තිබෙනවාද නැද්ද කියලා. ඒ වාගේම තවත් ගැටලුවක් මතු වෙනවා. කලාපයක හරි, කොට්ඨාසයක හරි විදුහල්පතිවරුන් කිහිප දෙනෙකුට සතියකට දවස් දෙකක් බාහිර අධීක්ෂණය සඳහා සම්පත් දායකයන් විධියට වෙනත් පාසල් පාසල්වලට යන්න වුණොත්, තමන් කළමනාකරණය කරන පාසලේ ඇති වන ගැටලු සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන ගැටලුව සම්බන්ධයෙන් නිශ්චිතව තොරතුරු සොයා බලන්නම්. අපට දැනට තිබෙන තොරතුරුවලට අනුව ගුරු උපදේශක සේවයට අදාළ කටයුතු සඳහා විදුහල්පති සේවය යොදා ගැනීමක් සිද්ධ වෙන්නේ නැහැ. එසේ යොදා ගන්නේ නැති බව තමයි නිලධාරීන්ගේ මතය වන්නේ. නමුත් අපි නිශ්චිතව මේ කියන කාරණාව ගැන සොයා බලන්නම්. අපි දන්නවා, විදුහල්පති සේවයට පරිපාලනයට අදාළව නිශ්චිත කාර්යභාරයක් තිබෙන බව. ඊට වැඩිමනත් යොදා ගැනීමක් සිද්ධ වෙනවා නම්, පරිපාලනය සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්න අපට හැකියාව තිබෙනවා. අපි ඒ ගැන සොයා බලන්න කටයුතු කරන්නම්.

---
*\ **පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

## "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් හානි වූ කොළඹ-මහනුවර-නාවලපිටිය දුම්රිය මාර්ගය: ප්‍රතිසංස්කරණය
"தித்வா" சூறாவளியால் பாதிக்கப்பட்ட கொழும்பு - கண்டி - நாவலப்பிட்டி புகையிரதப் பாதை: புனரமைப்பு
COLOMBO-KANDY-NAWALAPITIYA RAILWAY LINE DAMAGED DUE TO CYCLONE "DITWAH": RESTORATION

2052/2026

**10. ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ සිට මහනුවර සහ නාවලපිටිය දක්වා මේ වන විට දුම්රිය ගමනාගමනය සිදු නොවන බව දන්නේද;

(ii) 'දිට්වා' සුළි කුණාටුව හේතුවෙන් එම දුම්රිය මාර්ගයේ හානි වූ ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම හඳුනාගත් ස්ථාන අතරින් සිදු වී ඇති හානිය ඇස්තමේන්තුගත කර ඇති ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම හානි සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ආපදාවට ලක් වූ සියලු ස්ථාන පිළිසකර කර සංවර්ධනය කිරීමට අපේක්ෂිත කාල සීමාව කවරේද;

(vi) මාස 06ක් ඇතුළත එම දුම්රිය මාර්ගය පිළිසකර කර මහනුවර දක්වා දුම්රිය ගමනාගමනය නැවත ආරම්භ කිරීමට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொழும்பிலிருந்து கண்டி மற்றும் நாவலப்பிட்டி வரை தற்போது புகையிரதப் போக்குவரத்து இடம்பெறுவதில்லை என்பதை அவர் அறிவாரா;

(ii) 'தித்வா' சூறாவளி காரணமாக அப்புகையிரத வீதியில் சேதமடைந்த இடங்களின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி அடையாளம் காணப்பட்டுள்ள இடங்களில், சேத மதிப்பீடு மேற்கொள்ளப்பட்டுள்ள இடங்களின் எண்ணிக்கை யாது;

(iv) மேற்படி சேதங்கள் தொடர்பில் இதுவரை எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(v) அனர்த்தத்திற்குள்ளான அனைத்து இடங்களையும் புனரமைத்து அபிவிருத்தி செய்வதற்கு எதிர்பார்க்கப்படும் காலப்பகுதி யாது;

(vi) 06 மாத காலத்துக்குள் அப்புகையிரத வீதியைப் புனரமைத்து கண்டி வரை புகையிரத போக்குவரத்தை மீண்டும் ஆரம்பிக்க முடியுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) whether he is aware that train services from Colombo to Kandy and to Nawalapitiya are not currently in operation;

(ii) the number of locations on the said railway line that sustained damages due to Cyclone "Ditwah";

(iii) the number of identified locations of which the damage sustained has been estimated;

(iv) the measures that have been taken so far to repair such damages;

(v) the expected time frame for the restoration and development of all the affected locations; and

(vi) whether it is possible to restore the said railway line and recommence train services up to Kandy within a period of six months?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) කොළඹ සිට නාවලපිටිය දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගයේ ස්ථාන 136කට හානි සිදු වී ඇත.

(iii) හානිය ඇස්තමේන්තු කර ඇති ස්ථාන සංඛ්‍යාව 136කි.

(iv) හානියට පත් ස්ථාන 136න් ස්ථාන 122ක දුම්රිය මාර්ගය යථා තත්ත්වයට පත් කර ඇත. යථා තත්ත්වයට පත් කිරීමට ඇති ඉතිරි ස්ථාන 14න් එක් ස්ථානයක කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ එක්ව සිදු කරනු ලබන අතර, තවත් ස්ථානයක කටයුතු CECB මඟින් සිදු කරනු ලබයි. ඉතිරි ස්ථාන 12 NBRI ආයතනය සමඟ එක්ව සැලසුම් සකස් කර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. විස්තර ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(v) 2027 වර්ෂයේ මැද භාගය වන විට පිළිසකර කර අවසන් කිරීමට සැලසුම් කර ඇත.

(vi) මෙම වසර අවසාන වීමට ප්‍රථම රඹුක්කන සිට මහනුවර දක්වා දුම්රිය ධාවනයට අවශ්‍ය පියවර ගනිමින් ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඇමතිතුමනි, සංචාරක සහ අනෙකුත් සියලු ක්ෂේත්‍ර සමඟ ගත් විට මහනුවර ආර්ථික වශයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට එක හේතුවක් තමයි අද වන කොට එම දුම්රිය ධාවනය සිදු නොවීම. මම දන්නවා, ඔබතුමන්ලාගේ දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරින් යම් කාර්යභාරයක් කරන බව. හැබැයි තිබෙන ප්‍රශ්නය මේකයි, ගරු ඇමතිතුමනි. "දිට්වා" ව්‍යසනය සිදු වෙලා දැනට මාස 7ක වාගේ කාලයකුත් ගත වෙලා තිබෙනවා. මම සමාජ මාධ්‍යවල දැක්කා, ඔබතුමන්ලාගේ කට්ටිය ස්ථාන 6ක වැඩ කරනවා. එක ස්ථානයක් හදලා තමයි ඊළඟ තැනට එන්නේ. ගරු ඇමතිතුමනි, එහෙම බලන කොට වාසනාවකට තමයි ඔය වාගේ තැන් 6ක් විතරක් ඉතිරි වුණේ. වැරදිලා හරි ඒ වාගේ තැන් 20ක්, 30ක් විතර තිබුණා නම්, අපේ ජීවිත කාලය තුළම ඒ කටයුතු අවසන් කරන්න බැරි වෙනවා. එහෙම නම්, මේ තත්ත්වය මේ විධියටම ගිහින් බැහැ, ගරු ඇමතිතුමනි. මොකද, සංචාරකයන්ගේ bucket list එකේ තිබෙන එකක් තමයි "Ella Odyssey" Train එක කියන්නේ. ඒ නිසා එක්කෝ ඒ තැන්වලට ප්‍රවේශ වීමට විකල්ප ක්‍රමවේද හෝ යොදා ගෙන මීට වඩා යම් කඩිනම් ක්‍රමවේදයක් තුළ ඒවා හදන්න වැඩ පිළිවෙළක් සූදානම් කරන්න මහාමාර්ග අමාත්‍යාංශය හැටියට ඔබතුමන්ලාට පුළුවන්කම තිබෙනවාද? මොකද, එහෙම කළේ නැති වුණොත් මහනුවරට එන සංචාරකයන් හා සම්බන්ධ ප්‍රශ්නය මීට වඩා බරපතළ තැනකට යනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ අතුරු ප්‍රශ්නයට පිළිතුර මම ලබා දෙන්නම්.

ගරු කථානායකතුමනි, අප මේ කථා කරන්නේ mountainous area එකේ තිබෙන දුම්රිය මාර්ග පිළිබඳවයි. පළමු කාරණය තමයි, එම දුම්රිය මාර්ග නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කරන බඩු භාණ්ඩ ගෙන යන්න පුළුවන්කම තිබෙන්නේත්, එම මාර්ගය හරහාමයි. මොකද, ඒ තැන්වලට බඩු භාණ්ඩ ගෙන යන්න වෙනත් කිසිම ක්‍රමයක් නැහැ. මමත් personally ගිහිල්ලා බැලුවා. නානුඔය-අඹේවෙල කොටසේ විශාල රක්ෂිත කැලයක් තිබෙන්නේ. එහි එකම access road එක වන්නේ කෝච්චි පාරම විතරයි. ඒ හැර අපට වෙන ක්‍රමයක් නැහැ. අපට කැලෑ කපාගෙන යන්න බැහැ. සමහර තැන් අතිවිශාල කඳු පද්ධති මැද්දේ තිබෙන්නේ. ඒ නිසා ඇත්තටම ඒකට උත්තරයක් නැහැ.

දෙවැනි කාරණය මේකයි. අපට හැම තැනකදීම කෙසේ හෝ හදන්න බැහැ, ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමනි. අපි දිට්වාවලින් පසුව ජනවාරි මාසයේදී Operations Room එකක් පිහිටෙව්වා. එම Operations Room එකේ දුම්රිය දෙපාර්තමේන්තුව, RDA, Survey Department සහ NBRO එක මාස 4ක් තිස්සේ එකට වැඩ කරනවා. එහෙම තමයි අප හිතා ගන්න බැරි තරම් විශාල packages ප්‍රමාණයක් constructionsවලට දීලාත් තිබෙන්නේ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, සමහර තැන් තිබෙනවා - ඔබතුමාගේ දිස්ත්‍රික්කයේත් තිබෙනවා - ඉතා බරපතළ විධියට නාය ගිය. ගරු කථානායකතුමනි, ඒ තැන්වලට අදාළ engineering designs සහ ගොඩනැඟීම් කරන්න පුළුවන්කම තිබෙන්නේ NBRO එකට පමණමයි. ඒ නිසා මේ ප්‍රශ්න දෙකම බලපා තිබෙනවා. NBRO එක හැම ඉඩමක්ම තක්සේරු කරන අතරයි මේ කටයුතු කරන්නේ. නමුත් අපි මේ ගැනම කිය කියා ඉන්නේ නැතුව සමහර ස්ථානවලදී ගම්මුන්ගේ උදව්වෙන් අතුරු මාර්ග හදාගෙන ගිහින් කෝච්චි පාර හදන්න අවශ්‍ය material supply එකට service trains හදාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, එම කටයුතුවල එක උත්සාහයක් විධියට තමයි අපි නුවර Railway Station එකේ ඉඳලා පාරෙන් එන්ජින් එක ගෙනාවේ. අපි මේ ආකාරයට සියලු efforts දරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු දේ හරි. මොකද, normally මේ පාරවල් හැදුවා නම්, ඔබතුමා කියන විධියට ජීවිත කාලය කියන එක කෙසේ වෙතත් - ඔබතුමා තව ගොඩක් කල් ජීවත් වෙන්න ඕනෑ - සැලකිය යුතු කාලයක් ගත වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, සරලව කිව්වොත්, මට කියන්න පුළුවන් මෙච්චරයි. වත්තේගම-මාතලේ කොටස හැරුණාම, දුම්රිය මාර්ගයේ විනාශ වී තිබෙන අනෙක් සියලුම කොටස් මේ වසර අග වන කොට හෝ ලබන වසරේ ජනවාරි, පෙබරවාරි වන කොට හදන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

වත්තේගම සිට මාතලේ දක්වා කොටස පමණක් හදන්න අපට තව මාස හයක කාලයක් යන්න පුළුවන්. මේ අවස්ථාවේ මට පැහැදිලි කරන්න තිබෙන්නේ ඒ ටික තමයි.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2023 වර්ෂයේදී ජපානයත් එක්ක තිබුණු LRT ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක වීමත් සමඟ BYD එකත් එක්ක කරගෙන ආපු සැහැල්ලු දුම්රිය ධාවනය කරන වැඩ පිළිවෙළ අපි මහනුවරට අරගෙන ගියා. ගරු ඇමතිතුමනි, මහනුවරට ඇතුළු වෙන ප්‍රධාන නගර තිබෙන්නේ හතරයි. ඒ, ගන්නෝරුව, පල්ලේකැලේ, කටුගස්තොට සහ තවත් එක නගරයක්. මේ නගර හතර සම්බන්ධ කරලා, BYD එක හරහා ඒ monorail එක කරන්න සැලසුම් ටික හැදුවා. මහාමාර්ග අමාත්‍යාංශයේ ඒ සියලු සැලසුම් තිබෙනවා. ඒ කණ්ඩායම් ඇවිල්ලා BYD එක ආයෝජනය කරලා පළමුවැනි කිලෝමීටරයේ වැඩ කරන්නත් ඒ වෙලාවේ එකඟතාව දුන්නා, ගරු ඇමතිතුමනි. අපේ නියෝජ්‍ය ඇමතිතුමා නුවර නිසා එතුමාට ඒක අරගෙන කරන්න කියලා පළමුවැනි Budget meeting එකේදී මම කිව්වා. ඒක කළොත් මුළු මහනුවරම වෙනස් කරන්න පුළුවන් ව්‍යාපෘතියක් බවට අනිවාර්යයෙන්ම ඒක පත් වෙනවා. ගරු ඇමතිතුමනි, අද වන විට දුම්රිය සම්බන්ධයෙන් කලින් සඳහන් කළ ප්‍රශ්නයත් අපට තිබෙනවා. නගරයට එන වාහන සඳහා circular road එකක් හැටියට ප්‍රධාන නගර හා සම්බන්ධ වන විධියට තමයි මේ monorail එක සැලසුම් කළේ. අඩුම ගණනේ මේකවත් කරලා තිබුණා නම් මහනුවර තදබදය සහ ඒ සියලු කාරණාවලට යම් විසඳුමක් ලැබෙනවා. ගරු ඇමතිතුමාගෙන් මම දැන ගන්න කැමැතියි, මේ ආණ්ඩුවට අදට අවුරුද්දයි මාස නවයයි දින 16ක් වෙනකොට මේ ව්‍යාපෘතියේ තත්ත්වය මොකක්ද කියලා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඇත්තටම මේකට සවිස්තරාත්මක පිළිතුරක් මට ලබා දිය හැකියි. නමුත්, වේලාව ගැන මම සැලකිලිමත් විය යුතු නිසා, පුළුවන් තරම් telegram system එකට කියන්නම්.

පළමුවැනි දේ, අපි දැනට ඔය යෝජනාව consider කරලා නැහැ. මහනුවරට අදාළව ගත්තොත්, අපි ගලගෙදරට expressway එක හදන ගමන්ම, ඒක ගන්නෝරුවට යම් කිසි මොහොතක

[ගරු බිමල් රත්නායක මහතා]

connect කිරීමේ බලාපොරොත්තුවෙන් තමයි ඒ extension එක තියන්නේ. ගලගෙදර වැඩ ඉවර කරන්නේ යම් කිසි කාලයකදී ගන්නෝරුවට සම්බන්ධ කරන්න බලාගෙන.

දෙවනුව, අපි ගලගෙදර - කටුගස්තොට sector එකේ පාර පළල් කරනවා. ඊට පස්සේ, පේරාදෙණිය පාලම ළඟ flyovers දෙකක් අපි හදනවා. ඊට පස්සේ ඊට එහා තිබෙන මහයියාව උමඟේ වැඩ අපි මේ අවුරුද්දේ අග ඉවර කරනවා. ඊට පස්සේ විලියම් ගොපල්ලව මාවත මම හිතන හැටියට දැනට හදලා අවසන් හෝ හැදීගෙන යනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, මේ වසර අවසන් වෙන්න පෙර පේරාදෙණිය පරණ පාලම අලුත්වැඩියා කරලා කෝච්චි යන්න පුළුවන් විධියට හදන්න.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
මම ඇහුවේ LRT ව්‍යාපෘතිය ගැන.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක තමයි. ඒකේ තිබෙන ප්‍රයෝජනය ගත්තාම, LRT කියන්නේ අධික වියදමක් යන, - ඒක ලස්සන දෙයක් තමයි. නමුත්, ඒකේ ප්‍රවාහනය කළ හැකි මගීන් සංඛ්‍යාව ගත්තාට පස්සේ ගරු මන්ත්‍රීතුමනි, ඒක සම්බන්ධයෙන්,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුරාධ ජයරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහලා අවසානයි.

**ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne, Attorney-at-Law)
ඒක ගෙවන එකක් හැටියට නොවෙයි එන්නේ. ඒ මුදල් ටිකත් ගත්තා නම් මේක ප්‍රායෝගික වෙනවා. ඒ ටිකට් එකේ price එක.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, කොළඹ තිබෙන LRTs ගැනත් මේ ඔක්කෝම ගැනත් අපි බලලා තිබෙනවා. මට කියන්න තිබෙන්නේ මේකයි. ඒක ටිකක් fancy වුණාට, ඒවාට දරන්න වෙන වියදම වැඩියි. අපේ priorities බැලුවාට පස්සේ අපි හිතනවා, LRTsවලට වඩා විශාල සෙනඟක් ප්‍රවාහනය කරන්න පුළුවන් පහසුකම් සහිත ක්‍රමයක් පිළිබඳව. මම ඒ නිසා තමයි KMTT එකත් එක්ක තිබෙන විශාල ප්‍රවාහන සැලැස්ම ගැන කිව්වේ. අපි මෙට්‍රෝ බසුත් ඔබතුමන්ලාට ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

## යටියන්තොට-නාවලපිටිය මාර්ගය: සංවර්ධනය
### யட்டியாந்தோட்டை - நாவலப்பிட்டி வீதி: அபிவிருத்தி
### YATIYANTOTA-NAWALAPITIYA ROAD: DEVELOPMENT

1543/2025

**1. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. (Dr.) Nandana Millagala)
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට සිට සීපෝත්, නාගස්තැන්න හරහා නාවලපිටිය දක්වා ඇති මාර්ගය වර්ෂ 20ක පමණ කාලයක සිට පිළිසකර නොකිරීමට හේතු කවරේද;

(ii) කොළඹ සිට නාවලපිටිය දක්වා විකල්ප මාර්ගයක් ලෙස ඉහත මාර්ගය භාවිත කළ හැකි බව දන්නේද;

(iii) ඉහත මාර්ගයේ කිලෝමීටර 9 සිට සංවර්ධනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සැලසුම් කර තිබුණේද;

(iv) ඒ සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(v) එම සංවර්ධන කටයුතු නිසි ලෙස සිදු කර තිබේද;

(vi) එහිදී නියමිත ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කර තිබේද;

(vii) ඉහත මාර්ගයේ සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கேகாலை மாவட்டத்தில் யட்டியாந்தோட்டையில் இருந்து சீபோத், நாகஸ்தென்ன ஊடாக நாவலப்பிட்டி வரை செல்லும் வீதி சுமார் 20 வருடங்களாக புனரமைக்கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(ii) கொழும்பிலிருந்து நாவலப்பிட்டி வரையான மாற்று வீதியாக மேற்படி வீதியைப் பயன்படுத்தலாம் என்பதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி வீதியின் 9ஆவது கிலோமீற்றரிலிருந்து அபிவிருத்தி செய்வதற்கு வீதி அபிவிருத்தி அதிகாரசபையால் திட்டமிடப்பட்டிருந்ததா என்பதையும்;

(iv) அதற்காக ஒதுக்கப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(v) அந்த அபிவிருத்திப் பணிகள் முறையாக இடம்பெற்றுள்ளனவா என்பதையும்;

(vi) அதன்போது முறையான பெறுகை வழிமுறைகள் பின்பற்றப்பட்டுள்ளனவா என்பதையும்;

(vii) மேற்படி வீதியின் அபிவிருத்திப் பணிகள் துரிதமாக முன்னெடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -

(i) the reasons for the failure to repair the Yatiyantota-Nawalapitiya Road via Seepoth and Nagastenna in the Kegalle District for about 20 years;

(ii) whether he is aware that the above-mentioned road can be used as an alternative route from Colombo to Nawalapitiya;

(iii) whether the Road Development Authority had planned to develop the said road from kilometre 9 onwards;

(iv) the amount allocated for the said development;

(v) whether the said development tasks have been carried out properly;

(vi) whether the prescribed procurement procedures have been duly adopted in that regard; and

(vii) whether the development of the said road will be carried out expeditiously?

(b) If not, why?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) යටියන්තොට සිට සීපෝත්, නාගස්තැන්න හරහා නාවලපිටිය මාර්ගයේ දුර කිලෝමීටර 41කි. එය කෑගල්ල හා මහනුවර දිස්ත්‍රික්කවලට අයත් වේ.

I. එයින් කෑගල්ල දිස්ත්‍රික්කයට යටියන්තොට සිට කිලෝමීටර 29.8ක් අයත් වේ.

- මුල් කිලෝමීටර 23 (0+000km සිට 23+000km දක්වා) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් යටියන්තොට - පූනාගල, මීනාගල (B482) මාර්ගයට අයත් වන අතර,
- ඉතිරි කිලෝමීටර 6.8 (23+000km සිට 29+800km) දක්වා කොටස පළාත් සභා සහ ප්‍රාදේශීය සභාවලට අයත් වේ.

II. මහනුවර දිස්ත්‍රික්කයට අයත් කොටස කිලෝමීටර 11.2ක් වන අතර (29+800km සිට 41+000km දක්වා) එය මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග කොටසක් වේ.

- මෙම මාර්ගය පහත පරිදි පිළිසකර කර ඇත.

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග කොටසේ,

v 0+000km සිට 3.760km දක්වා සහ

v 9+000km සිට 13+400km දක්වා කොටස කාපට් අතුරා සංවර්ධනය කර ඇත.

v ඉතිරි මාර්ග කොටස මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් රථ වාහන ගමනාගමනයට සුදුසු පරිදි නඩත්තු කරගෙන යමින් පවතී.

- පළාත් සභා සහ ප්‍රාදේශීය සභා යටතේ වන 6.8km දුරින් සබරගමුව පළාත් සභාවට අයත් 3km මාර්ග කොටස කාපට් අතුරා සංවර්ධනය කර ඇත.

(ii) ඔව්. ඉහත මාර්ගය කොළඹ සිට නාවලපිටිය දක්වා ගමනාගමනයට දැනට භාවිත නොවුවත්, ප්‍රදේශයේ ජනතාවට සහ මෙම මාර්ගය හරහා ගමන් කරන මගීන්ට යටියන්තොට සිට නාවලපිටියට විකල්ප මාර්ගයක් ලෙස භාවිත කළ හැකිය.

(iii) ඔව්.

(iv)

| මාර්ග කොටස | කොන්ත්‍රාත් සමාගම | මුදල |
|---|---|---|
| 9+000km - 14+000km | ජයසිංහ කන්ට්‍රැක්ටර්ස් | රු. 238,447,454.80 |
| 14+000km - 19+000km | සන්බීම් කන්ස්ට්‍රක්ෂන් පෞද්ගලික සමාගම | රු. 229,901,065.32 |

(v)
- කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය මත මුදල් අමාත්‍යාංශයේ අංක 03/2022 හා 2022/04/26 දිනැති චක්‍රලේඛයට අනුව රජයේ වියදම් දැඩි ලෙස පාලනය කිරීමට ලබා දී තිබූ උපදෙස් අනුව මෙම මාර්ග ව්‍යාපෘති අවසන් කිරීමට පෙර නවතා ඇත.
- වැඩ නතර කළ අවස්ථාවේ සංවර්ධනය කිරීමට සැලසුම් කර තිබූ 10km අතරින් 1.7km දුරක් පමණක් කාපට් අතුරා සංවර්ධනය කර ඇත.

(vi) මෙම කොන්ත්‍රාත් ලබාදීමේදී මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මඟින් නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත.

(vii) මාර්ග සංවර්ධන අධිකාරියට අයත්,

- මාර්ගයේ ඉතිරි කොටස වන 3+760km සිට 9+000km සහ 13+400km සිට 23+000km දක්වා කොටස කාපට් අතුරා නැවත සංවර්ධනය කිරීම පහත පරිදි ආරම්භ කර ඇත.

| මාර්ග කොටස | කොන්ත්‍රාත් සමාගම | මුදල |
|---|---|---|
| 3+760km - 6+760km | ෆයිනයිට් ලංකා පෞද්ගලික සමාගම | රු. 208,660,137.65 |
| 6+760km - 9+000km | ෆයිනයිට් ලංකා පෞද්ගලික සමාගම | රු. 242,179,381.81 |
| 13+400km - 18+200km | සදර්න් ගෲප් සිවිල් කන්ස්ට්‍රක්ෂන් පෞද්ගලික සමාගම | රු. 170,714,785.54 |
| 18+200km - 23+000km | ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පවතී. | |

- +800km සිට 21+500km දක්වා කොටස NBRI නිර්දේශ මත ස්ථායිකරණය කිරීමෙන් පසු සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

("දිට්වා" සුළි කුණාටුවෙන් දැඩි ලෙස හානියට පත් වී ඇත.)

(ආ) අදාළ නොවේ.

## ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණ: විස්තර
## இலங்கையிலுள்ள சர்வதேச கிரிக்கெட் மைதானங்கள்: விபரம்
## INTERNATIONAL CRICKET STADIUMS IN SRI LANKA: DETAILS

1642/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු ඉම්රාන් මහරූෆ් මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு இம்ரான் மஹ்ரூப் சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Imran Maharoof)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වල ඉදිරියේදී නව ක්‍රිකට් ක්‍රීඩාංගණ ඉදිකිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රීඩාංගණ ඉදිකිරීමට නියමිත ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයන් සිටින බව දන්නේද;

(ii) එසේ නම්, ඔවුන් හඳුනාගෙන ජාතික කණ්ඩායමට ඇතුළත් කර ගැනීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள சர்வதேச கிரிக்கெட் மைதானங்களின் எண்ணிக்கை மாகாண வாரியாக வெவ்வேறாக யாது;

(ii) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் எதிர்காலத்தில் புதிய கிரிக்கெட் மைதானங்களை நிர்மாணிக்கத் திட்டமிடப்பட்டுள்ளதா;

(iii) ஆமெனில், மேற்படி மைதானங்களை நிர்மாணிக்கத் திட்டமிடப்பட்டுள்ள பிரதேசங்கள் யாவை;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் திறமையான கிரிக்கெட் வீரர்கள் உள்ளனர் என்பதை அறிவாரா;

(ii) ஆமெனில், அவர்களை இனங்கண்டு தேசிய அணியில் இணைத்துக்கொள்வதற்கான வேலைத்திட்டம் யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the number of international cricket stadiums situated in each province in Sri Lanka, separately;

(ii) whether plans have been made to construct new cricket stadiums in the Northern and Eastern Provinces in the future; and

(iii) if so, the areas in which the aforesaid stadiums are to be constructed?

(b) Will he also inform this House -

(i) whether he is aware that there are talented cricket players in the Northern and Eastern Provinces; and

(ii) if so, the programme available to identify them and include them in the National Team?

(c) If not, why?

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| අංකය | පළාත | ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ | යෝජිත ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත | · ආර්. ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගණය<br>· එස්.එස්.සී. ක්‍රිකට් ක්‍රීඩාංගණය<br>· පී. සරා ඕවල් ක්‍රිකට් ක්‍රීඩාංගණය | කොළඹ දියගම ක්‍රිකට් ක්‍රීඩාංගණය |
| 02. | දකුණු පළාත | · ගාල්ල ක්‍රිකට් ක්‍රීඩාංගණය<br>· හම්බන්තොට මහින්ද රාජපක්ෂ ක්‍රිකට් ක්‍රීඩාංගණය | - |
| 03. | මධ්‍යම පළාත | · දඹුල්ල ක්‍රිකට් ක්‍රීඩාංගණය<br>· පල්ලෙකැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණය | - |
| 04. | ඌව පළාත | - | - |
| 05. | වයඹ පළාත | - | - |
| 06. | උතුරු මැද පළාත | - | - |
| 07. | සබරගමුව පළාත | - | - |
| 08. | නැගෙනහිර පළාත | - | - |
| 09. | උතුරු පළාත | - | යාපනය මණ්ඩතිව් ක්‍රිකට් ක්‍රීඩාංගණය |

(ii) ඔව්.

(iii)

| අංකය | පළාත | දැනට පවතින දිස්ත්‍රික් ක්‍රිකට් ක්‍රීඩාංගණ (District Grounds) | යෝජිත ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත | - | 03 |
| 02. | දකුණු පළාත | - | 03 |
| 03. | මධ්‍යම පළාත | - | 03 |
| 04. | ඌව පළාත | - | 03 |
| 05. | වයඹ පළාත | - | 03 |
| 06. | උතුරු මැද පළාත | 01 | 02 |
| 07. | සබරගමුව පළාත | 01 | 02 |
| 08. | නැඟෙනහිර පළාත | - | 03 |
| 09. | උතුරු පළාත | 01 | 05 |

උතුරු පළාතේ පහත දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ක්‍රීඩාංගණ ඇති කිරීමට මේ වන විට මූලික කටයුතු ආරම්භ කර ඇත.

1. යාපනය දිස්ත්‍රික්කය
2. කිලිනොච්චි දිස්ත්‍රික්කය
3. මුලතිව් දිස්ත්‍රික්කය
4. මන්නාරම දිස්ත්‍රික්කය
5. වව්නියාව දිස්ත්‍රික්කය

නැඟෙනහිර පළාතේ පහත දිස්ත්‍රික්ක සඳහා දිස්ත්‍රික් ක්‍රීඩාංගණ ඇති කිරීමට මේ වන විට මූලික කටයුතු ආරම්භ කර ඇත.

1. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
2. මඩකලපුව දිස්ත්‍රික්කය
3. අම්පාර දිස්ත්‍රික්කය

(ආ) (i) ඔව්.

(ii) ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් දක්ෂතා ඇති ක්‍රිකට් ක්‍රීඩකයින් හඳුනාගෙන ඔවුන් ජාතික මට්ටම සහ ජාත්‍යන්තර නියෝජනය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාව, පුහුණුව, පහසුකම් යනාදී සියල්ලම සහිතව ක්‍රිකට් ක්‍රීඩාව ඔස්සේ ඉදිරියටම පැමිණීම පිණිස පුළුල් සහ ජාතික මට්ටමේ ගමන් මාර්ගයක් -National Pathway- ඇති කර, එය ඔස්සේ අවස්ථාව සලසා දී ඇත. (විස්තර **ඇමුණුමෙහි**** දක්වා ඇත.)

(ඇ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ ළමා අපයෝජන නඩු කඩිනම් කිරීම
### சிறுவர் உரிமைகளைப் பாதுகாத்தலும் சிறுவர் துஷ்பிரயோக வழக்கு களை விரைவுபடுத்தலும்
### SAFEGUARDING CHILDREN'S RIGHTS AND EXPEDITION OF CHILD ABUSE CASES

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

"ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් දේශීය නීතිමය වගකීම් මෙන්ම ජාත්‍යන්තර බැඳීම් රැසක් වෙනුවෙන් වගකීමට බැඳී සිටී. එහෙත්, රටේ ළමා ආරක්ෂණ පද්ධතිය සම්බන්ධයෙන් පවතින බරපතළ අකාර්යක්ෂමතාව, නොවිසඳුණු පැමිණිලි සහ ප්‍රමාද වූ අධිකරණ ක්‍රියාවලිය හේතුවෙන් දරුවන්ගේ මූලික අයිතිවාසිකම් බරපතළ ලෙස බලපෑමට ලක්ව ඇති බව පෙනී යයි. විශේෂයෙන්ම එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තිය තනි නීතියක් හැටියට ගෙන එන්නට තවමත් අපොහොසත් වෙලා තිබෙනවා. ඒ වාගේම, බාල වයස්කාර යුක්තිය ලබාදීමේ සංශෝධන පනත - Juvenile Justice (Amendment) Act - ක්‍රියාවට නංවන්න අපොහොසත් වෙලා තිබෙනවා. ළමුන්ගේ අයිතිය සුරක්ෂිත කිරීම උදෙසා ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරන්නට අපි මේ අවස්ථාවේදී බලාපොරොත්තු වෙනවා. ඒ අනුව පහත සඳහන් ප්‍රශ්න මා යොමු කරමි.

1. 2015.01.01 දින සිට 2026.06.30 කාලපරිච්ඡේදය තුළ ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත ලැබී ඇති මුළු ළමා අපයෝජන පැමිණිලි සංඛ්‍යාව, ඉන් විමර්ශන අවසන් කළ, නීතිමය ක්‍රියා මාර්ග සඳහා යොමු කළ සහ තවමත් නොවිසඳී පවතින පැමිණිලි සංඛ්‍යාව වෙන වෙනම කීයද?

2. 2026 ජූනි 30 දින වන විට මහාධිකරණවල විභාග වෙමින් පවතින මුළු ළමා අපයෝජන නඩු සංඛ්‍යාව කොපමණ ද? එම නඩු අතරින් පසුගිය වසර 5 තුළ අධිචෝදනා ගොනු කළ නඩු සංඛ්‍යාව, වසර 5ත්, 10ත් අතර කාලය තුළ අධිචෝදනා ගොනු කළ නඩු සංඛ්‍යාව සහ වසර 10කට පෙර අධිචෝදනා ගොනු කළ නඩු සංඛ්‍යාව වෙන වෙනම කීයද? එම නඩු කඩිනමින් අවසන් කිරීම සඳහා රජය ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග මොනවාද? එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ කවදා ද?

3. දැනට මහාධිකරණවල විභාගවෙමින් පවතින ළමා අපයෝජන නඩු සංඛ්‍යාව කොපමණද? එම නඩු කඩිනමින් අවසන් කිරීම සඳහා අමාත්‍යාංශය අදාළ ආයතන සමඟ ක්‍රියාත්මක කරන විශේෂ වැඩ පිළිවෙළ කුමක්ද?

ජනාධිපතිවරයාගේ ලන්ඩන් සංචාරයේදී තුෂ් වික්‍රමනායක මැතිනිය ප්‍රධාන කරුණු 3ක් ඉදිරිපත් කළා, කල්ගත වූ නඩු ඉක්මන් කරවීම පිළිබඳව විශේෂ විමර්ශන ඒකකයක්, දරුවන් වෙනුවෙන් ජනාධිපති කාර්ය සාධක බලකායක් සහ ළමා ආරක්ෂණ අධිකාරිය සහ පොලිසිය අතර තිබෙන ගැටුම් තත්ත්වය ඉවත්කොට ළමා ආරක්ෂණ අධිකාරියේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම යනාදී වශයෙන්.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

4. ජනාධිපතිවරයා විසින් ප්‍රසිද්ධියේ පොරොන්දු වූ පරිදි කල්ගත වූ ළමා අපයෝජන පැමිණිලි කඩිනමින් විමර්ශනය කිරීම සඳහා විශේෂ පොලිස් විමර්ශන ඒකකයක් පිහිටුවන්නේද? එසේ නම්, එය ස්ථාපිත කරන්නේ කවදාද?

5. ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය පනතේ විධිවිධාන සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර එම අධිකාරිය ස්වාධීන, කාර්යක්ෂම සහ වගවිය හැකි ආයතනයක් බවට පත් කිරීම සඳහා රජය ගන්නා පියවර කවරේද?

6. 2025-2029 කාල වකවානුව තුළ ජාතික ළමා ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විශේෂඥ කමිටුව පත් කර එම ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන්නේ කවදාද?

7. දරුවන්ට එරෙහි ශාරීරික දඬුවම් අහෝසි කිරීම සඳහා අවශ්‍ය නීති සංශෝධන සභාවට ඉදිරිපත් කර බලාත්මක කරන්නේ කවදාද? එමඟින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් ලබා දී ඇති බැඳීම් ඉටු කරන්නේ කෙසේද?

8. දැනට පවතින ළමා ආරක්ෂණ තත්ත්වය ජාතික ළමා ආරක්ෂණ අර්බුදයක් ලෙස රජය පිළිගන්නේද? එසේ නම්, ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් වහාම අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය සහිත ජාතික ක්‍රියාන්විතයක් ආරම්භ කරන්නේ ද? ඒ කවදාද?

ගරු කථානායකතුමනි, ළමා වින්දිතයන් 46,000ක් වෙනුවෙන් යුක්තිය ඉටු කිරීම සම්බන්ධයෙන් වන මේ මහජන පෙත්සම මම මේ අවස්ථාවේදී **සභාගත *** කරනවා.

විපක්ෂයේ අපි බොහෝදෙනා ඒකට අත්සන් කළා. ගරු සභානායකතුමාටත් ඒ සඳහා අපි ආරාධනා කරනවා. ඒ වාගේම භේදයක් නැතුව ආණ්ඩු පාර්ශ්වය ඇතුළු පාර්ලිමේන්තුවේ සියලුදෙනාටත් මෙය අත්සන් කිරීමට අවස්ථාව සලසා දෙන්න පහසුකම් සපයන්න කියලා මහ ලේකම්තුමියගෙනුත් මම ඉල්ලීමක් කරනවා. මේක ඉතාම වැදගත් කාර්යයක්; ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කරන පෙත්සමක්. කරුණාකරලා පක්ෂ, විපක්ෂ භේදයෙන් තොරව එය අත්සන් කරන්නට ඉදිරිපත් වෙන්න කියලා යෝජනා කරනවා. ඉදිරිපත් කළ ප්‍රශ්නවලට ගරු අමාත්‍යතුමියගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා. ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Speaker.

நிலையியற் கட்டளை 27(2)இன்கீழ், Minister of Health and Mass Media, the Hon. (Dr.) Nalinda Jayatissa -

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Orderஐ சத்தமாகச் சொல்லுங்கள்!

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා**
(மாண்புமிகு மயில்வாகனம் ஜெகதீஸ்வரன்)
(The Hon. Mayilvaganam Jegatheeswaran)
கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்றத்தில் உடை அணிதல் தொடர்பில் சம்பிரதாயங்கள் இருக்கின்றன. அந்தச் சம்பிரதாயங்களை மீறும் வகையிலே இன்றைய தினம் கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்கள் உடையணிந்து வந்திருக்கிறார். அதனை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම දෙයක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇඳගෙන ඇවිල්ලා තිබෙන්නේ, -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මම මේක ගලවලා පෙන්වන්නද? මේ වෙට්ටියක් ඇඳගෙන ඉන්නේ; full suit එක ඇඳගෙන ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ලෙඩක් නම් බෙහෙත් ගන්න පුළුවන්. හවස ආවොත් මම prescribe කරලා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## යාපනය සහ වවුනියාව බන්ධනාගාරවල වෛද්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම
## யாழ்ப்பாணம் மற்றும் வவுனியா சிறைச்சாலைகளில் மருத்துவ வசதிகளை மேம்படுத்தல்
## IMPROVEMENT OF MEDICAL FACILITIES IN JAFFNA AND VAVUNIYA PRISONS

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சர் கௌரவ (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

இலங்கையில் சிறைச்சாலை என்பது நரகத்தின் ஒரு பகுதியாகவே கருதப்படுகின்றது. அதாவது, அடிப்படை வசதிகள் எதுவுமற்ற மிகவும் மோசமான கட்டமைப்பாகவே இந்த நாட்டிலுள்ள சிறைச்சாலைகள் கடந்த அரசாங்கத்தினால் நடாத்தி வரப்பட்டன. அவ்வாறே தங்களது அரசாங்கத்தினாலும் நடாத்தி வரப்படுகின்றன. இந்தச் சிறைச்சாலைக்குள், இதுவரை நிரூபிக்கப்படாத குற்றச்சாட்டுகளுக்காக 23 நாட்கள் நான் இருந்திருக்கின்றேன். மன்னார் வைத்தியசாலையில் உயிரிழந்த ஒருவர் தொடர்பில் நீதி கேட்பதற்காக அந்த வைத்தியசாலைக்கு ஒரு வைத்தியராகச் சென்றதற்காக 5 நாட்களும், சாவகச்சேரி ஆதார வைத்தியசாலையில் நடந்த ஊழல் தொடர்பாக வைத்திய அதிகாரிகள் சங்கம் எனக்கு எதிராக சாவகச்சேரி நீதிமன்றத்தில் தொடர்ந்த பொய்யான வழக்குகளால் 14 நாட்களும், அரசாங்கம் பாராளுமன்ற உறுப்பினருக்கு உரிய பாதுகாப்பை தர மறுத்ததால், என்னை நானே அரசாங்கம் தந்த கைத்துப்பாக்கியால் தற்பாதுகாத்துக்கொள்ள முயற்சித்ததற்காக 4 நாட்களும், வவுனியா மற்றும் யாழ்ப்பாண சிறைச்சாலைகளில் இருந்திருக்கின்றேன். இந்தச் சிறைச்சாலைகளை ஒரு பாராளுமன்ற உறுப்பினராகப் பார்க்கவேண்டிய நான், இந்த நாட்டின் நீதித்துறையில் இருக்கின்ற ஓட்டைகள் காரணமாக குற்றஞ்சாட்டப்பட்ட, ஆனால் குற்றம் நிரூபிக்கப்படாத குற்றவாளியாக இன்றுவரை இருக்கிறேன். நேரடியாக என் கண்களால் இந்தச் சிறைச்சாலைகளைப் பார்க்க முடிந்தது, என்னைப் பொறுத்தவரை, நான் செய்த மிகப் பெரிய பாக்கியமே! எனவே, இந்தச் சிறைச்சாலைகளில் நடக்கின்ற விடயங்களை கேட்பதற்குரிய சகல தகுதிகளும் எனக்கு இருக்கிறது. அந்தச் சிறைச்சாலைகளின் சுவர்களில் எழுதப்பட்டிருக்கின்ற, சிறைச்சாலைகளில் அடைக்கப்படுகின்ற குற்றஞ்சாட்டப்பட்ட, குற்றம் நிரூபிக்கப்பட்ட குற்றவாளிகள் அனைவரும் மனிதர்கள் என்ற வாசகத்தை நான் அடிக்கடி வாசிப்பேன். ஆனால், உள்ளே நடப்பதோ வேறு.

பொறுப்புமிக்க சுகாதார அமைச்சர் என்ற அடிப்படையில், பின்வரும் கேள்விகளுக்குரிய பதில்களை தாங்கள் தருவீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது.

1. இலங்கையின் வடக்கு மாகாணத்தில் இருக்கின்ற வவுனியா சிறைச்சாலையில் நிரந்தரமாக ஒரு வைத்தியர் நியமிக்கப்பட்டு இருக்கிறாரா? ஆமெனில், அவருடைய பெயர் என்ன?
2. அதேபோல், யாழ்ப்பாணச் சிறைச்சாலையிலும் ஒரு வைத்தியர் கடமையில் இருக்கிறாரா? ஆமெனில், அவருடைய பெயர் என்ன?
3. யாழ்ப்பாணம் மற்றும் வவுனியா சிறைச்சாலைகளில் 2024ஆம், 2025ஆம் ஆண்டுகளில் நிரந்தர வைத்தியர் ஒருவர் நியமிக்கப்பட்டு இருந்தாரா? ஆமெனில், அவர்களுடைய பெயர் என்ன?
4. யாழ்ப்பாணம் மற்றும் வவுனியா சிறைச்சாலைகளை இதுவரை தங்களுடைய Cabinet அமைச்சர்கள் யாராவது சென்று பார்த்திருக்கிறார்களா? ஆமெனில், எப்போது?
5. சிறைச்சாலையில் இருக்கின்ற வைத்தியர் ஒருவர் கடமை செய்கின்ற நேரம் என்ன? அவர் சிறைச்சாலையிலேயே இருக்கவேண்டிய நேரம் என்ன?
6. on-call வைத்தியராக அவரால் வீடுகளிலிருந்து தொலைபேசிமூலம் மருத்துவம் பார்க்க முடியுமா? அதற்குரிய சட்டவரையறைகள் இருக்கின்றனவா? அவை யாவை?
7. ஒரு சிறைச்சாலையில் கைதி ஒருவருக்கு ஆஸ்துமா நோயால் அல்லது heart attack நிலைமையால் மருத்துவ அவசரநிலை ஏற்பட்டால், அந்த நிலையில் மருத்துவ உதவி வழங்குவதற்கு அந்தச் சிறைச்சாலையில் இரவு நேரத்தில் மருத்துவர்கள் இருக்கிறார்களா?
8. 2025ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 26ஆம் திகதியிலிருந்து ஒக்ரோபர் மாதம் 09ஆம் திகதிவரை நான் சிறைச்சாலையில் இருந்த நாட்களில், யாழ்ப்பாண சிறைச்சாலைக்குள்ளே மரணித்த கைதிகள் எத்தனை பேர்? அவர்களுடைய பெயர் என்ன? அவர்கள் எவ்வாறு மரணித்தார்கள்? post-mortem செய்யப்பட்டதா? கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய கண் முன்னாலே மூன்று கைதிகள் இறந்திருக்கிறார்கள்.
9. இனிவரும் காலங்களில் சிறைச்சாலையில் மருத்துவ வசதிகளை மேம்படுத்துவதற்காக தங்களால் ஒரு குழுவை அமைத்து, சிறைக் கைதிகளின் அடிப்படை உரிமைகளைப் பாதுகாக்க முடியுமா?

கௌரவ சபாநாயகர் அவர்களே, எனக்கு ஒரு நிமிடம் தாருங்கள்! ஏனெனில், எனக்கு எட்டு நிமிடங்கள் இருக்கின்றன. சிறைச்சாலைகளில் 'பெனடோல்' என்ற மருந்தை தவிர வேறு எந்த மருந்தும் இல்லை. கைதிகள் என்ன வருத்தம் சொன்னாலும், 'பெனடோல்' மட்டும்தான் வழங்கப்படுகின்றது. சிறைச்சாலைகளில் ஒரு வைத்தியர் குறைந்தது காலை 8.00 மணியிலிருந்து மாலை 5.00 மணி வரையாவது இருக்க வேண்டும். பின்னேரத்தில் on-callஇல் doctors இல்லை. அந்த நேரத்தில் அங்கிருக்கின்ற nursing staffதான் patient ஐப் பார்க்கிறார்கள். ஒரு கைதிக்கு heart attack என்றால், அவருக்கு உண்மையாகவே heart attack வந்திருக்கிறதா அல்லது அவர் பொய்கூறுகிறாரா என்பதைக் கூட அடையாளம் காண முடியாது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න ලබා දී තිබූ කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

මම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

எனவே, குறைந்தது ஒரு வைத்தியர் on-callஇலாவது இருக்க வேண்டுமென கேட்டுக்கொள்கின்றேன். நன்றி!

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

1. ඔව්.
   වෛද්‍ය බී. රූබසිංගම් මහතා.
2. ඔව්.
   වෛද්‍ය ගෝබිකිෂ්ණන් මහතා.
3. ඔව්.
   * වවුනියාව - වෛද්‍ය බී. රූබසිංගම් මහතා - 2024 දෙසැම්බර් සිට මේ දක්වා.
   * යාපනය - වෛද්‍ය උමාසුතන් මහතා - 2024 ජනවාරි සිට 2024 පෙබරවාරි දක්වා.
     වෛද්‍ය කමලනාදන් මහතා - 2024 පෙබරවාරි සිට 2025 දෙසැම්බර් දක්වා.
     වෛද්‍ය කේ. ගෝබිකිෂ්ණන් මහතා - 2025 දෙසැම්බර් සිට මේ දක්වා.
4. යාපනය සහ වවුනියාව බන්ධනාගාර නැරඹීම සඳහා කැබිනට් ඇමතිවරුන් කිසිවෙකු මෙතෙක් ගොස් තිබේද යන්න පිළිබඳව අපි බන්ධනාගාර දෙපාර්තමේන්තුවෙන් විමසීමක් කරලා තිබෙනවා. ඒ සඳහා මෙතෙක් පිළිතුරක් ලැබී නැහැ. ඒ පිළිතුර ලැබුණු වහාම ඒ පිළිබඳව දැනුම් දෙන්නම්.
5. ඇතැම් බන්ධනාගාර රෝහල් තුළ වෛද්‍යවරුන් 2-3 අතර සංඛ්‍යාවක් සේවය කරනු ලැබේ. ඒ වාගේම සමහර බන්ධනාගාරවල - ප්‍රධාන බන්ධනාගාරවල - ඊට වැඩි සංඛ්‍යාවක් ඉන්නවා. එහිදී සේවා මුර ක්‍රමයට රාජකාරි සිදු කරන්නේ. නමුත් එක් වෛද්‍යවරයෙක් පමණක් සේවයේ නිරත වන බන්ධනාගාර රෝහල් තිබෙනවා. ඒ රෝහල්වල සාමාන්‍ය රාජකාරි වේලාව පැය 6ක් වෙනවා. ඒ වාගේම අමතර රාජකාරි වේලාවන් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම on-call රාජකාරිය පැය 24 පුරාම ක්‍රියාත්මක වෙනවා.
6. වෛද්‍යවරයෙක් රෝහලේ රැඳී නොසිටින අවස්ථාවලදී දුරකථනය මඟින් අවශ්‍ය උපදෙස් ලබා දීමට හැකියාව පවතී. නමුත් ඒ වෛද්‍යවරයාට සාධාරණ කාලයක් තුළ පැමිණ ඒ පිළිබඳව යම් තීරණයක් ගන්න පුළුවන්. වෛද්‍යවරයා පැමිණෙන වේලාව සහ රෝගියාගේ තත්ත්වය සලකා බලා එතැනදී ඒ පාලනාධිකාරියට තීරණයක් ගන්න පුළුවන්, ළඟම තිබෙන රෝහල වෙත ඒ සිරකරුවා රැගෙන යනවාද කියන කාරණය පිළිබඳව.
7. අදාළ හදිසි රෝගී තත්ත්වය ඇති වන අවස්ථාවේ බන්ධනාගාරය තුළ වෛද්‍යවරයෙක් සිටියහොත්, ඔහු විසින් අවශ්‍ය ප්‍රතිකාර වහාම ලබා දෙනවා. අර මම කියපු විධියට එහෙම නැති අවස්ථාවක් වුණොත් ඔහුගෙන් දුරකථන මාර්ගයෙන් උපදෙස් ලබාගන්න පුළුවන්. ඔහු එන වෙලාව සහ රෝගියා පත් වෙලා තිබෙන තත්ත්වය අතර ලොකු ප්‍රශ්නයක් තිබෙනවා නම්, ළඟම තිබෙන රෝහල වෙත රෝගියා රැගෙන යෑමට උපදෙස් දීලා තිබෙනවා.
8. 2025 සැප්තැම්බර් මස 26වන දින සිට ඔක්තෝබර් මස 09වන දින දක්වා යාපනය බන්ධනාගාරය තුළදී සිරකරු මරණ කිසිවක් සිදුවී නොමැති බව වාර්තා වේ.
9. බන්ධනාගාර රෝහල්වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි ක්‍රියාමාර්ග ගොඩක් අරගෙන තිබෙනවා. ඒ සඳහා වූ වෙනම අධ්‍යක්ෂවරයෙක් අපට ඉන්නවා. එතුමා මඟින් අපි ඊයේ දිනයේදීත් බන්ධනාගාර රෝහල් සම්බන්ධව විශේෂ සාකච්ඡාවක් පැවැත්වූවා. ඒ වාගේම බන්ධනාගාර රෝහල් තුළ, දැනට භාවිත කරන අපේ හැම රෝහලකම ඒ රෝහලේ තත්ත්වය මත අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව තිබෙනවා. පැනඩෝල් විතරක් තිබෙනවා කියන එක අපි පිළිගන්නේ නැහැ.

අපි දැක්කා, මීගමුව බන්ධනාගාරයේ සිරකරුවන් විසින් අපේ රෝහලේ ඖෂධ ගබඩාව කඩා දමා තිබුණු ආකාරය. එතැනත් ඖෂධ විශාල ප්‍රමාණයක් තිබුණා. ඒ කියන්නේ, ඒ ඒ බන්ධනාගාරවල රෝහලේ තත්ත්වය මත තිබිය යුතු අවශ්‍ය සියලු බෙහෙත් බන්ධනාගාරවලට අපි ලබා දී තිබෙනවා. ඒ වාගේම අපි දැනට ක්‍රියා කරගෙන යනවා, විශේෂයෙන්ම ජාතික රෝහල වාගේ තැනක සිරකරුවන් සඳහා වූ වෙනම වාට්ටුවක් සකසන්න තිබෙන අවශ්‍යතාව සම්බන්ධයෙන්. ඒ, රෝගීන්ගේ සහ සිරකරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන්.

ඒ වාගේම ඔබ දන්නවා, හොඳින් එළියේ ඉන්න හැම කෙනෙක්ම ලෙඩ වෙන්නේ බන්ධනාගාරයට ගියාම බව. පසුගිය කාලයේ අප එය දැක්කා. ඒ නිසා බන්ධනාගාර සේවකයින් සෑහෙන ප්‍රමාණයක් අපට අවශ්‍ය වනවා, මේ සිරකරුවන් රෝහල් කරා රැගෙන යෑමට. මොකද, ඔවුන්ගේ ඔක්කෝම medical checkups දාන්නේ, ඔක්කෝම රෝගී තත්ත්වයන් ඇති වන්නේ, bypass surgeries කරන්නේ, stents දාන්නේ වරදකට අහුවුණාට පසුව. එම නිසා ඒක නිකම් medical checkups කරන අවස්ථාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා සෑහෙන සිරකරුවන් ප්‍රමාණයක් අපේ සාමාන්‍ය රෝහල් පද්ධතිය තුළත් ප්‍රතිකාර ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා, do you need any clarification on the Answer?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි. මම ඒක Tamilවලින් අහන්නම්.

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் சொல்வதைப்போல, யாழ்ப்பாணம் சிறைச்சாலையில் வைத்தியசாலையொன்று இருக்கின்றது. அதாவது, வைத்தியசாலையென room ஒன்று இருக்கின்றது. அங்கு வைத்தியர் வருவார்; nurse ஒருவர் இருக்கிறார். அதை நான் ஏற்றுக்கொள்கின்றேன். வவுனியா சிறைச்சாலை என்பது உண்மையிலேயே சிறைச்சாலை அல்ல. அதுவொரு detention camp. தமிழீழ விடுதலைப் புலிகள் இருந்த காலத்தில், சந்தேகநபர்களைக் கொண்டுவந்து அடைக்கின்ற இடமாகத்தான் வவுனியா சிறைச்சாலை இருந்தது. அது ஒரு சிறைச்சாலையே இல்லை. கௌரவ மயில்வாகனம் ஜெகதீஸ்வரன் அவர்களே, நீங்கள் ஒரு தடவையேனும் அங்கு சென்று பார்க்க வேண்டும். ஏனெனில், அது ஒரு detention camp. அங்குள்ளவர்கள் திறந்த வெளியில்தான் நித்திரை கொள்வார்கள். அதாவது, அவர்கள் நிலத்தில்தான் இருக்கிறார்கள். அங்கு ஒருவருக்கு நெஞ்சு வலி என்றால், 'பெனடோல்'தான் கொடுப்பார்கள். இங்கிருக்கின்ற குறித்த மூன்று உறுப்பினர்களில் ஒருவர், வவுனியா சிறைச்சாலைக்கு ஒரு தடவை சென்று, அங்கு on-call doctor இருக்கிறாரா, இல்லையா எனப் பார்க்க முடியுமா? என்பதைத்தான் கேட்கின்றேனே ஒழிய, வேறெதுவும் கேட்கவில்லை.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු කථානායකතුමනි, මම හිතන විධියට, එතුමා ඉදිරිපත් කළේ ප්‍රශ්නයක් නොවෙයි. එතුමාගේ අදහස් දැක්වීමක් තමයි

කළේ. හැම බන්ධනාගාරයකම ඉන්න රැඳවියන්ගේ ජීවිත සුරක්ෂිත කිරීමට වෛද්‍යමය පැත්තෙන් අවශ්‍ය සියලු පියවර අපි අරගෙන තිබෙනවා. ඒ වාගේම එම පහසුකම් වැඩිදියුණු කරමින් පවතිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

2026.03.17 සහ 2026.04.08 යන දිනයන්හි ගරු රවී කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම.

## ක්‍රිප්ටෝ මුදල් සහ ඩිජිටල් වත්කම් ගනුදෙනු නියාමනය: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## CRYPTOCURRENCY மற்றும் டிஜிட்டல் சொத்து பரிவர்த்தனைகளின் ஒழுங்குமுறை: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## REGULATION OF CRYPTOCURRENCY AND DIGITAL ASSET TRANSACTIONS: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පළමුවෙන්ම ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ 2026.03.17 දින අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්.

1. Pursuant to Section 47(1) of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023, the Sri Lankan Rupee is the legal tender in Sri Lanka. Therefore, cryptocurrencies or any other digital or virtual currencies are not accepted as a payment in Sri Lanka.

   Crypto assets are not regulated in Sri Lanka as an asset class or a financial instrument. The Central Bank of Sri Lanka has not licensed or authorized any cryptocurrency trading platforms, digital asset exchanges, mining operations or related service providers to operate within the country.

   With regard to cryptocurrency trading, currently within Sri Lanka, such activities are neither formally legalized nor supported and occur outside the regulated financial systems, without regulatory oversight, investor protection or legal safeguards. Therefore, participation in cryptocurrency trading is undertaken entirely at the individual's own risk. Cryptocurrency exchanges are not licensed or supervised by any domestic regulatory authority.

2. Since 2018, the Central Bank of Sri Lanka has consistently emphasized that cryptocurrencies are not recognized as a legal tender in Sri Lanka and that if it remains unregulated, may pose significant financial and operational risks.

   As a result, on 16.04.2018 a press release had been made, warning the general public about the risk and other related issues. That report is available on the website, which I am not going to read out. Again, there was a press release in 2021 and another in 2022. Likewise, several press releases had been made, notifying that. *[Interruption.]* I will read the Answer quickly.

   Further, for the AML/CFT purposes, the Financial Intelligence Unit has started a phased-out approach to implement Financial Action Task Force Recommendations for Virtual Assets Service Providers. In line with this approach, the Financial Transactions Reporting Act, No. 06 of 2006 had already been amended and submitted to Parliament today for its approval to reflect the virtual asset service providers under the finance business definition, which would allow for AML/CFT supervision by the Financial Intelligence Unit on a limited scope.

3. Regulation No. 1 of 2026, issued under Section 7 of the Foreign Exchange Act, No. 12 of 2017 and published in Government Gazette Extraordinary No. 2213/34, govern capital transactions undertaken outside Sri Lanka by residents through the conversion of Sri Lankan Rupees into foreign exchange. These Regulations specify the permitted classes of capital remittances along with the applicable limits, procedures and related terms and conditions. Notably, the Regulations do not recognize investments in crypto assets issued or sold by non-residents as a permitted class of capital transactions.

4. No formal study has been carried out regarding cryptocurrency-related virtual assets or virtual assets-related transactions.

   (i) However, under Section 47 of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023, all currency notes and coins issued by the Central Bank of Sri Lanka are legal tender in Sri Lanka for the payment of any amount.

   (ii) Section 47(2) also provides that any transactions executed or liquidated between or among residents in Sri Lanka shall, unless otherwise authorized by the Central Bank for the purposes of the Foreign Exchange Act, No. 12 of 2017, be conducted in Sri Lankan Rupees.

   (iii) Direction No. 03 of 2021 prohibits resident cardholders from making foreign exchange payments for virtual currency transactions.

   Accordingly, the formal financial system cannot be utilized for cryptocurrency-related transactions. However, certain peer-to-peer transactions, where the Virtual Asset Service Providers do not involve, have been observed, which cannot be clearly identified or distinguished by the banking system.

5. Regarding taxation, any profits arising from cryptocurrency or related activities will be recognized by the Inland Revenue Department as other income. Information relating to the tax rate

and how it is being imposed will have to be collected from the IRD because, as of now, that information is not available.

6. Yes.

Section 7 of the Financial Transactions Reporting Act, No. 06 of 2006 mandates financial and designated non-financial institutions to report Suspicious Transaction Reports to the Financial Intelligence Unit. Accordingly, the FIU conducts an analysis and disseminates financial intelligence to appropriate Law Enforcement Agencies and Supervisory Authorities. This is carried out for a wide range of unlawful activities including cryptocurrency-related financial frauds.

In addition, the Law Enforcement Agencies have identified several cases linked to online investment scams, cyber-enabled fraud and cross-border fraud schemes, where proceeds were converted into virtual assets for movement or layering. The FIU has supported investigations related to cryptocurrency-related financial frauds by identifying wallets connected to the cases, using data obtained from suspected websites.

The FIU is actively coordinating with relevant Law Enforcement Agencies to obtain cryptocurrency-related transaction data from global cryptocurrency exchanges in support of ongoing investigations. Additionally, the FIU has facilitated the freezing of cryptocurrency assets held in wallets on foreign cryptocurrency exchanges, in compliance with court orders issued.

In several cases where Law Enforcement Agencies have seized non-custodial - private - wallets, the FIU has provided the necessary technical expertise and assistance to support the investigation processes.

7. In fact, Sri Lanka has been ranked 48th in the Chainalysis Global Crypto Adoption Index 2025, trailing regional leaders like India and Pakistan, indicating lower grassroots adoption compared to South Asian countries.

(i) However, since, 2018, the Central Bank of Sri Lanka has consistently emphasized that cryptocurrencies are not recognized as legal tender, remain unregulated and pose significant financial and operational risks to the public. Acknowledging these gaps, the Government recognizes that Sri Lanka is trailing international best practices and has initiated several measures to align with global standards. There are several web links given in that regard. Do you want me to read them out? - *[Interruption.]*

Actually, two national-level risk assessments had been conducted in 2021/2022 and 2024/2025 about Virtual Assets and Virtual Asset Service Providers.

(ii) Incorporating "Virtual Asset Service Providers" within the definition of financial institutions under the proposed Amendments to the Financial Transactions Reporting Act, No. 6 of 2006.

(iii) Implementing a phased-out AML/CFT supervisory framework for Virtual Asset Service Providers including a survey to identify existing Virtual Asset Service Providers operating in Sri Lanka.

(iv) Appointing a Ministerial-level Subcommittee on Virtual Asset Service Providers established under the policy guidance of the AML/CFT National Coordinating Committee to oversee the establishment of a prudential regulatory framework for Virtual Assets and Virtual Asset Service Providers.

(v) Draft a concept paper and road map for establishing a prudential regulatory authority for Virtual Asset Service Providers by the Subcommittee on Virtual Asset Service Providers.

(vi) The Cabinet Memorandum on Establishment of a Regulatory Framework and a Regulatory Body for Virtual Assets and Virtual Asset Service Providers - VASPs - in Sri Lanka was prepared by the Subcommittee and will be presented to the Cabinet shortly.

(8) The Government's approach is twofold in this regard:

(a) Preparing a regulatory approach to prudentially register and regulate Virtual Assets and Virtual Asset Service Providers. One of the Bills we are presenting today relates to Virtual Asset Service Providers.

(b) Preparing an Anti-Money Laundering and Countering the Financing of Terrorism regulatory approach via the Amendments to the Financial Transactions Reporting Act.

For the AML/CFT supervisory purposes, the FIU has started a phased-out approach to implement Financial Action Task Force Recommendations for Virtual Asset Service Providers.

In line with this approach, the Financial Transactions Reporting Act, No. 6 of 2006 has already been amended.

The proposed AML/CFT framework for Virtual Asset Service Providers, as implemented by the FIU with the approval of the Governing Board of the Central Bank of Sri Lanka, is structured according to the following timeline:

- July, 2025 to December, 2025 - Identification of Virtual Asset Service Providers and implementation of the awareness and outreach initiatives.
- January, 2026 to June, 2026 - Integration of Virtual Asset Service Providers into the AML/CFT framework, with the initiation of supervision and monitoring.
- July, 2026 to December, 2026 - Identification of a prudential regulator for Virtual Asset Service Providers.
- Four Subcommittee meetings were already held to discuss the way forward and for implementing the phased Action Plan.

As at 09th July 2026, the Cabinet Memorandum mentioned in Question No. 07 seeks the approval of the Cabinet of Ministers to designate the Securities and Exchange Commission of Sri Lanka as the prudential regulatory authority for Virtual Assets and Virtual Asset Service Providers by amending the Securities and Exchange Commission Act, No. 19 of 2021. Subject to the approval of the Cabinet of Ministers, other relevant legislations and/or related Regulations highlighted in the Cabinet Memorandum may require to be amended.

Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake, you can seek a short clarification on the Answer.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, may I point out that it reflects how helpless the Minister becomes when he has to represent an independent institution such as the Central Bank and Hon. Minister, you are stymied in responding to the Questions that had been raised. My Question is directly related to a matter under the Magistrate's Court, where a Rs. 290 million fraud had been committed through cryptocurrency. Now, is this a trading facility or not?

I asked a relevant question whether there is a tax evasion on that basis. If cryptocurrency is not accepted in the country, then it is illegal. If it is illegal, then a tax evasion takes place. So, how is it dealt with from there onwards? And, the Answer that was given, Sir, is a very clear sign that the stable door had been closed after the horse had bolted. Therefore, I would urge you all, as a Government, please take a decision as to how the Central Bank should respond to matters of this nature. There are three areas which basically make it illegal, and you were saying that they are conducting seminars.

The direct question I asked was, have there been monies earned and are they taxable? If they are not taxable, then it is illegal. Then, what action is being taken, as there are many people who are now saying that they have cryptocurrency as their asset base? So, Hon. Minister, I would like you to be more upfront. I say that this is a revenue source that could be used by the Government, and also being futuristic, you have got to look at it, not disband it. If you are doing so, please ensure that a legislation is brought in to say, "Yes, cryptocurrency is accepted and this is the way we intend going and this is the regulatory measure we intend taking". This is a revenue source for the Government as well and I am only trying to point out to you how you could get this legalized and make it representative so that it could be used as a mode of making investment. Do you know that President Trump has made US Dollars 1 billion on cryptocurrency last year? So, if the American President is able to do so, as a Government, you all must consider whether it could be accepted and if not, what are the consequences of that.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Thank you very much.

It is very clearly mentioned in the Answer. I do not know the litigation that you just highlighted in that regard. But, with respect to cryptocurrencies, it was very clear mentioned that Sri Lankan Rupee is the legal tender and that others are not allowed. As of now, trading or exchanges in cryptocurrency are not allowed and are not recognized.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, are all those illegal?

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
They are not illegal. The Virtual Assets Service Providers can offer their services and peer-to-peer transaction may also take place. However, there is no possibility for using electronic cards such as debit cards, credit cards or any such thing when acquiring assets. That is why, for tax purposes or assessing the taxable income, it has to be assessed by the Inland Revenue Department - IRD. That is the situation as of now. If you ask a separate question, we will collect the relevant data and respond. If you maintain a crypto asset - a digital asset - maybe, in trading, value appreciation or for any other purpose and earn a capital gain and had it been declared, a tax would have been charged, for sure. - *[Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, now you can move on to the Answer for the next Question raised by him under Standing Order No. 27(2) on 08.04.2026.

## විදේශ විනිමය ගනුදෙනුවලදී ගෝලීය වශයෙන් පිළිගත් ඩිජිටල් ගෙවීම් වේදිකා භාවිතය: මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## வெளிநாட்டுப் பரிவர்த்தனைகளின்போது உலகளவில் அங்கீகரிக்கப்பட்ட டிஜிட்டல் கட்டண தளங்களைப் பயன்படுத்துதல்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று
## USE OF GLOBALLY RECOGNIZED DIGITAL PAYMENT PLATFORMS IN FOREIGN EXCHANGE TRANSACTIONS: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
Sir, this Question raised by the Hon. Ravi Karunanayake on 08.04.2026 also relates to currency and the Answer is as follows:

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

1. The legal tender of Sri Lanka is the Sri Lankan Rupee.

   There are 16 designated foreign currencies, which consist of the United States Dollar, the Euro, the Sterling Pound, the Australian Dollars, the Singapore Dollar, the Swedish Kroner, the Swiss Franc, the Canadian Dollars, the Hong Kong Dollar, the Japanese Yen, the Danish Kroner, the Norwegian Kroner, the Chinese Renminbi, the New Zealand Dollar, the Indian Rupee and the Thai Baht.

   When designating a foreign currency, the trade and investment activities between the countries are considered so that additional costs associated with dual conversion would be reduced.

2. The Japanese Yen, the Chinese Renminbi and the Indian Rupee are among the 16 foreign currencies recognized as designated currencies, in which foreign currency bank accounts may be opened and maintained. Foreigners could also exchange these currencies at banks which function as Authorized Dealers - ADs - and Authorized Money Changers - AMCs.

   At the moment, Sri Lanka has linked with India's UPI system and WeChat Pay, AliPay and UnionPay systems of China. That will provide the facility for Indian and Chinese tourists to use their home country payment apps in Sri Lanka, where their bank accounts linked to the apps are used for payments in Sri Lanka.

3. The Central Bank of Sri Lanka has not imposed any restrictions on Authorized Dealers or Authorized Money Changers on the types of foreign currencies they may accept or purchase. The Authorized Dealers and Authorized Money Changers will decide to purchase foreign currencies based on market demand and supply conditions, subject to assessment of associated risks of such transactions.

4. Telegraphic Transfer, which we normally call TT, buying and selling rates are determined by licensed commercial banks in line with the prevailing foreign exchange market conditions. These rates incorporate several key factors including forex liquidity, transaction and operational costs, market volatility premiums and settlement risk considerations.

   Under normal market conditions characterized by stable exchange rate and adequate liquidity, the spread between TT buying and selling rates is typically narrow, reflecting lower risk and cost margins. Conversely, during periods of exchange rate pressure or heightened volatility, banks may widen this spread to account for increased uncertainty, reduced liquidity and higher risk exposure.

   The Central Bank of Sri Lanka maintains regulatory oversight of these practices by continuously monitoring the spreads applied by licensed banks. In instances where spreads exhibit abnormal or unjustified deviations, the Central Bank engages with the relevant institutions to ensure alignment with prudent market conduct and to promote stability and transparency in the foreign exchange market.

5. Even though Banks engage in foreign exchange transactions with different categories of stakeholders, profits are not classified along such categories. Therefore, the Central Bank does not generate profits from handling foreign exchange transactions with the Government and does not engage in transactions with the public.

6. There are no restrictions for the international payment platforms to operate in Sri Lanka subject to the existing regulatory framework. As a result of the discussions held with relevant stakeholders, measures have been taken to operationalize PayPal service in Sri Lanka for the purpose of receiving export proceeds. Further, some banks are already providing fund receiving facilities through Wise.

7. Several Licensed Commercial Banks - LCBs - have partnered with international service providers similar to PayPal such as Wise and Payoneer to facilitate seamless inward remittances to Sri Lankan freelancers, start-ups and SMEs engaged in cross-border trade and services.

8. To introduce a prudential regulatory framework for Virtual Assets - VAs - and Virtual Asset Service Providers - VASPs - a Subcommittee, which was also referred to in the previous Answer as well, was established under the National Coordinating Committee on AML/CFT chaired by the Governor of the Central Bank. The Subcommittee on Virtual Asset Service Providers, which is led by the Deputy Minister of Digital Economy, consists of 33 members, representing a wide range of stakeholders.

   That Subcommittee works on a time-bound plan addressing the following areas :

   - Policy and preparation;
   - Mandatory registration;
   - Asset Class and taxation; and
   - Full licensing.

   Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Ravi Karunanayake, you can seek a clarification.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගන්න අවශ්‍ය වන්නේ මෙයයි. මීට සුමාන දෙකකට ඉස්සෙල්ලා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, අපනයන ක්ෂේත්‍රයෙන් US Dollar 1 billion, ඒ කියන්නේ රුපියල් බිලියන 340ක විතර ප්‍රමාණයක් අපේ රටට ඇවිල්ලා නැහැ කියලා. ඒ කාරණය ගැන අනිවාර්යයෙන්ම සෝදිසි කරන්න අවශ්‍ය වනවා. මම cryptocurrency ගැන අහපු ප්‍රශ්නයේදී, තවම මේ සම්බන්ධයෙන් නීතිමයභාවයක් තිබෙනවා ද, නැද්ද කියන එකේ ප්‍රශ්නය ඉස්මතු වෙන්නේ ඒ නිසායි. ගිය සුමානේ ඇවිල්ලා කියන්න අවශ්‍ය වුණේ, මේක නීතිගත වෙලා නැති නිසා මේ රටේ මූල්‍ය සම්පත් වක්‍රශීලීව රටින් පිට කිරීම තමයි වෙලා තිබෙන්නේ කියලා. ගරු ඇමතිතුමනි, 8වන ප්‍රශ්නයෙන් මම ඇහුවේ මේ සම්බන්ධවයි. හිරිකැටිය, පොතුවිල්, නුවරඑළිය සහ ඇල්ල වාගේ ප්‍රදේශවල

සංචාරක කර්මාන්තය ඉතාම සාර්ථක ලෙස කෙරෙන තත්ත්වයක් තිබෙන්නේ. ඒකේ payment platforms මේ රටේ මහ බැංකුව තුළින් නොවෙයි ක්‍රියාත්මක වෙන්නේ. කෙළින්ම වෙනත් රටකට තමන්ගේ සල්ලි ගෙවීමේ හැකියාව තිබෙනවා. ඔබතුමන්ලා ආදායම් හොයන්න පුළුවන් අවස්ථා ඇති කරනකොට කෙළින්ම ගෙවීම තුළින් ඇමතිතුමනි, සියයට 30ක් වන VAT එක, SSCL එක, NBT සහ අනෙක් වක්‍රශීලී බදු ටිකේ සියයට 35ක් ගෙවන්නේ නැහැ. වෙනත් payment platform එකක් පාවිච්චි කළොත් සුද්දා රටට ගෙවන සල්ලි ටික ආයිත් පිටින් එවලා අපේ ආදායම් බදු ලැබෙන්නේ නැහැ. ලාංකිකයන් කටයුතු කිරීමේදී සියලු බදුත් එක්ක තරග කරන්න තිබෙනවා. මේ දෙකට තවම ඍජු උත්තරයක් මහ බැංකුව තුළින් ඔබතුමන්ලාට ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් තමයි තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මම කාරුණිකව ඉල්ලා සිටිනවා මෙය නිවැරදි කරන්න කියලා.

සුද්දාට එක නීතියකුත්, ලාංකිකයන්ට තව නීතියකුත් ඇයි? මේ රටේ මෙහෙම කරන්න එපා. ගරු ඇමතිතුමනි, මහ බැංකුව තුළ ඔබතුමා ඔය විධියට අසරණ වෙන්න එපා. ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් තිබෙනවා. මහ බැංකුවේ තිබෙන ස්වාධීනත්වය වැරදියි කියලා කියනවා. අපි කියන්නේ, කරුණාකරලා රටේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කරන්න කියලායි. මම ඒ ඉල්ලීම ඔබතුමාගෙන් කරනවා. ඒකට ඍජු පිළිතුරක් දෙන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කරුණු කිහිපයක් මතු කළා. ප්‍රධාන වශයෙන්ම ගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කළ කාරණය. ඒ තමයි, ලංකාවෙන් ඩොලර් බිලියනයක් පමණ එළියට ගියා කියන කාරණය. *[බාධා කිරීමක්]* ඔව්, එතුමා කිව්වා. ඒක ඇත්ත. හැබැයි, අපනයනය සඳහා නොවෙයි, ආනයනය සඳහායි භාවිත කර තිබෙන්නේ. ඒ කියන්නේ, අපේ රට ඇතුළේ advance payments කරන්න පුළුවන්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආනන්ද විජේපාල ඇමතිතුමා-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඔබතුමා පිළිතුර ලබා දී අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ඒ කියන්නේ, අපනයනවලින් මුදල් ගෙන එනවා ද, නැද්ද කියන කාරණය. අවසානයේ රට ඇතුළේ තිබුණු ඩොලර් එළියට ගියා කියන කාරණය. ඇත්තටම දැන් ඒ පිළිබඳව පරීක්ෂණ සිදු වෙමින් තිබෙනවා. ඒ පිළිබඳව යම් කණ්ඩායම් අත්අඩංගුවට පත් කරගෙනත් තිබෙනවා. තනි පුද්ගලයෙක් විසින් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි, එය ජාලයක් විධියට operate වෙලා තිබෙන්නේ. අපි ඒකයි ක්ෂණිකව තීන්දුවක් ගත්තේ, ආනයන ලියාපදිංචි කරන කණ්ඩායම්වලට LCs open කරන එක සම්බන්ධ කරන්න කියලා. දැන් ඒක වේගයෙන් සිද්ධ වෙමින් යනවා. මේ පද්ධතිය ඇතුළේ විවිධ වූ ක්‍රමවේද, loopholes ගොඩක් තිබෙන නිසා තමයි අනීතික විධියට ඒ ගනුදෙනු කරලා තිබෙන්නේ. අපි පියවරෙන් පියවර උත්සාහ කරමින් තිබෙන්නේ ඔබතුමන්ලාගේ අදහසුත් අරගෙන මේක ශක්තිමත් කරගෙන මේ නීති විරෝධී ගනුදෙනු ඉවත් කර ගන්න තමයි.

කෙසේ වෙතත්, අපි cryptocurrencyවලට ආවොත්, trading allow කරන්නේ නැහැ. මොකද, ඒ පිළිබඳව regulate කරන්න තවම තත්ත්වයක් ඇති වෙලා නැහැ. නමුත්, Service Providersලාගේ තත්ත්වයට අපි පත් කරලා තිබෙන්නේ, Financial Action Task Force එකේ ක්‍රියාදාමයක් විධියට, anti-money laundering සහ countering the financing of terrorism කියන කාරණයත් එක්කයි. ඒ නිසා අපි පළමුවෙන් සිදු කළ යුතු වන්නේ මෙන්න මේ නියාමන කාර්යය ශක්තිමත් කරගෙන ඉදිරියට ඒම. ඒ වාගේම අපි හඳුපු payment gateways එකේදී අපට සිද්ධ වන්නේ ගරු මන්ත්‍රීතුමනි, පියවරෙන් පියවර යන්නයි. මොකද, ලෝකය පුරා විවිධාකාරයෙන් හදා ගත්ත payment gateways තිබෙනවා. ඒවායේ තිබෙන authenticity එක, risk එක දන්නා නිසා දැනට යම් ප්‍රමාණයක් අනුමත - allow - කරලා තිබෙනවා. අපි ඉදිරියේදී Financial Action Task Force එකේ තිබෙන recommendation එක මතත්, ඔබතුමන්ලා දක්වන අදහස් මතත්, අදාළ ක්‍රියාමාර්ග ගන්න උත්සාහ කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා.

2026.05.07 දින ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## හමුදාව විසින් අත්පත් කරගත් උතුරු ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම: ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## வடக்கில் இராணுவத்தால் கையகப்படுத்தப்பட்டிருக்கின்ற தனியார் காணிகளை விடுவித்தல்: பாதுகாப்புப் பிரதி அமைச்சரினது கூற்று

## RELEASE OF PRIVATE LANDS IN THE NORTH ACQUIRED BY THE MILITARY: STATEMENT BY DEPUTY MINISTER OF DEFENCE

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා. ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා මේ යටතේ ප්‍රශ්න 14ක් අසා තිබෙනවා. ඒවාට පිළිතුරු මෙසේයි.

1. එතුමා පෙන්වා දීලා තිබෙන්නේ අපි අත්පත් කරගෙන ඇති ඉඩම් කියලා. අත්පත් කරගෙන නොවෙයි, අවශ්‍යතාව සඳහා භාවිත කිරීම සඳහා තමයි අපි ඒ ඉඩම් ලබාගෙන තිබෙන්නේ. එම ඉඩම් ප්‍රමාණය; ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව දැනට ලබාගෙන තිබෙන ප්‍රමාණය සහ භාවිත කරන ප්‍රමාණය පිළිබඳ විස්තර පහත වගුවෙහි දක්වා තිබෙනවා, 1 වෙනි ප්‍රශ්නයට පිළිතුර හැටියට.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

| දිස්ත්‍රික්කය | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ඉඩම් ප්‍රමාණය | | එකතුව (අක්කර) | ශ්‍රී ලංකා නාවික හමුදාව ඉඩම් ප්‍රමාණය | | එකතුව (අක්කර) | ශ්‍රී ලංකා ගුවන් හමුදාව ඉඩම් ප්‍රමාණය | | එකතුව (අක්කර) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | රජය | පෞද්ගලික | | රජය | පෞද්ගලික | | රජය | පෞද්ගලික | |
| යාපනය | 590.26 | 1.897.66 | 2.487.92 | 275.53 | 183.49 | 459.02 | 774.98 | - | 774.98 |
| කිලිනොච්චිය | 635.33 | 87.88 | 723.21 | 354.68 | 0.31 | 354.99 | 941.47 | - | 941.47 |
| මුලතිව් | 3,603.64 | 101.23 | 3,704.87 | 301.23 | 399.22 | 700.45 | 609.84 | - | 609.84 |
| මන්නාරම | 715.39 | 38.00 | 753.39 | 1119.58 | 102.2 | 1221.78 | 127 | - | 127 |
| වවුනියාව | 924.35 | 94.26 | 1,018.61 | - | - | | 413.37 | - | 413.37 |
| | | | | | | | 399.31 | - | 399.31 |
| **එකතුව** | **6468.97** | **2219.03** | **8688.00** | **2051.02** | **685.22** | **2736.24** | | | **3265.97** |

2. පලාලි ජාත්‍යන්තර ගුවන් තොටුපළ ද පිහිටා ඇත්තේ YA/TLL/2025/276 දරන නව අනුරේඛනයෙහි සලකුණු කර ඇති ඉඩම් කොටස්වල මුළු භූමි ප්‍රමාණය වන අක්කර 774.98ක වූ ඉඩම් කොටස තුළයි. තවද, මෙම ඉඩම් කොටස තුළ ගුවන් හමුදාව සහ සිවිල් ගුවන් සේවා අධිකාරිය හා ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම සමඟ ඒකාබද්ධව මෙම මෙහෙයුම් සිදු කරමින් පවතිනවා. නමුත් අලුත් ඉඩම් ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළදී සිවිල් ගුවන් සේවා අධිකාරිය හා ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම හා ගුවන් හමුදාවේ සීමාවන් වෙන් වෙන් වශයෙන් නිර්ණය කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතිනවා.

3. ඉස්සෙල්ලා ප්‍රශ්නයට අදාළ පිළිතුරේ සඳහන් කර ඇති පරිදිම, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉඩම් අක්කර 774.98ක ප්‍රමාණයක් තමයි දැනට පාවිච්චි කරන්නේ.

4. වර්තමාන ඉඩම් ලබා ගැනීමේ ක්‍රියාවලියට සමගාමීව යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළේ අනාගත සංවර්ධනය සඳහා ඉඩම් අවශ්‍යතාව සම්බන්ධයෙන් මැනුම් කිරීමට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය පිළිබඳව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් සිදු කරන ලද ඉල්ලීමට අනුව ගුවන් හමුදාව මඟින් වාර්තාවක් ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර තිබෙනවා.

එහිදී වර්තමානයේ පලාලි ගුවන් තොටුපළ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව භාවිත කරන සීමාවෙන් ඔබ්බට ඇති ඉඩම් ලබා ගැනීම පිළිබඳව ඉඩම් අමාත්‍යාංශය, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ ප්‍රාදේශීය ලේකම් වලිකාමම් උතුර තෙලිප්පලෙයි හා ඒකාබද්ධව කටයුතු කිරීම සුදුසු යැයි අපි වාර්තා කර තිබෙනවා. තවද, ආරක්ෂක අමාත්‍යාංශය, සිවිල් ගුවන් සේවා අධිකාරිය හා යාපනය දිස්ත්‍රික් ලේකම් එක්ව සාකච්ඡාවක් සිදු කර ඉඩම් කට්ටි නිශ්චිතව හඳුනා ගැනීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතිනවා.

5. මෙම ප්‍රදේශය තුළ හමුදාව විසින් වගා කටයුතු සිදු කරන්නේ නැහැ. කෙසේ වුවද, නිලධාරින් සහ හමුදා භට පිරිස් සඳහා අවශ්‍ය ආපනශාලා සහ කරණවැමි පහසුකම් ආදිය හමුදා ක්‍රමවේද අනුව සිදු කරනු ලබනවා.

ව්‍යාපාර කටයුතු සඳහා මෙම ඉඩම් ලබා ගෙන භාවිත කරන්නේ නැහැ.

6. මේ සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - වලිකාමම් උතුර වෙතින් ලබා ගැනීම සුදුසු බව නිර්දේශ කරනු ලබනවා.

7. ඔව්.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පවතින රෝහල සඳහා අත්‍යවශ්‍ය ගොඩනැඟිලි ඉදි කරමින් සහ අලුත්වැඩියා කටයුතු සිදු කරමින් පවතිනවා.

8. පලාලි යුද්ධ හමුදා රෝහල ස්ථාපිත ඉඩම් ප්‍රමාණය අක්කර 27.90ක් වන අතර, එම ඉඩම් කොටස පලාලි අධිආරක්ෂිත කලාපය වෙත අයත් වන්මන් යුද්ධ හමුදාව වෙත විධිමත්ව පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින සම්පූර්ණ ඉඩම් ප්‍රමාණයට ඇතුළත්ව තිබෙනවා.

9. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මඟින් එම රෝහල සඳහා මේ වසරේ - 2026 වසරේ - වෙන් කර ඇති මුළු හමුදා වියදම පහත පරිදි වෙනවා.

- රෝහලේ ඉදිකිරීම් සේවාව ඉටු කිරීම සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ වටිනාකම රුපියල් මිලියන 99.30යි.
- රෝහලේ ඉදිකිරීම් සඳහා මේ දක්වා වැය කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 55යි.
- රෝහලෙහි ඉදිකිරීම් කටයුතු සඳහා 2026 වර්ෂයෙහි වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 42.11යි.

10. මෙම රෝහල මේ වන විටත් යුද්ධ හමුදා පරිහරණයේ පවතින ඉඩම් ප්‍රමාණයන් තුළම ඉදි කරමින් පවතිනවා.

මේකට ජනතාවගේ කිසිම විරෝධයක් මතු වෙලා නැහැ.

11. ත්‍රිවිධ හමුදා පරිහරණයෙන් බැහැර කළ හැකි සෑම ඉඩම් කොටසක්ම නැවත අයිතිකරුවන්ට පවරා දීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම, හැකි සෑම ඉඩමක්ම නැවත සිවිල් ජනතාව වෙත ලබා දීමට කටයුතු සිදු කර තිබෙනවා. සැහෙන ඉඩම් ප්‍රමාණයක් ලබා දීලාත් තිබෙනවා.

12. ත්‍රිවිධ හමුදා පරිහරණයට අත්‍යවශ්‍ය යැයි හඳුනාගත් ඉඩම් කොටස් එකී පරිහරණයෙන් බැහැර කිරීමට මෙම අවස්ථාවේ හැකියාවක් නැහැ.

ඒ සම්බන්ධයෙන් දන්වලාත් තිබෙනවා. නමුත්, අපි පලාලි මාර්ගයේ නැඟෙනහිර ප්‍රදේශයේත් අක්කර විශාල ප්‍රමාණයක් ලබා දී තිබෙනවා, ගොවිතැන් කටයුතු සඳහා. ඒත් එක්කම, ගුවන් හමුදාව පරිහරණයට ගෙන තිබෙන අක්කර 253කට අදාළව 453දෙනෙකු සඳහා වන්දි මුදල්ද ලබා දීමට දිස්ත්‍රික් ලේකම් මාර්ගයෙන් අපි කටයුතු කර තිබෙනවා. ඒ කටයුතුත් දැන් විධිමත් කරන්න සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ සම්බන්ධව කටයුතු කර තිබෙනවා.

13. යුද්ධ හමුදා රෝහල ඉදිකිරීම සඳහා රජයේ මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

14. පලාලි යුද්ධ හමුදා රෝහල ස්ථාපිත ඉඩම් කොටස පහත සඳහන් කරුණු හේතුවෙන් යුද්ධ හමුදා පරිහරණයෙන් නිදහස් කිරීමට හැකියාවක් නොමැති බවයි අපේ අමාත්‍යාංශය දන්වන්නේ.

- මෙම ඉඩම් කොටස ඇතුළත් පලාලි අධිආරක්ෂිත කලාපය තුළ වත්මනෙහි යුද්ධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන සම්පූර්ණ අක්කර 1,661.0227ක ඉඩම් ප්‍රමාණය යුද්ධ හමුදාව වෙත විධිමත්ව පවරා ගැනීමේ කටයුතු සහ ඉඩම් හිමි සිවිල් ජනතාව වෙත වන්දි මුදල් නිරවුල් කිරීමේ කටයුතු මෙම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ සිදු කරමින් පවතිනවා.
- මෙම රෝහල මඟින් යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි එම බල ප්‍රදේශයන්හි ස්ථාපිත සියලු යුද්ධ හමුදා කඳවුරුවල රාජකාරි කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයන් වෙත අවශ්‍ය සියලු වෛද්‍ය පහසුකම් ලබා දීම සහ හදිසි ප්‍රතිකාර අවශ්‍යතාවන්හිදී නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ සාමාජිකයන් වෙත ද අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සිදු කරනු ලබනවා.
- ඉල්ලුම් කරනු ලබන ඉඩම් කොටසට ඉතා ආසන්නයේ පලාලි ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි ගුවන් යානා ගුවන්ගත කරනු ලබන කලාපය පිහිටා තිබීම හේතුවෙන් සහ එහි ආරක්ෂාවට මෙන්ම ජාතික ආරක්ෂාව වෙනුවෙන්ද යුද්ධ හමුදාව වෙත උපායමාර්ගික හා උපක්‍රමික වශයෙන් මෙම යුද්ධ හමුදා රෝහල ස්ථාපිත ඉඩම් ප්‍රමාණය යුද්ධ හමුදාව වෙත අත්‍යවශ්‍ය බවයි අප දන්වා සිටින්නේ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, ඔබතුමාට කෙටි පැහැදිලි කර ගැනීමකට අවස්ථාව තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதி அமைச்சர் அவர்கள் யாழ்ப்பாணம் வருகின்றபோது, வலி. வடக்கு காணிகளின் கிழக்குப் பகுதிகள், Army வைத்தியசாலை, மயிலிட்டி பிரதேசம் எல்லாம் விடுவிக்கப்படுமென்ற மிகப் பெரிய நம்பிக்கை எனக்கு இருந்தது. ஆனால், இன்றைக்கு தரப்பட்டுள்ள பதிலில் சொல்லியிருக்கிறார்கள், எந்தப் பொதுமக்களும் ஆர்ப்பாட்டம் செய்யவில்லை என்று. எனக்கு விளங்கவில்லை! எனக்கு உங்கள்மீது இருந்த நம்பிக்கை போய்விட்டது. அவ்வளவுதான்! தமிழ் மக்கள் உங்கள்மீது வைத்துள்ள நம்பிக்கையை நீங்களே கெடுத்துக்கொள்கிறீர்கள். நீங்களே சொல்கிறீர்கள், வைத்தியசாலையை விடுவிக்கமாட்டோம், வலி. வடக்கு காணிகளை விடுவிக்கமாட்டோம், Myliddy Army Campஐ விடுவிக்கமாட்டோம் என்று.

ஐயா! இங்கு சில பேர் இருக்கிறார்கள், cancer வந்த பிறகும் சாகும் வரைக்கும் அரசியல் செய்வதற்காக அந்த இடங்களை வைத்துக்கொண்டு. நீங்கள் எடுக்கின்ற முடிவுகளில் இருக்கின்ற பிழையான விடயங்களை வைத்துக்கொண்டு இவர்கள் சாகும் வரைக்கும் அரசியல் செய்ய நினைக்கிறார்கள். ஏற்கெனவே, KKSஐ எப்படி பரம்பரை பரம்பரையாக விற்றுத் தொலைத்தார்களோ, அதேமாதிரி இந்த விடயத்தையும் வைத்துக்கொண்டு சாகும்வரை அரசியல் செய்வார்கள். அதுதான் நடக்கும்! இந்த அரசியல்வாதிகள், உங்களுடைய இவ்வாறான சிறிய தவறுகளைப் பயன்படுத்தி, சிங்கள மக்கள் வடக்கில் காணிகளைப் பிடிக்கிறார்கள் என்ற பெரிய பொய்யை தமிழ் மக்கள் மத்தியில் கொண்டுபோய், cancer வந்து செத்த பிறகும் அரசியல் செய்வார்கள். ஆகவே, சிந்தியுங்கள்! நாங்கள் உங்களிடம் பல தடவை சொல்லியிருக்கிறோம், தயவுசெய்து காணி தொடர்பான விடயங்களைக் கதைக்கும்போது யோசித்து கதைக்குமாறு. சரியான கவலையாக இருக்கின்றது. நேரடியாக கேள்விக்கு வருகின்றேன். நீங்கள் சொல்லியிருக்கிறீர்கள், அங்கு விவசாயம் செய்யவில்லை என்று. ஆனால், அங்கு வாழைத்தோட்டம், தென்னந்தோட்டம் என எல்லாமே இருக்கின்றன. அங்கு போராடுகின்ற மக்களை இவர்கள்தான் பாவிக்கிறார்கள். வேறு யாருமல்ல. அவர்களைப் பாவித்து 30 பேர் இருந்து சண்டை பிடிக்கிறார்கள். நீங்கள் அந்த மக்களுக்கு என்ன பதில் சொல்லப் போகிறீர்கள்? அவர்கள் எங்கு போய் வாழ்வது? நீங்கள் காசு கொடுக்கப் போகின்றீர்களா? -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා, සර්.

சுமந்திரன் அவர்கள் சொல்லியிருக்கிறார், தான் தாக்கல் செய்த வழக்கில், நீதிமன்றத்துக்கு ஒரு மாதத்துக்குள் நீங்கள் விடுவிக்கக்கூடிய காணிகளின் அளவைச் செல்வதாக. ஆக, உங்களுக்குத் தேவை, சுமந்திரனும் இங்கே cancer வந்தும் சாகாமல் இருக்கின்ற சிலரும் தமிழ் மக்களின் வலியை வைத்து அரசியல் செய்ய வேண்டும் என்பதா? அவ்வளவுதான் உங்களுக்குத் தேவையா? இப்படியே இந்தப் பிரச்சினையை தமிழ் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் இடையில் கொண்டுபோகப் போகிறீர்களா? தயவுசெய்து, பதிலைச் சொல்லுங்கள்!

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා එහෙම කියන්න ඇත්තේ එතුමාගේ දේශපාලන කටයුතු සම්බන්ධයෙන් වෙන්න ඇති. නමුත් අපේ දේශපාලනය එහෙම නැහැ. අපි හරි වගකීමෙන් කටයුතු කරන්නේ. මේ පිළිතුරුත් ඒ විධියටයි දෙන්නේ.

ඔබතුමාගේ දැනගැනීමට මම කෙටියෙන් කියන්නම්. ඒ සංග්‍රාමය අවසන් වුණාට පස්සේ 2009 ඉඳලා මේ දක්වා උතුරු සහ නැඟෙනහිර අක්කර 64,663ක් නිදහස් කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ඉන්න මම කියනකම්. *[බාධා කිරීමක්]* ඒක තමයි මේ කියන්නේ. ඉන්නකෝ තවම පිළිතුර ඉවර කළේ නැහැ නේ.

නාවික හමුදාව අක්කර 2,706ක්, ගුවන් හමුදාව අක්කර 3,391ක්. මුළු ගණන ගත්තොත්, අක්කර 68,000ක් 2024 අවසාන මාසයේ සිට මේ දක්වා අපි නිදහස් කරලා තිබෙනවා. අපි බලයට පත් වුණාට පස්සේ 2024 ඉඳලා 2026 ජනවාරි වෙනකම් අක්කර 692ක් නිදහස් කරලා තිබෙනවා. මේ අවුරුද්දේ මුල සිට මේ දක්වා අක්කර 377ක් යුද සහ නාවික හමුදා විසින්, - ගුවන් හමුදාව නිදහස් කරලා නැහැ - නිදහස් කරලා තිබෙනවා. ඉදිරියට තව අක්කර 243ක් නිදහස් කරන්නත් අපි කටයුතු සලස්වාගෙන යනවා.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

මම ඉස්සෙල්ලා කිව්ව විධියට, පලාලි නැගෙනහිර ප්‍රදේශයේ හමුදා ජනපදය පිහිටි කලාපයේ ඉඩම් අතුරින් අක්කර 234ක් වගා කටයුතු සඳහා භාවිත කරන්න 2024 මාර්තු මාසයේ ඉඳලා අපි ඉඩ දීලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මම ගියා යාපනේට. ඔබතුමා හිටියේ නැහැ. මම ජනතාව හම්බ වුණා. ඒ හැමෝම එක්ක කථා කළා. රාජ්‍ය නිලධාරීන් හම්බ වුණා, දේශපාලන අධිකාරිය හම්බ වුණා. මම කෝවිල්වල ගිහිල්ලා කුරුක්කාල්තුමන්ලාට කථා කළා, ගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි. ඔබතුමා හිටියේ නැති එකට මට කරන්න දෙයක් නැහැ. පසුගිය සුමානයට කලින් සුමානයේ පාර්ලිමේන්තුවේදී ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා, වරාය සහ සිවිල් ගුවන් සේවා ඇමතිතුමා ඇතුළු දේශපාලන අධිකාරිය සහ වලිකාමම් උතුර දිසාපතිතුමා සහ ප්‍රාදේශීය ලේකම් එක්ක විශේෂ සාකච්ඡාවකුත් තිබ්බා, මේ ඉඩම් ඉක්මනින් නිදහස් කරන්නේ කොහොමද කියලා. ඉතින් හරිම කනගාටුයි. *[බාධා කිරීමක්]* ඔබතුමාට දැන ගන්න කියන්නේ, උතුරේ විතරක් අක්කර 23,850කින් release කරලා තිබෙනවා, 21,280ක්. මම ගියේ මල් මාලා දමා ගන්න නොවෙයි නේ. ඔබතුමාට ලැබුණු මල් මාලා කොයි විධියද කියලා ඔබතුමාම දන්නවා නේ. බිමේ ඉන්න මිනිස්සු මා එක්ක හොඳට කථා කළා. ඒ වාගේම මමත් ගිහිල්ලා කථා කළා. මන්ත්‍රීතුමාට දෙන්න තිබෙන පිළිතුර ඉතාම සාධාරණව දුන්නා.

ගරු කථානායකතුමනි, එච්චරයි මට කියන්න තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා කැල්වරි දේවස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත
### இலங்கை கல்வாரி தேவஸ்தானம் (கூட்டிணைத்தல்) (திருத்தம்) சட்டமூலம்
### CALVARY CHURCH OF SRI LANKA (INCORPORATION) (AMENDMENT) BILL

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Speaker, I move,

> "That leave be granted to introduce a Bill to amend the Calvary Church of Sri Lanka (Incorporation) Act, No. 2 of 1999."

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Buddhasasana, Religious and Cultural Affairs for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා.

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம்
## PREVENTION OF MONEY LAUNDERING (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ විෂය අංක 3 - ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත ද මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne to start the Debate. You have ten minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
It is under Standing Order Nos. 76(1), 91(h) and 92(2)(a).

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම ඇඳගෙන ඉන්න dress එක ගැන imputation එකක් කළා, ආණ්ඩු පක්ෂයෙන්. කරුණාකරලා ඒගොල්ලන්ට කියන්න මේක veshti එකක්; දෙමළ මිනිස්සු අඳින එකක් කියලා. කරුණාකරලා ඒක කියන්න.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, that was sorted out.

Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you may commence your speech now.

[පූ.භා. 11.51]

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉතාම වැදගත් පනත් කෙටුම්පත් 3ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් අද වැනි ජූලි 9වැනි දා දිනෙක, හිටපු ජනාධිපතිවරයෙක් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙලා පැනලා ගිය දවසක මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීමට ලැබීමම දෛවෝපගත සිද්ධියක්. මේක අපි ජනතාවට දීපු පොරොන්දුවක්. ඒ කියන්නේ, අපේ ආර්ථිකය ශක්තිමත් කරනවා, හොරකම් කරපු දේපළ අපි ආපසු පවරා ගන්නවා, විනිවිදභාවයෙන් යුතු පාලනයක් අපි සහතික කරනවාය කියා ජනතාවට දුන් පොරොන්දු ඉටු කිරීමේ එක්තරා පියවරක් විධියට මම මේවා දකින්න කැමැතියි.

අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් තුනෙන් එකක් තමයි, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත. ඒ කියන්නේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පතත්, ඒ වාගේම 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පතත්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පතත් අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

මේ පනත් කෙටුම්පත් තුන ගැන දළ වශයෙන් හැඳින්වීමක් කළොත්, ඇත්තටම මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත වාගේම, අනෙක් පනත් කෙටුම්පත් දෙකත් අද ලංකාව මුහුණ දී තිබෙන තත්ත්වයට අත්‍යවශ්‍ය සන්දර්භයක් ඇතුළේ ඉදිරිපත් කිරීම වැදගත් වනවා කියලායි මම හිතන්නේ. මොකද, අපි මේ මොහොතේ පටන් අරගෙන තිබෙනවා, යුද්ධයක්. ඒක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මනුෂ්‍යත්වයට එරෙහි යුද්ධයක් නොවෙයි. මේක ත්‍රස්තවාදයට, පාතාල අපරාධවලට, නීති විරෝධී අවි ගනුදෙනුවලට එරෙහි යුද්ධයක්. ඒක කොයි තරම් මුල් බැසගෙන තිබෙනවාද කියලා කිව්වොත්, ඊයේ සහ පෙරේදා මීගමුව බන්ධනාගාරයේ සිදු වුණු අවාසනාවන්ත සිදුවීම අපි දැක්කා. ඒ වාගේම පසුගිය දවස්වල සජබ කෘත්‍යාධිකාරි මණ්ඩල සාමාජිකයෙක් පාතාලයෙනුත් කප්පම් අරගෙන රිමාන්ඩ් බන්ධනාගාරයට ගිය සිදුවීමත්, හිටපු අධිකරණ ඇමතිවරයෙකුගේ පුතෙක් ඒකට සම්බන්ධ වීම ගැනත් අපට අහන්නට ලැබුණා. එම සිද්ධීන් එක්ක බැලුවාම ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය සහ නීති විරෝධී ගනුදෙනු කොයි තරම් එකිනෙකට බැඳී තිබෙනවාද කියන එක අපට අමුතුවෙන් කියන්නට අවශ්‍ය නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you will get your original 12 minutes.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
Thank you, Hon. Deputy Speaker.

මුදල් විශුද්ධිකරණය කියන්නේ ඇත්තටම සංවිධානාත්මක අපරාධකරුවන් මුදල් සඟවා ගැනීම සහ ඒවා වෙනත් ආකාරයේ ව්‍යාපෘතිවල ආයෝජනය කරන්න පාවිච්චි කරන මූලිකම ක්‍රමවේදයක්. එතැනදී ගනුදෙනු කළ මූලාශ්‍ර වසන් කරනවා, ඒවා කළු සල්ලි සුදු කරන විවිධ ව්‍යාපෘතිවලට යොදවනවා. ඒ වාගේම, ඒවා මඟින් වෙනත් අපරාධවලට සම්බන්ධ වෙනවා. අපි පසුගිය දශක ගණනාවක් තිස්සේම දැක්කා, දේශපාලකයින් තමයි ඒවාට සහයෝගය දුන්නේ කියන එක. දේශපාලනික සම්බන්ධයක්, එහෙම නැත්නම් දේශපාලනික සහයෝගයක්, පදනමක් නැතුව කිසිදු පාතාල නායකයෙකුට, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුට ක්‍රියාත්මක වීමේ හැකියාව තිබුණේ නැහැ. ඒක අපි හැමෝම දන්නා කාරණයක්.

ගෝලීය මූල්‍ය පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා වන මූල්‍ය කාර්ය සාධන බලකාය - FATF - මේ සඳහා ගෝලීය ප්‍රමිතීන් හඳුන්වා දී තිබෙනවා. අවස්ථා දෙකකදී ශ්‍රී ලංකාව එහි grey list එකට ඇතුළත් වුණා. Grey list එකට ඇතුළත් වුණේ මොකද, ලංකාව සංවිධානාත්මක අපරාධ, නීති විරෝධී අවි ගනුදෙනු, මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධයෙන් නම දරා හිටපු රටක් නිසායි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇත්තටම අපේ මූල්‍ය පද්ධතිය අධි අවදානම් සහිත එකක් විධියට ලෝකය හඳුනා ගත්තා. ඒ වාගේම එය

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

ජාත්‍යන්තර බැංකු ගනුදෙනු, විදේශ ආයෝජන අධෛර්යවත් වීමටත් බලපෑවා. ඉතින්, මේ තත්ත්වය නැවත සිදු නොවිය යුතු බවට අපි ස්ථිර අධිෂ්ඨානයක ඉන්නවා. එහි ඊළඟ සමාලෝචනයට පෙර, අපි දැනටමත් කරගෙන යන සියලු ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දෙන නීතිමය සංශෝධන තුනක් සිදු විය යුතු බවයි අප සිතන්නේ. ඒක තමයි මෙහිදී සිද්ධ වෙන්නේ.

ඇත්තටම 2024-2025 සඳහා තෙවන ජාතික අවදානම් ඇගැයීමේදී මුදල් විශුද්ධිකරණය medium තත්ත්වයක පැවතුණා. හැබැයි, මත්ද්‍රව්‍ය ජාවාරම ඉහළ - high - තත්ත්වයකට ආවා. ඒ වාගේම ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමේ ජාතික අවදානම ඉහළ මධ්‍යම මට්ටමකට ගිහින් තිබුණා. ඇත්තටම මම කලින් පැහැදිලි කරපු විධියට එය පසුගිය දශක ගණනාවක්ම පවත්වාගෙන ගියේ කිසියම් ආකාරයක තදබල දේශපාලනික සම්බන්ධතා සහිත ක්‍රමවේදයක් යටතේයි. නමුත්, අපට බලාපොරොත්තු සහගතභාවයක් පවත්වාගෙන යන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි දූෂණ පිළිබඳ සංජානන දර්ශකයේ - Corruption Perceptions Index එකේ - 121වැනි තැන ඉඳලා දැන් 107වැනි තැන දක්වා ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ අපේ රටේ දූෂණය අඩුවෙලා තිබෙනවා.

ඒ වාගේම මත්ද්‍රව්‍යවලට, සංවිධානාත්මක අපරාධවලට එරෙහිව අපි විශේෂ වැඩ පිළිවෙළක් පවත්වාගෙන යනවා. අපි දන්නවා, පසුගිය දවස්වල මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට සහ සංවිධානාත්මක අපරාධකරුවන්ට අයත් රුපියල් බිලියන 3.1කට අධික නීති විරෝධී දේපළ සහ වත්කම් තහනම් කළ බව. ඒ වාගේම 2026.07.05වන දා වන විට තිබෙන දත්ත අනුව හෙරොයින් කිලෝග්‍රෑම් 1,972කුත්, අයිස් කිලෝග්‍රෑම් 2,126කුත්, නීති විරෝධී වත්කම් 361කුත් සම්බන්ධයෙන් අපි විමර්ශන ආරම්භ කර තිබෙනවා. ඇත්තටම මෙය දීර්ඝ කාලයක් තිබුණු ක්‍රමයක්. මෙහිදී අපි පොලීසිය සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ශක්තිමත් කර තිබෙනවා. ඒ වාගේම ඒවායේ ප්‍රතිසංස්කරණ සහ අධිකරණවල ප්‍රතිසංස්කරණ කටයුතු කරලා තිබෙනවා. බන්ධනාගාර ප්‍රතිසංස්කරණය කරමින් යනවා. ඒ වාගේම ප්‍රධාන දේ තමයි, එම අපරාධ සඳහා තිබෙන දේශපාලන සහයෝගය සහ උදව් දැන් නවත්වලා අපේ පැත්තෙන් දේශපාලනය පිරිසිදු කරලා තිබෙනවා. එම නිසා ආණ්ඩුවෙන් තව දුරටත් යැපෙන පාතාල කල්ලිවල, බන්ධනාගාරගත වෙලා ඉඳගෙන අපරාධ කරන පාතාල කල්ලිවල බලය අඩු වෙමින් යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ගැන කෙටියෙන් කිව්වොත්, එහි "මුදල් විශුද්ධිකරණය" කියන වචනවල අර්ථ නිරූපණය අපි පුළුල් කරලා තිබෙනවා. ඒ කියන්නේ, භාවිතය, මිලදී ගැනීම, මාරු කිරීම, ප්‍රතිලාභී හිමිකාරිත්වය ලබා ගැනීම් කියන වරදත් මෙහි තුන්වැනි වගන්තිය යටතට ඇතුළත් කරමින්, විදේශ රටවල සිදු වන මුදල් විශුද්ධිකරණ ක්‍රියාකාරකම්ද ආවරණය කරමින් අප මෙහි වපසරිය පුළුල් කරලා තිබෙනවා.

ඒ වාගේම, කෙනෙක් විදේශයකදී මුදල් විශුද්ධිකරණයකට, මත්ද්‍රව්‍ය ජාවාරමකට, අපරාධයකට සම්බන්ධ වෙලා එම මුදල් ලංකාව ඇතුළේ පාවිච්චි කරනවා නම්, එහිදී එම දේපළ හෝ ලංකාවෙන් මිලදී ගත් දේපළ, එහෙමත් නැත්නම් ලංකාවේ කරන දේවල් නීති විරෝධී ක්‍රියාකාරකමකට සම්බන්ධ නම්, ඒකටත් මුදල් විශුද්ධිකරණය යටතේ නඩු පැවරීමට හැකි වන පරිදි මෙහි නීති ප්‍රතිසංස්කරණය කරනවා. ඒ වාගේම මූලික අපරාධයකට සම්බන්ධ නම් අපරාධය සහ මුදල් විශුද්ධිකරණය කියන දෙකටම එකට නඩු පැවරීමේ හැකියාව මේ පනතින් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මේ සම්බන්ධව තිබුණු දඩ මුදල් ප්‍රමාණය ඉතාම යල් පැන ගිය, අඩු දඩ මුදල් ප්‍රමාණයක්. ඒ දඩ මුදල රුපියල් 50,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම යම් කෙනෙක් ඇතුළේ තිබෙන විමර්ශන ගැන තොරතුරු අනාවරණය කිරීම - tipping off - කියන වරදට පනවා ඇති දඩයත් වැඩි කරලා තිබෙනවා.

මට තව පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේපළක් තහනම් කිරීම සම්බන්ධව 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත - Proceeds of Crime Act එක - අපි ගෙනාවා. ඒක විශාල වෙහෙසක් දරලා කාලයක් තිස්සේ සංවර්ධනය කරපු පනතක්; අතිදැවැන්ත වෙනසක් කරපු පනතක්. යම් දේපළක් අපරාධයකින් උත්පාදනය වෙලා තිබේ නම්, ඒ දේපළ තහනමට ගැනීමට authority එකක් හැදුවා. ඒ POCA authority එකට සම්බන්ධ කරමින් තහනමට ගන්නා - freeze කරන - දේපළ එහි කළමනාකරණයට යටත් කිරීමටත් මේ පනතින් හැකියාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මේ දේපළවල සැබෑ හිමිකරුවන් කොහේද ඉන්නේ කියලා සොයන්නත් මේ පනතින් බලතල ලැබෙනවා. පසුගිය කාලයේ එවැනි අයිතිකරුවන් නොමැති දේපළ ගොඩක් තිබුණා, අපි දැක්කා.

ඊළඟට, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත ගැන බැලුවොත්, අපි මේ සම්මුතියට අත්සන් කිරීම නිසාම එහි දේශීය බලාත්මකභාවය සඳහා ආපු පනතක් තමයි මේ සම්මුති පනත. මේ සංශෝධනය එන්නේ ඊටත් වඩා ප්‍රායෝගිකව, මෙය ලංකාවේ ක්‍රියාත්මක වෙද්දී තිබෙන අභියෝග සහ අඩු ලුහුඬුකම් මඟහැර ගැනීමේ අරමුණින්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී මුදල් හෝ දේපළ කියන එක, "මුදල්, දේපළ, වෙනත් වත්කම්, ද්‍රව්‍යමය සහාය හෝ සම්පත්" කියලා අපි මෙහි අර්ථ නිරූපණය පුළුල් කරලා තිබෙනවා. අපි දන්නවා, දැන් ලෝකයේ නීති විරෝධී ව්‍යාපාර සිද්ධ වෙන්නේ cash හැටියට හෝ property හැටියට විතරක් නොවෙයි කියලා. එය cryptocurrency වෙන්න පුළුවන්. ඒ නිසා, සියලු ආකාරවල මූල්‍ය ගනුදෙනු මේකට ඇතුළත් කර ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් මේවා සම්බන්ධව විමර්ශන කිරීමේ හැකියාව සහ අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ වාගේම මෙහි තවත් වැදගත්ම දෙයක් තිබෙනවා. ත්‍රස්තවාදී ක්‍රියාවක් කරන්නම ඕනෑ නැහැ. කිසියම් ආකාරයක ත්‍රස්ත ක්‍රියාවකට සහයෝගය දක්වන්න, එහෙම නැත්නම් එවැන්නක් අරමුණු කරගෙන, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු ඉලක්ක කරගෙන, එහෙම නැත්නම් රජයේ ආයතනයක් ඉලක්ක කරගෙන, website එකක් ඉලක්ක කරගෙන, ආයතනයක් ඉලක්ක කරගෙන, ක්‍රියාවක් ඉලක්ක කරගෙන සැලසුම් සහගතව මුදල් එකතු කිරීම පමණක් මේ පනත් කෙටුම්පත යටතට ඇතුළත් වෙන්න ප්‍රමාණවත් වෙනවා. ඒ නිසා මේ නීතිය බලාත්මක වෙන්න නම් ත්‍රස්තවාදී කටයුත්තක නිරත වෙන්නම අවශ්‍ය නැහැ. මම කලින් කිව්වා වාගේ, එතැනදී මහාධිකරණයට යම් දේපළක් පවරාගන්න manager කෙනෙක් පත් කරන්න පුළුවන්. ඒ වාගේම අපරාධයකින් උත්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියට ඒ වත්කම් භාරදීලා ඒවායේ කළමනාකරණය පවත්වාගෙන යන්න කටයුතු කරන්නත් පුළුවන්. එකේදි වත්කම් සොයාගන්න, හඳුනාගන්න, ස්ථාන සොයා ගන්න, වටිනාකම් ගණනය කරන්න විමර්ශන නිලධාරින්ට වඩාත් පුළුල් බලතල ලබා දීලා තිබෙනවා. ඒ වාගේම බැංකු සහ අනෙකුත් ආයතනවලින් තොරතුරු, ලේඛන එකතු කරන්නත් වඩාත් පුළුල් බලතල ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ශ්‍රී ලංකා පොලීසියට විදේශීය නීති බලාත්මක කිරීමේ ආයතන සමඟ ඒකාබද්ධ විමර්ශන කණ්ඩායම් පිහිටුවාගෙන වඩාත් පුළුල් ආකාරයට විදේශයක තිබෙන සාක්ෂි ගෙනැල්ලා

මේවා විමර්ශනය කිරීමේ බලතලත් ලබා දීලා තිබෙනවා. ඒක නිසා, 2025 අපි ගෙනාපු අපරාධයකින් උද්පාදිත දේ කළමනාකරණය කිරීමේ අධිකාරියේ කටයුතු පහසු කරන්නත් මේ පනත් කෙටුම්පත තවදුරටත් අදාළ වෙනවා කියලා අපි හිතනවා.

ඊළඟට මම කථා කරන්නේ, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව. අද උදේත් පාර්ලිමේන්තුවේදී ඒ ගැන කථා වුණා. ඒ වාගේම පසුගිය දවස්වල ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාත්, ගරු ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවේදී කිව්වා, භාණ්ඩ ආනයනය කරනවා කියලා බොරු කියලා රටින් පිටතට මුදල් ගලාගෙන ගිහිල්ලා තිබෙනවා කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you have two minutes left of your 12 minutes.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
I will wind up, Hon. Deputy Speaker.

මේ පනත සංශෝධනයෙන් අදාළ වැරදිවල විෂය පථය තුළට සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීමේ වරදත් ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම තමා ගනුදෙනු කරන ගනුදෙනුකරුවකු කිසියම් ආකාරයක සැක සහිත ගනුදෙනුවල නිරත වනවා නම් ඒ පිළිබඳව වාර්තා කිරීමේ වගකීමත් මේ තුළින් ලබා දෙනවා. ඒ වාගේම National Coordinating Committee on Anti-Money Laundering, Countering the Financing of Terrorism and Countering Proliferation Financing කියන කමිටුව පිහිටුවමින් එහි ක්‍රියාකාරකම් වඩාත් යාවත්කාලීන කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ඇත්තටම කියන්න ඕනෑ කාරණය මේකයි. අපි දැක්කා, ප්‍රාදේශීය සභාවක හිටපු යොහාන් වික්‍රමසිංහ කියන පොහොට්ටුව පක්ෂයේ මන්ත්‍රීවරයෙක්, ඒ වාගේම ගිය සැරේ සමගි ජන බලවේගයේ වත්තල කොට්ඨාසයේ අපේක්ෂකයෙක් අද උදේත් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරමින් ඉඳලා අහුවනවා. මත්ද්‍රව්‍ය, පාතාල ක්‍රියාකාරකම් කියන ඒවා ගැන කප් එක ගහලා හිටියේ පොහොට්ටුව. හැබැයි අපි දන්නවා, දැන් සමගි ජන බලවේගයටත් ඒ පිළිබඳව චෝදනාවලින් ගැලවෙන්න බැහැ කියලා. *[බාධා කිරීමක්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එහෙම කියන්න එපා.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමා. මගේ කථාව අවසන් කරන්න ඉඩ දෙන්න. මම ඔබතුමාට චෝදනා කළේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කාටවත් පෞද්ගලික - *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි සමගි ජන බලවේගයේ. එහෙම කියන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you have a few seconds to wind up.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවට බාධා කරන්න කලින් මම කියපු කාරණය අහගෙන හිටියා නම් හරි. ඇත්තටම හර්ෂ ද සිල්වා මහත්තයාට තරහා යන එක සාධාරණයි. මොකද සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් ඉන්නවා, ඒවාට සම්බන්ධ නොවන. මම නම් කියලා කිව්වේ නැහැ. එතුමාට තරහා ගියා වාගේ ඒ මන්ත්‍රීවරුන් තමයි අපි කරන දැවැන්ත සටනේ ඇත්තම ප්‍රතිලාභින්. මම ඇයි එහෙම කියන්නේ? මේ සභාවේ ඉන්නවා, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, your time is up.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මම කථාව අවසන් කරන්නම්.

වරිත් අබේසිංහ ගෙනිහිල්ලා රුපියල් කෝටියකට අදාළ මුදලක් cashවලින් දුන්නා. තව ටික දවසකින් පාතාලයෙන් කප්පම් ගන්න කෙනෙක් තමයි සජබයේ උපනායකයා වෙන්න හිටියේ. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආණ්ඩුව ආවේ නැත්නම් වරිත් අබේසිංහ අද උපනායක. අද අපි කරපු දේ ගැන ඔබතුමන්ලා සතුටු වෙන්න. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා ඇත්තටම සජබයේ හොඳ මන්ත්‍රීවරුන්. ඇත්තටම අපි ගරු කරන මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් සජබයේ ඉන්නවා. ඒ මන්ත්‍රීවරුන් අපට ස්තුතිවන්ත වෙන්න ඕනෑ, වරිත් අබේසිංහ අද ඇතුළේ ඉන්න එක ගැන. මොන අභියෝගය ආවත් අපි ආරම්භ කර තිබෙන සටන ආපසු හරවන්නේ නැහැ කියන දැඩි ප්‍රකාශය කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sajith Premadasa, Leader of the Opposition. - [Interruption.]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to a point of Order. I will take only 30 seconds.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Member?

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I raise this under Standing Order No. 92(2)(a).

இன்று காலையில் கௌரவ அபூபக்கர் ஆதம்பாவா அவர்கள் இந்த நாட்டில் இல்லாத ஒரு பிரதேச செயலகம் பற்றிச் சொன்னார். அதாவது, "கல்முனை தெற்கு முஸ்லிம் பிரதேச செயலகம்'" என்று சொன்னார். அப்படியொன்று கிடையாது. அவர் உடனடியாக அதனைத் திருத்தி, "கல்முனை பிரதேச செயலகம்" என்று சொல்ல வேண்டும். ஏனெனில், அது தொடர்பான கேள்வி பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சருக்கு ஆற்றுப்படுத்தப்பட்டு இருக்கின்றது. I hope he would correct it.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, the Floor is yours now. You have been allotted five minutes and your time starts now.

[අ.භා. 12.08]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තවශයෙන්ම අද අපේ රටේ නීතිය හා සාමය දිහා බැලුවාම, බරපතළ බිඳ වැටීමක් තිබෙන මොහොතක්. ඒ වාගේම අධිකරණ, බන්ධනාගාර මුළු පද්ධතියම බරපතළ කඩා වැටීමකට ලක් වුණු මොහොතක රජය අපට ඇඟිලි දිගු කරනවා, විවිධ චෝදනා කරමින්. මම විශේෂයෙන්ම ඒ අයට කියන්න කැමැතියි, සමගි ජන බලවේගය කියන්නේ මත්ද්‍රව්‍ය භාවිතය, මත්ද්‍රව්‍ය ජාවාරම, මිනීමැරුම, කප්පම යනාදී ක්‍රියා සහමුලින්ම බැහැර කරපු දේශපාලන ව්‍යාපාරයක් බව. ඒ නිසා මම කනගාටු වනවා, අද මේ සභාව තුළට ඇවිල්ලා මිනිස් ඝාතනවලට, මිනීමැරුම්වලට, මංකොල්ලකෑම්වලට, ජාතික දේපළ විනාශ කිරීම පිළිබඳව ජාත්‍යන්තර කුසලාන ලබපු කණ්ඩායම් අපට ඇඟිලි දිගු කිරීම පිළිබඳව.

විශේෂයෙන්ම අපේ රටේ නීතිය හා සාමය සම්බන්ධව බැලුවාම ඒ රූප රාමුවල අපි දැක්කා, රජයේ ආකාර්යක්ෂමතාව, රජයේ බැරිකම, අදක්ෂකම, නොහැකියාව බන්ධනාගාර නිලධාරින්ගේම මුවින් පිටවන ආකාරය. රජයට "දිට්වා" සුළි කුණාටුවේ පශ්චාත් ආපදා සමය කළමනාකරණය කරගන්නත් බැහැ, ආර්ථික ගැටලුව කළමනාකරණය කරගන්නත් බැහැ, ඩෙංගු මර්දන ව්‍යාපාරය ක්‍රියාත්මක කරගන්නටත් බැහැ, දැන් බන්ධනාගාරය පාලනය කරගන්නටත් බැහැ. එහෙව් කණ්ඩායම තමයි කියන්නේ පොහොසත් රටක් හදනවා, ලස්සන ජීවිතයක් නිර්මාණය කරනවා කියලා.

මීගමුව බන්ධනාගාරයේ ඇති වූ ගැටුමෙන් ජීවිත අහිමි වුණු නිලධාරින් ඇතුළු ඒ කණ්ඩායමට පොහොසත් රටයි, ලස්සන ජීවිතයයි නිර්මාණය කරපු ආකාරය රජයේ වැඩවලින්ම පෙනෙනවා. මොකක්ද, ඒකට හේතුව? ඒකට හේතුව මෙයයි. අධිකරණ ඇමතිවරයා ප්‍රමුඛ රජය නිශ්චිත කරුණු පිළිබඳව, වගකීම් පිළිබඳව හරි ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ, බන්ධනාගාරවල තිබෙන පීඩනය ගැන හොයලා බැලුවේ නැහැ. අවුරුදු 65 වූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 67 කරන්නේ කොහොමද, අවුරුදු 63 වූ අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු 65 කරන්නේ කොහොමද කියන එක ගැන තමයි මේ රජය හොයලා බැලුවේ. ගරු අභියාචනාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් පත් කිරීම රජය අදටත් ප්‍රතික්ෂේප කරනවා. එසේ කරමින් තමයි රටේ නීතිය හා සාමය සුරක්ෂිත කරන අලුත් system change එක ක්‍රියාත්මක කරනවා කියන එක කියන්නේ. රජය බන්ධනාගාර පද්ධතිය තුළ වූ පීඩනයට, ඒ කළමනාකරණ ගැටලුවලට විසඳුම් ලබා නොදී, Commonwealth Lawyers Association එක, ඒ වාගේම LAWASIA forum එක, Bar Association එක, කොළඹ මහාධිකරණ නීතිඥවරුන්ගේ සංගමය ඇතුළු නීතිඥ සංගම් ගණනාවක් මේ දේ කරන්න එපා කියද්දි අධිකරණයට ඇඟිලි ගසන්නට කටයුතු කරපු නිසාත්, නිසි වගකීම් සහ අරමුණු සාක්ෂාත් නොකිරීම නිසාත් තමයි අද මේ වාගේ ඛේදවාචකයක් නිර්මාණය වුණේ.

දැන් ගාල්ල මහමෝදර ප්‍රදේශයේ අලුතෙන් බන්ධනාගාරයක් නිර්මාණය කරන්න හදනවා. ඒ ප්‍රදේශය සංචාරක පුරවරයක්, සංචාරක ආයෝජන ක්‍රියාත්මක විය යුතු ස්ථානයක්. බන්ධනාගාරයක් ස්ථාපනය කළ යුතු පරිසරයවත් හොයාගන්නට බැරි ආණ්ඩුව, ඒ සඳහා සුදුසු ස්ථානයක් හොයා ගන්නට තීන්දුවක් ගන්න බැරි ආණ්ඩුව අද කථා කරනවා, "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" ගැන. මේ වාගේ මහා ඛේදවාචකයක් වුණාම ඒ පිළිබඳව පශ්චාත් අවස්ථාවේ තීන්දු තීරණ ගැනීමේදී එය යම්කිසි නිර්මාණශීලී ආකාරයකට, යම්කිසි නිසි ක්‍රමවේදයකට අනුව කරන්න කියන යෝජනාව අපි මේ රජයට කරනවා.

අද මේ ඔක්කෝම අස්සේ අපට පෙනෙනවා, දේශපාලන දඩයමක් ක්‍රියාත්මක කරනවා කියලා. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, දයාසිරි ජයසේකර මැතිතුමා ඉලක්ක කර ගෙන මහා පරිමාණයේ දඩයමක් ක්‍රියාත්මක කරන බව. 2019දී එතුමාට කරුණා සහගත දීමනාවක් - *ex gratia* payment එකක් - ලැබුණා, රුපියල් ලක්ෂ 5ක. විශේෂයෙන්ම එතුමා වෛද්‍ය ප්‍රතිකාර අරගෙන තිබෙනවා, රුපියල් 868,000ක් වියදම් කරලා. මේ මොහොත වනකොට නිවැරදි bills ලබා නොදීම පිළිබඳව පරීක්ෂණ පවත්වලා දයාසිරි ජයසේකර මැතිතුමාව අත්අඩංගුවට ගන්නට රජය සූදානම් වෙනවා. *Ex gratia* payment එකක් කියන්නේ මොකක්ද? ඒක කරුණා සහගත දීමනාවක්. ඒක විධායක ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි ලබා දෙන ප්‍රදානයක්. ඒකට bills ඉදිරිපත් කරන්න කියලා කිසිම තැනක සඳහන් වෙලා නැහැ. තමන් සතු සමාජ මාධ්‍ය අතකොළුවන්, වහලුන් උපයෝගී කර ගෙන දැන් පසුබිම සකස් කරනවා, දයාසිරි ජයසේකර මැතිතුමා වැරදි bills ඉදිරිපත් කරලා, තමන්ට ලබා දුන් ප්‍රදානය අයුතු ලෙස - වැරදි ආකාරයට - පාවිච්චි කළා කියලා යම්කිසි චෝදනාවක් ගොතන්නට. එවැනි චෝදනාවක් ගොතලා එතුමාව අත්අඩංගුවට ගන්නට අද මේ රජය සැලසුම් කරගෙන යනවා. ඒ නිසා රජයට වෙලාවක් නැහැ, බන්ධනාගාර පද්ධතිය කළමනාකරණය කරන්න, කඩාගෙන වැටෙන ආර්ථිකය පණ ගන්වන්න, දූෂ්පත්කම තුරන් කරන්න, මන්දපෝෂණයට විසඳුම් ලබා දෙන්න, ඩෙංගු මර්දන ව්‍යාපාරය සාර්ථක කරවන්න සහ "දිට්වා" විනාශය තුළින් හානියට ලක් වුණු අයට පොරොන්දු වුණු ඒ සහන ටික ලබා දෙන්න. නිවසේ ටකරමක් ගැලවිලා ගිය අයත් තවමත් බලාගෙන ඉන්නවා, රුපියල් ලක්ෂ 10 ලැබෙන කල්. ලබා දෙනවා කියපු දේවල් දෙන්නේ නැතිව අද දේශපාලන දඩයමක නිරත වීම ලජ්ජා සහගත ක්‍රියාවක්, නිර්ලජ්ජිත ක්‍රියාවක්. ඒ නිසා අපි පැහැදිලිවම මේ කාරණය කියන්න කැමතියි. දයාසිරි ජයසේකර මැතිතුමාගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි අනිවාර්යයෙන්ම පෙනී හිටිනවා කියන එක මම මේ අවස්ථාවේදී වගකීමෙන් ප්‍රකාශ කරනවා.

ඇත්තවශයෙන්ම මම දැන ගෙන හිටියේ නැහැ, කෞෂල්‍යා ආරියරත්න මැතිනියට අපේ පක්ෂය තුළ තනතුරු තීන්දු කිරීමේ බලයක් ලැබී තිබෙනවා කියලා. මම එතුමියට කියන්න කැමතියි, පැලවත්තෙන් පාලනය වන ආකාරයට අපේ පක්ෂය පාලනය වෙන්නේ නැහැ කියන එක. වගකීමෙන් කියන්න පුළුවන්ද, ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ කිසිම දේශපාලනඥයෙක් මේ වනතෙක් කුඩු ජාවාරමට, කුඩු භාවිතයට අහු වෙලා නැහැ කියලා? බැහැ නේ. මම පැහැදිලිව කියන්නට ඕනෑ, වැරදි කරන අය හැම පැත්තකම ඉන්න බව. ඇත්තවශයෙන්ම යම්කිසි අඩුපාඩුවක් සිදු වනකොට ඒ තුළ ගන්න ක්‍රියාමාර්ගය තමයි ඉතාම වටින්නේ. ඒ කවුද, කොයි ආකාරයටද ක්‍රියාමාර්ග අරගෙන තිබෙන්නේ කියන කාරණාව හොයා බලනකොට ඕනෑම පුද්ගලයෙකුට ඒ නිගමනවලට එන්න පුළුවන්.

අපේ කෞෂල්‍යා ආරියරත්න මැතිනිය කාන්තාවක්. මම හිතනවා, එතුමිය මවක් කියලා. මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරන්න කැමතියි. ඇත්තවශයෙන්ම ජාතික ළමා ආරක්ෂක අධිකාරියට අනුව ඒ අපචාර ක්‍රියාවන් තුළ වින්දිතයන් බවට පත් වුණු 40,000කට අධික දරුවන් පිරිසක් ඉන්නවා. ඔබතුමිය මවක් හැටියට, කාන්තාවක් හැටියට අන්න ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා, මේ සභාවට ඇවිල්ලා වරිත ඝාතන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා වෙනුවට රටට වැදගත් වන ඵලදායී ක්‍රියාවක, රටට වටිනාකමක් එකතු කරන ක්‍රියාවක නිරත වන්නය කියා මම ආරාධනා කරනවා.

අපි දේශපාලන දඩයම පරාජය කරනවා. ඒ වාගේම අපි තවම බලාගෙන ඉන්නවා, බන්ධනාගාර ක්ෂේත්‍රයේ සිදු වුණු බෙදවාවකය ගැන. මහර බන්ධනාගාරයේ ඇති වුණු බෙදවාවකය පිළිබඳව වාගේම වැලිකඩ බන්ධනාගාරයේ ඇති වුණු බෙදවාවකය පිළිබඳව වර්තමාන ජනාධිපතිවරයා එවකට විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට යම් යම් නිගමන, ප්‍රකාශ මේ සභාව තුළ ඉදිරිපත් කළා. එදා විපක්ෂයේ සිටියදී අනුර කුමාර දිසානායක මැතිතුමා කියපු ඒ දේවල් අද රාජ්‍ය බලය ලබා ගත් එතුමාගේ රජය තුළ ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්නට කටයුතු කරනවාද, නැද්ද කියන එක අපි මේ අවස්ථාවේදී විමසන්න කැමැතියි. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne?

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මගේ නම සඳහන් කළ නිසා මම ඇත්තටම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. කුඩු භාවිත කරන අය ඕනෑ තැනක ඉන්න පුළුවන් කියලා එතුමා කිව්වා. මම කියන්නේ ඒක තමයි අපේ ව්‍යසනය. හෙට දවසේ ඔබේ දරුවෙක්, අපේ දරුවෙක් කුඩු භාවිතය තුළ ඉන්න පුළුවන්. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පැහැදිලිව කිව්වේ, අපි කුඩු, පාතාල ගනුදෙනු කරන අයගෙන්, මුදල් විශුද්ධිකරණය සම්බන්ධව පිට රට චෝදනා ලබා දඩුවම් විඳපු අයගෙන් කප්පම් අරගෙන, එවැනි ජාවාරම්කරුවන් අපේ කෘත්‍යාධිකාරී මණ්ඩලවල තනතුරුවලට පත් කර නැහැ කියන එකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Ariayarathne, make it short please.

**ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
මම එතුමාට කියනවා, ජනාධිපතිවරණයෙන් පසුව මහ මැතිවරණයේදී වරිත් අබේසිංහ රුපියල් කෝටියක් එතුමාට ගෙනැල්ලා දුන්නේ නැහැ කියලා පුළුවන් නම් ඔප්පු කර පෙන්වන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the Opposition, there is not going to be a debate on it. I will give you 30 seconds.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
She maligned my character, Hon. Deputy Speaker.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Did she? I do not think she did.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Did she do that, malign your character?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Why, were you not listening? ඔබතුමා එතුමිය කිව්ව දේවල් අහගෙන හිටියේ නැද්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I did. But, I do not think she had,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මොකක්ද එතුමිය කියන්නේ? එතුමිය කියනවා මට මුදල් දුන්නා කියලා. කීයද ගණන?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, not to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතුමිය කියනවා, මට මිලියන 10ක් දීලා වරිත් අබේසිංහ සජබ පක්ෂයේ තනතුරු ලබා ගත්තා කියලා. *[බාධා කිරීමක්]* මම ඔබතුමියගෙන් අහන්න කැමැතියි, මේ වාගේ අමු පට්ටපල් බොරු කියන්නේ ඇයි කියලා. *[බාධා කිරීම්]* අපි හිතුවා, ඔබතුමිය යම් අධ්‍යාපනයක් තිබෙන, යම් පරිණත දේශපාලනඥවරියක් කියලා. *[බාධා කිරීම්]* ඇත්තවශයෙන්ම ඔබතුමිය මේ වාගේ බොරුවක්, මුසාවක්, මුළාවක් කළ එක ගැන මම පුදුම වෙන්නේ නැහැ. මොකද, ජනතා විමුක්ති පෙරමුණත් කප් ගහලා තිබෙන්නේ බොරු කීමට. ටොන් පවකාරයෝ ටිකක් මේ ඉන්නේ. තවදුරටත් ඒ ටොන් පව ප්‍රතිපත්තියයි ක්‍රියාත්මක කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sunil Handunnetti. - *[Interruption.]*

[අ.භා. 12.22]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමා,- *[බාධා කිරීම්]* විපක්ෂ නායකතුමා, අපි මේ වැඩේ කරමුද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Please stop the crosstalk. Hon. Sunil Handunnetti, you may continue. You have the mike.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කථා කළ සජිත් ප්‍රේමදාස මැතිතුමා අපේ රටේ විපක්ෂ නායකතුමා නිසා මම විශ්වාස කළා, අද මේ සාකච්ඡාවට ගන්නා පනත් කෙටුම්පත් ගැන එතුමාට තිබෙන දැනුමින්, විපක්ෂයට දෙන නායකත්වයෙන් එතුමා යම් අදහසක් කියයි කියලා. ඇත්තටම මම කරීක ලැයිස්තුව බැලුවා. එතකොට මම දැක්කා, මට කලින් කථා කරන්නේ විපක්ෂ නායකතුමා බව. ඒ සම්බන්ධයෙන් මම සතුටින් හිටියේ.

අද දින දෙවන වර කියවීමේ විවාදයට ගන්නේ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතයි - Prevention of Money Laundering (Amendment) Bill. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නායකත්වය ගත්තත්, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා මේ රට පාලනය කළත් මේවා රටේ තිබිය යුතු වැදගත් අණපනත්. හැබැයි, දැන් විපක්ෂ නායකතුමා හැටියට මෙතුමා කථා කරද්දී මේ පනත් කෙටුම්පත් තුන ගැන මොනවාද කථා කළේ?

බන්ධනාගාර ගැන කථා කළ තුන්වැනි දවස අද. ටෙස්ට් මැච් එකක් වාගේ බන්ධනාගාර ගැන කථා කරනවා. මීට කලින් මෙතුමන්ලාම මේ ගැන පැය තුනක හදිසි විවාදයක් පැවැත්වූවා. ඊයේත් ඒ ගැන කථා කළා. අදත් කථා කරනවා. මම කියන්නේ මේකයි. එහෙම කථා කළාට කමක් නැහැ. හැබැයි, විපක්ෂ නායකතුමා හැටියට මේ විෂයය ගැන අවබෝධයෙන් කථා කරන්න ඕනෑ. මොකද, වචන තිබුණු පලියට කථා කරන එකෙයි, විෂයබද්ධ කරුණු සහිතව කථා කරන එකෙයි වෙනසක් තිබෙන්න ඕනෑ. අපිට තේරුම් යනවා, වචන කථා කරන බව. වචන කථා කරන එක ඕනෑ කෙනෙකුට කරන්න පුළුවන්. හැබැයි, කරුණු, දත්ත සහිතව කථා කරන එක ටිකක් අමාරුයි. අපිට එතුමාගේ කථාවේ එහෙම බරක් පෙනෙන්නේ නැහැ. රටකට, විපක්ෂයකට නායකත්වය දෙන්න, එතුමන්ලා නියෝජනය කරන ජනතාවට නායකත්වය දෙන්න තරම් බරක් එතුමාගේ කථාවෙන් දැනෙන්නේ නැහැ.

මම ඇහිඳ ගන්න උත්සාහ කළා, එතුමා මේ මුදල් විශුද්ධිකරණය ගැන කියන්නේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා සම්බන්ධවද කියලා. මොකද, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාගේ මොනවා හරි ගනුදෙනු ගැන, වියදම් ගැන එතුමා කථා කළා. එතකොට ඒකෙන් එතුමා අහවන්න උත්සාහ කරන්නේ, මේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට අදාළ සංශෝධනයට දයාසිරි ජයසේකරගේ සම්බන්ධයක් තිබෙනවා කියන එකද? මම එහෙම උපුටා ගන්න උත්සාහ කළා. බන්ධනාගාරය ගැන කථා කරනකොට, ත්‍රස්තවාදීන්ට ආයුධ සැපයීම සම්බන්ධව මොනවා හරි ගනුදෙනුවක් මේකේ තිබෙනවාද කියා බැලුවා. නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරිම කනගාටුදායකයි.

අද මේ කථා කරන පනත් මේ රට සුද්ද පවිත්‍ර කිරීමේ, පිරිසිදු කිරීමේ, මේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ මූලික පනත්. පසුගිය දශක ගණනාව තුළ අපේ රට ජාත්‍යන්තර වශයෙන් යම්කිසි අපකීර්තියකට ලක් වුණා නම්, එයින් මේ රට ගලවා ගන්නා අණ පනත් මේවා. හැබැයි, එතුමා කියනවා, "දිට්වා" සුළි කුණාටුවෙන් වෙච්ච හානිය තවම හරි ගියේ නැහැලු, ඩෙංගු මර්දනය කරලා නැහැලු, බන්ධනාගාරයේ ප්‍රශ්නය තවම ඉවර නැහැලු. ඒ වාගේ මොනවාද මන්දා කිව්වා. හැබැයි, එතුමාට වචන තිබෙනවා. ඒ වාගේම කිව්වා, නිශ්චිත කරුණු සහිතව තීරණ ගත්තේ නැහැලු. "යන්නෙ කොහෙද, මල්ලේ පොල්" න්‍යායෙන් තමයි කථා කළේ. "යන්නෙ කොහෙද, මල්ලෙ පොල්" වාගේ විපක්ෂ නායකතුමෙක්.

ගයන්ත මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔතැන ඉන්න ඉවසිලිවන්තභාවය ගැන මම ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. ඒ කියන්නේ, ඔබතුමාට දැනෙන කිසිම හැඟීමක් පිට කර ගන්න බැරිව, මේ රූප රාමුවට හසු වෙන නිසා ඉවසා ගෙන ඉන්නවා නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඔබතුමා අහගෙන ඉන්නවා වාගේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි, මම අහගෙන ඉන්නවා වාගේ. ඒක ඇත්තටම හරි පුදුමයි. අපි ලෝකයේ රටවල විපක්ෂ නායකවරු දැකලා තිබෙනවා. සාමාන්‍ය මන්ත්‍රීවරු කථා කරනකොට නම් වගකීමක් නැතුව ඕනෑ හැටියට කථා කරන්න පුළුවන්. නමුත්, මෙතැනදී කෞෂල්‍යා නියෝජ්‍ය ඇමතිතුමිය මේ විෂය ගැන කථා කළාට

පස්සේ, ඊළඟට විපක්ෂයෙන් විවාදය ආරම්භ කරන පළමුවැනි කථිකයා විපක්ෂ නායකතුමා වුණාම, ඒකේ බරක් තිබෙන්න එපායැ. ඒ මොකුත් නැහැ. අවසානයේදී එතුමා අභියෝගයක් කරනවා, කුඩු ජාවාරමට සම්බන්ධ ජවිපෙ දේශපාලනඥයෝ ඉන්නවාද, ඒ අයගේ නම් කියන්න කියලා.

මම ආයෙත් එතුමාගෙන් අර එදා වාගේ නම අහන්නේ නැහැ. "ඔබතුමාම නම කියන්න" කිව්වා නම්, රෙදි "ඉල්ලෙයි" මෙතැන. අපිට චෝදනාවක් කරලා, නම් කියන්න කියනකොට, එහෙම නම් නම කියන්න ඕනෑ එතුමා නේ. "කුඩු ජාවාරමට සම්බන්ධ ජවිපෙ මෙන්න මේ අහවල් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා, මෙන්න මේ මන්ත්‍රීවරයා" කියලා නම කියන්න ඕනෑ. එතුමා නේ කියන්න ඕනෑ. දැන් කෞෂල්‍යා නියෝජ්‍ය ඇමතිතුමිය හරියට කිව්වා, වරිත් අබේසිංහ එතුමන්ලාගේ හොරණ සංවිධායකවරයා රුපියල් කෝටියක් දුන්නා හරි, එහෙම නැත්නම් ගනුදෙනු කරලා කියලා. ඇත්තටම එක විධියට ගත්තාම, ඒක ත්‍රස්තවාදී කටයුත්තක්. මූල්‍ය වංචාවක්. ඒගොල්ලෝ සල්ලි අරගෙන, නඩු බේරන්න කියලා, අපරාධකාරයෝ මෙහෙට ගේනවා කියලා නිදහස් කරවන්න පගාවක් අරගෙන තිබෙනවා. ඒක දැන් විමර්ශනය කරනවා. ඒගොල්ලෝ හිරේ ඉන්නවා. එතකොට නම නිශ්චිතයි නේ. දැන් මොකුත් කියන්නේ නැතුව අපෙන් අහනවා, "ඔයගොල්ලෝ කුඩු ජාවාරම්වලට සම්බන්ධ අයගේ නම් කියනවාද?" කියලා. ඉතින්, අපෙන් අහලා හරියන්නේ නැහැ නේ, චෝදනාව කරන කෙනා නමක් කියන්න එපායැ. මම කියන දේ සාධාරණ නැද්ද? චෝදනාව කරන කෙනා නමක් කියන්නේ නැතුව, චෝදනාව එල්ල කරන අපිට කියනවා, නම් කියන්නලු. දැන් එහෙම නම්, අපි නම් ටිකක් කියන්න ඕනෑ එතුමාව සතුටු කරන්න. එතුමා දන්නේ නැහැ නම්. මෙහෙම විපක්ෂ නායකවරයෙක් ලැබීම ගැන ආණ්ඩු පක්ෂය හැටියට අපි සතුටු වෙනවා. මොකද හේතුව, අපිට අභියෝගයක් නැහැ නේ. හැබැයි, ඔබතුමන්ලා කනගාටුවට පත් වෙන්න ඕනෑ. මොකක් හරි ක්‍රමයකට එතුමාව හදා ගන්න. ඒ කියන්නේ අඩු තරමින් කථාවක් ලියලා දීලා, "මෙන්න මේකයි අද මාතෘකාව, මේකයි අද විෂයය, මේකයි විපක්ෂ නායකතුමනි අද දවසේ කථා කරන්න ඕනෑ" කියලා පොඩ්ඩක් කියා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීමක්]*

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතේ තිබෙන වැදගත් දේ තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]* අපි අපේ වේලාව කළමනාකරණය කර ගන්නම්. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට අදාළ නැහැ ඒක.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පොඩ්ඩක් රිදෙනවා නේද? රිදෙන්නේ මොකද දන්නවාද? ඔබතුමන්ලාට දැනෙනවා අපි හරි දේ කියනවා කියලා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා විෂය ගැනද කථා කරන්නේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි දේ කියනවා කියලා දැනෙනවා. ඇත්තටම විපක්ෂ නායකකමට සුදුසු අය ඉන්නවා. මේ ඉස්සරහ පේළියේත් ඉන්නවා. ඔබතුමන්ලා අතර ඉන්න බව අපි දන්නවා. ඒකට ඉතින් එන්න අමාරුයි. ඒකයි තිබෙන ප්‍රශ්නය. අපි ප්‍රාර්ථනා කරනවා, මුජිබුර් මන්ත්‍රීතුමාට ඒ අවස්ථාව කොළඹ දිස්ත්‍රික්කයෙන් ලැබේවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ආණ්ඩුව හැටියට අද දවසේ අපට වැදගත් දෙයක් තිබෙනවා. අපි රටක් හැටියට කඩා වැටෙන ආර්ථිකයක්, කඩා වැටෙන රටක්, අසාර්ථක රාජ්‍යයක් කියලා නම් කරන්න ලෝකයේ රටවලිනුත්, ඒ වාගේම එක එක සමීක්ෂණවලිනුත්, අපේ රට ඇතුළේ ඉන්න සමහර කණ්ඩායම් විසිනුත් පසුගිය ඉතිහාසය පුරාම උත්සාහ කර තිබෙනවා. හැබැයි, අද වෙනකොට ශ්‍රී ලංකාව ඒ තත්ත්වයෙන් වෙනස් වෙලා ඕනෑම රටක කෙනෙකුට සංචාරය කරන්න සුදුසු රටක් බවට අපේ රට නම් කර තිබෙනවා. මේ දූපත ලෝකයේ වටිනාම දූපතක් හැටියට නම් කෙරිලා තිබෙනවා. ඒ වාගේම තමයි, මේ දූපත ලෝකයේ සිටින ඕනෑම මනුස්සයෙකුට ඇවිල්ලා ජීවත් වෙන්න පුළුවන්, ඕනෑම පවුලකට ඇවිල්ලා ජීවත් වෙන්න පුළුවන් වටිනාම දූපතක් හැටියට නම් වෙලා තිබෙනවා.

ලෝක බැංකුව පසුගිය දවසක වාර්තා කළා, පහළ මැදි ආදායම් රටක සිට ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් බවට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තිබෙන නිර්ණායක වෙනස් කරගෙන තිබෙනවා කියලා. ඒක ඉබේම සිද්ධ වෙච්ච දෙයක් නොවෙයි. ඒකට අපි අපේ රටේ ජනතාවට ගරු කරන්න ඕනෑ. අපේ රටේ ජනතාව කැමැත්තෙන්, ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා බදු ගෙවලා තිබෙනවා. තමන් ගෙවන මේ බදු මුදල් අපරාධයක් වෙන්නේ නැහැ, නාස්තියක් වෙන්නේ නැහැ, විනාශ වෙන්නේ නැහැ කියලා විශ්වාස කරලා බදු ගෙවලා තිබෙනවා. ඒ නිසා පසුගිය අවුරුද්දේ අපේ බදු ආදායම් වැඩි වෙලා තිබෙනවා. රේගු ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රට දාලා යන්න හදපු මිනිස්සු මේ රට දාලා යනවා වෙනුවට මේ රටේ ව්‍යාපාර, කර්මාන්ත ආරම්භ කරලා තිබෙනවා. සංචාරකයින් අපේ රටට එන්න පටන් අරන් තිබෙනවා. පිට රටවල ඉන්න අපේ විදේශගත ශ්‍රී ලාංකිකයන් ලංකාවට වැඩිම විදේශ ප්‍රේෂණ එවලා තිබෙනවා. ඒ නිසා රට ආර්ථික වශයෙන් මධ්‍යම ආර්ථිකයක් දක්වා වර්ධනය කරන්න රටේ ජනතාව දායක වෙලා තිබෙනවා; රාජ්‍ය සේවකයෝ දායක වෙලා තිබෙනවා; නිලධාරින් දායක වෙලා තිබෙනවා. ඒ නිසා අද මධ්‍යම ආර්ථිකයක් බවට අපි පත් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sunil Handunnetti, you have two more minutes.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් අපිට තවදුරටත් කරන්න තිබෙන්නේ මොකක්ද? පසුගිය කාලයේ අපේ රටේ අපරාධ සංස්කෘතියක් බිහි කළා. ඒකට දේශපාලන වශයෙන් විශාල නායකත්වයක් දුන්නා. අපේ රටේ මිනීමැරුමක් වුණා නම්, මාධ්‍යවේදියෙක් පැහැරගෙන ගියා නම්, මාධ්‍ය ආයතනයකට පහර දුන්නා නම් දේශපාලන පවුලක් ඒක පිටුපස හැමදාම හිටියා. අද ඒ තත්ත්වය නැහැ. ඒක වෙනස් වෙලා තිබෙනවා. හැබැයි, ඒවායේ අවතාර කැරකෙනවා. ඒ නිසා තමයි ත්‍රස්තවාදීන්ට උදව් කරන ඒ මූල්‍ය ගනුදෙනු නතර කරන්න ජාත්‍යන්තරව බැඳිලා තිබෙන නීතිත් එක්ක අපි එකතු වෙන්න ඕනෑකම තිබෙන්නේ. මුදල් විශුද්ධිකරණ පනත අපට වැදගත් වෙන්නේ ඒකත් එක්කයි. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

අපට වැදගත් වෙන්නේ ඒකත් එක්ක. ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීති-රීති ශක්තිමත් වෙන්න ඕනෑ ඒකත් එක්කයි. මොකද, අපි දූපතක් වීම විසින්ම අනෙකුත් රටවල් හා ගනුදෙනු කෙරෙන ආකාරයක් තිබෙනවා. ධීවර කර්මාන්තයත් එක්ක ගැට ගැහිච්ච ආර්ථිකයක් තිබෙනවා අපට. හැබැයි, මේ මුහුදු ගමන් එක්ක මූල්‍ය ගනුදෙනු ඕනෑ තරම් සිද්ධ වෙනවා. Overinvoicing, underinvoicing ක්‍රමවලින් රටින් එළියට මුදල් ගිහිල්ලා තිබෙනවා. පසුගිය කාලයේ වාර්තා වුණා, අපේ ආර්ථිකයට එන්න ඕනෑ සල්ලි ඩොලර් බිලියන 8කට වැඩිය overinvoicing, underinvoicing ක්‍රමවලින් රටින් එළියට ගිහිල්ලා තිබෙනවා කියලා. ඒවා වළක්වන්න ඕනෑ. මේක තමයි system change එක. මේවාට ක්‍රමවේද හදන එක තමයි මේ කරන්නේ. විශේෂයෙන්ම ලෝක බැංකුවේ මේ නිර්දේශ නියෝග අනුවත්, ඒ වාගේම අපි පිළිගන්නා සම්මතයන් අනුවත්, ප්‍රමිතීන් අනුවත් වාර්තා කිරීම නොකරන්නේ නම් ගෙවන දඩ මුදල අපි වැඩි කරලා තිබෙනවා. මේ හැම ක්‍රමවේදයකින්ම රටේ ආර්ථිකය ශක්තිමත් කරනවා.

අපට ජනතාවට දෙන්න පුළුවන් සහතිකයක් තිබෙනවා. ඒ මොකක්ද? විනිවිදභාවයක් සහිත ආර්ථිකයක් අපි හදලා තිබෙනවා. දේශපාලන වශයෙන් අපි දූෂණය බින්දුවටම පත් කර තිබෙනවා. ඒ නිසා අපි මේ රට ඉදිරියට ගෙන යනවා. ඒ සඳහා ශක්තිමත් ආර්ථික ක්‍රමවේදයකට ගැළපෙන නීති-රීති පද්ධතියක් අපි හදනවා කියන එක අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Harsha de Silva. The Floor is yours and you have 12 minutes.

[1.00 p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

At the outset, I want to show you something, Hon. Deputy Speaker. I do not know whether you could see the screen of my phone. See, now it is connecting. Sir, could you see a plane? The plane flies. There is also a number. It flies and suddenly crashes. The idea here is for somebody to bet on exactly where it will crash. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකට අනුව ඒ bet එක හරි ගියොත් දිනන්න පුළුවන්. දැන් වන කොට total bids තිබෙනවා, 1,034,000, 1,011,000 වාගේ ප්‍රමාණ. මේක වෙනස් වෙනවා. Bets තිබෙනවා, 1,500ක්, 83,000ක් ආදි වශයෙන්. මේවා කරන්නේ, online. දරුවෝ මේ කියන සෙල්ලම් කරනවා. මේවාට සල්ලි දාන්නේ කොහොමද? මේවාට ගෙවන ක්‍රම ගොඩක් තිබෙනවා. මම තව එකක් බැලුවා. ඒකට ලංකාවේ සියලුම බැංකුවලින් ගෙවන්නත් පුළුවන්. එකකට අදාළව ගෙවන්න පුළුවන් ක්‍රම මම ගණන් කරලා බැලුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, eZ Cash ආදි වශයෙන් ගෙවන්න පුළුවන් ක්‍රම හැට ගණනක් තිබෙනවා.

මම මේක ගැන කථා කරන්නේ ඇයි? අද ඉදිරිපත් කරලා තිබෙන ඉතාම වැදගත් පනත් කෙටුම්පත් දෙකකට අදාළ ප්‍රධාන කාරණා දෙකක් තමයි AML/CFT. AML/CFT කියන්නේ, Anti -Money Laundering and Counter-Financing of Terrorism. මේකට ඇතුළත් කරලා තිබෙනවා, Virtual Asset Service Providers. ඒ කියන්නේ, cryptocurrencyකාරයෝ වාගේ නොයෙකුත් කට්ටිය. ඒ කට්ටියට, FATF එක යටතේ, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ දඩ ගහන්න පුළුවන්. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාත් අද ඒ සම්බන්ධයෙන් කථා කළා. මේකෙන් හවාලා, උණ්ඩියල් වාගේ ක්‍රම illegal වෙනවා, register කළේ නැත්නම්.

මම මෙහිදී online gaming සහ casino ගැන යමක් කියන්න කැමැතියි. මම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට කියනවා, දැන් Google එකට ගිහිල්ලා ලංකාවේ "online casino" කියා ගහන්න කියලා. ඕනෑම කෙනෙකුට Google එකෙන් තොරතුරු හොයන්න පුළුවන් නේ. "Online casino, Sri Lanka" කියලා ගැහුවාම, එවැනි ගොඩක් ඒවා එනවා. ඒවා නීත්‍යනුකූල ද? ඒවායෙන් මුදල් විශුද්ධිකරණය වැළැක්වෙනවාද? ඒවා පවත්වාගෙන යන්නේ කොහොමද? අපට මතුපිටින් බලා කියන්න පුළුවන්, "අපි නීති ගෙනාවා, අපි නීත්‍යනුකූලව වැඩ කරනවා" කියලා. ඒක හොඳයි. හැබැයි, ඇතුළේ මොකක්ද වෙන්නේ? කවුද මේවා කරන්නේ? මම මේවා ගැන කථා කරන්නේ නිර්භීතවයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, බොහෝ දෙනෙක් කථා කරන්නේ නැහැ මේ සම්බන්ධයෙන්. අද ගෙනෙන සංශෝධනවලින් මේ කියපු දේට අදාළව සිද්ධ වෙන්නේ මොකක්ද? අපි පාර්ලිමේන්තුවට එනකොට දැක්කා, පාර්ලිමේන්තුව ළඟ විශාල බෝඩ් එකක් ගහලා තිබෙනවා. ඒකේ "ක්‍රීඩාවට හැඟීමක්" කියලා සඳහන් කරලා, ළඟදී ජාත්‍යන්තර තරගයකින් ජයග්‍රහණය ලැබූ ලංකාවේ තරුණ කාන්තාවකගේ පින්තූරය දමලා තිබුණා. ඒවා කොහොමද කරන්නේ? ඒවා නීත්‍යනුකූලද?

අපි දැන් බලමු, මෙතැන වෙලා තිබෙන අවුල මොකක්ද කියලා. මෙතැන තිබෙන්නේ නියාමනයේ අසාර්ථකභාවයයි. Online gaming, online casino ලංකාවේ ප්‍රවර්ධනය වෙනවා දැක්කාම 2022දී අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී ඒ ගැන දීර්ඝව සාකච්ඡා කළා. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "මේක මෙහෙම සිද්ධ වෙන්න බැහැ. නියාමනයක් තිබෙන්න ඕනෑ" කියලා. එතකොට, එවකට පැවැති ආණ්ඩුව ඒක පිළිගෙන අපට කිව්වා, "මේක නීත්‍යනුකූල නැහැ. ඒ නිසා මේක නියාමනය කිරීම සඳහා අපි අලුත් නීති ගේන්න ඕනෑ" කියලා. ඒ ගෙනාපු අලුත් නීතිවලට අදාළව නීතිපතිවරයා සහතික කරලා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට කියා තිබෙනවා, Gambling Regulatory Authority Act එකේ explicitly මේ online gamblingවලටම අදාළ වූ නීති තිබෙනවා, ඒවා ලංකාවේ incorporate කරපු කොම්පැනි වෙන්න ඕනෑ කියලා; valid licence එකක් නැතුව ඒවා කෙරෙනවා නම් ඒවා අනීතිකයි කියලා. අප ළඟ ඒ ලියුම් ඔක්කොම තිබෙනවා. එහෙම නම්, මේ ආයතන අනිවාර්යයෙන්ම ලංකාවේ නීතිගත - incorporate - වෙලා තිබෙන්න ඕනෑ. ඔබතුමන්ලා Google ගිහින් යම් යම් දේවල් බලනවා නේ. ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු ඇමතිතුමන්ලා දැන් Google ගිහින්

බලන්නකෝ, මේවායෙන් කීයක් ලංකාවේ registered ද, කීයක් registered නැද්ද කියලා. මම බැලුවා "Contact us" කියන එකේ. සමහර ඒවායේ තිබෙන්නේ එංගලන්තයේ නොම්මර.

Value Added Tax (Amendment) Bill එක pass කළා මීට සතියකට පමණ කලින්. එහිදී කිව්වා, පිටරට ඉඳලා digital services ලංකාවේ විකුණනවා නම් ඒ කට්ටියට VAT එක ගහන්න ඕනෑ, ඒකට register වෙන්න ඕනෑ, licence ගන්න ඕනෑ කියලා. Licence ගත්තු online gambling operatorsලා 29දෙනෙකු ඉන්නවා කියා Inland Revenue Department එකෙන් කියනවා. ඒ බව සඳහන් කරමින් අපි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට අප්‍රේල් මාසයේ 10වන දා - ඒ කියන්නේ, මීට මාස 3කට කලින් - ප්‍රශ්න 18ක් ඉදිරිපත් කර තිබෙනවා, ඒ අයට licence දීලා තිබෙන්නේ කොහොමද, ඒ licence දීලා තිබෙන්නේ මොන නීතියට අදාළවද, කොච්චර බදු ප්‍රමාණයක් එකතු කර ගත්තාද යනාදි වශයෙන්. ඒ ප්‍රශ්න 18න් එකකට මේ මාස තුන ඇතුළත උත්තරයක් එවා තිබෙනවා. ඒක අදාළ වන්නේ මා අර කලින් කියපු VAT registration එකට. නමුත් මේ කිසි දෙයකට උත්තර ලැබී නැහැ. හැබැයි, වැඩේ ලස්සනට කෙරීගෙන යනවා.

මේ අවුරුද්දේ මාර්තු 31වන දා **අපේ** කාරක සභාවට ආවා, ආචාර්ය එන්.එම්.ඩබ්ලිව්.එන්. බණ්ඩාර මහත්මයා; අලුතින් ස්ථාපනය කරපු සූදු ක්‍රීඩා නියාමන අධිකාරියේ සභාපතිවරයා. මේ වැඩ පිළිවෙළ පටන් ගත්තේ 2024දී. මට මතක විධියට 2023 ද කොහේදෝ කැබිනට් අනුමැතිය ලැබුණා. මේක දීර්ඝ ක්‍රියාවලියක් වුණා. අපට අතිශයින්ම කනගාටුයි මෙහි නිලධාරින් මෙච්චර කල් ගත්තාට. ඒ ගැන මම දැන් කථා කරන්නේ නැහැ. කෙසේ වෙතත්, අවසානයේදී මේ නියාමන කමිටුව පිහිටෙව්වා. First phase, second phase වශයෙන් කොටස් කිහිපයකට කඩලා තමයි මේ නියාමනය ක්‍රියාත්මක වෙන්නේ. නියාමනය කරන්න නම් නියාමන රෙගුලාසි ඕනෑ. ඔබතුමන්ලා ඒක දන්නවා. මේ කියන නියාමන කමිටුව පිහිටුවා ඒ කට්ටිය අපට දැනුම් දුන්නා, ජූනි මාසයේ 30වැනි දා වන කොට මේ නියාමන රෙගුලාසි ඉදිරිපත් කරනවා, නොවැම්බර් මාසයේ 30වන දා වන කොට මෙය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වෙනවා කියලා. මම කැමැතියි මුදල් ඇමතිවරයාගෙන් සහ අධිකරණ ඇමතිවරයාගෙන් අහන්න, කෝ ඒ රෙගුලාසි කියලා. අද ජූලි මාසයේ 09වන දා. කෝ ඒවා? ආණ්ඩුවට ඒක ක්‍රියාත්මක කර ගන්න බැරි වෙලා තිබෙනවා. අඩු ගාණේ building එකක්වත්, office එකක්වත් ඒ කට්ටියට තිබෙනවාද? අවම වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කෙනෙකුවත් බඳවා ගත්තා ද? මොනවද කරලා තිබෙන්නේ? අපට update එකක් ඉදිරිපත් කරන්න කියලා කිව්වාට, ඒ කිසි දෙයක් වෙලා නැහැ. මම මේවා anti-money laundering යටතේ ගන්නේ ඇයි? Financial Action Task Force - FATF- කියා එකක් තිබෙනවා. Money laundering කරන රටවල් තිබෙනවා නම්, ඒ අය ඒවාට අදාළව grey list එකක් ගහනවා. එය ලෝකයම බලනවා. Grey list එකක් ගැහුවොත්, අපට ජාත්‍යන්තරයෙන් ලබා ගන්න පුළුවන් සහයෝගය නැති වෙලා යනවා; "මේ, හොරු කණ්ඩායමක්" කියලා කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon, (Dr.) Harsha de Silva, you have two minutes remaining of your allotted time.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
The Chief Opposition Whip will give me another five minutes, Sir, because I am a senior Member.

මේ නීති ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා scam capital එකක් බවට ලංකාව පත් වෙමින් තිබෙනවා. ජපානයේ ප්‍රධානම පත්තරය වන "Nikkei Asia" පත්තරේ පළවෙලා තිබෙන, "Sri Lanka emerges as new online scam hub after Cambodia and Myanmar" කියන මේ ලිපිය මම **සභාගත*** කරනවා.

මොන තරම් ලජ්ජාවක්ද? මේක ජපානයේ ප්‍රධාන පත්තරේ. මෙතැන විශාල ලිපියක් තිබෙන්නේ. මියන්මාරයට, කාම්බෝජයට පස්සේ ලංකාව තමයි ලෝකයේ scam capital එක. මේකේ තිබෙනවා, 400ක්, 500ක් arrest කළා කියලා. That news article states, I quote:

> " 'Cyber-fraud is being reported in an alarming way', Fredrick Wootler, a police spokesperson ......"

It further states, I quote:

> "Raids on suspected cyber-scam operations have resulted in more than 700 foreign nationals being detained ........"

It goes on to state, I quote:

> "Sri Lanka risks becoming not merely a victim of cybercrime but an international operational hub for organized digital criminal cartels."

This is stated by Mahil Dole, former head of the SIS of Sri Lanka. කොහේටද අපි මේ යන්නේ?

Colombo Port City එක හරහා නොයෙකුත් software companies හදන්න කියලා approvals අරගෙන ඒවා පාවිච්චි කරනවා නොයෙකුත් scamsවලට. මේවා money laundering තමයි. මේවා licences නැතුව operate වෙනවා. ලෝක බැංකුවේ ප්‍රධානියා මේ ළඟදී මට කිව්වා, "අපේ බිල්ඩින් එකේ තට්ටු කීයක් තිබෙනවාද කියලා ඇවිල්ලා බලන්න, හර්ෂ. අපි දන්නේ නැති, අපට විශ්වාස කර ගන්න බැරි ආයතන ක්‍රියාත්මක වෙනවා" කියලා. මොනවාද මේ?

වේලාව සීමිත නිසා මම කෙටියෙන් මේ ටික කියන්නම්. අපිට මේ ගැටලු ටික විසඳා ගන්න වෙනවා. අපේ නියාමනයේ තිබෙනවා සිදුරු ගොඩක්. ඒ කියන්නේ online casino operatorsලා register වෙන්න ඕනෑ වුණත්, එතැන යම් කිසි ආකාරයක නීතියේ loophole එකක් තිබෙන නිසා, අපට ආරංචි වන විධියට කිසිම online casino එකක් register වෙලා නැහැ. දැනට තිබෙන නීතිය ඇතුළේ බිල්ඩිමක් ඇතුළේ කැසිනෝ එකක් තිබෙනවා නම්, ඒ කට්ටියට registration එකක් තිබෙනවා. හැබැයි නීතියේ තිබෙනවා, සයිබර් අවකාශයේ තිබෙන casino එකක් ඒ licence එකෙන් පවත්වාගෙන යන්න බැහැ කියලා.

TRC එකෙන් අපි ඇහුවා ඔබතුමන්ලාට මේ පිළිබඳ අයිතියක්, වගකීමක් තිබෙනවාද කියලා. මම දැන් පෙන්නුවේ. දරුවෝ මේ කැසිනෝ ගහනවා. පොඩි කොල්ලො කෙල්ලො මේ කැසිනෝ ගහනවා. ඒකට අම්මාගෙන් හරි තාත්තාගෙන් ඉල්ලාගෙන හරි, eZ Cash එකෙන් හරි සල්ලි දමනවා. එක්කෙනෙක් අද මේ ගැන article එකක් ලියා තිබුණා. කුඩුවලට වඩා ඇබ්බැහි වෙනවා කියලා තිබුණා මේ වැඩේට. අපේ තරුණයන් කුඩුවලට වඩා ඇබ්බැහි වෙනවා කියලා තිබුණා මේ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

වැඩේට. කොයි වෙලාවේත් ගහනවා, ගහනවා, ගහනවා; සල්ලිත් යනවා. TRC එකට කිසිම නෛතික බලයක් නැහැ කියනවා, ඒක නවත්වන්න.

ඊළඟට, misleading advertisements ගැන කියන්නම්. මම මේ ගැන කියලා ලියුමකුත් ඇරියා. මම දැක්කා ගරු මන්ත්‍රීවරුනි, අපේ රටේ ලාංඡනය ගහලා, අපේ ස්වෛරී රාජ්‍යයේ ලාංඡනය ගහලා cricket match එකකදී කියනවා, මේක licensed online game එකක් කියලා. කොහොමද, එහෙම කරන්නේ? කවුද ඒවා බලන්නේ? ඊළඟට, junket operations තිබෙනවා. ඒ junket operationsවලින් කොහොමද කැසිනෝ ගහන්න මුදල් යෙදෙන්නේ? ඒ රටවලින්ම සල්ලි ගෙවලා, ඒ රටවලින්ම බෙදා ගන්නවා. එතකොට කොහොමද අපි ඒවාට tax අය කරන්නේ? ඒවා AML එකට යටත් වෙනවාද? මේ අද ගෙනාපු නීති ක්‍රියාත්මක වෙනවාද? අපේ ඇස් ඉදිරිපිට මේ නීති උල්ලංඝනය වෙනකොට ආණ්ඩුව ඇස් වහගන්නවාද? ඒකයි මම අහන ප්‍රශ්නය. නිර්භීතව අහන ප්‍රශ්නය ඒකයි.

ඊළඟට, Virtual Asset Service Providers. අද ඇමතිවරයා කිව්වා, අද ගෙනෙන නීතියෙන් පස්සේ ක්‍රිප්ටෝ වාගේ ඒවාට licence ගන්න ඕනෑ, එහෙම නැත්නම් ඒවා illegal වෙනවා කියලා. දැන් බලන්න, රුපියල් 1,000ක් දැම්මාම ක්‍රිප්ටෝ ගන්න පුළුවන් ලංකාවේ කෙනෙකුගෙන් USDT. USDT ගත්තාම USDT එක ලෝකයේ ඕනෑම රටකට මාරු කරන්න පුළුවන්. එතකොට මේ නීති ගෙනාවාට වැඩක් නැහැ. ඒ නිසා එක පැත්තකින් ඒවාට අවශ්‍ය රෙගුලාසි ගෙනෙන්න ඕනෑ. අනෙක් පැත්තෙන් ඒ රෙගුලාසි ක්‍රියාත්මක කරන්න capacity එකක් තිබෙන්න ඕනෑ; නියාමන ආයතනයක් තිබෙන්න ඕනෑ. ඒ මොකුත් නැහැ. "ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ" කියනවා, "ඔව්, ඔව්, අපි ඔක්කෝම කළා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් මේ පනත් ගේන එක හොඳයි. හැබැයි, අපි මේකත් තේරුම් ගන්න ඕනෑ. අපේ ඇස් ඉදිරිපිට මේ පනත් උල්ලංඝනය වෙනවා නම්, ඇස්පියා ගන්න එක නොවෙයි ආණ්ඩුවක වගකීම. ඒ වගකීම තමයි මේ නීති ක්‍රියාත්මක කිරීම. අපි මේ වංචාවලට, දූෂණවලට නැහැ. අපි කෙළින් කථා කරනවා. හරිද? අවසාන වශයෙන් කියන්නේ මේකයි. අපි සියයට 100ක් මේවාට එකඟයි; විපක්ෂය එකඟයි. අපි කිසි විධියකට මේවාට එකඟ නැත්තේ නැහැ. හැබැයි, ඒ එකඟත්වය තිබෙන්නේ බොරුවට සෝබනයට මේවා කරන එකට නොවෙයි, ඇත්ත වශයෙන්ම මේවා මහපොළවේ ක්‍රියාත්මක කරන එකටයි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Thilina Samarakoon. You have ten minutes.

[අ.භා. 1.17]

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙන මේ සංශෝධන පනත් පිළිබඳව මගේ පැත්තෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මුලින්ම සතුටු වෙනවා. ඒවාට අදාළව ගත්තාම, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සංශෝධන හඳුන්වා දීම, ඒ වාගේම 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධන හඳුන්වා දීම, ඒ වාගේම 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට සංශෝධන හඳුන්වා දීම තිබෙනවා. මෙන්න මේ පනත් තුනට අදාළ කරුණු තමයි අද මේ පාර්ලිමේන්තුව ඇතුළේ අපි සාකච්ඡාවට ලක් කරන්නේ.

ඉතින් මේ කාරණා මතු කරමින් තිබෙන මොහොතක විපක්ෂයේ ගරු මන්ත්‍රී, අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාගේ පැත්තෙන් අදහසක් යොමු කළා, විශේෂයෙන්ම online casino සම්බන්ධව. එහෙම නැත්නම් online ආශ්‍රිතව කරන games සම්බන්ධව. ඇත්තටම එතුමාත් දන්නවා, රජයේ මුදල් කාරක සභාවේදී අපි මේවා පිළිබඳව සාකච්ඡා කළ බව. අපි කිසි ලෙසකින්වත් මේවා නොසලකා හැර නැහැ. මේ අවුරුදු එකහමාර ඇතුළත අපි මේවා යම් නීතිමය රාමුවකට ගෙන එන්න අවශ්‍ය මැදිහත්වීම මේ වන විට කරමින් ඉන්නවා.

දැන් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු රැඳිලා ඉන්නවා. ඒ වාගේම අපේ පාසල් දරුවෝ ගැලරියේ ඉඳගෙන මේ සභාව නරඹමින් ඉන්නවා. ඒ නිසා ඒ අයට වැරදි අදහසක් යන්න පුළුවන්, ආණ්ඩුවක් හැටියට අපි මේවාට හරියට මැදිහත් නොවෙනවා කියලා. මේ online casino කියන එක digital platform එකක් හරහා තමයි සිද්ධ වෙන්නේ. කොහේ හරි office එකක් දාලා, මිනිස්සු දෙන්නෙක් තුන්දෙනෙක් වාඩි වෙලා, පෙනෙන්න බෝඩ් එකක් ගහගෙන කරන දෙයක් නොවෙයි මේක. මේ digital platform එකක් ඇතුළේ සිද්ධ වෙන බොහෝ දේවල් සොයා බැලීම සහ ඒවා නියාමනය කිරීම සඳහා අපට යම්කිසි දැනුමක්, යම්කිසි අත්දැකීම් ප්‍රමාණයක්, ඒකට අදාළ capacity එකක් තියෙන්න ඕනෑ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, අපි රටේ පාලනය භාර අරගෙන අවුරුද්දක් එකහමාරක වාගේ කාලයක් ඇතුළත මේ කටයුතු කරමින් සිටින බව. හැබැයි, පසුගිය අවුරුදු හැත්තෑ ගණනකට ආසන්න කාලසීමාව තුළදී මෙන්න මේවා නියාමනය කිරීම සඳහා යම්කිසි අවධානයක් යොමු වෙලා නැහැ. එතකොට අපි ජනාධිපතිතුමා යටතේ ඩිජිටල් අමාත්‍යාංශයක් හදලා, දැන් ඒ ආශ්‍රිතව කටයුතු ටික සැලසුම් කරමින් ඉන්නවා. ඒකට අදාළ මැදිහත්වීම් මේ වන විට සිද්ධ කරමින් ඉන්නවා. ගරු මන්ත්‍රීතුමාත් දන්නවා, TRC එක ගෙනැල්ලා මේ ගැන කථා කරපුවාම මේ digital platform එක නියාමනයට අදාළ තාක්ෂණික පසුබිම ප්‍රමාණවත් නැහැ වාගේ කියන අදහසක තමයි ඔවුන් හිටියේ. ඉතින් අපි ඒවාට අදාළ මැදිහත්වීම් මේ වන විට කරමින් ඉන්නවා. එතකොට ඒකට අදාළ නියාමනය ඉදිරියේදී සිද්ධ කරන්න නියමිතයි. අපි මේ දේවල් කොතැනකින් හරි පටන් ගන්න ඕනෑ. මුදල් විශුද්ධිකරණය වෙන්න පුළුවන්. වැරදි විධියට රට ඇතුළට මුදල් එන ක්‍රම වෙන්න පුළුවන්, එහෙම නැත්නම් virtual assets සාමාන්‍ය මුදල් බවට පත් වෙන එක වෙන්න පුළුවන් ඒවාට අදාළ නීති අණ පනත් හදමින් කොතැනකින් හරි මේ වැඩේ ආරම්භ - start - කරන්න ඕනෑ; එතකොට අද මේ කරන්න බලාපොරොත්තු වෙන්නේ, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත ශක්තිමත් කරලා, මෙන්න මේ කියපු කරුණුවලට අදාළ මැදිහත්වීම් කරන්න අවශ්‍ය නීති රාමුව හදා ගැනීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ඉතිහාසය ගත්තාම, අපේ රට අපරාධ රාජ්‍යයක් විධියට තමයි ලෝකය ඉදිරියේ යම්කිසි විධියක නාමකරණයකට ලක් වෙලා තිබුණේ. දැන්

එතුමාගේ කථාබහ ඇතුළේම කිව්වා, ජාත්‍යන්තරව පිළිගත් සංවිධාන විසින් අපව grey list එකට, එහෙම නැත්නම් grey colour එකට යොමු කරලා තමයි අපේ රටේ මුදල් විශුද්ධිකරණයට අදාළ තත්ත්වයන් දක්වා තිබුණේ. මේවා වෙනස් කරන්න ඕනෑ. ඒ වෙනස් කිරීමට අදාළ මැදිහත්වීම තමයි අපි මේ කරමින් ඉන්නේ. පසුගිය කාල සීමාව තුළ එක් පැත්තකින් අපේ රටේ දේශපාලන යන්ත්‍රණය වෙන්න පුළුවන්; ඒ වාගේම කළු සල්ලි සොයන ලද ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්; මත්ද්‍රව්‍ය වෙළෙන්දන් වෙන්න පුළුවන්; වෙනත් දූෂණ වංචාවලට සම්බන්ධ පිරිස් වෙන්න පුළුවන් - යම්කිසි විධියකට මෙන්න මේ මුදල් විශුද්ධිකරණයට අදාළ කටයුතුවල නිරත වෙමින් වැරදි විධියට මුදල් උපයාගැනීම් සිද්ධ කර තිබෙනවා. අපි දැන් ඒවා වෙනස් කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි, දැන් අපේ අධිකරණ ක්‍රියාවලිය ඇතුළේ හෙළි වෙමින් තිබෙන බොහෝ වංචා, දූෂණ ගත්තාම, white-collar crimes - එහෙම නැත්නම් නිලධාරි යන්ත්‍රණය; එහෙමත් නැත්නම් තමන්ගේ බලය භාවිත කරමින් කරපු වංචා, දූෂණ - තමයි මේ හෙළි වෙමින් තිබෙන්නේ. ඒ වාගේ දේවල් රටක් විධියට හෙළි කරගනිමින් සිටින මොහොතක තමයි අපි මේ නීති, අණ පනත් රටට ඉදිරිපත් කරන්නේ. වංචා, දූෂණ සම්බන්ධව ආණ්ඩුවක් විධියට අපි මේ වන විට ගනිමින් සිටින ක්‍රියාමාර්ග තුළ අපි දැන් ලෝක ශ්‍රේණිගත කිරීම්වලින් යම්කිසි ඉහළ තැනකට, හොඳ මට්ටමකට එමින් තිබෙනවා. රටේ ජනතාව අපට ඡන්දය දීලා බලාපොරොත්තු වුණෙත් මෙන්න මේ දූෂණ, වංචා වළක්වාගෙන අපි යහපත් විධියට රට පාලනය කරයි කියලායි.

මේ නීති ශක්තිමත් කර අපි බලාපොරොත්තු වන අනෙක් කාරණය මෙයයි. යම්කිසි වංචාවක්, දූෂණයක් සිදු කර; එහෙම නැත්නම් යම්කිසි ගේම් එකක් ගහලා, මොකක් හෝ වැරදි ක්‍රියාවක් තුළින් උපයා ගන්නා ලද මුදලක් සාමාන්‍ය - normal - cash flow එකට ඇතුළත් කරන්න යම්කිසි කෙනෙක් බිය වෙන්න ඕනෑ. පසුගිය ඉතිහාසය තුළ එහෙම බියවීමක් තිබුණේ නැති නිසා තමයි සමහර අය පගාව විධියට වෙන්න පුළුවන් වැරදි විධියට ගත්ත මුදල් යම් යම් තැන්වල ආයෝජනය කරලා, වෙනත් කටයුතුවලට යොදවලා, වත්කම් මිලදී ගෙන තිබෙන තත්ත්වයක් තිබුණේ. මෙන්න මේ අණ පනත් ශක්තිමත් කිරීම තුළින්; ඒවායේ පරාසය වැඩි කිරීම තුළින්; වැරදි විධියට උපයන මුදල් සාමාන්‍ය cash flow එකට ඇතුළත් කරන්න බැරි තත්ත්වයක් නිර්මාණය කරන්න අපි උත්සාහ කරනවා.

මේ වාගේ දේවල් කථා කරන එක ඇතුළේ - අද දින 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සංශෝධන හඳුන්වා දෙන එක ඇතුළේ - නීතිවිරෝධී ක්‍රියාකාරකම්වලින් උපයාගන්නා ලද ඕනෑම දේපළක් පරිවර්තනය කිරීම සහ ඕනෑම නීතිවිරෝධී ක්‍රියාකාරකමකින් උපයාගන්නා ලද ඕනෑම දේපළක් අර්ථලාභී හිමිකාරිත්වය අත්පත් කර ගැනීම ආවරණය වන පරිදි මුදල් විශුද්ධිකරණ විෂය පථය පුළුල් කරන්න බලාපොරොත්තු වෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, කුමක් හෝ හිමිකාරත්වයක් ඇති සමාගමක කොටස් ටිකක් මිලදී ගැනීමේදී ප්‍රාග්ධනය වශයෙන් මෙන්න මේ වෙන විධියකට උපයා ගත් මුදල් යොදා තිබෙනවා කියලා අපට සැකයක් තිබෙනවා නම්, ඒක හොයන්න අවශ්‍ය විෂය පථය පුළුල් කරනවා; එහෙම නැත්නම් ඒක හොයාගෙන යන්න පුළුවන් දුර අපි පුළුල් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ක්‍රියාවිරහිත කිරීමේ නියෝග සම්බන්ධයෙන් සලකා බැලුවොත්, මූලික නියෝගය සඳහා කලින් පැවති දින 7ක කාලය වැඩ කරන දින 14 දක්වා දීර්ඝ කිරීම සහ මහාධිකරණය විසින් වරකට ලබාදිය හැකි උපරිම දීර්ඝ කිරීම මාස 4 දක්වා වැඩි කිරීම සහ එවැනි දීර්ඝ කිරීම්වල සමස්ත එකතුව උපරිම වශයෙන් වසර 3ක් දක්වා බලපැවැත්විය හැකි වන සේ සංශෝධනය කර තිබෙනවා. මේකට අදාළ අදහස ඔබට තේරුම් ගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, විශේෂ විමර්ශන ශිල්පීය ක්‍රමවේද සහ ඒකාබද්ධ විමර්ශනවලට අදාළ විධිවිධානත් හඳුන්වා දී තිබෙනවා. ඒ කියන්නේ මේ විමර්ශනවලට අදාළ ශිල්පීය ක්‍රම හඳුන්වා දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි, විමර්ශනය අතරතුර යම් තැනැත්තකු විසින් පොලිස් නිලධාරියෙකුට ලබා දුන් දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරා ලබා දුන් ප්‍රකාශයක් ලබා දීම සඳහා විධිවිධාන හඳුන්වා දීම සහ එවැනි දිවුරුම් ප්‍රකාශයක් සහ දිවුරා ලබා දුන් ප්‍රකාශයක ආවේශ්‍යතාව පිළිබඳ විධිවිධාන හඳුන්වා දී තිබෙනවා. ඒ වාගේම 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනතට අනුකූලව මුදල් විශුද්ධිකරණයට සම්බන්ධ දේපළ රාජසන්තක කිරීම, කළමනාකරණය කිරීම සහ බැහැර කිරීම සඳහා වූ,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thilina Samarakoon, you have two minutes left.

**ගරු තිළිණ සමරකෝන් මහතා**
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙන්න මේ වාගේ කාරණා ගණනාවක් පනත් දෙක තුළ සංශෝධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ පනත් කෙටුම්පත තුළින් බලාපොරොත්තු වන කාර්යයන් තමයි, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සුපිළිපන් බව ආරක්ෂා කිරීම, ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම සහ මූල්‍ය කාර්යසාධන බලකාය රාමුව යටතේ ජාත්‍යන්තර බැඳීම් සපුරාලීම. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා කියපු විධියට, Financial Action Task Force එකෙන් තමයි අපට අර grey colour එක දීලා තිබුණේ. අන්න ඒ අවශ්‍යතා සපුරා දීම සඳහාත් මෙන්න මේ කටයුතු සිද්ධ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මෙන්න මේ වාගේ කාරණා සාකච්ඡා කරන එක ඇතුළේ, 2006 අංක 6 දරන පනතේ සංශෝධන අනුව, Central Bank එක හරහා ක්‍රියාත්මක වෙන Financial Intelligence Unit of Sri Lanka - FIU - එක, ශක්තිමත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ වාගේ කාර්යයන් ශක්තිමත් කරමින් මුදල් විශුද්ධිකරණයට අදාළ නීති, අණ පනත් සංශෝධනය කරලා ශක්තිමත් කරන අවස්ථාවක මේ කටයුත්ත කරන්න විපක්ෂයෙනුත් හොඳ සහයෝගයක් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ජනතාව බලාපොරොත්තු වෙන්නේ මේ රටේ හොඳ නීතියක් ගොඩ නඟලා වැරදි විධියට මුදල් උපයන එක නතර කිරීමයි. ඒ සඳහා අද දවසේ විපක්ෂයෙනුත් සහයෝගය ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. අපි ආණ්ඩුවක් විධියට දරන මේ උත්සාහය සඳහා විපක්ෂයේ කාර්ය භාරය හොඳ විධියට කරමින් ඔබතුමන්ලාගේ යහපත් ප්‍රතිචාර ලැබෙයි කියා බලාපොරොත්තු වෙන බව සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan. You have seven minutes.

[பி.ப. 1.27]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நாடாளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள, பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம், நிதிசார் கொடுக்கல்வாங்கல்களை அறிக்கையிடல் (திருத்தம்) சட்டமூலம் ஆகியன குறித்த விவாதத்தில், எனது கருத்துகளை எடுத்துரைக்க விழைகின்றேன். பணச்சலவை என்பது சட்டத்துக்குப் புறம்பான வழிகளில் ஈட்டப்படும் கறுப்புப் பணத்தை, முறையான வணிகம் மற்றும் முதலீடுகள்மூலம் வெள்ளைப் பணமாக மாற்றும் ஒரு நடவடிக்கை ஆகும். கறுப்புப் பணத்தை வெள்ளைப் பணமாக மாற்ற முனைவோர் மூன்று படிகளைக் கையாள்கின்றனர். முதலாவதாக, சட்டத்துக்குப் புறம்பாகப் பெற்ற பணத்தை வைப்பகக் கணக்குகளிலோ அல்லது முறையான நிதி அமைப்புகளிலோ சிறுசிறு தொகைகளாக உள்ளே செலுத்துதல்; இரண்டாவதாக, பணத்தின் உண்மையான மூலத்தைக் கண்டறிய முடியாதவாறு, அந்தப் பணத்தைப் பல வங்கிக் கணக்குகளுக்கு மாற்றுவது, வெளிநாடுகளுக்கு அனுப்புவது அல்லது பங்குகளில் முதலீடு செய்வது போன்ற சிக்கலான பணப் பரிமாற்றங்களைச் செய்தல்; மூன்றாவதாக, பல அடுக்குப் பரிமாற்றங்களுக்குப் பிறகு, அந்தப் பணத்தை முற்றிலும் சட்ட அடிப்படையிலான வருமானம் போலக் காட்டி, அதனை நிலக் கொள்வனவு அல்லது வணிகங்களில் முதலீடு செய்து தமக்குச் சொந்தமாக்கிக் கொள்ளுதல். இவற்றைத் தடுப்பதற்காக இங்கு முன்வைக்கப்பட்டுள்ள இந்தத் திருத்தங்கள், நிதி உலகில் ஏற்பட்டுள்ள புதுமையான மாற்றங்களை உள்வாங்கி, குற்றவாளிகள் தப்புவதற்கான துவாரங்களை அடைக்கும் வகையில் வடிவமைக்கப்பட்டுள்ளன.

எண்மிய நாணயம் மற்றும் மெய்நிகர் சொத்துப் பரிமாற்றங்கள் இதுவரை போதிய கண்காணிப்புக்கு உள்ளாகாமல் இருந்தன. புதிய சட்டத் திருத்தங்கள் இவற்றை நிதிப் புலனாய்வுப் பிரிவின்கீழ்க் கொண்டுவருகின்றன. நிறுவனங்களில் வெறும் காகிதத்தில் இருக்கும் நபர்களைத் தாண்டி, அவற்றுக்குப் பின்னால் இருக்கும் உண்மையான பயனாளிகளைத் துல்லியமாகக் கண்டறியும் கட்டாய விதிமுறைகள் சேர்க்கப்பட்டுள்ளன. நிதி நடவடிக்கைப் பணிக்குழுவின் பரிந்துரைகளின் அடிப்படையில், சட்டச் செயலாக்க அதிகாரங்கள் விரிவாக்கப்பட்டுள்ளன. வங்கி அல்லாத நிதி நிறுவனங்கள் மற்றும் சட்ட வல்லுநர்கள் முதலியோர் ஐயத்திற்குரிய பெரிய பணப் பரிவர்த்தனைகளை அறிக்கை செய்வதற்கான முறைகள் மறுசீரமைக்கப் பட்டுள்ளன.

2026ஆம் ஆண்டின் 60ஆம் எண்ணிட்ட பணச் சலவைத் தடுப்புத் திருத்தச் சட்டமானது, 2006ஆம் ஆண்டின் 5ஆம் எண் கொண்ட மூலப் பணச் சலவைச் சட்ட வரையறையை மாற்றியமைப்பதோடு, புதிய விசாரணை வழிமுறைகளையும் அறிமுகப்படுத்துகிறது. இந்தத் திருத்தச் சட்டமானது மூலச் சட்டத்தில் 3A என ஒரு புதிய பிரிவைச் சேர்க்கிறது. இது பணச் சலவையை ஒரு தன்னாதிக்கக் குற்றமாக நிறுவுகிறது. மேலும், குறிப்பிட்ட ஒரு சொத்துச் சட்டத்துக்குப் புறம்பான நடவடிக்கைமூலம் பெறப்பட்டது என்ற ஆதாரத்தின் அடிப்படையில், சுயாதீனமான குற்றச்சாட்டுக்களைப் பதிவுசெய்ய ஒப்புதல் அளிக்கிறது. இப்பிரிவானது, "சட்டத்துக்குப் புறம்பான நடவடிக்கையின் வருவாய்" என்ற சட்ட மொழியை "ஏதேனும் சட்டத்துக்குப் புறம்பான நடவடிக்கையின் வருவாய்" அல்லது "அத்தகைய சொத்தின் ஏதேனும் பரிமாற்றம்" என விரிவுபடுத்துகிறது. இதுபோன்ற சொத்துக்களைப் பயன்படுத்துதல், வாங்குதல், மாற்றுதல் அல்லது அவற்றின் உண்மையான உரிமையைப் பெறுதல் ஆகியவற்றைக் குற்றமாக்குகிறது. அத்தோடு, இச்செயல்களுக்கு உடந்தையாக இருப்பவர்களுக்கும் அல்லது அறிவுரை வழங்குபவர்களுக்கும் பொறுப்பை நீடிக்கிறது.

இந்தத் திருத்தம் மூலச் சட்டத்தின் உப பிரிவு 3(1)இலுள்ள "ஐந்து ஆண்டுகளுக்குக் குறையாத காலத்திற்கு" என்ற சொற்றொடருக்கு மாற்றாக, "ஒரு காலப்பகுதிக்கு" என மாற்றுவதன்மூலம், நீதிபதிகளுக்குப் பரந்த ஒறுப்பு அளிக்கும் அதிகாரத்தை வழங்குகிறது. மேலும், இத்திருத்தச் சட்டத்தின் பிரிவுகள் 8, 9 மற்றும் 12 ஆகியன உதவிப் பொலிஸ் அத்தியட்சகர் - ASP தரத்திற்குக் குறையாத ஓர் அதிகாரிக்கு நியாயமான ஐயத்தின் அடிப்படையில் சொத்துக்களை முடக்கும் ஆணையைப் பிறப்பிக்கும் அதிகாரத்தை வழங்குகின்றன. இந்தத் திருத்தமானது, தொடக்க நிருவாக முடக்கல் காலத்தை ஏழு நாட்களிலிருந்து பதினான்கு வேலை நாட்களாக நீடிக்கின்றது. மேலும், நீதிமன்றத்தால் விதிக்கப்படும் அதிகபட்ச முடக்கல் காலத்தை இரண்டு ஆண்டுகளிலிருந்து மூன்று ஆண்டுகளாக உயர்த்துகிறது. இத்திருத்தச் சட்டமானது, பிரிவு 17C, 17D மற்றும் 17E ஆகிய பிரிவுகளைச் சேர்ப்பதன்மூலம் இரகசியச் செயற்பாடுகள், மின்னணு கண்காணிப்பு மற்றும் கணினி அமைப்புகளுக்கான நேரடி அணுகல் உள்ளிட்ட சிறப்பு உசாவல் முறைகளைப் பயன்படுத்த ஒப்புதல் அளிக்கிறது.

அடுத்ததாக, 2026ஆம் ஆண்டின் 58ஆம் எண் கொண்ட நிதிப் பரிவர்த்தனைகள் அறிக்கைப்படுத்தல் திருத்தச் சட்டமூலமானது, 2006ஆம் ஆண்டின் 6ஆம் எண்ணிட்ட மூலச் சட்டத்தின் ஒழுங்குமுறை எல்லைகளை விரிவுபடுத்துவதோடு இணக்கப்பாட்டு ஆணைகளையும் அதிகரிக்கின்றது. இந்தத் திருத்தச் சட்டத்தின் 34 மற்றும் 39ஆம் பிரிவுகள் மெய்நிகர் சொத்துச் சேவை வழங்குநர்களை இச்சட்ட வரம்பிற்குள் கொண்டுவருவதோடு, எண்மிய நாணயப் பரிமாற்றம், பாதுகாப்பு மற்றும் பரிமாற்ற சேவைகளை உள்ளடக்கு கின்றன.

மேலும், சட்டத்தரணிகள், கணக்காளர்கள், இரத்தினக்கல் வியாபாரிகள் உள்ளிட்ட வங்கி சாராத பல வணிகங்கள் மற்றும் தொழில்களின் இணக்கப்பாட்டுக் கடமைகளை விரிவுபடுத்துகின்றது. இந்தத் திருத்தச் சட்டத்தின் 21 மற்றும் 26ஆம் பிரிவுகள், நிதிப் புலனாய்வுப் பிரிவுக்கு ஆவணங்கள் மற்றும் விளக்கங்களைக் கோரவும் உசாவல்களை நடத்தவும் கணக்குகளைக் கண்காணிக்கவும் அறிக்கை செய்யவும் நிறுவனங்களுக்குப் பணிக்கவும் பரந்த அதிகாரத்தை வழங்குகின்றன. மேலும், நிதிப் புலனாய்வுப் பிரிவு அதிகாரிகளுக்கு வளாகங்களுக்குள் நுழையவும் பதிவேடுகளை ஆய்வு செய்யவும் ஒப்புதல் அளிக்கின்றன.

இந்தத் திருத்தமானது, நிறுவனங்களும் அவற்றின் அதிகாரிகளும் தமது வாடிக்கையாளர்களுக்கு அவர்களது பரிவர்த்தனைகள் உசாவலில் உள்ளன என்று தெரியப்படுத்துவதைத் தடை செய்கிறது. இவ்வாறான திருத்தங்கள் உள்ளபொழுதிலும், இந்தச் சட்டமூலங்கள் பற்றி சில விமர்சனங்களுக்கும் உள்ளன. இந்தத் திருத்தச் சட்டங்கள் 'வணிகம் செய்வதற்கான எளிமை' என்ற குறியீட்டில் இலங்கையைப் பாதிக்கும் என்று முதலீட்டாளர்கள் கருதுகின்றார்கள். அந்த அதிகாரங்கள் அரசியல் எதிரிகளுக்கு எதிராகத் தவறாகப் பயன்படுத்தப்படலாம் என்ற அச்சத்தைச் சிவில் சமூகத்தினர் தெரிவிக்கின்றனர். சட்டத்தரணிகள்

மற்றும் கணக்காளர்கள், தங்கள் வாடிக்கையாளர்களின் தகவல்களைத் தன்னிச்சையாக முன்வைப்பது, 'வாடிக்கையாளர் தொழில்முறை இரகசியம்' என்பதற்கு எதிரானது என்று வாதாடுகின்றார்கள்.

மேற்படி விமர்சனங்களை மட்டுப்படுத்தி, இந்தத் திருத்தச் சட்டங்களை வலுப்படுத்தப் பின்வரும் பரிந்துரைகளை நான் முன்வைக்கின்றேன்:

1. நிதிப் புலனாய்வுப் பிரிவானது, எந்தெந்தச் சூழலில் தகவல்களைக் கோரலாம் என்பது குறித்த தெளிவான நெறிமுறைகளை வெளியிட வேண்டும்.
2. சட்டத்தரணிகள் மற்றும் தொழில் வல்லுநர்கள் தமது வாடிக்கையாளர்களது தனிப்பட்ட இரகசியத்தைப் பாதுகாக்கும் அதேவேளையில், குற்றங்களைத் தடுக்கும் சமநிலையான சட்டப் பிரிவுகள் சேர்க்கப்பட வேண்டும்.
3. இந்தச் சட்டத்தைச் செயற்படுத்துவதில் ஏதேனும் தவறுகள் நடக்கிறதா என்பதைக் கண்காணிக்க ஒரு சுதந்திரமான மேற்பார்வைக் குழுவை அமைக்க வேண்டும்.
4. சிறு மற்றும் நடுத்தர நிறுவனங்களுக்கு இந்த விதிகளைச் செயற்படுத்துவதில் கூடுதல் கால அவகாசம் மற்றும் தொழில்நுட்ப உதவிகளை அரசு வழங்க வேண்டும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பன்னாட்டு நிதி அமைப்புகளின் நம்பகத்தன்மையை நாம் இழந்துவிட்டால், அதன் விளைவுகள் ஒட்டுமொத்தப் பொருளாதாரத்தையும் பாதிக்கும். எனவே, இங்கு முன்வைக்கப்பட்டுள்ள பரிந்துரை களை ஏற்று, இந்தத் திருத்தச் சட்டமூலங்களை நிறைவேற்றுவது நாட்டின் எதிர்காலத்திற்கு உகந்தது எனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Wijesiri Basnayake. The Floor is yours and you have ten minutes.

[අ.භා. 1.33]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැදගත් විවාදයට සම්බන්ධවීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අද දවස පුරාවටම ප්‍රධාන පනත් කෙටුම්පත් තුනක් පිළිබඳව අපි සාකච්ඡා කරනවා. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත - Prevention of Money Laundering (Amendment) Bill -, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත - Financial Transactions Reporting (Amendment) Bill - සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත - Convention on the Suppression of Terrorist Financing (Amendment) Bill.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට ප්‍රථම විපක්ෂ නායකතුමාත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාත් මේ පිළිබඳව සාකච්ඡා කළා. විශේෂයෙන්ම විපක්ෂ නායකතුමාගේ කථාව තුළින් අපි බලාපොරොත්තු වුණා money laundering පිළිබඳව සුවිශේෂී, විෂයබර වැදගත් කථාවක්. නමුත් එතුමාගේ කථාව තුළ ඒ කිසිම දෙයක් සාකච්ඡා වෙන්නේ නැහැ. ඒක මේ රටේ ඛේදවාචකයක්. අපට ඕනෑ - ආණ්ඩු පක්ෂයට ඕනෑ - updated විපක්ෂ නායකයෙක්. එහෙම එක්කෙනෙක් නොවෙයි ඉන්නේ. එතකොට අපිත් අපේ කථාවලදී ටිකක් පස්සට යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියනවා, අද රටේ සාමය බිඳ වැටිලාලු, අධිකරණ පද්ධතිය කඩාගෙන වැටිලාලු, මත්ද්‍රව්‍ය, මිනී මැරුම්, පාතාලය රජ වෙලාලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපේ සමාජ ආර්ථික දේහය පාතාලය, මිනී මැරුම් සහ මත්ද්‍රව්‍යවලින් පිරිලා තිබෙන්නේ ඇයි? ඒකේ ප්‍රධාන නිර්මාපකයෝ කවුද? ඒ, වෙන කවුරුවත් නොවෙයි, 1977දී බලයට පත් වුණු එක්සත් ජාතික පක්ෂයයි. අපි දැක්කා, 1978දී ඔවුන් හඳුන්වා දුන් ත්‍රාඩ, ලුම්පන්, පාදඩ ලිබරල් ආර්ථිකය. ඒ තුළ ඉස්සරහට ආවේ මුදල්. නැහැ මානව ගුණධර්ම; නැහැ අධ්‍යාත්මය; නැහැ සාරධර්ම; නැහැ හර පද්ධතීන්. ඒවා බල්ලට දැම්මා. ඒකේ ප්‍රතිඵලයක් විධියට රටේම ජනතාව මුදල් පස්සේ දුවන පිස්සෝ බවට පත් වුණා. ඒකේ ප්‍රතිඵලයක් විධියට අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේ රටේ 1977 ඉඳන් මේ වෙනකම් බලයට ආ හැම ආණ්ඩුවක්ම කළේ පාතාලය සහ මැර කණ්ඩායම් මුල් කරගෙන, ඔවුන්ගේ කරට අත දාගෙන වැඩ කරපු එක.

මනෝරි මුත්තෙට්ටුවේගමගේ සභාපතිත්වයෙන් පත් කළ අතුරුදහන්වූවන් පිළිබඳ ජනාධිපති කොමිසමේ conclusion එක - නිගමන - තුළින් ඒ අශිෂ්ට ක්‍රියාකාරකම් පිළිබඳ මනා චිත්‍රයක් පැහැදිලි කළා. දේශපාලනයේ ප්‍රබල චරිත පාතාලය එක්ක සම්බන්ධතා පැවැත්වූ ආකාරය ගැන එහි සඳහන් වුණා. ගෝනවල සුනිල්ලා, සොත්ති උපාලිලා, බැද්දගානේ සංජීවලා එක්ක බැඳුණු ඒ ජරා සංස්කෘතිය ගැන එහි සඳහන් වුණා. ඒ ජරා සංස්කෘතියත් එක්ක තමයි අද වනකොට රටේ සමාජ දේහය කුණු වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි උත්සාහ කරන්නේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේ අපි කියපු ඒ system change එකට නව පරිච්ඡේදයක් දෙමින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ සංශෝධන ගෙන එන්නයි. අපේ ගරු හර්ෂ ද සිල්වා සභාපතිතුමා පැහැදිලි කළා, online gaming සහ online casino පිළිබඳව. ඔව්, අපි ඒ පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කළා. ඒ සඳහා මේ වනකොට Authority එකක් නිර්මාණය කරලා, සභාපතිවරයෙක් පත් කරලා, කාර්ය මණ්ඩල පත් කරලා ක්‍රමයෙන් ඒකට අවශ්‍ය කොන්දේසි, නිර්දේශ නිර්මාණය වෙමින් තිබෙන්නේ. අපට මේ තත්ත්වය එක රැයකින් වෙනස් කරන්න බැහැ, පෙරළන්න බැහැ. අප සියලුදෙනා එකතු වෙලා මේ ලස්සන රට තවත් සුන්දර කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් විශුද්ධිකරණය කියන්නේ මොකක්ද? ඉපැයූ ආකාරය හෙළිදරව් කරන්න බැරි මුදල් පිළිගත හැකි වත්කම් බවට පරිවර්තනය කිරීමයි. මෙන්න මෙතැනදී තමයි reporting පිළිබඳ ප්‍රශ්නය එන්නේ. ඔවුන් කළු සල්ලි උපක්‍රමශීලීව සුදු සල්ලි බවට පරිවර්තනය කරනවා. විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම කියන කාරණා මුළු ලෝකයේම තිබෙන ගැටලුවක්. එම ගැටලුව ලෝකයේ මූල්‍ය පද්ධති හොල්ලලා තිබෙනවා. එය රටක ජාතික ආරක්ෂාවට වාගේම රටේ ආර්ථික ස්ථායිතාවටත් බලපාන ගැටලුවක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF එක - කියනවා, "ලෝක නිෂ්පාදිතයේ මූල්‍ය වටිනාකමින් සියයට 2ත්, 5ත් අතර ප්‍රමාණයක මුදල්, විශුද්ධිකරණයට ලක් වුණු මුදල්" කියලා. ඔබතුමාට ඒකෙන්ම අවබෝධ වනවා ඇති, මේකේ බරපතළකම.

[ගරු විජේසිරි බස්නායක මහතා]

මේ තුළින් ලෝකය පුරා මූල්‍ය අපරාධ බහුල වෙලා තිබෙනවා. ඒකට එරෙහිව කටයුතු කරන්න 1989දී මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය - Financial Action Task Force එක - නිර්මාණය වනවා. ඔවුන් ගෝලීය නීති සම්පාදකයා, ප්‍රතිපත්ති සම්පාදකයා විධියට මේ දේවල් මැඩ පවත්වන්න ක්‍රියා කරනවා. ඒ සඳහා ඔවුන් විවිධ නිර්දේශ ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය රටවල් අන්තර්ගත කරලා මේ වනකොට ලැයිස්තු දෙකක් නිර්මාණය කර තිබෙනවා. ඒකේ පළමුවන එක තමයි, black list එක. ඒ, කළු ලැයිස්තුවට එන්නේ කවුද? මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීමට එරෙහිව දැඩි ලෙස කටයුතු නොකරන රටවල්. විශේෂයෙන්ම ඉරානය, උතුරු කොරියාව හා මියන්මාරය වාගේ රටවල් ඒ list එකේ ඉන්නවා. ඒකේ දෙවැනි list එක තමයි, grey list එක. ඒකට අයිති වන්නේ මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදීන්ට මූල්‍ය සැපයීම වැළැක්වීමට ටිකක් දුර්වල රටවල්. එම ලැයිස්තුවේ ශ්‍රී ලංකාවත් තිබුණා. නමුත්, වැඩිදියුණු කරන ලද මූල්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම නිසා අපි 2019දී එම ලැයිස්තුවෙන් එළියට එනවා. එම මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකායේ ඊළඟ අන්‍යෝන්‍ය ඇගැයීම මේ වසරේ අග භාගයේ තිබෙනවා. අපි ඒකට සූදානම් වෙන්න ඕනෑ. ඒකටත් එක්ක තමයි මේ සාකච්ඡාව පාර්ලිමේන්තුවේ සිදු වන්නේ.

අපි නිකම් ඉඳලා නැහැ. අපි රටක් විධියට මුදල් විශුද්ධිකරණයට එරෙහිව කටයුතු කර තිබෙනවා. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව රටේ මූල්‍ය බුද්ධි ඒකකයක් - Financial Intelligence Unit එකක් - නිර්මාණය වනවා. අපි ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට, ඒ සම්මතවලට, ඒ පරිචයන්ට අනුව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණයත්, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම ආශ්‍රිත අපරාධ වළක්වන්නත් අවශ්‍ය කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි 2025 වර්ෂයේදී සම්මත කළා, සමාගම් (සංශෝධන) පනත. අපි සමාගම් (සංශෝධන) පනතට මුදල් විශුද්ධිකරණය මැඩ පැවැත්වීම සඳහා විශේෂ රෙගුලාසි කිහිපයක් එකතු කළා. ඒ යටතේ සමාගම්වල සැබෑ හිමිකරුවා හෙළි කරන ඒ අර්ථලාභී අයිතිය - අපි එයට කියනවා, beneficial ownership කියලා - අනිවාර්ය කළා. ඒ විතරක් නොවෙයි. තනි පුද්ගල සමාගම් නීතිගත කිරීම උල්ලංඝනය කරන අයට දැඩි දඬුවම් ලබා දීම සිදු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ විධියට අපි විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපි ගත්තොත්, අද දවසේ මේ රට තුළ ඒ ප්‍රධාන නීති තුනක් ක්‍රියාත්මක වනවා. එකක්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත. දෙවැනි එක, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත. තුන්වන එක තමයි, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත. එම පනත්වලට අදාළ සංශෝධන පිළිබඳව තමයි අද දවසේ සාකච්ඡා කරන්නේ. අපි මේ හරහා මොකක්ද කරන්න හදන්නේ? මුදල් විශුද්ධිකරණය මැඩ පැවැත්වීමට අවශ්‍ය නීති රීති බලවත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සංශෝධන හඳුන්වා දීලා අපි මොකද කරන්නේ? මේ හරහා ලංකාවේ මුදල් විශුද්ධිකරණය සම්බන්ධ වැරදි වළක්වන්නයි උත්සාහ කරන්නේ. ඒ වාගේම ඒවා අනාවරණය කිරීම, ඒවා විමර්ශනය කිරීම, ඒවාට නඩු පැවරීම සම්බන්ධ නීතිමය රාමුව අපි බලවත් කරනවා. මෙන්න මේ හරහා අපට පුළුවන්, විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණයටත්, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම - terrorism financing - කියන එකටත් එරෙහිව කටයුතු කරන්න. මේ විධියට අපි කරන්න හදන්නේ system change එකක්. මේක දරා ගන්න බැරි මිනිස්සු මේ වෙලාවේ වියරු වෙලා ඉන්නේ. අපි විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, ඔබ ඉස්සරහට ඇවිල්ලා, මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදයට අනුබල දෙන කාරණාවලට එරෙහි වෙලා, රටක් විධියට අපි මේ රට ලෝකයේ ප්‍රබල රටක් බවට පරිවර්තනය කරමු කියලා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rohitha Abeygunawardhana. You have 10 minutes.

[අ.භා. 1.43]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මම ස්තුතිවන්ත වෙනවා, වැදගත් පනත් කෙටුම්පත් තුනක් දෙවැනි වර කියවීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත් කොච්චර වැදගත් වුණත් ඊට වඩා වැදගත් කාරණයක් ගැන අපට කථා කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මොකද, ඒ කාරණය අමතක කරන්න පුළුවන්කමක් නැහැ.

පාර්ලිමේන්තුවේ කැබිනට් අමාත්‍යවරයෙකු කියනවා මම අහගෙන හිටියා, මීගමුව බන්ධනාගාරයේ ඇති වුණු සිද්ධිය ගැන අඟහරුවාදා පාර්ලිමේන්තු රැස්වීම් පටන් ගත් දවසෙත්, ඊයෙත් - බදාදා-, අදත් test match එකක් වාගේ දිගටම කථා කරනවා කියලා. මේක test match එකක් නොවෙයි, මුළු රටම කම්පා කරවන සිදුවීමක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මුළු රටේම ජනතාව අඬන සිදුවීමක්. මේවා කවදාවත් සිදු නොවිය යුතු දේවල්. මේ තුළ ජීවිත කීයක් අපට අහිමි කළාද? මේ, බන්ධනාගාරයේ හිටපු නිලධාරීන්, රැඳවියන් හැමෝගේම ජීවිත. ජීවිත විශාල ප්‍රමාණයක් අපි නොසිතූ මොහොතක අපට අහිමි වුණා. කලිනුත් කිව්වා වාගේ මේක එක රැයින් අමතක කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ සිදුවීමෙන් මියගිය බන්ධනාගාර නිලධාරීන්ගේ ඇතුළු රැඳවියන්ගේ පවුල්වල සියලුදෙනාට අපේ සංවේගය ප්‍රකාශ කරනවා. මේකේ හරි වැරැද්ද හොයන්න ඕනෑ. හැබැයි, ඒ අතරතුරේ අපි බලන්න ඕනෑ, මේ වාගේ දෙයක් සිදු වෙන්නේ කොහොමද කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දකින්න ඇති, ඊයේ දවසේ, ඒ මිය ගිය බන්ධනාගාර නිලධාරීන්ව වැලිකඩ බන්ධනාගාරයට ගෙනැල්ලා ඔවුන්ට ගෞරව කරනවා. එතකොට සහෝදර නිලධාරීන් කොච්චර නම් හඬා වැලපුණාද? ඔවුන් කොච්චර නම් දුක් වුණාද, කම්පා වුණාද?

මම නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල මැතිවරණ කොට්ඨාසයේ දෙල්මැල්ල ප්‍රදේශයේ දර්ශන තරංග කියන තරුණ සහෝදරයා බන්ධනාගාර නියාමකවරයෙකු හැටියටයි කටයුතු කළේ. ඔහු මේ සිදුවීමෙන් මිය ගිහිල්ලා තිබෙනවා. ඊයේ ඔහුගේ දේහය ගෙනෙනකොට ඔහුගේ දයාබර අම්මා, දයාබර තාත්තා, අසල්වැසියෝ කොච්චර නම් හඬා වැලපුණාද? ඔහුගේ දරුවාට මාස 7යි. මාස 7ක දරුවෙකු

මොනවාද දන්නේ? තාත්තා අහිමි වෙනවා, මේ දරුවාට. අපි මේවාට වග කියන්න ඕනෑ නැද්ද? මේකට රජය නොවෙයි, කවුරු වුණත් වග කියන්න ඕනෑ. මේවා ඉතිහාසයෙත් සිද්ධ වුණා. හැබැයි, මේවාට අපි වග කියන්න ඕනෑ කියන එක මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොතැනින්ද මේවා වරදින්නේ? ජූලි මාසයේ 05වැනි දා වනකොට බන්ධනාගාරය තුළ රැඳවියන් 41,257ක් ඉන්නවා. බන්ධනාගාර 36ක තමයි මේ රැඳවියන් ඉන්නේ. බන්ධනාගාර 36ක ඉන්න පුළුවන් රැඳවියන් ප්‍රමාණය කීයද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? බන්ධනාගාර 36 තුළ ඉන්න පුළුවන්කම තිබෙන්නේ රැඳවියන් 10,500කටයි. රැඳවියන් 10,500ක් ඉන්න ඕනෑ බන්ධනාගාර 36 තුළ අද රැඳවියන් 41,257ක් ඉන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වැඩිපුර 30,757ක් ඉන්නවා. ඒ කියන්නේ, රැඳවියන්ගේ ප්‍රමාණය හතර ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. රැඳවියන් ප්‍රමාණය හතර ගුණයකින් වැඩි වුණාට 100දෙනෙකුට තිබෙන්නේ එක වැසිකිළියයි. ඒ අයට මානව අයිතිවාසිකම් නැද්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේවා නේද බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට මාස 6, 7කට ඉස්සෙල්ලා බන්ධනාගාරවල තත්ත්වය පිළිබඳව ගරු ඇමතිතුමාගෙන් මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා. එතුමා එදා ඒ ප්‍රශ්නයට උත්තර දීලා කිව්වා, අපි පුළුවන් තරම් ඉක්මනට ඒ තදබදය ඉවත් කරන්න කටයුතු කරනවා කියලා. නමුත්, මොකක්ද කරලා තිබෙන්නේ? මේ සිදුවීම වුණාට පස්සේ නම් අලුතින් බන්ධනාගාර විවෘත කරන්න යනවා. හැබැයි, ඒ කටයුතු මීට ඉස්සෙල්ලා කළා නම් අපට අර ජීවිත ටික රැක ගන්න තිබුණා. නමුත්, අපට ඒක කරන්න බැරි වුණා.

දැන් බන්ධනාගාර නිලධාරින් කීදෙනාද ඉන්නේ? දැනට සිටින සමස්ත නිලධාරින් ප්‍රමාණය 6,000යි. ඒ අයගෙන් 5,000ක් පමණ තමයි uniform අඳින්නේ. Uniform අඳින නිලධාරින් ඉන්නේ 5,000යි නම්, රැඳවියන් 41,000ක් බලා ගන්නේ කොහොමද? රැඳවියන් 41,000ක් ආරක්ෂා කරන්නේ කොහොමද? ඔවුන් එක්ක බන්ධනාගාරවල ආරක්ෂාව පවත්වාගෙන යන්නේ කොහොමද? නිලධාරින් කියන්නේ මනුෂ්‍යයෝ. රැඳවියන් කියන්නේත් මනුෂ්‍යයෝ. මේ දෙගොල්ලන්ම ආරක්ෂා කර ගැනීමේ වගකීම අපට තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉදිරියේදී නැවත මෙවැනි දේවල් සිදු නොවෙන්න නම් මොකක්ද කරන්න ඕනෑ?

දැන් බන්ධනාගාරවල සිටින නිලධාරින් දිහා බලන්න. බන්ධනාගාරය කියන්නේ දෙපාර්තමේන්තුවක්. පොලීසියත් දෙපාර්තමේන්තුවක්. පොලිස් දෙපාර්තමේන්තුවේ ක්‍රමවේදයක් තිබෙනවා. ඔවුන්ට උසස්වීම් ලබා දීම, දීමනා ලබා දීම, පහසුකම් ලබා දීම වාගේම ඔවුන්ගේ වැටුප් තල සකස් කිරීම පොලිස් දෙපාර්තමේන්තුව කළ යුතුව තිබෙනවා. පොලීසිය ලොකු රාජකාරියක් කරනවා. අපි ඒක අගයන්න ඕනෑ. ශ්‍රී ලංකා පොලීසිය මේ රට තුළ ලොකු රාජකාරියක් කරනවා. හැබැයි, ශ්‍රී ලංකා පොලීසිය දෙපාර්තමේන්තුවක් නම් බන්ධනාගාරයත් ඒ හා සමානම දෙපාර්තමේන්තුවක්. පොලීසියේ තිබෙන නිලතලම තමයි බන්ධනාගාරයේත් තිබෙන්නේ. පොලිස් දෙපාර්තමේන්තුවේ Sergeant, SI, IP වාගේ තනතුරු තිබෙනවා. පොලීසියේ DIG කියන තනතුර බන්ධනාගාර කොමසාරිස් කියන තනතුරට සමාන වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා මම ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා, තමුන්නාන්සේලාගේ රජය තුනෙන් දෙකක බලයක් තිබෙන රජයක්, දැන්වත් මේක යට ගහන්නේ නැතුව කරුණාකරලා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට තිබෙන පහසුකම් හා සමාන තත්ත්වයක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් ඇති කරන්න කියලා. ඒ වැටුප් තලවල තබන්න, ඒ දීමනා ටික ලබා දෙන්න, ඒ වාගේම ඔවුන්ට ලැබිය යුතු සියලු වරප්‍රසාද ලබා දෙන්න, ඔවුන්ට ආරක්ෂාව සලසන්න කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නොවුණොත් ඉදිරියේදී බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අලුතින් කෙනෙක් ගන්න හම්බ වෙන්නේ නැහැ. ඉදිරියේදී කවුරුවත් ඒවායේ රස්සාවට එන්නේත් නැහැ කියන එක අපට පෙනෙනවා.

මීගමුව බන්ධනාගාරයේ ඇති වූ සිදුවීමෙන් මරණයට පත් වුණු බුලත්සිංහල, දෙල්මැල්ල ප්‍රදේශයේ ජීවත් වුණු ඒ අහිංසක තරුණ සහෝදරයා මුලින් සේවය කළේ තැපැල් දෙපාර්තමේන්තුවේ; දෙල්මැල්ල තැපැල් කන්තෝරුවේ ඔහු හිටියේ. ඔහු ඒ රස්සාව අත්හැර දාලා බන්ධනාගාර රස්සාවට ආවා. අන්තිමට ඔහුගේ ජීවිතය අහිමි වුණා. එතුමාගේ නෝනාට මහත්තයෙක් නැති වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ඒ නිලධාරින් ගැන හිතන්න කියලා. ඒ නිලධාරින්ට හරියාකාරව රාජකාරි කරන්න පුළුවන් වාතාවරණයක් හදන්න. එක පැත්තකින්, ඔවුන්ගේ මරණ බිය නැති කරන්න. අනෙක් පැත්තෙන්, රැඳවියන් ගැනත් හිතන්න. ඔවුන්ගේ යටිතල පහසුකම් ගැන බලන්න. සනීපාරක්ෂක පහසුකම් ගැන බලන්න. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ටික දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 10දෙනෙක් දාන්න පුළුවන් තැනකට 100දෙනෙක් දාලා වැහුවොත් මොකද වෙන්නේ? ඒ වාගේම නාන්න අවශ්‍ය වතුර ටික නැත්නම්, ඉස්පිරිතාලයෙන් බෙහෙත් ටික ගන්න නැත්නම්, කන්න අවශ්‍ය කෙනාට කන්න නැත්නම් ඔවුන් අමනුෂ්‍යයෝ වෙනවා. ඒ තත්ත්වයට පත් කරන්න එපා කියලායි අපි කියන්නේ.

මේකේ වැරැද්ද භාරගන්න වෙනවා. එදා තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්දෙද්දි කිව්වා වාගේ මේ වැරැද්ද රජයට භාරගන්න වෙනවා. මේකෙදි අත හෝදා ගෙන, අත පිහදා ගෙන පැත්තකට වෙන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මේක වැරැද්දක්. ඒ වැරැද්ද අපි දැක්කා. නිලධාරින් කියනවා, "ඇයි සර් අපට උපදෙස් දුන්නේ නැත්තේ? ඇයි අපට වේලාසනින් උපදෙස් දුන්නේ නැත්තේ, නියපොත්තෙන් කඩන්න තිබෙන දේ පොරවෙන් කපන්න සිදු වුණා" කියලා. කාගේ ද වැරැද්ද? ඒක නිහතමානීව පිළිගන්න පුරුදු වෙන්න ඕනෑ. අපට අත්දැකීම් තිබෙන්න ඕනෑ. අපට අත්දැකීම් එක්ක වැඩ කරන්න සිදු වෙනවා. මේ දුන්නේ අපට පණිවුඩයක්. අපිට මේ ගැන කල්පනා කරන්න වෙනවා. ඉතුරු බන්ධනාගාරවලටත් මේ විෂබීජය පැතිරෙන්න ගියොත් එක පැත්තකින් නිලධාරින් ටික අමාරුවේ වැටෙනවා. අනෙක් පැත්තෙන් රැඳවියන් අමාරුවේ වැටෙනවා. කවුරු වුණත් අපට හැම කෙනෙකුගේම ජීවිත වටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rohitha Abeygunawardhana, your time is over.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ රටේ ඉස්සර එල්ලා මැරීමේ නීතිය තිබුණා. දිනයක් දෙනවා, අහවල් දවසේ එල්ලා මරන්න කියලා. මම ඊයේත්

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

දැක්කා අධිකරණයෙන් එල්ලා මරන්න තීන්දු කරලා තිබුණා. නමුත් එල්ලන්නේ නැහැ. එල්ලුම්ගහත් තිබෙනවා. එල්ලන්නේ නැහැ. දැන් එල්ලන්නේත් නැහැ, එල්ලුම්ගහත් නැහැ; එල්ලන්න තීන්දුවත් දෙනවා, එල්ලන්නේ නැහැ. එල්ලන්න ඉන්න ඔක්කෝම ටික මැරිලා යනවා, හිරගෙදර ඇතුළේ. හැබැයි, මේ වාගේ සිද්ධි වුණාම එල්ලා මැරීමේ නීතියත් නැහැ. ඔහු සැකකරුවෙක් විතරයි. ඔහු බන්ධනාගාරය ඇතුළේම මිය යනවා. එක දවසින් ඔහු මැරෙනවා. කොහොම වුණාද, කවුරු කළාද කියන එක නොවෙයි ප්‍රශ්නය. එල්ලා මැරීමේ නීතිය රටේ තිබුණත් එල්ලන්නේ නැති නිසා බන්ධනාගාරය ඇතුළේ මැරෙන එක මේ රටේ නීතියද කියන එක අපට අහන්න සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ගරු ඇමතිතුමාගෙන්, ගරු ජනාධිපතිතුමාගෙන්, රජයෙන් ඉල්ලීමක් කරනවා, මේක අද දවසට, හෙට දවසට විතරක් සීමා නොකර මේකට ගත යුතු ක්‍රියාමාර්ග ගන්න කියලා. එහෙම කළොත් එය, ඒ මිය ගිය අයගේ පවුල්වල හැම කෙනෙකුටම සහ මේ රටේ මිනිසුන් වෙනුවෙන් කරන කෘතවේදීකමක් බව මතක් කරමින්, මට වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have 12 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

Sir, I propose that the Hon. (Prof.) Sena Nanayakkara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 1.55]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම වැදගත්, විශේෂ පනත් කෙටුම්පතක් වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත ගැනත් අපි අද කථා කරනවා. ඒ ගැන කථා කරන්න මට කාලය ලබා දීම සම්බන්ධව විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ පැවති යුද වාතාවරණය තුළත් ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම, අවි ආයුධ සැපයීම සිදු වුණා. ඊට පස්සේ සංවිධානාත්මක අපරාධ කල්ලි, ජාවාරම් කල්ලි, ඒ ජාල කළමනාකරණය කරන දේශීය, විදේශීය මහා අපරාධකරුවන්ට මුදල් සැපයීම යනාදී දේවල් - කෙටියෙන් කිව්වොත් කළු සල්ලි සුදු කිරීම - මහා විශාල ලෙස පැවතිච්ච රටක් තමයි අපි භාර අරගෙන මේ කටයුතු සම්පාදනය කිරීම සඳහා දැන් මේ විශේෂ සංශෝධන පනත අපි හඳුන්වා දෙන්න යන්නේ.

මේ රටේ මහා දරුණුතම අපරාධ කල්ලි සාමාජිකයන්ගෙන්, සංවිධානාත්මක අපරාධ කල්ලිවලින් සමන්විත, දේශපාලන හවිහරණය, රැකවරණය තිබුණු දේශපාලන කල්ලි තමයි අපි බලයට පැමිණීමත් සමඟ පලවා හැරියේ. මම පෞද්ගලිකවම සන්තෝෂ වෙනවා, මමත් මේ දේශපාලන ව්‍යාපාරයට සම්බන්ධ වෙලා ඒ විධියේ දෙයක් කර ගැනීමට හැකිවීම ගැන. අපේ ජනතාව වෙනුවෙන්, රට වෙනුවෙන්, ව්‍යවස්ථාව වෙනුවෙන් මහා දෙයක් කරන්න පුළුවන් වීම ගැන මම සතුටු වෙනවා. දැන් ඒවා එළිපිටම පේ‍රෙනවා, දිනෙන් දින තහවුරු වෙනවා. මහා අපරාධ ජාවාරම්කාරයෝ ඒ හිටපු දේශපාලන ව්‍යාපාරවල නියෝජිතයන් හැටියට කටයුතු කරලා තිබෙනවා. රාජ්‍ය බලය පාවිච්චි කරලා, පරිපාලන බලය භාවිත කරලා, හොර සල්ලි හම්බ කරලා, දේපළ හම්බ කරලා තිබෙන ඒවා වාගේම, අපරාධකරුවන්ගෙන් මුදල් ලබාගෙන තමන්ගේ දේශපාලන වැඩකටයුතුවලට පාවිච්චි කරපු ඒවා සම්බන්ධයෙන් දැන් හෙළිදරව් වෙමින් තිබෙනවා. හිටපු සමහර දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරින් සුවිසල් මන්දිර අරගෙන තිබෙනවා, දේශීය, විදේශීය වතුපිටි අරගෙන තිබෙනවා, මේ මුදල්වලින්. ඒ නිසා සංවිධානාත්මක අපරාධකාරයෝ කියන්නේ ත්‍රස්තවාදියෝම තමයි. මේ රටට වින්නැහියක් කරපු, රට අගාධයට දාපු, ආර්ථික වශයෙන් වට්ටපු, නැති කරපු ඒ සංවිධානාත්මක අපරාධකාරයින්ගේ වැජඹීම තමයි පසුගිය දශක ගණනක කාලයක් තිස්සේ මේ රට කඩා වැටෙන්න මූලික හේතුවක් වුණේ.

ධනය උපයා ගත් ආකාරය අනාවරණය කරන්න බැරුව හිටපු දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරින් සැහෙන ප්‍රමාණයකගෙන් දැනට ප්‍රශ්න කරනවා, අපේ විශේෂ විමර්ශන ඒකක මඟින්. ඒවා ගැන ඉදිරියේදී තවත් සොයනවා. එසේ සොයලා ඔවුන් සම්බන්ධයෙන් නිසි පරිදි නීත්‍යනුකූලව කටයුතු කරනවා. මොකද, සංවිධානාත්මක අපරාධ ජාලයට රාජ්‍ය තන්ත්‍රයේ අනුග්‍රහය ගත්තාම මේකට සාමාන්‍යයෙන් රජයේ නිලධාරින් කිහිපදෙනෙක් සම්බන්ධ වෙනවා, ඒ වාගේම බැංකු කිහිපයක් සම්බන්ධ වෙනවා. සංවිධානාත්මක අපරාධ ජාලයක් ක්‍රියාත්මක වෙන ආකාරය තමයි ඒ. ඔවුන්ගේ හොර මුදල් ලබා ගැනීමට සහ ඔවුන්ගේ අවශ්‍යතාවන්ට භාවිත කිරීමට සමාගම් කිහිපයක්, ගිණුම්කරණ කටයුතු සිදු කරන කොම්පැනි කිහිපයක්, auditing firms කිහිපයක් වාගේම real estate ඒජන්තවරු කිහිපදෙනෙක් සම්බන්ධ කර ගන්නවා. ඔවුන් මේ අපරාධකාරයින්ගේ ජාලයට සම්බන්ධ කරගෙන තමයි මේ අපරාධ ඉස්සරහට සිදු කරගෙන ආවේ. අපි ඒ ගැන හොඳ අවබෝධයක් ලබාගෙන තමයි ඒ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා දැන් ඉදිරියට කටයුතු කරගෙන යන්නේ.

පසුගිය දිනකත් අපිට ඉතාම සංවේදී, තීරණාත්මක අවස්ථාවකට මුහුණ දෙන්න වුණා. ඒ තමයි, අපේ ජල තීරය ඉස්සරහා සිද්ධ වෙච්ච ඒ මහා ප්‍රහාරය; බලවත් රටකින් තවත් රටක යුධ නෞකාවකට එල්ල කරපු ඒ ප්‍රහාරය. විපක්ෂ නායකතුමාත් ඒ සම්බන්ධව ඇහුවා. මොන torpedo එකකින්ද ගැහුවේ, බැලස්ටික් මිසයිලයකින්ද, එහෙම නැත්නම් air-to-

surface missile එකකින්ද, surface-to-surface missile එකකින්ද, අර්ධ බැලස්ටික් මිසයිලයකින්ද ආදී වශයෙන් මමවත් දන්නේ නැති ඒවා එතුමා ඇහුවා. මම අහන්න කැමැතියි, චරිත් අබේසිංහ කියන හොරණ සංවිධායකතුමා ගැන. ඔහු හොරණ සංවිධායක හැටියට කටයුතු කරලා හිටපු අධිකරණ ඇමතිතුමාගේ පුතාත් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කර තිබෙනවා. මම අහන්න කැමැතියි, ඒ මුදල් ගත්තේ මොනවායින්ද කියලා. ඇඩො වලින්ද? අපි "ඇඩො" කියන්නේ ඇමෙරිකානු ඩොලර්. එහෙම නැත්නම් ඒ මුදල් ගත්තේ ඩිරාම්වලින්ද? එහෙම නැත්නම් ජපාන යෙන්වලින්ද? එහෙම නැත්නම් චීන යුවාන්වලින්ද? එහෙම නැත්නම් ඉතාලි ලීරාවලින්ද? එහෙම නැත්නම් යුරෝවලින්ද කියලා කියන්න. අර torpedo ගැන, බැලස්ටික් මිසයිල, අර්ධ බැලස්ටික් මිසයිල ගැන අහනවා වාගේම, මොන මුදල්වලින්ද - currencyවලින්ද - ඒ සල්ලි ගත්තේ කියලාත් කියන්න. මොකද, මමත් දැනගන්න කැමැතියි, විශේෂයෙන්ම ඒ ගනුදෙනු කරපු මුදල් වර්ගය මොනවාද කියලා. මොකද, ඒවා තමයි ඇත්තටම කළු සල්ලි සුදු කරන්න ප්‍රධානම හේතුව. චරිත් අබේසිංහ හැම තැනම ගිහිල්ලා කිව්වා, අපේ සංවිධානය මෙන්න මෙහෙමයි කියලා. පිටරටත් ගිහිල්ලා කිව්වා. නමුත් ගිහිල්ලා තිබෙන්නේ කොහේද? ඩුබායිවලට. කළු සල්ලි සුදු කරගෙන ඇවිල්ලා තිබෙනවා තමන්ගේ වැඩ කටයුතුවලට භාවිත කරන්න. ජනතාව දන්නවා, අපේ විමර්ශන කණ්ඩායම් දන්නවා, ඔවුන් කොච්චර දුරට ඒක කරලා තිබෙනවාද කියලා.

අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ සිද්ධ වෙච්ච මේ සංවිධානාත්මක අපරාධවල දරුණුකම. හිතා ගන්න පුළුවන්ද, අපේ රටේ හිටපු අධිකරණ ඇමතිගේ පුත්‍රයා මේකට සම්බන්ධ වෙලා කියලා අපිට දැන් සැක පහළ කරලා තිබෙනවා. ඒ ගැන විමර්ශනය කරනවා. අපි ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම වැරදිද? ඔවුන්ට ඉස්සරහට නීතිය ඉදිරියේ කටයුතු සිද්ධ වෙයි. ඒ විධියේ දේවල් කොච්චර සිද්ධ වෙලා ඇතිද, සිද්ධ වෙලා තිබෙනවාද? ඒ නිසා තමයි අපිත් මේ පෙරට ආවේ? අපි ඉතාම ශුද්ධ - පිරිසිදු - විනයගරුක, හොඳ දේශපාලන දැක්මක් තිබෙන ව්‍යාපාරයක් එක්ක එකතු වෙලා ඉස්සරහට ඇවිල්ලා මේ කටයුතු සිද්ධ කරන්නේ ඔන්න ඔය හොර මගඩිවලින් රට බේරා ගැනීමටයි; හොරෙන් සල්ලි හම්බ කරලා, මේ රට කාබාසිනියා කරපු, මේ රට නැති කරපු අයගෙන් රට බේරා ගැනීමටයි. උදේ, දිවා, රෑ නොබලා හැම දෙයක්ම කැප කරලා මේ රට වෙනුවෙන් දිවි පිදූ කොටඨාසයක් තමයි ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ STF එක.

නමුත්, අපට ලැබිච්ච රට මොකක්ද? බිහිසුණු සංවිධානාත්මක අපරාධ ජාලවලින් සමන්විත, හොරුන්ගේ කල්ලියක් විසින් පාලනය කරපු, එවැනි දේශපාලන ව්‍යාපාරයක් විසින් පාලනය කරපු රටක් අපට ලැබුණේ. ඒ තත්ත්වය නැති කරන්න තමයි අපි මේ ඉස්සරහට ආවේ. එම නිසා ඔය තිබෙන සියලුම සංවිධානාත්මක අපරාධ ජාල අපි අනිවාර්යයෙන් නැති කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට හොඳට මතකයි, පසුගිය මාර්තු මාසයේ 09වන දා ශ්‍රී ලංකා නාවික හමුදාව මහ මුහුදේ විශාල මෙහෙයුමක් කරලා එක දවසකට මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 600කට වැඩි ප්‍රමාණයක් ඇල්ලුවා. එදාම ඒ මත්ද්‍රව්‍යවලට අමතරව අවි 11ක් අත්පත් කර ගත්තා, T-56 දෙකක්, M16 දෙකක්, විදේශ රටවල නිෂ්පාදිත sidearms, එනම් පිස්තෝල 8ක් ආදි වශයෙන්. ඒ කියන්නේ මත්ද්‍රව්‍ය ජාවාරමත් එක්ක අවි ජාවාරමත් සම්බන්ධ වෙලා තිබෙනවා. ඒවා හසු වන්නේ, විශේෂයෙන්ම නාවික හමුදාව ආරක්ෂක අමාත්‍යාංශය ඇතුළු නීතිය හා සාමය පවත්වා ගෙන යන අනෙකුත් ආයතනත් එක්ක එකතු වෙලා ඉතාම හොඳට සැලසුම් කරලා කරන ලද ක්‍රියාන්විතවල ප්‍රතිඵල වශයෙනුයි. මීට කලින් මේ විධියට කොච්චර නම් අවි ආයුධ මෙහේට ඇවිල්ලා තිබෙනවා ඇත්ද? නමුත්, අපි ඉන්න කල් -මේ රජය තිබෙන කල්- එවැනි කිසිම දෙයක් සිදු වෙන්න දෙන්නේ නැහැ.

සංවිධානාත්මක අපරාධ කල්ලි, ජාවාරම්කරුවන් දැනට තිබෙන තාක්ෂණය, සංවර්ධනය වෙලා තිබෙන තාක්ෂණය උපයෝගි කරගෙනත් අනීතික ලෙස මුදල් ඉපැයීම කරනවා. එම නිසා විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයත් ඒ ගැන හොඳ අවබෝධයකින් සිටිනවා; විමසිල්ලෙන් සිටිනවා; විමර්ශනය කරනවා. ඒ සියලුදෙනා හොඳ අවධානයකින් සිටිනවා, එවැනි කටයුතු ගැන සොයා ගැනීමේ අරමුණින්. මේ සංවිධානාත්මක අපරාධ ජාලවලින් සිදු කරන අනීතික ලෙස මුදල් ඉපැයීම අපේ ජාතික ආර්ථිකයට විශාල ප්‍රහාරයක්, විශාල බලපෑමක්. ජාතික ආරක්ෂාවටත් විශාල බලපෑමක්. එම නිසා අපට විශාල වගකීමක් තිබෙනවා. ඒ පැවැති මහා යුද වාතාවරණයෙන් ඇති වෙච්ච ජාතිවාදය, ආගම්වාදය, බෙදුම්වාදය කිසි කලෙක ආපසු මේ රටේ, මේ බිමේ ඇති වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ. අපි ඒ තත්ත්වය අනිවාර්යයෙන් නැති කරනවා. ඒ නිසා තමයි අපි සංහිඳියාව ගොඩ නඟා ගැනීමට ප්‍රායෝගික ලෙස බිම් මට්ටමට ගිහිල්ලා මේ වැඩ කටයුතු කරන්නේ. දේශපාලන අධිකාරිය, රාජ්‍ය නිලධාරින් ඇතුළු අපි හැමෝම මේ රටේ ආපහු එවැනි දේවල් ඇති නොවෙන්න අනිවාර්යයෙන් වග බලා ගන්නවා.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත ආදිය ගෙන ඒමෙන් අපි එක්සත් ජාතීන්ගේ සම්මුතිවලට අනුකූල වීම සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ අනුකූලතාව ශක්තිමත් කිරීම සිදු කරනවා. ඒ වාගේම මේ තුළින් මූල්‍ය පද්ධති කළමනාකරණය ආරක්ෂා කිරීම, ජාතික ආරක්ෂාව ශක්තිමත් කිරීම, විශේෂයෙන්ම මූල්‍ය කාර්ය සාධක බලකා රාමුව යටතේ කටයුතු කිරීම සම්බන්ධයෙන් අපි ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය ජාත්‍යන්තරයට පෙන්නුම් කරනවා.

මේ පනත් කෙටුම්පත් මඟින් ත්‍රස්තවාදීන්, අපරාධකරුවන් ජාවාරම්වලට සම්බන්ධ වෙලා මුදල් සැපයීමට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීම කළ හැකි වනවා. විශේෂයෙන්ම අපේ විමර්ශන කණ්ඩායම්, අපේ පොලීසිය, අපේ මත්ද්‍රව්‍ය නාශක කොට්ඨාස මේ වෙනුවෙන් සම්පූර්ණයෙන්ම කැප වෙලා වැඩ කටයුතු කරනවා. පසුගිය මාස 20ක් වැනි කාලයක් තුළ අප පනත් කෙටුම්පත් සංශෝධනය කරගෙන මේ සභාවට ගෙනැල්ලා අනුමත කර ගැනීමට කටයුතු කිරීමේ ප්‍රතිඵල තමයි අප දැන් මේ දකින්නේ. ඒ නිසා තමයි මහ මුහුදේ මහා විශාල මත්ද්‍රව්‍ය තොග අපට හසු වන්නේ, අවි ආයුධ හසු වන්නේ.

දැන් කෝ අර උදේ, දවල්, රෑ වෙඩි තියපු තුවක්කුකාරයෝ? ඔවුන් එළියට එන්න බයයි. එළියට ආවොත් ඊළඟ පැයේ අල්ලනවා. එළියට ඇවිල්ලා කෑ ගහලා ගියොත් අල්ලනවා. ඒ වාහනත් එක්කම, තුවක්කුත් එක්කම, ඒවාට ආධාර දීපු, අනුබල දීපු, වාහන පාවිච්චි කරපු ඔක්කෝම අනිවාර්යයෙන් අල්ලනවා; ඒ කිසිවෙකු අත් හරින්නේ නැහැ. ඒ තරම් දුරට අපේ විමර්ශන කටයුතු, මෙහෙයුම් කටයුතු, බුද්ධි කටයුතු ඉතාම හොඳින් ජාලගත කරලායි තිබෙන්නේ. ඒ සඳහා වෘත්තීය මට්ටමින් පුහුණු වීම් ලබා තිබෙන, ඒ ගැන හොඳ අවබෝධයක් තිබෙන, හැකියාවක් තිබෙන නිලධාරින් තමයි පත් කරලා තිබෙන්නේ. ඒ ඒ මෙහෙයුම් කරන කාණ්ඩ එක්ක, කණ්ඩායම් එක්ක, ඒකක එක්ක ආරක්ෂක අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය ඉතාම හොඳින් බද්ධ වෙලා කටයුතු කරනවා. අප වුණත් ඉදිරිපත් වෙලා මේ කටයුතු කරන්නේ ඇයි? අපටම ලජ්ජයි අපේ රටට වෙච්ච දේ ගැන. අපේ රට දණ ගහගෙන බිමට වැටිච්ච රටක්. අපි දැන් නැඟිටිනවා. එහෙම නැඟිටින කොට වෙන වෙන දේවලින් ප්‍රහාර එල්ල කරනවා.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

සමගි ජන බලවේගයේ හොරණ සංවිධායකගෙන් මම අහන්න කැමැතියි, අර විධියට සල්ලි ගන්න මහා අපරාධකාරයන් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කළේ ඇඳුම් ඇඳගෙන ගිහිල්ලාද කියලා. ඒක මේ රටේ මිනිසුන්ට කරපු ලොකු අගෞරවයක්, අහිංසක අනාගත පරපුරට කරපු අගෞරවයක් වාගේම ඒ දෙන්නේ නරක ආදර්ශයක්. මේ ගෙන ආ පනත් කෙටුම්පත් මඟින් ඒ සියලු දේවල් නවතිනවා; තහනම් වෙනවා; කරන්න බැරි වෙනවා. ඉදිරියේදී ඉතා හොඳ රටක් ගොඩ නඟා ගන්න පුළුවන් වෙනවා, අප මේ පනත් කෙටුම්පත් ගෙන ඒමෙන් සහ මෙසේ විවාද කර සම්මත කර ගැනීමෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි මට කාලය ලබා දුන්නාට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.07]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විනාඩි 4ට තවත් 4ක් එකතු වෙලා විනාඩි 8ක් වෙලායි තිබෙන්නේ. මොකද, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා මට තවත් විනාඩි 4ක් ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මීගමුව බන්ධනාගාරයේ පළමුවැනි දවසේ වූ සිදුවීම වළක්වා ගන්න බැරි සිද්ධියක් වෙන්න පුළුවන්. අපි ඒක පිළිගන්නවා. පළමුවැනි දවසේ සිදුවීමක් වෙනවා; කණ්ඩායම් දෙකක් අතර ගැටුමක් ඇති වෙනවා; මරණ 2ක් සිදු වෙනවා. පළමුවැනි දවසේ සිදුවීමෙන් පසුව විශේෂයෙන් අධිකරණ ඇමතිතුමා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා ඇතුළු නිලධාරි පිරිස ඒ සම්බන්ධව ගත්තු තීන්දු තීරණ මොනවාද? ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් අමාත්‍යාංශයකට අදාළ ආයතනයක - ඔබතුමාගේ ආයතනයක වෙන්නත් පුළුවන් - ඒ වාගේ සුවිශේෂී සිද්ධියක් වුණාම, ඒ සඳහා ක්ෂණික මැදිහත්වීමක් අවශ්‍ය වෙනවා; ඊළඟට ගත යුතු ක්‍රියාමාර්ග, පියවර ගැන සාකච්ඡා කළ යුතු වෙනවා; ඒවාට අවශ්‍ය තීන්දු තීරණ පහළ ඉන්න නිලධාරින්ට ක්ෂණිකව ලබා දිය යුතු වෙනවා. මෙහිදී එහෙම දෙයක් සිදු වුණාද? එහෙම දෙයක් වුණු බවක් පෙනෙන්නට නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ගරු රෝහණ බණ්ඩාර මැතිතුමාගෙන් විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම දෙයක් වුණා නම් පහුවදා වෙච්ච සිදුවීම වෙන්නේ නැහැ. ඝාතනයට ලක් වුණු බන්ධනාගාර නිලධාරින්ගේ අවමඟුල් උත්සවයට විෂය භාර ඇමතිවරයා ගිය වෙලාවේ එතැන හිටපු එක නිලධාරියෙක් කියපු දේ අපි දැක්කා. ඔහු කිව්වා "ඇමතිතුමා, නියපොත්තෙන් කඩන්න තිබුණු දෙයක් තමයි වළක්වා ගන්න බැරුව ගියේ" කියලා. ඒ නිලධාරියාගේ වචනවලින් කියැවෙන්නේ මොකක්ද? පසුවදා මරණ 27ක් වුණා; නිලධාරින් මැරුණා, රැඳවියන් මැරුණා. ඒ මරණ 27 සිදු වන එක වළක්වා ගන්න තිබුණා කියන එක, ඇඬූ කඳුලින් ඒ ප්‍රකාශය කරපු ඒ නිලධාරියාගේ හදවතේ තිබෙන වේදනාවෙන් අපට වැටහෙනවා. *[බාධා කිරීමක්]* ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමා කියපු ඒ කාරණය ගැනත් මම කියන්නම්. ඒක බොහොම පැහැදිලිව වළක්වා ගත යුතුව තිබුණු දෙයක්. අපි දන්නවා, අධිකරණ ඇමතිතුමා ඒ පැත්ත පළාතක ගිහිල්ලා නැති බව, අවශ්‍ය නිලධාරින්ට තීන්දු තීරණ දීලා නැති බව, උපදෙස් දීලා නැති බව.

බිමල් රත්නායක මහත්තයෝ, මට මේක කියන්නකෝ. ඔබතුමන්ලාට තවම පුළුවන් වුණාද, අඩුම ගණනේ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයෙකුවත් පත් කර ගන්න? දැන් අවුරුදු කීයක්ද? දැන් අවුරුදු එකහමාරක් වෙනවා. ඔබතුමන්ලා තුෂාර උපුල්දෙණිය මහත්මයාව එම තනතුරෙන් අයින් කරලා දැම්මා. ඒකම වැරදි තීන්දුවක්. අන්න, මානව හිමිකම් කොමිෂන් සභාවෙන් කියා තිබෙනවා, ඒක නිවැරදි කරන්න කියලා. එතුමා අයින් කළාට පසුව තාම බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කරලා නැහැ. තුෂාර උපුල්දෙණිය මහත්මයා විතරක් නොවෙයි, අපට ආරංචියි ඔබතුමන්ලා මීගමුව බන්ධනාගාරයේ ප්‍රධාන නිලධාරින් දෙදෙනෙකුත් මාරු කර තිබෙනවා කියලා. ඔබතුමන්ලා දේශපාලන කෝණයෙන් බලලා හැම ආයතනයක්ම, හැම තැනක්ම අනලා තිබෙන්නේ. දේශපාලන කෝණවලින් නිලධාරින් දිහා බලලා ගත්තු තීන්දු තීරණවල ප්‍රතිඵල තමයි අද මේ රට අත් විඳිමින් ඉන්නේ. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමන්ලා මේක නිවැරදි කරන්න. හැම නිලධාරියෙකු දිහාම දේශපාලන කෝණයෙන් බලන්න එපා. අද්දැකීම් සහිත, පළපුරුද්ද සහිත, මේ වාගේ අවස්ථාවකට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳ හොඳට තෙම්පරාදු වෙච්ච නිලධාරින් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉන්නවා. අදාළ තීන්දු තීරණ නිසි වෙලාවට ක්ෂණිකව ගත්තා නම් පහුවදා වුණු සිදුවීම කිසිසේත්ම වෙන්නේ නැහැ. ඒ නිසා මෙහි වගකීම පැහැදිලිවම ඔබතුමන්ලාට තිබෙනවා.

ඔබතුමන්ලාගේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විපක්ෂයේ සිටියදී සිදුවූ මහර බන්ධනාගාර ප්‍රහාරය වෙලාවේ එතුමා මොකක්ද කිව්වේ? විෂය භාර ඇමතිවරයා ඉල්ලා අස් වෙන්න ඕනෑ කිව්වා. ඒක අපි කිව්වාම ඔබතුමන්ලා අහනවා, මේ පැත්තෙන් ඉල්ලා අස් වුණාද, අර පැත්තෙන් ඉල්ලා අස් වුණාද කියලා. ඔබතුමන්ලා අවුරුදු 76ක් ගැන කථා කරලා මේ සම්පූර්ණ system එක වෙනස් කරන්නයි බලයට ආවේ. හැබැයි, 1988දී වැලිකඩ බන්ධනාගාරය කඩාගෙන යන්න කටයුතු කරපු වෙලාවේ නිශ්ශංක විජේරත්න මැතිතුමා තමයි විෂය භාර ඇමතිවරයා. එතුමා එම ධුරයෙන් ඉවත් වුණා. ෂෙල්ටන් රණරාජා මැතිතුමා තමයි නියෝජ්‍ය ඇමතිවරයා. එතුමාත් ඉවත් වුණා. එහෙම නම් එවැනි ආදර්ශ දීපු අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා දැන් හැම දෙයකම පරණ දේවල් සොය සොයා සමීක්ෂණ කටයුතු කරනවා නේ, නිරීක්ෂණ පවත්වනවා නේ, කොමිෂන් දමනවා නේ. පුළුවන් නම් වැලිකඩ බන්ධනාගාරය කඩාගෙන යන්න උත්සාහ දැරුවේ කවුද කියන එක පිළිබඳවත් පරීක්ෂණ පවත්වන්න. සමහර විට මේක ඇතුළේත් ඉන්නවාද දන්නේ නැහැ, ඒකට වග කිව යුතු අය. වැලිකඩ බන්ධනාගාරය කඩාගෙන යන කොට - ඒ දවස්වල - බිමල් රත්නායක මහත්මයාලා හිටියේ තරුණ වියේ කියා මම හිතන්නේ නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතකොට, නලින්?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
එතකොට මම 8 පන්තියේ හිටියේ; 1988දී මම 8 පන්තියේ හිටියේ. *[බාධා කිරීමක්]* ඔබතුමා 7 පන්තියේද? ඒක තමයි. *[බාධා කිරීමක්]* ඒක තමයි. ඒ නිසා වහාම ඒ ගැනත් පරීක්ෂණ පවත්වන්න ඕනෑ. මෙතැනදී බොහොම පැහැදිලිවම රූදවියන් වෙන්න පුළුවන්, නිලධාරින් වෙන්න පුළුවන් මේ කියන දෙකොට්ඨාසයටම අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ අසාධාරණය සිද්ධ වුණේ මේ ආණ්ඩුව ක්ෂණිකව තීන්දු, තීරණ ක්‍රියාත්මක කිරීමට පියවර නොගත් නිසායි; නිද්‍රාශීලීව හිටපු නිසායි. මම දන්නේ නැහැ, ඔබතුමන්ලා අධිකරණ ඇමතිවරයාට කියලා ඇති, වෙනත් වෙනත් වගකීම්වලට priority දෙන්න කියලා. "අගවිනිසුරුතුමාගේ විශ්‍රාම යන දිනය දීර්ඝ කරන්න, ඒකට මූලිකත්වය දෙන්න, ඒක focus කරන්න, වෙන ඒවාට අත ගහන්න යන්න එපා. පාඩුවේ ඉන්න" කියලා ඔබතුමන්ලා කියලා ඇති. අපට බොහොම පැහැදිලිවම පෙනෙනවා, අධිකරණ ඇමතිවරයා ඇතුළු සියලුදෙනාම මේකට වග කියන්න ඕනෑ බව. රජය වගකියන්න ඕනෑ මේ මිලේච්ඡ මිනීමැරුම්වලට, මේ ප්‍රහාරවලට සහ මේ තුවාල කිරීම්වලට.

අද බන්ධනාගාරවල ඉන්න ප්‍රමාණය, බන්ධනාගාරවල capacity එක වාගේ හතරගුණයක්. බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමන්ලා මේවාට අවශ්‍ය නීති ගෙනෙන්න. ඔබතුමන්ලාට මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. අවුරුදු 65, 70 පැනපු අය අවුරුදු ගණන් මේ බන්ධනාගාරවල ඉන්නවා. ඔබතුමන්ලා නීතියක් ගෙනෙන්න; මේ අවුරුදු 65, 70 පැනපු අය දමන්න එළියට. ඒ මිනිස්සු වයසයි. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඒ මිනිස්සු අවුරුදු 20-30 වාගේ කාලයක් ඉන්නවා, හිරේ. ඒ අය දමන්න එළියට. ඒකට ගෙනෙන්න නීති. හැම දේටම 54 වගන්තිය යටතේ කටයුතු කරනවා කියලා ඇතුළට දමනවා. ඒවාට වෙන නීති ගෙනෙන්න. ලෝකයේ වෙනත් රටවල ඕනෑ තරම් තිබෙනවා නීති. ඒ සමහර අය තියන්න පුළුවන් ගෙවල්වල, සිරකරුවන් විධියට. එහෙම නැත්නම් ඔවුන්ගේ ගම් ප්‍රදේශ තුළ සිරකරුවන් විධියට තියන්න පුළුවන්. ඒ අයගේ කකුලට chip එකක් දමලා monitor කරන්න. අද තාක්ෂණය දියුණුයි. මේවාට ලෝකයේ දියුණු තාක්ෂණය ගෙනෙන්න. ඔබතුමන්ලා ඩිජිටල් ආර්ථිකයක් ගැන නේ කථා කළේ; ඩිජිටල්කරණයක් ගැන නේ කථා කළේ.

මම මේ ගැන සොයා බලද්දී, මම ඉස්සෙල්ලාම බැලුවා ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රකාශනයේ මේ ගැන මොනවාද කියා තිබෙන්නේ කියලා. "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එක කෝ කියලා මම බැලුවා. එහෙම බලනකොට, ඔබතුමන්ලාගේ වෙබ් අඩවියෙන් "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එක අතුරුදහන් වෙලා. රට තුළ නම් කොහොමත් "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" කියන එක අතුරුදහන් වෙලා නේ තිබෙන්නේ. ඒක වෙනම කථාවක්. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඔබතුමන්ලාගේ වෙබ් එකේ කෝ, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එක? අපි බලන්න එපායැ ඒකේ මොනවාද තිබෙන්නේ කියලා. අපේ ඒවා නම් වැඩක් නැහැ. අපි පැරදුණා. අපේ වෙබ් අඩවිය වැඩකුත් නැහැ, අපේ ප්‍රතිපත්ති වැඩකුත් නැහැ. ජනතාව ඒවා ප්‍රතික්ෂේප කළා. හැබැයි, ඔබතුමන්ලාගේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එකට මොකද වුණේ? සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා පුළුවන් නම් ගූගල් එකේ බලන්න ඒක තිබෙනවාද කියලා. ඒක නැහැ. ඒක අතුරුදහන් වෙලා. *[බාධා කිරීමක්]* ඒක තමයි. AI තමයි දැන් අතුරුදහන් වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* බිමල් රත්නායක ඇමතිතුමා තමයි හොඳම AI. ඒ ඇයි බිමල්? මම අහන්නේ ඒකයි. ඒ ඇයි අතුරුදහන් වෙලා තිබෙන්නේ? ඒ ඇයි අතුරුදහන් වෙලා තිබෙන්නේ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එක? ඒ නිසා ඔබතුමන්ලා පොහොසත්, රටක් ලස්සන ජීවිතයක් හදන්න කලින් වහාම ඔබතුමන්ලාගේ වෙබ් අඩවිය තුළ "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" කියන එක ප්‍රදර්ශනය කරන්න. මොකද, රටේ ජනතාව බලනවා, NPP එකට ඡන්දය දෙනකොට අපි මොනවා බලලාද ඡන්දය දුන්නේ කියලා. දැන් මතක නැහැ නේ, මිනිස්සුන්ට. ඒ නිසා ඔබතුමන්ලාට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් භූමියේ ස්ථාපිත කරන්න බැරි නම්, අඩුම ගණනේ ඔබතුමන්ලාගේ වෙබ් අඩවියේවත් ඒක තියන්න කියලා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[ப.ப. 2.15]

**ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) செல்லத்தம்பி திலகநாதன்)
(The Hon. (Dr.) Sellaththamby Thilaganathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சி யடைகின்றேன்.

கடந்த காலத்தில் பெருமளவான நிதியானது, நிதி தூய்தாக்கல்மூலம் இலங்கையிலிருந்து வெளியேற்றப் பட்டுள்ளது. இலங்கையில் வாழ்கின்ற மக்களில், 10 சதவீதமானவர்களின் கைகளில்தான் இந்த நாட்டின் 90 சதவீதமான பொருளாதாரம் சிக்கிக் காணப்படுகின்றது. இந்த நாட்டில் இருக்கின்ற 90 சதவீதமான மக்களுடைய பொருளாதாரத்தை உயர்த்த வேண்டுமென்றால், இலங்கையில் வாழ்கின்ற சாதாரண குடிமக்களும் நல்ல முறையில் தரமானதொரு வாழ்க்கை வாழ வேண்டுமென்றால், இவ்வாறான சட்டங்களைக் கொண்டுவர வேண்டும். சட்டரீதியற்ற முறையில் சேமிக்கின்ற பணத்தை அதாவது, போதைவஸ்து மூலமும் சட்டவிரோத தொழில்களை மேற்கொள்வதன் மூலமும் சேமிக்கின்ற பணத்தை இவ் வாறான சட்டங்கள் ஊடாக அரசாங்கம் பெறுப்பேற்று, நாட்டில் அபிவிருத்தியை மேற்கொள்வதன்மூலம் இந்த நாட்டைச் சிறந்ததொரு நிலைக்குக் கொண்டுசெல்ல முடியுமென நான் நினைக்கின்றேன்.

கடந்த காலத்தில் வரி முறைமைகளில் மாற்றத்தை ஏற்படுத்தினார்களே ஒழிய, வரித் தளத்தில் எந்தவிதமான மாற்றத்தையும் மேற்கொள்ளவில்லை. குறிப்பிட்டுச் சொல்வதென்றால், 2002ஆம் ஆண்டு இலங்கையின் மொத்தத் தேசிய உற்பத்தில் - GDPஇல் - 7 சதவீதம்தான் வரி வருமானமாக இருந்தது. அப்போது, 302,454 நபர்கள்தான் வரி செலுத்தி இருந்தார்கள். எமது அரசாங்கம் ஆட்சியைக் கைப்பற்றியதன் பின்னர், 2025ஆம் ஆண்டு GDPஇல் 14.7 சதவீதமான பங்களிப்பை வரி வருமானம் செலுத்தியுள்ளது.

[ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා]

இதன்போது, 1,450,000 நபர்கள் வரி செலுத்தியுள்ளார்கள். காரணம், எமது அரசாங்கத்தின் போக்கு! பெறப்படுகின்ற இந்த வரி வருமானம் மக்களைச் சென்றடைவதைக் கண்ணால் கண்ட பின்னர்தான், மக்கள் விரும்பி வரி செலுத்துகின்றார்கள். கடந்த காலத்தில் வட மாகாண மக்கள் விருப்பமில்லாமலேயே வரி செலுத்தினார்கள். ஆனால், தற்போது அம்மக்கள் விரும்பி வரி செலுத்துகின்றார்கள்.

ஏனெனில், வரிமூலம் பெறப்படுகின்ற நிதியானது சிறந்த முறையில் மக்களைச் சென்றடைவதைக் காணக்கூடியதாக இருக்கின்றது. குறிப்பிட்டுச் சொல்வதென்றால், முல்லைத்தீவு மாவட்டத்தில் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கும் ஏழை மக்களுக்குமென - கிட்டத்தட்ட 1,400 பயனாளிகளுக்கு - தலா 50 இலட்சம் ரூபாய் பெறுமதியான வீடுகள் அமைக்கப் படுகின்றன. கடந்த காலத்தில் இவ்வாறான வீடமைப்புத் திட்டங்கள் வெளிநாடுகளிலிருந்து பெற்றுக்கொண்ட நிதிமூலம் தான் அமைக்கப்பட்டன. ஆனால், எமது அரசாங்கம் உள்நாட்டில் பெற்றுக்கொண்ட நிதியைப் பயன்படுத்தியே இதனை மேற்கொள்கின்றது. மக்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்துவதாக இருந்தாலும் சரி, உட்கட்டுமானப் பணிகளாக இருந்தாலும் சரி - வீதி அமைப்பதாக இருந்தாலும் சரி, வீடு அமைப்பதாக இருந்தாலும் சரி - இவை எல்லாம் எமது நாட்டிலிருந்து பெற்றுக்கொள்ளப்பட்ட வரிப் பணத்தின் மூலம்தான் மேற்கொள்ளப்படுகின்றன என்பதை நான் இங்கு குறிப்பிட்டுக் கூற விரும்புகின்றேன். வட்டுவாகல் பாலமானது, எமது நாட்டு மக்களிடமிருந்து பெற்றுக் கொள்ளப்பட்ட வரிப் பணத்தின்மூலமே அமைக்கப்பட்டது. கடந்த காலங்களில் பாதைகளாக இருந்தாலும் சரி, பாலங்களாக இருந்தாலும் சரி, வீடுகளாக இருந்தாலும் சரி, பாடசாலைகளாக இருந்தாலும் சரி, வெளிநாடுகளி லிருந்து கடன் அடிப்படையில் பெற்றுக்கொள்ளப்பட்ட நிதிமூலம்தான் அமைக்கப்பட்டன. எமது அரசாங்கமானது குறுகிய காலத்தில் இவ்வாறான பெருமளவு அபிவிருத்திகளை மேற்கொண்டுள்ளது.

தற்போது இலங்கையில் ஒரு கோடியே எழுபது இலட்சம் பேர் TINஐப் பெற்றுக்கொள்ள வேண்டியவர்களாக இருக்கின் றார்கள். அதில் ஓரிலட்சத்து முப்பதாயிரம் பேர் TINஐப் பெற்றுக்கொள்வதற்கு விண்ணப்பித்துள்ளார்கள். இதனைப் பார்க்கும்போது விளங்குகின்றது, இலங்கையில் வாழுகின்ற மக்கள் தற்போது நேர்மையான ஆட்சி நடைபெறுகின்றது என்பதை உணர்ந்துள்ளார்கள் என்பது. அதன் காரண மாகத்தான் பெருமளவான மக்கள் வரி செலுத்துவதற்கு முன்வருகின்றார்கள். 2025ஆம் ஆண்டு எமது மொத்தத் தேசிய உற்பத்தியானது 32.75 டிரில்லியன் ரூபாயாகக் காணப்பட்டது. எனினும், கடந்த காலத்தில் இவ்வாறு இருக்கவில்லை. இப்போது எமது மொத்தத் தேசிய உற்பத்தியும் அதிகரித்துச் செல்கின்றது; மக்களுடைய வாழ்வாதாரமும் சிறப்படைந்து செல்கின்றது.

டிஜிட்டல் பொருளாதாரம்மூலம் எமது முறைசார் பொருளாதாரத்தை நாங்கள் ஊக்குவிக்கக்கூடியதாக இருக்கும். கடந்த காலத்தில் முறைசாரா பொருளாதாரமே இலங்கையில் பெருமளவில் காணப்பட்டது. நேரடியாகப் பணக் கொடுக்கல் வாங்கல்மூலம் வர்த்தக நடவடிக்கைகளை மேற்கொண்ட தனால், அரசுக்குக் கிடைக்கவேண்டிய வரிப் பணம் கிடைக்கவில்லை. ஆனால், தற்போது எமது அரசாங்கத்தில், digitalizationமூலம் நிதிக் கொடுக்கல்வாங்கல் இலத்திரனியல் ரீதியில் மேற்கொள்ளப்படுவதனால் அரசாங்கத்துக்குக் கிடைக்கவேண்டிய நிதியானது நேரான வழியில் அரசாங்கத்தைச் சென்றடைகின்றது. இவ்வாறு digitalization செய்வதன்மூலம் எதிர்வரும் காலத்தில் அரசுக்குப் பெருமளவு நிதியை வரி ஊடாகப் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும். உதாரணத்துக்கு, இந்தியா போன்ற நாடுகளில் ஒரு தண்ணீர் போத்தலைக்கூட digital money மூலம்தான் பெற்றுக் கொள்கின்றார்கள். கடந்த காலங்களில் இலங்கையில் பல்வேறு வர்த்தக நிலையங்களில் நாங்கள் credit cardஐ அல்லது debit cardஐ வழங்கினால், அவர்கள் அதனை விரும்புவதில்லை. அதுமாத்திரமல்ல, அந்த cardஐ வழங்கினால் 3 அல்லது 4 சதவீத நிதியை மேலதிகமாகவும் அறவிடுவார்கள். ஏனெனில், அவர்கள் குறித்த taxஐ தாங்கள் வழங்காமல், வாடிக்கையாளர்களிடமிருந்து பெற்றுக்கொள் கின்றார்கள். இதன்மூலம் அவர்கள் வரி ஏய்ப்பை மேற்கொள்கின்றார்கள். இவ்வாறு கறுப்புப் பணத்தைச் சேர்த்து, அதனைப் பணத் தூய்தாக்கல்மூலம் பல்வேறுபட்ட தேவைகளுக்குப் பயன்படுத்துகிறார்கள். எதிர்வரும் காலத்தில் எமது ஆட்சியில் இவ்வாறான பணத் தூய்தாக்கல் நடைபெறுவதற்கு இடமளிக்கப்படாது என்பதை நான் இங்கு குறிப்பிட்டுக்கொள்ள விரும்புகின்றேன்.

பொதுவாக ஒரு நாட்டில் நேர் வரிதான் - direct taxதான் - அதிகமாகக் காணப்பட வேண்டும். ஆனால், எமது நாட்டில் direct tax - நேர் வரி - 20 சதவீதமாகவும் நேரில் வரி 80 சதவீதமாகவும் காணப்படுகின்றது. குறிப்பிட்டுச் சொல்லப் போனால், அமெரிக்கா போன்ற நாடுகளில் 93 சதவீதம் நேர் வரியும் மிகுதி நேரில் வரியும் காணப்படுகிறது. எமது நாட்டிலும் நேர் வரியை அதிகரிப்பதன்மூலம் பொருளாதாரத்தை ஆரோக்கியமான நிலையில் கொண்டு செல்லக் கூடியதாக இருக்கும். கடந்த காலத்தில் எமது இளைய சமுதாயம் போதைப்பொருள் மற்றும் சட்டவிரோத நிதிப் பயன்பாடுகளில் ஈடுபட்டதன்மூலம் ஆரோக்கியமற்ற சமுதாயமாக உருவானது. ஆனால், நாங்கள் எதிர்காலத்தில் ஆரோக்கியமானதொரு சமுதாயத்தை உருவாக்கி, அதன்மூலம் பொருளாதாரத்தைக் கட்டியெழுப்பி, எமது நாட்டைச் சிறந்த முறையில் முன்னோக்கிக் கொண்டு செல்வோமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.23]

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ පැවති කුරිරු යුද්ධයෙන් පස්සේ වැඩිම ආරක්ෂක නිලධාරීන් පිරිසක් මිය ගිය අවස්ථාවක් හැටියට මේ ශෝචනීය අවස්ථාව වාර්තා වෙනවා. මෙහිදී මියගිය ආරක්ෂක නිලධාරීන් ඇතුළු අනිකුත් සියලු දෙනාගේම පවුල්වල අයට මේ අවස්ථාවේදී අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමතිතුමාට ඉවත් වෙන්න කියලා ගොඩක් කට්ටිය කියනවා. අවුරුදු ගණනකට කලින් මහර බන්ධනාගාරයේ සිදු වූ සිද්ධිය ගැන අනුර කුමාර මහත්මයා කරපු කථාව මම දැක්කා. එතුමා එදා ඉතාම fiery speech එකක් කළා, "ඇමතිවරයා අනිවාර්යයෙන්ම අයින්

වෙන්න ඕනෑ, මේක තනිකරම ආණ්ඩුවේ වගකීමක්, ආණ්ඩුව භාරයේ තිබෙන්නේ" යනාදී වශයෙන්. එතුමා එදා කියපු සියලුම කථා ටික අද එතුමාට පාරාවළල්ලක් වෙලා තිබෙනවා. එතුමා එදා කථා කරපු ඔක්කෝම ටික දැන් එතුමාට කියනවා. මේ අවස්ථාවේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. එතුමා සාධාරණ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පක්ෂ, පාට භේදයකින් තොරව අවස්ථා කිහිපයකදී දිගින් දිගටම කිව්වා, බන්ධනාගාරයේ පවතින තදබදය නැති කරන්න කියලා. දේශපාලන වුවමනා ඉටු කරගන්න බන්ධනාගාර පුරවනවා. 500ක් ඉන්න ඕනෑ තැන 3,500ක් 4,000ක් ඉන්නවා. බල්ලෝ, බළල්ලු වාගේ ගාල් කරනවා, මේ මිනිස්සු. කිසිම හිතක් පපුවක් නැහැ. මේක වෙයි කියලා මම කිව්වා. මම මේ යෝජනාව කලිනුත් ඉදිරිපත් කරලා තිබෙනවා, "දැනට බන්ධනාගාරයේ සිටින මරණ දණ්ඩනය ලැබී ඇති සිරකරුවන්ගේ දඬුවම් කාලය, ජීවිතාන්තය දක්වා සිරදඬුවම්..." යනාදී වශයෙන්. මට තිබෙන්නේ විනාඩි 6ක් නිසා මේ කාරණා කෙටියෙන් කියලා කථාව අවසන් කරන්නම්.

මේ සියලු දේවල් මම ඉදිරිපත් කළා. ඒ වාගේම ඒ ආයතනවලට ගිහිල්ලාත් මම මේ අදහස් ඉදිරිපත් කළා. ඒ වාගේම මේක කරන්න කියලා මම බල කළා. හැබැයි, අමාත්‍යතුමා ඒක කරන්න යම්කිසි උත්සාහයක් දැරුවා. දැන් අමාත්‍යතුමාට ඉවත් වෙන්න, ඉවත් වෙන්න කියලා කියනවා. නමුත් මම අමාත්‍යතුමාට ඉවත් වෙන්න කියලා කියන්නේ නැත්තේ, හිටපු කථානායක රන්වලට ඉවත් වෙන්න කියලා වුණු වැඩේ ආපහු වෙයි කියලායි. මොකද, ඒ මනුස්සයාට ඉවත් වෙන්න කිව්වාට පස්සේ එතැනට ගෙනෙන්න මනුස්සයෙක් හිටියේ නැහැ. අර රන්වල මහත්මයා හිටියා නම් දැන් හොඳයි කියලා හිතෙනවා. මොකද, මේ මනුස්සයාත් ඉවත් කළොත් ඒ වෙනුවට පත් කරන්න කෙනෙක් නැති නිසා. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාව හරි පත් කරනවා නම්, - ඒකට පත් කරන්න පුළුවන් එක මනුස්සයායි මට පෙනෙන විධියට ඉන්නේ. ඒ නිසා එතුමාව ඉවත් කරන වැඩේ ගැන පොඩ්ඩක් සලකා බලන්න කියලා මම කියනවා. නමුත් එතුමාගේ ක්‍රියාකලාපය විවේචනයට ලක් වෙන්න ඕනෑ. නලින් බණ්ඩාර මැතිතුමා කියපු විධියට ඒ ගැටුම කලින්ම නතර කර ගන්න තිබුණා. මමත් අධිකරණ නියෝජ්‍ය ඇමති වශයෙන් කටයුතු කර තිබෙනවා. ඒ කාලයේත් මේ වාගේ තත්ත්වයන් උද්ගත වුණා. ඒ අවස්ථාවලදී අපි අදාළ ස්ථානවලට ගිහිල්ලා, ඇතිවෙලා තිබුණු ප්‍රශ්න නිරාකරණය කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක state capture එකක්. මම මේක දිගටම කිව්වා. මේ state capture එක ඔබතුමන්ලා කළා. ඔබතුමන්ලාට වැඩ බැහැ. ගොවියෝ පාරේ. ගොවියෝ වෙනුවෙන් අඬපු ඇමතිවරු මෙතැන ඉන්නවා. අද රුපියල් 80ට, 85ට තෙත වී ටික විකුණා ගන්න බැහැ. ඒ සඳහා රුපියල් 120ක් දෙනවා කියලා තමයි ඒ කාලයේ කිව්වේ. ගොවියෝ අඬනවා. මේ කන්නය ඉවර වුණාට පස්සේ ණය ටික ගෙවා ගන්න බැහැ කියනවා. ඒ වාගේම උපාධිධාරින්ටත් කිසිම විසඳුමක් නැහැ. ගල් අඟුරු හොරකම, කන්ටේනර් හොරකම, බැංකු හොරකම ඇතුළු හොරකම් සියල්ල මධ්‍යයේ ඔබතුමන්ලාගේ ක්‍රියාකාරිත්වය අන්තිමයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා ඉතුරු කරලා ගිය ටිකවත් දැන් නැහැ. විදේශ සංචිත ප්‍රමාණය පහළ වැටිලා, ආර්ථික වර්ධනය පහළ වැටිලා, රට බංකොලොත් වෙනකොට දැන් මොකක්ද කරන්න හදන්නේ? අනුර කුමාර මහත්මයාගේ අන්තිම ඉලක්කය මොකක්ද? State capture එක. නීති ගෙනෙන්න. නීති ගෙනැල්ලා හොරු ටික අල්ලන්න. ඒකට තමයි අපි ඔබතුමන්ලාට ඒ කාලයේදී සහයෝගය දුන්නේ. නමුත් දැන් ඒක නොවෙයි කරන්නේ. තමන්ට විරුද්ධව හඬ නඟන මනුස්සයාව හිරේ දමනවා. දිගින් දිගටම මේක ඒ විධියට හරිගස්සනවා. Commission to Investigate Allegations of Bribery or Corruption තනිකරම දේශපාලනීකරණය කළා. ඒකට දේශපාලන හිතවතුන් දැම්මා. ඊට පස්සේ CID එක දේශපාලනීකරණය කළා. දැන් අල්ලන්න තිබෙන්නේ අධිකරණය විතරයි. - [*බාධා කිරීමක්.*] Please be quiet, brothers.

විපක්ෂ නායකතුමා කිව්වා, විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කරන්න යන්නේ ඉහළ අධිකරණයේ - ඇපැල් අධිකරණයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ - එක් පුද්ගලයෙක් වෙනුවෙන් කියලා. ඒක තමයි state capture. ඒ, අධිකරණය අල්ලන්න. අධිකරණය අල්ලලා තමන්ට ඕනෑ විධියට, තමන්ට ඕනෑ කට්ටියව හිර කරන්න; තමන්ට විරුද්ධ පුද්ගලයෙක් ඉන්නවා නම් ඒ පුද්ගලයාව හිරේ දමන්න. හර්ෂණ නානායක්කාර ඇමතිතුමා කියන්නේ මොකක්ද? එතුමා කියනවා, "Sir, basically, we have no intention of breaking the rule of law. We have no intention of using any posts as carrots for promotions for anybody. I believe the Hon. Leader of the Opposition presumed a lot of things that we were not even intending to do and then, he made comments on that" කියලා. ඒක හිතලාවත් නැහැ කියලා ඇමතිතුමා කියනවා. ඊට පස්සේ එතුමා හැන්දෑවේ ඇවිල්ලා කියනවා, "සමාවෙන්න, මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් යනවා" කියලා. මොකක්ද මේ කරන්න යන්නේ? පොදු රාජ්‍ය මණ්ඩලයේ ස්ටීවන් තිරු කියා තිබෙනවා, මේක රට ඉවර වෙන වැඩක් කියලා. මේක සිම්බාබ්වේ කියන රටේත් සිදු වුණා. ඒක තමයි මේ කරන්න යන්නේ. වැඩ බැරිවෙනකොට, දුප්පත් අහිංසක මිනිස්සු හිඟා කනකොට මොකක්ද කරන්න යන්නේ? රාජ්‍යය අල්ලන්න හදනවා. ඊට පස්සේ ගහන්න, මරන්න පටන් ගන්නවා. අපි මේක කිව්වා. මේ එන්නේ එතැනට. අධිකරණය අල්ලන්න බැරි වුණොත්,- එහෙනම් ඇපැල් අධිකරණයේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවන්ගේ විශ්‍රාම යන වයස දීර්ඝ කරන්නකෝ. කාලය ඉවර වුණාම අහන්න, දීර්ඝ කරන්න පුළුවන්ද කියලා. පුළුවන් නම් දෙසැම්බර් මාසයෙන් පස්සේ දීර්ඝ කරන්නකෝ. එහෙම කරන්නේ නැහැ. ඔබතුමන්ලා රට අල්ලන්න යන්නේ; අධිකරණය අල්ලන්න යන්නේ; ආයතන අල්ලන්න යන්නේ. ඒක කරලා ඉවරයි. අන්තිම එක තමයි මේ කරන්න යන්නේ. Commonwealth එක විතරක් නොවෙයි, LAWASIA එකේ සභාපති ඇතුළු ඔක්කෝම අය කියනවා, "සිම්බාබ්වේත් මේක කළා, මේකෙන් රටවල් ඉවර වෙනවා" කියලා. මේවා මහින්ද රාජපක්ෂත් කළා. අපි ඒවාට විරුද්ධ වුණා. ශිරානි බණ්ඩාරනායකව ගෙනාවෙත් වැරදි ක්‍රමයට. අපේ ඥාතියෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටියා. ඒ අය විරුද්ධ වුණා. මොකද, එතුමිය ගෙනාපු විධිය හරි නැහැ. හැබැයි, එතුමියව පත් කළාට පස්සේ, ඉවත් කරපු විධියත් හරි නැහැ. ඔබතුමන්ලා එදා දේශපාලන පක්ෂයක් විධියට විරුද්ධ පක්ෂය පැත්තේ ඉන්නකොට අනුර කුමාරප මහත්මයා ඇතුළු මේ කණ්ඩායම යටි ගිරියෙන් කෑ ගැහුවා, මේ දේවල් ගැන.

දැන් ඔබතුමන්ලාට බලය ලැබී තිබෙනවා. අපි කිව්වා, මිනිස්සු මරන්න පටන්ගෙන හරි මේ අය මේ රටේ බලය තියා ගන්නවා කියලා. හැබැයි, මේ රටේ එහෙම කරන්න ජනතාව ඉඩ දෙන්නේ නැහැ. ජනතාව ඔබතුමන්ලාට විරුද්ධව පොල්ල අතට ගන්නවා. ඔබතුමන්ලා මේක කරන්න එපා. ඒ නිසා මම ඔබතුමන්ලාට අනතුරු ඇඟවීමක් කරනවා. මුළු අධිකරණයම මේකට විරුද්ධයි. රියෙන්සි අර්සකුලරත්න, ඔබතුමන්ලාගේ නීතිඥතුමා විරුද්ධයි. සාලිය පීරිස්, ඔබතුමන්ලාගේ නීතිඥතුමා විරුද්ධයි. උපුල් කුමරප්පෙරුම නීතිඥතුමා විරුද්ධයි. ඒ සියලුදෙනා විරුද්ධයි. මේ, රට විනාශ වන වැඩ. බලය තියාගන්න පුළුවන්, හැබැයි මේ රටවල් විනාශ වෙනවා. අපි ඒ කාලයේ ඉඳන් මේ වාගේ දේවල්වලට විරුද්ධයි. අපේ පැත්තේ වුණත් වැරදි දෙයට වැරදියි කියලා අපි

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

කියනවා. ජේආර්ලා කළත්, ප්‍රේමදාසලා කළත් එහෙමයි. හැබැයි, එතුමන්ලා කවුරුවත් එහෙම කළේ නැහැ. ප්‍රේමදාස මැතිතුමා අධිකරණට අත ගැහුවේ නැහැ. චන්ද්‍රිකා අධිකරණයට අත ගැහුවේ නැහැ. ඒ නිසා අපි ඉතා පැහැදිලිව ඔබතුමන්ලාට කියනවා, මේ කරන්න යන වැඩේ නවත්වන්න කියලා. රටේ, ලෝකයේ සියලුදෙනා කියනවා, මේ කරන්න යන දෙය නවත්වන්න කියලා. ඔබතුමන්ලා මේක කරන්නේ ඔබතුමන්ලාගේ පැවැත්ම සඳහා පමණයි කියන එක මම ඉතා පැහැදිලිව මේ අවස්ථාවේදී කියනවා.

Bail දෙන නඩුකාරයෝ අද ඉවත් කරනවා. Bail නොදෙන්නේ ඇයි, bail දෙන එක තමයි රීතිය. කාටද bail දෙන්න ඕනෑ කියන එක ඔබතුමන්ලා කරන්නේ තෝරලා බේරලා. කරන්නාගොඩ ඉන්න කොට කරන්නාගොඩට bail දෙනවා. මොකද, දේශපාලන වශයෙන් ඒකෙන් බලපෑමක් එයි කියලා. අනෙක් පුද්ගලයෝ සොච්චම් වැරදිවලට ඇතුළට දාලා, මාසයක් මාස දෙකක් යනවා, bail දෙන්නේ නැහැ. හැමකෙනාටම bail දෙන්න ඕනෑ. Bail දුන්නාම මොකක්ද වන පාඩුව? ඒකේ ව්‍යතිරේක තිබෙනවා; bail දෙන්නේ නැති අවස්ථා තිබෙනවා, exceptional circumstances කියලා. ඒවා මොනවත් නැහැ. එක තැනකට විනිසුරුවරයෙක් දමනවා, ඒ විනිසුරුවරයා පාවිච්චි කරනවා, ඒ විනිසුරුවරයා bail දුන්නොත් එතුමාව එතැනින් ඉවත් කරලා වෙනත් තැනකට දමනවා. මේක කරන්න එපා. අධිකරණයට අත ගහන්න එපා. මේ රටේ ස්වාධීනව තිබෙන්නේ අධිකරණය විතරයි. ඒ නිසා ඉතා පැහැදිලිව කියනවා, මේකට අපි විරුද්ධ වෙනවා, අපි මේක කරන්න දෙන්නේ නැහැ කියලා. අපි අනිවාර්යයෙන්ම මේ රටේ ස්වාධිපත්‍යය, නීතියේ ආධිපත්‍යය, ඒ වාගේම අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න පෙනී ඉන්නවා කියන එක මේ අවස්ථාවේදී සඳහන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.30]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඊයේ දැක්කා, මිය ගිය බන්ධනාගාර නිලධාරි මහත්වරුන්ට අවසන් ගෞරව දක්වන්න වත්මන් ආණ්ඩුවේ අධිකරණ ඇමතිතුමා ගිහිල්ලා තිබෙන ආකාරය. අවසන් ගෞරව දක්වා කඳුළු සලා සංවේදී වුණාට පමණක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ කියන කාරණය අපි මතක් කරන්න ඕනෑ. ඇයි, අපි එහෙම කියන්නේ? කඳුළු සලා සංවේදී වුණා කියන කාරණයෙන් පමණක් මේ ප්‍රශ්න විසඳන්න බැහැ. තවම මේ ආණ්ඩුව මෙහි ගැඹුර පිළිබඳව අවබෝධ කරගෙන නැහැ කියන කාරණය මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

අපි දැක්කා, ඊයේ දවසේ ගාල්ල මහමෝදර පැරණි මාතෘ රෝහල ගැසට් පත්‍රයක් මඟින් බන්ධනාගාරයක් බවට පත් කරන්න තීන්දුවක් ගත් බව. අපි අහනවා, එහෙම තීන්දුවක් ගන්න මහමෝදර රෝහල පිළිබඳව, ඒ පරිසරය පිළිබඳව මේ ආණ්ඩුව පූර්ව සූදානමකින්, පූර්ව නිගමනයකින් කටයුතු කළාද කියන කාරණය. විශේෂයෙන්ම ගාල්ල කියන්නේ, ලෝක උරුමයන් විධියට නම් වෙච්ච සංචාරක පුරවරයක්. ඒ විතරක් නොවෙයි. ඒ යෝජිත ස්ථානය ගාල්ල සංවර්ධන සැලැස්ම තුළ වෙනත් කාරණයකට යෝජනා වෙච්ච ස්ථානයක්. ඒ වාගේම ගාල්ලේ වැඩිම වාණිජ වටිනාකමක් තිබෙන ස්ථානයක තමයි, අද ඔබේ ආණ්ඩුව බන්ධනාගාරයක් ඇති කරන්න උත්සාහ ගන්නේ. ගාල්ලේ මේ වනකොටත් තිබෙන බන්ධනාගාරයත් ඒ ස්ථානයෙන් ඉවත් කරන්න තීන්දු තීරණ ගත්ත වෙලාවක තමයි, නැවත වරක් ගාල්ලට තවත් බන්ධනාගාරයක් එකතු කරන්න යන්නේ. මේකත් එක්ක අද ගාල්ලට බන්ධනාගාර තුනයි. හැබැයි, ගාල්ලට බන්ධනාගාරයක් ගේනකොට ගාල්ල දිස්ත්‍රික්කයේ ඒ සංවර්ධන සැලැස්ම පිළිබඳව ඔබ අවධානය යොමු කළාද?

ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හත්දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් සහ මන්ත්‍රීවරුන් පස්දෙනෙක්. ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ සම්බන්ධව තීන්දු ගත්තා. මහමෝදරට කරන්නේ මොකක්ද කියන කාරණය, ගාල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන සැලැස්ම මොකක්ද කියන කාරණය ඔවුන් දන්නවා. අපේ ආණ්ඩුව කාලයේදී හදපු ඒ සංවර්ධන සැලැස්ම අද ඉදිරියට ගෙන යමින් ඔවුන් කටයුතු කරනවා. හැබැයි, එහෙම කටයුතු කරන වෙලාවක, ගාල්ලට තවත් බන්ධනාගාරයක් ගේන්න ගැසට් ගහනතුරු ගාල්ලේ අපේ මන්ත්‍රීවරුන් නිහඬව ඉන්නේ ඇයි කියලා අපි අහනවා. ගාල්ල කියන්නේ සංචාරක පුරවරයක්. ඒ සංචාරක පුරවරය ආරක්ෂා කරන්න, ශක්තිමත් කරන්න අපි කටයුතු කරන්න ඕනෑ. බන්ධනාගාර පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්නයට පිළිතුරක් තිබෙන්නත් ඕනෑ. තාවකාලිකව ගාල්ලට බන්ධනාගාරයක් ගෙනාවාට, ස්ථිරව බන්ධනාගාරයක් ගේන්න එපා කියලා අපි කියනවා. අපි පාර්ලිමේන්තුව තුළ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ සඳහා විරුද්ධ වෙලා ඒ ගැසට් පත්‍රය අවලංගු කරන්න කටයුතු කරන්න කියලා.

ඒ වාගේම මේ අවස්ථාවේදී මම තවත් කාරණයක් මතක් කරන්න ඕනෑ. ඊයේ දවසේ මම බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ ගැටලුවක් පිළිබඳව කථා කළා. බෝපෙ-පෝද්දල ආදාහනාගාරයේ කටයුතු විවෘත නොකිරීම පිළිබඳව තමයි මම ඇහුවේ. ආදාහනාගාරය පිළිබඳව අහපු ඒ ප්‍රශ්නයේදී ඔබේ ආණ්ඩුවේ පළාත් පාලන විෂය භාර ගරු ඇමතිතුමා ඉතාම ගෞරවනීය විධියට පොරොන්දු වුණා ඒ කටයුත්ත තව සති දෙකකින් ඉෂ්ට කරන බවට. ඒ සම්බන්ධව එතුමාට අපේ ස්තුතිය පුද කරන්න ඕනෑ.

හැබැයි එතුමාට ස්තුතිය පුද කළාට, බෝපෙ-පෝද්දල තිබෙන ඒ ආදාහනාගාරය විවෘත කිරීම පිළිබඳව කථා කළාම ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන එක්තරා මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, ඒක දූෂිතයි, ඒ සම්බන්ධයෙන් දූෂණය පිළිබඳ තොරතුරු තිබෙනවා කියලා. අපි ඒ මන්ත්‍රීතුමාගෙන් අහනවා, දූෂණ තිබෙනවා නම්, තොරතුරු තිබෙනවා නම් ඒවා අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ කොට්ටය අස්සේ දමාගෙන ඉන්නේ ඇයි කියලා. ඒක ඔප්පු කරන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා පවත්වා, එළියේ කථා පවත්වා "දූෂණය කර තිබෙනවා, වංචා කර තිබෙනවා" කියලා කියන කාරණය පමණක් වැදගත් වන්නේ නැහැ. අද ඒක නිකම්ම නිකම් කථා බවට, හිස් වචන බවට පත් වෙලා තිබෙනවා. බෝපෙ-පෝද්දල හදන ආදාහනාගාරය සම්බන්ධයෙන් වංචාවක්, දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ඒක ඔප්පු කිරීමේ වගකීම තිබෙන්නේ ඔබට. ඔබයි අද ආණ්ඩු කරන්නේ.

අපි හදපු ආදාහනාගාරය ඔබ විවෘත කරලා ඒ ලකුණු ටික දමාගන්න, ඒ ආදාහනාගාරය විවෘත කිරීමේ වගකීම, වටිනාකම

ඔබ ගන්න, ඒ සම්බන්ධව අපට ගැටලුවක් නැහැ. හැබැයි, ඒ වටිනාකම ඔබ ගන්නවා වාගේම ඒ අවශ්‍යතාව ඉටු කිරීමේ වගකීම, මහජන දේපළක් විධියට මහජන මුදලින් හදපු ඒ ආදාහනාගාරය ජනතාව සතු කිරීමේ වගකීමත් ඔබට තිබෙනවා කියන කාරණය මම මතක් කරනවා. මේ වනකොට ගාල්ලේ ජනතාවට, බෝපෙ-පෝද්දල ජනතාවට ආදාහනාගාරයක දැඩි අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා ඒ ගරු මන්ත්‍රීතුමාට අපි අභියෝග කරනවා, එහෙම වංචාවක්, දූෂණයක් තිබෙනවා නම් ඒක ඔප්පු කරන්න, ඔප්පු කර ඒ කටයුතු නිදොස් කරන්න කියලා. එහෙම නැතුව පාර්ලිමේන්තුව පාවිච්චි කරලා ඒ පිළිබඳව චෝදනා කරන්න උත්සාහ ගන්න එපා කියන කාරණයත් මේ මොහොතේ මම සිහිපත් කරනවා.

ගාල්ල දිස්ත්‍රික්කයේ පවතින තවත් ගැටලුවක් පිළිබඳව මම මේ සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි. ගාල්ල දිස්ත්‍රික්කයේ කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය කියන්නේ ඉතාම වටිනා කලාපයක්. ඒ කලාපය තුළ දස දහසකට අධික පිරිසක් රැකියාවල නිරත වනවා. ඒ වාගේම කර්මාන්තශාලා 23කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය කියන්නේ ලංකාවේ ආරම්භ කරපු තුන්වැනි ආයෝජන ප්‍රවර්ධන කලාපයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ තිබෙන ගැටලුවක් පිළිබඳව මම මේ සභාව හමුවේ කියන්න කැමැතියි. ඒ කලාපය තුළ ගිනි නිවීමේ ඒකකයක් නැහැ. ජාත්‍යන්තර මට්ටමේ දැවැන්ත කර්මාන්ත මෙහි ක්‍රියාත්මක වනවා. ඒ වාගේම මෙතනෝල් වැනි ඉතා ඉක්මනින් දැවෙන රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරන කර්මාන්තශාලාවක් කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කලාපය තුළ පවතින මේ ගැටලුව නිසා අනාගතයේදී ප්‍රශ්න මතුවන්න පුළුවන්. ඒක ඔබේ ආණ්ඩුවට එල්ල කරන චෝදනාවක් නොවෙයි. හැම ආණ්ඩුවක්ම ඒ වගකීම පැහැර හැර තිබෙනවා.

ගාල්ල මහ නගර සභාවේ ගිනි නිවීමේ සේවා ඒකකය කොග්ගලට යන්න පැය භාගයක් පමණ ගත වනවා. මේ කලාපය තුළ දස දහසකට අධික පිරිසක් රැකියාව කරනවා. කර්මාන්තශාලා 23ක් තිබෙනවා. කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ යම් ගැටලුවක් මතු වුණොත් ගිනි නිවීමේ සේවා ඒකකය එතැනට යන්න පැය භාගයක් පමණ ගත වන නිසා ඒ ආයෝජන කලාපයත්, එහි සේවය කරන මිනිසුන්ගේ ජීවිතත් සුන්නද්දූලි වෙලා යනවා. ඒ නිසා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා, BoI එක යටතේ ඒ කලාපය තුළ විද්‍යාත්මකව, ප්‍රායෝගිකව පිළිගත හැකි ගිනි නිවන ඒකකයක් වහාම ස්ථාපනය කරන්න කියලා. අපි දන්නවා, අනෙකුත් සෑම නිදහස් කලාපයකම BoI එක මඟින් ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපනය කර තිබෙන බව. කොග්ගල විතරයි ඒක නැත්තේ. ඒ නිසා අපි ඉතාම ගෞරවයෙන් ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා, කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපය තුළ BoI එක යටතේ වූ ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපනය කිරීමට වහාම කටයුතු කරන්න කියලා. ඒ වාගේම රසායනික ද්‍රව්‍ය ගිනි ගැනීම පාලනය කළ හැකි නවීන උපකරණ ලබා දී, පුහුණු ශ්‍රමිකයින් ඒ ස්ථානයට කඩිනමින් අනුයුක්ත කරන ලෙසත් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. යම්හෙයකින් එහි අනතුරක් සිදුවුණොත්, මේ රටට අහිමි වන්නේ දැවැන්ත ආයෝජන කලාපයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතයේ පටන් වර්තමානය දක්වා මේ රටට ඉතාම සුවිශේෂී කාර්යභාරයක් ඉෂ්ට කරපු කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයේ තිබෙන වටිනාකම රටේ අගයයි කියන කාරණය ඉතාම ගෞරවයෙන් සිහිපත් කරමින්, ඒ පිළිබඳව මැදිහත් වන්න කියන කාරණයත් සිහිපත් කරමින්, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතා සුවිශේෂ දවසක්. මොකද, ඉතිහාසයක් පුරා මේ රටේ ආණ්ඩු කරපු, අත්දැකීම් බහුල, ආර්ථික ඔස්තාර්ලා කියලා විශේෂ නාම යොදා ගත් උදවිය මේ රටට කරපු හරිය පිළිබඳ පැතිකඩක් අද සමාජය තුළ යම් යම් අවස්ථාවලදී දකින්න ලැබෙනවා.

නීති හා රෙගුලාසි සම්පාදනය කරන උත්තරීතර ආයතනය වන පාර්ලිමේන්තුව තුළ එවැනි නීති සම්පාදනය කළත්, ඒවා ඒ ආකාරයෙන් ක්‍රියාවට යෙදෙව්වාද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. මා එහෙම කියන්නේ ඇයි? අද දවසේ අපි සාකච්ඡාවට භාජන කරන, සංශෝධනයට ලක් කරන 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත මීට පෙර 2011දීත් සංශෝධනය කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතත්. 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතත් 2011 සහ 2013 යන වසර දෙකේදීම සංශෝධනය කරලා තිබෙනවා. ඇත්තෙන්ම අපි රටක් විධියට ජාත්‍යන්තරයත් සමඟ ගනුදෙනු කරනකොට ජාත්‍යන්තරය තුළ පිළිගැනීමක් ඇති වෙන්නේ මේ රට කොයි තරම් යහපත් විධියට කළමනාකරණය කරනවාද කියන කාරණාව මතයි. ආර්ථික ස්ථාවරත්වය, දේශපාලන ස්ථාවරත්වය සහ සමාජීය ස්ථාවරත්වය යන කරුණු රටක් තුළ ඉබේ ගොඩනැඟෙන්නේ නැහැ. ඒ සඳහා අවශ්‍ය කරන නීති රෙගුලාසි සම්පාදනය කරමින් ඒවා ක්‍රියාවට නංවන්න අවශ්‍යයි.

බොහෝ අය අද කිඹුල් කඳුළු හෙළනවා, මීගමුව බන්ධනාගාරය තුළ වෙච්ච සිද්ධිය සම්බන්ධයෙන්. බන්ධනාගාරගත වෙලා ඉන්න රැඳවියන් ඇත්තටම අහිංසක මිනිසුන් වෙන්න පුළුවන්. ඔවුන් ඒ තත්ත්වයට පත් වෙන්න ඉතිහාසයේ ආණ්ඩු කරපු අය යම් ප්‍රමාණයකට වග කියන්න ඕනෑය කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ඇත්තටම මට මතක් වෙනවා, 2018 ජනවාරි 10වැනි දා බැඳුම්කර සිද්ධිය පිළිබඳ සාකච්ඡාව එළියට එනකොට මේ සභා ගර්භය තුළ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු හැසුරුණු ආකාරය. ජනාධිපතිවරු, අගමැතිවරු සහ මැති ඇමතිවරු එදා කෑ ගැහුවේ කොහොමද? "කවුද හොරා? රනිල් හොරා", "කවුද හොරා? මහින්ද හොරා" කියලා තමයි එදා කෑ ගැහුවේ. මේ නීති සම්පාදනය කරන මෙම උත්තරීතර ආයතනය තුළත් එකිනෙකාට විරුද්ධව "හොරා" කියන්න තරම් ශක්තිමත් ප්‍රජාවක්, එහෙම නැත්නම් මන්ත්‍රීවරු කණ්ඩායමක් එදා දවසේ හිටියා. ඒවා සම්බන්ධයෙන් පත්තරවල ඉහළින්ම වාර්තා කරමින් තිබුණා. ඒ විධියට ගත්තාම එලෙස සම්පාදනය කරපු කිසිම නීතියක් අපි අපේක්ෂා කළ ආකාරයෙන් සමාජය තුළ ක්‍රියාත්මක වෙන්න හෝ ඒ තුළින් අපි බලාපොරොත්තු වූ තත්ත්වය මේ රටට අත්කර දෙන්න පැවැති ආණ්ඩු යම් ආකාරයක හෝ සාධාරණ මැදිහත්වීමක් කළේ නැති බවට එමට සාක්ෂි තිබෙනවා.

[ගරු නිමල් පලිහේන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ මේ පිළිබඳව කථා කරන ප්‍රධාන ආයතනය වන මූල්‍ය කාර්ය සාධක බලකාය 1989දී ඇති කර ගන්නා ලද නියමයන් 40ක් ඔස්සේ හැම රටක්ම ඒ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක විය යුතුයි කියන එක තහවුරු කරලා තිබෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, රටේ අපරාධ අඩු කරන්න, ස්ථාවරත්වය ගොඩනඟන්න සහ රටේ ආරක්ෂාව තහවුරු කරන්නයි. එහෙම නම්, ජාත්‍යන්තර වශයෙන් එක් එක් රටවල් දිහා බලමින් එවැනි අඩුපාඩු හදා ගන්න උපදෙස් දෙනකොට ඇත්තටම අද අපට සිද්ධ වෙලා තිබෙන්නේත් අන්න ඒ නියමයන්ට අනුකූලව පවතින නීතිරීති යම් ප්‍රමාණයකට සංශෝධනය කර ගන්නයි. ඒ සඳහා අද අපි පියවරක් තබා තිබෙනවා. ඉතිහාසය තුළ මේ නීති සම්පාදනය කළ උදවියම ඕනෑ තරම් ඒ නීති කඩ කළ බවට දේශපාලනඥයන් අතරින්ම වන උදාහරණ පුවත් පත් සහ වෙබ් අඩවිවල ඕනෑ තරම් තිබෙන ආකාරය අපි දකිනවා.

මේ අවස්ථාවේදී මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපේ හිටපු අධිකරණ ඇමතිවරයා පොතක් ලිව්වා, "පහන් සංවේගය" කියලා. 2026.02.15වැනි ඉරිදා "අරුණ" පුවත් පතේ සඳහන් වෙනවා, මෙන්න මේ පොත සමන් ඒකනායක කියෙව්වා නම් ඔහු සිරගත වෙන්නේ නැහැ කියලා. හැබැයි, හිටපු අධිකරණ ඇමතිතුමාගේ පුතාත් අද මේ අල්ලස් හා දූෂණ චෝදනා යටතේ අත්අඩංගුවට පත් වෙනවා. එහෙම නැත්නම් අල්ලස් හා දූෂණ චෝදනා යටතේ ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ විධියට සාක්ෂි සපයන්නේ මේ රටට නීති හදපු අය සහ මේ රටේ අධිකරණ ඇමතිවරු විධියට කටයුතු කරපු අය. ඒ නිසා අද මේ අණපනත් අපි අරගෙන එනවා වාගේම ඒවා ක්‍රියාත්මක කරන්නත් වගකීමකින් යුක්තව කටයුතු කරනවා කියන කාරණාවත් මේ වෙලාවේදී මම මතක් කරන්න කැමැතියි. මොකද, 2024 අවුරුද්ද වෙනකොට Corruption Perceptions Index එකේ, එහෙම නැත්නම් දූෂණය සම්බන්ධයෙන් වන ජාත්‍යන්තර දර්ශකයේ අපි හිටියේ 121වැනි ස්ථානයේ. නමුත්, අපි ආණ්ඩුව භාර අරගෙන 2025 අවුරුද්දේ අපේ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට පටන් ගත්තාට පස්සේ එම ස්ථානය 107 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒකෙන් කියැවෙන්නේ පවතින ආණ්ඩුව කිසියම් ආකාරයක හෝ දූෂණය, වංචාව සහ අල්ලස සම්බන්ධයෙන් මැදිහත් වෙන්නේ නැහැ කියන එකයි. මේ රටේ සල්ලි බහිරවයෙක් ගිල්ලා වාගේ සිද්ධි ඉතිහාසය පුරාවට ඕනෑ තරම් වාර්තා වෙලා තිබුණා. ණයක් විධියට රුපියල් කෝටියක් ගත්තත් වත්කම් ගොඩනැඟිලා තිබුණේ ඒ මුදල්වලින් ඉතා අල්ප ප්‍රමාණයක් විතරයි. ඒවා සම්බන්ධයෙනුත් ඉතිහාසය විසින් අපට සාක්ෂි සපයනවා. මේ තත්ත්වයන් නිවැරදි කර ගනිමින් මේ රටේ ආරක්ෂාව, ස්ථාවරත්වය තහවුරු කරගෙන ඉදිරියට යන්න නම් මෙවැනි පනත්වලට සංශෝධන ගෙන ඒම අනිවාර්ය වෙනවා. ඒ වාගේම, ඒවා ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමේ වුවමනාවකුත් තිබෙනවා කියන එක මම මේ සභාව හමුවේ කියන්න කැමතියි.

මේ සභාව තුළ නිතරම සාකච්ඡාවට ලක් වුණු මෙන්න මේ කාරණය ගැනත් මම දැන් කිව්වාට කමක් නැහැ කියලා හිතනවා. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා 2023 සැප්තැම්බර් මාසයේ 22 සහ 23 දිනවල විදෙස් රටක සිදු කළ පෞද්ගලික සංචාරයක් වෙනුවෙන් රුපියල් එක්කෝටි හැටහයලක්ෂයක මුදලක් වංචා කිරීම මේ උත්තරීතර ආයතනය තුළ සාකච්ඡාවට ලක් වුණා. සමන් ඒකනායක කියන පරිපාලන නිලධාරියා සිරගත වෙන්නේත් මේ හේතුව නිසාමයි.

අපි අද මේ කථා කරන විශුද්ධිකරණය කියන කාරණාව යටතේ ප්‍රධාන කරුණු දෙකක් තිබෙනවා. මුදල් උපයා ගත්ත ආකාරය සහ ඒ මුදල් සුදු කරන්න කොයි විධියට කටයුතු කළාද කියන කරුණු දෙකම මෙයට අදාළ වෙනවා. මේ කටයුතු දෙකම නඩු සඳහා නිමිති වෙනවා. ඒ වාගේම ඒ සඳහා නඩු පැවරීමේ හැකියාවක් තිබෙනවා. අද දවසේදී අපි මේ සම්මත කරන පනත්වලින් ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රවේශය සහ පහසුකම සලසා දෙනවා. පැහැදිලිවම ඒ කටයුතු කරගෙන යෑම සඳහා මේ වනකොට නිලධාරින්ට ලබා දීලා තිබුණු සතියක කාලය - දින 7ක කාලය - ඒවා සම්පාදනය කරලා නඩු කටයුතු සඳහා ප්‍රවේශ වෙන්න ප්‍රමාණවත් නැති නිසා එය සති දෙකක් දක්වා වැඩි කිරීමත් මේ සංශෝධනයට ඇතුළත් වෙනවා.

ඒ වාගේම තමයි, ඉතා අල්ප ප්‍රමාණයන්ගෙන් දඩ සහ සිර දඬුවම් නියම කරලා තිබුණු මුදල් ප්‍රමාණ සහ කාල සීමා සැලකිය යුතු ආකාරයකින් වැඩි කර තිබෙනවා. මෙවැනි වැරදිවලට නැවත යොමු වීමට තිබෙන ඉඩකඩ ඇහිරීම සඳහා එම දඩය 20 ගුණයකින් පමණ වැඩි කර තිබෙනවා. ඇත්තටම දඩය දිහා බැලුවාමවත් පොඩි තිගැස්මක් ඇති වෙන්න ඕනෑ, මෙවැනි වැඩ අපි විසින් නොකළ යුතුයි කියන අදහසින්. ඒ නිසා වරදට පෙලඹෙන්න තිබෙන ඉඩකඩ ඇහිරීම මේ පනත් සංශෝධනයෙන් අපි අපේක්ෂා කරන තවත් දෙයක් කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

මීට මොහොතකට පෙර අදහස් දැක්වූ අපේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු මතු කළා, මේ රජය උපාධිධාරින්ට රැකියා ලබා දෙන්න කිසිදු ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ කියන කාරණාව. නමුත්, ඊයේ පෙරේදා ගුරු පත්වීම් සඳහා පමණක් උපාධිධාරින් 23,000ක් බඳවා ගන්න විභාග පැවැත්වූවා. ඒ වාගේම, 100,000කට වැඩි ප්‍රමාණයකට රැකියා ලබා දෙන්න මේ අවස්ථාව වනකොට අප කටයුතු කර තිබෙනවා. 2017 අවුරුද්දෙන් පසුව විශේෂ වූ ආකාරයක රජයේ පත්වීම් දීමට පැවති කිසිදු රජයක් කටයුතු කරලා නැහැ. එවැනි තත්ත්වයක් තුළ ආපු හිරවීම, ඒ පීඩාකාරී තත්ත්වය යටතේ 2019 අවුරුද්දේ ඉඳන් විශ්වවිද්‍යාලවලින් out වෙච්ච අපේ ආදරණීය දරුවෝ රස්තියාදු වෙනවා. ඒ දරුවන්ට එහෙම වෙලා තිබෙන්නේ පැවති රජයන් ඔවුන්ට ඒ අවස්ථා නොසැලසීම නිසායි. ඒ නිසා වගකිව යුතු රජයක් විධියට වාගේම ජනතාවාදී රජයක් විධියට ඔවුන්ට රැකී රක්ෂා අවස්ථා ලබා දෙන්න මේ අවස්ථාවේදී රජය ඉතා ඉක්මනින් මැදිහත් වෙලා ඒ කටයුතු කරමින් සිටින බව මම කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
මට තව සුළු වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් පත් වෙලා තිබෙන්නේ NPP ආණ්ඩුවක්. අපිට අවශ්‍ය කරන ප්‍රමාණවත් නීති තිබෙන තැන්වලදී අපට ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. ඒවා ක්‍රියාත්මක කරන්න අපි කැමතියි. නමුත්, මේ හැම තැනකම පවතින පුංචි හෝ අඩුපාඩුවක් සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීමේ වුවමනාවක් අපිට තිබෙනවා. මේ සමාජය නිවැරදි තැනට ගෙනියන්න අවශ්‍ය දේවල් අපි කරන්න ඕනෑ. මොකද, අපි අපේක්ෂා කරන තැනට මේ සමාජය ඔසවා තබන්න මිනිස්සු ස්වාධීනව හිතලා වැඩ කරන්නේ නැහැ කියන එක අපට පැහැදිලියි. ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න තමයි ජනතාව ඡන්දය දීලා අපිව මෙවැනි තැන්වලට එව්වේ. ඒ යුතුකම ඉෂ්ට කරන අටියෙන් ජනතාවගේ ඒ අයිතිවාසිකම් දිනා

දෙන්න අවශ්‍ය කරන නීති සම්පාදනය කරනවා වාගේම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම අපේ පැත්තෙන් සිදු කරනවා කියමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[2.50 p.m.]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Presiding Member, there are three important Bills to be passed today. When I make my comments, Sir, one might feel that we are opposed to new Bills being brought in to prevent money laundering, that we are for terrorist financing or some might even think that we are for the corrupt. But, I must say this. I was one of the first Members to have willingly, on my own, provided my Declaration of Assets to be made public through the Transparency International when I first got elected to Parliament. Sir, we are for bringing in laws to stop corruption; we are for bringing in laws to prevent money laundering and we for the anti-corruption drive that the Government is taking forward.

But, having said that, Sir, I must also say that there seem to be certain concerns. With regard to some of the Bills that are to be passed today, there are certain concerns. That is, about the extent of power that is being given to the Police. An ordinary police officer is able to issue an order to freeze a person's assets for a period of 14 days initially and then, extend it to another three weeks without any judicial purview. So, without having to go before a court or a judge, a police officer is able to extend a freezing order for 14 days and then, for another 21 days under Clause 9 - "Amendment of Section 8 of the principal enactment" - of the Prevention of Money Laundering (Amendment) Bill. The Police could misuse this law. So, there are so many concerns, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත යටතේ අපි money laundering නවත්වන්න ඕනෑ, anti-corruption law එක ශේන එක ශක්තිමත් කරන්න ඕනෑ, financial transactions reporting හරියට කරන්න ඕනෑ. මේ සියලු දේට අපේ සහයෝගය තිබෙනවා. වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධව ගත්තොත්, ආණ්ඩුවෙන් ඒක පනතක් හැටියට ගෙනැල්ලා, මහජනතාවට ඉදිරිපත් කරන්න පෙර අපේ කැමැත්තෙන්, ස්වේච්ඡාවෙන් අපි ඉදිරිපත් කළා, අපේ වත්කම් බැරකම් ප්‍රකාශ අපි දෙනවා කියලා.

අපි මේ money laundering වාගේ දේවල්වලට විරුද්ධයි. හැබැයි, මෙම පනත යටතේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියට අසීමිත බලතල දීලා තිබෙනවා. උසාවියට යන්න ඕනෑ නැහැ. අපට මතකයි, පසුගිය කාලයේ පොලීසියේ මාධ්‍ය ප්‍රකාශකවරයෙක් කිව්වා, "පොලීසියේ 80,000කට වඩා නිලධාරින් ඉන්නවා, ඒ සියලු දෙනාටම මට සහතික දෙන්න බැහැ" කියලා. අද මෙම පනත සම්මත වීම තුළින් පොලීසියට අසීමිත බලතල දීලා තිබෙනවා. මේකෙන් යම් ආකාරයකින් වංචා, දූෂණ නැවැත්වීමට එහා ගිහිල්ලා, වංචා, දූෂණ වැඩිවීමට පවා ඉඩ කඩ තිබෙනවා. අපි ඉල්ලන්නේ, මේ කටයුත්ත උසාවියට භාර දෙන්න කියලා. මේ පනත අනුව පොලීසියේ නිලධාරියෙකුට බලය තිබෙනවා, මුල් අවස්ථාවේදී දවස් 14කට එක්කෙනෙකුගේ වත්කම් සහ දේපළ freeze කරන්න; එතැනින් එහාට තව සති තුනකට freeze කරන්න. මම හිතන විදියට, උසාවියකට යන්නේ නැතුව දීර්ඝ කාලයක් මෙම වත්කම් එහෙම freeze කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ මේ Online Safety Act එක ගෙනාපු වෙලාවෙත් අපි කිව්වේ, කොමිෂන් සභාවක් පත් කරලා ඒ කොමිසමට බලතල දෙන්නේ නැතුව උසාවියට බලතල දෙන්න කියලා. එවකට අපිත් එක්ක, මේ ජනාධිපතිවරයා ඇතුළු ජාතික ජන බලවේගයේ සියලු දෙනාම උසාවිය ශක්තිමත් කරන්න උසාවියට බලතල දෙන්න ඕනෑ කියන අදහසේ ඉතා පැහැදිලිව හිටියා. හැබැයි, මේ වෙනකොට මේ Financial Transactions Reporting (Amendment) Bill එකේ Clause 24 යටතේ "Establishment of the National Committee on Anti-Money Laundering, ..." කියලා අලුතෙන් කමිටුවක් පත් කරන්න යනවා. මෙම කමිටුව පාර්ලිමේන්තුවටවත් උත්තර දෙන්න ඕනෑ නැහැ. එම කමිටුව කැබිනට් එකට වාර්තා කරන්න ඕනෑ. හැබැයි, පාර්ලිමේන්තුවටවත් මෙම කමිටුව ගන්න නිර්දේශ පිළිබඳව, නැත්නම් කමිටුව ගන්න තීන්දු පිළිබඳව කිසිම තීරණයක් ගන්න බැහැ. එතැනින් එහාට ගියාම Financial Intelligence Unit - FIU- එකට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අසීමිත බලතල දෙනවා. Financial Intelligence Unit එකේ mandate එක මොකක්ද? මේකේ කොහොමද, මේ තීන්දු තීරණ ගන්නේ කියන එක පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් නැහැ. ඒ Financial Intelligence Unit එකෙන් ගන්න සමහර තීන්දු අනුව - මම නිකම් example එකක් වශයෙන් කිව්වොත්,- දැනට ලංකාව තුළට මුදල් එවන පුද්ගලයෙක් නැත්නම් ලංකාවට පිටරට ඉඳන් ඥාතියෙක් එනවා නම්, එයා ඩොලර් 100ක් එයාගේ හිතවත් අයියාට හෝ මල්ලීට හෝ දීලා යනවා නම්, එයා ගිහිල්ලා registered money exchange කරන පුද්ගලයෙකුගෙන් ඒක මාරු කර ගන්නවා. ඒ registered money exchange කරන පුද්ගලයාගෙන් ඒක මාරු කර ගත්තාට පස්සේ FIU එකෙන් දෙනවා ඉදිරියට guideline එකක්. අපි දන්නේ නැහැ, මොකක්ද ඒ දෙන්න යන guideline එක කියලා. හැබැයි, මේ පනත තුළින් FIU එකට ඒ බලතල ටික ලබා දෙනවා. එතකොට මේ guideline එක හරහා පුළුවන් කියන්න, සමහර වෙලාවට ඩොලර් 100 ප්‍රමාණය වුණත් report කරන්න ඕනෑ කියලා. අපි දන්නේ නැහැ, මොකක්ද වෙන්නේ කියලා. ඒක තමයි මේකේ තිබෙන ප්‍රශ්නය. එහෙම බලතලයක් දුන්නොත්, සමහර වෙලාවට ඒ money exchange කරන පුද්ගලයාව ගෙනෙන්න පුළුවන් වරදකරු කරලා. මම හිතන විදියට, මෙහිදී මිලියන 100ක් වාගේ ලොකු දඩයක්විශාල දඩයක් - ගෙවන්න වෙනවා. ඒකෙන් වෙන්නේ මොනවාද? කළු කඩ වැඩි වෙනවා; the black market will thrive. ඩොලර් 100ක් අරගෙන ගිහිල්ලා registered කෙනෙක් හරහා මාරු කරන්නේ නැතිව වෙන කෙනෙක් හරහා මාරු කරගන්නවා.

இதேபோலதான் இந்தச் சபையில் இருக்கின்ற பெரும்பான்மையான ஆளுந் தரப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் கூறும் கருத்துகளைக் கேட்டால், இன்று கொண்டுவரப்பட்டிருக்கும் இந்தச் சட்டத் திருத்தங்கள் ஊழல் மோசடியைக் கட்டுப்படுத்துவதற்கானது, இல்லாவிட்டால் இலஞ்சம் வழங்குவதைக் கட்டுப்படுத்துவதற்கானது, அதுபோல் கறுப்புப் பணத்தைக் கட்டுப்படுத்துவதற்கானது என்று நாம் யோசிக்கலாம். ஆனால், வடக்கு, கிழக்கில் வாழுகின்ற எங்களுடைய மக்கள் இன்றுவரை மிகவும் கடுமையாகப் பாதிக்கப்படும் ஒரு விடயம்தான் Terrorist

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

Investigation Division - TID - எனப்படும் பயங்கரவாத விசாரணைப் பிரிவினால் எங்களுடைய இளைஞர்கள் ஒவ்வொரு வாரமும் விசாரணைக்கு அழைக்கப்படுவது. எங்களது மட்டக்களப்பு மாவட்ட இலங்கைத் தமிழ் அரசுக் கட்சியின் முக முக்கியமான உறுப்பினர்கள் பலர் பயங்கரவாத விசாரணைப் பிரிவினரால் தொடர்ச்சியாக விசாரணைக்கு அழைக்கப்படுகிறார்கள். இப்போது, வெளிநாடுகளில் வாழும் தங்களுடைய உறவினர்கள் நிதி அனுப்பினாலும்கூட விசாரணைக்கு அழைக்கப்படப் போகின்றார்கள். இந்தச் சட்டம் நடைமுறைக்கு வந்தால், தவறானதொரு செயற்பாடு நடைபெறுகின்றது என்று பொலிஸ் அதிகாரி ஒருவருக்குச் சந்தேகம் இருந்தால், அவர் சம்பந்தப்பட்ட நபரின் ஒட்டுமொத்தச் சொத்துகளையும் முதற்கட்டமாக 14 நாட்களுக்கும், அடுத்த கட்டமாக 21 நாட்களுக்கும் freeze பண்ணலாம். நீதிமன்றின் அனுமதியைப் பெறாமலேயே இதனைச் செய்யலாம். அவ்வாறு முடக்கப்படும் சொத்துகளை அந்த நபரால் கையாள இயலாது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய வடக்கு, கிழக்கு மக்களுக்கு எவ்வளவோ அச்சுறுத்தல்களும் மோசடிகளும் நடைபெறுவது எங்களுக்குத் தெரியும். பொலிஸாருடைய கெடுபிடிகள், இராணுவத்தின ருடைய கெடுபிடிகள் எனப் பல்வேறு விதத்திலும் முடிவில்லாத கஷ்டங்களுக்கு மத்தியில்தான் அவர்கள் வாழ்ந்து கொண்டிருக் கின்றார்கள்.

அது மாத்திரமல்ல, under Clause 14 of the Prevention of Money Laundering (Amendment) Bill, which this Government is planning to pass with a two-thirds majority, if an ordinary police officer feels that a particular asset has some connection to an offence - he might not have enough evidence, but might feel so - power is being given to him to freeze that asset without going to court. That is a deadly scenario. இது எங்களுடைய மக்களுக்குப் பாதிப்பானதொரு விடயமாக மாறலாம். அது மாத்திரமல்ல-

මතක තබාගන්න, අද ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් තිබෙන්නේ. පොලීසිය ඔක්කොම ආණ්ඩුවේ ඉන්නේ. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව නැති වෙච්ච දවසක -කවදා හෝ නැති වෙන්න පුළුවන් නේ. අවුරුදු 5ක් කියනවා, 10ක් කියනවා. ඒක බලමු. කවදා හෝ මේ ආණ්ඩුව නැතිවෙන්න පුළුවන්- මතක තබාගන්න, එදාට අනෙක් පැත්තට, වැරදි විධියට භාවිත කරන අයගේ අතට මෙම පනත් අහුවුණොත් එහෙම මොකද වෙන්නේ? ඔබතුමන්ලාට නොවෙයි, මේවා වැරදි විධියට භාවිත කරන අයගේ අතට අහුවුණොත් එහෙම මොකක්ද වෙන්නේ කියන එකත් අද මේ පනත් සම්මත කරනකොට ඔබතුමන්ලා මතක තබාගන්න.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට විනාඩි 5ක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 3ක් කියලායි සඳහන් වන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 2.58]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දින කිහිපය තුළම මේ පාර්ලිමේන්තුව තුළ විශේෂ මාතෘකාව වෙලා තිබුණේ මීගමුව බන්ධනාගාරයේ සිදු වුණු අවාසනාවන්ත සිදුවීම. අපි දන්නවා, ඒ හේතුව නිසාම මරණ 8ක් සිදු වෙලා, ඒ වාගේම 100කට අධික සිරකරුවන් සංඛ්‍යාවක් රෝහල්ගත වෙලා තිබෙන බව. මේ අවස්ථාවේදී මම පළමුකොටම ඒ පවුල්වල සියලු දෙනාට අපේ ශෝකය ප්‍රකාශ කරනවා.

බන්ධනාගාරයේ වුණු මේ සිදුවීම ගත්තොත්, පසුගිය දවස්වල අපේ මැති ඇමතිවරු සියලුදෙනාම කිව්වේ, මේ සම්බන්ධව රජය කිසිම වගකීමක් දරන්නේ නැහැ කියලා. එක්තරා කල්ලි දෙකක් අතර සිදු වුණු සිදුවීමක් නිසා මේ ප්‍රශ්නය පැන නැඟුණා කියලා හුවා දක්වන්න තමයි මේ අය කටයුතු කෙරුවේ. නමුත්, මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනිවාර්යයෙන් ආණ්ඩුව මෙහි වගකීම භාරගන්න ඕනෑ බව. ඒකට හොඳම හේතුව මේකයි. අපට මතකයි, වර්තමාන ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මහත්මයා එවකට විපක්ෂයේ ඉන්නකොට මහර බන්ධනාගාරයේ සිද්ධියක් වෙලා මරණ කිහිපයක් සිදු වුණු අවස්ථාවේ එතුමා කිව්වේ මොකක්ද කියලා. "මේක රජයේ නිලධාරින්ගේ භාරයේ තිබෙන්නේ, රජය සම්පූර්ණයෙන් වගකීම භාරගන්න ඕනෑ, අදාළ ඇමතිවරයා ඉල්ලා අස්වෙන්න ඕනෑ" කියලා තමයි එතුමා එදා ප්‍රකාශ කෙරුවේ. අනුර කුමාර දිසානායක මැතිතුමාගෙන් අපි මේ කාරණය අහන්න කැමැතියි. දැන් ඔබතුමා ජනාධිපති වෙලා ඉන්නවා, දැන් ඔබතුමාට පුළුවන් ඒ ආදර්ශය ලබා දෙන්න. මොකද, අපි දන්නවා හැම කෙනාම කියන්නේ අනිවාර්යයෙන්ම මේ සම්බන්ධ වගකීම අධිකරණ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා භාරගන්න ඕනෑ කියලායි. එතුමා නිකම් වචනයෙන් විතරක් වගකීම භාරගෙන හරියන්නේ නැහැ. අනිවාර්යයෙන්ම පූර්වාදර්ශයක් දෙන්න කියලා තමයි අපි එතුමාට මේ අවස්ථාවේදී කියා සිටින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකට හේතු සාධක තිබෙනවා. මොකද, මේ සිද්ධිය වෙච්ච දවසේම ඒක සම්පූර්ණයෙන් මැඩ පවත්වන්න පුළුවන්කම තිබුණා. ඊට පහුවදාට මේක දික් ගස්සන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ. මොකද, මේ සිද්ධිය වුණාට පස්සේ එතුමා බන්ධනාගාර නිලධාරින් හමුවෙන්න ගිය අවස්ථාවේදී බන්ධනාගාර නිලධාරින් කිව්වේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? "ඔබතුමන්ලා අපට නියපොත්තෙන් කඩන්න තිබුණු දේ පොරවෙන් කපන තත්ත්වයට පත් කෙරුවා, අපට අවශ්‍ය උපදෙස් ටික ලබා දුන්නේ නැහැ. එහෙම ලබා දුන්නා නම් මේක

අපි මර්දනය කරන්න, එහෙම නැත්නම් මැඩ පවත්වන්න කටයුතු කරනවා" කියලා තමයි ඔවුන් කිව්වේ. ඒ නිලධාරින් කරන චෝදනාවම ඇති, එතුමාට ඒ සම්බන්ධ වගකීම භාරගෙන ඉල්ලා අස්වෙන්න. අපේ විපක්ෂ නායකතුමා, එතුමාගෙන් ඉල්ලා අස්වෙන්න කියන ඉල්ලීම කරනකොට, එතුමා මොකක්ද කිව්වේ? එතුමා කියනවා, එහෙම නම් විපක්ෂ නායකතුමාත් ඉල්ලා අස්වෙන්න ඕනෑලු. මොකද, විපක්ෂ නායකතුමාත් ඡන්ද දෙකක් පරාද නිසා. මේවා මොන විහිළු කථා ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අනුර කුමාර දිසානායක මහත්මයා 2019දී ඡන්දය ඉල්ලුවා. එතුමාට ඡන්ද ලක්ෂ 4යි ගන්න පුළුවන්කම ලැබුණේ. බොහොම අමාරුවෙන් තමයි ඇපය බේරා ගත්තෙත්. අපි අහන්න කැමැතියි, මේ ආණ්ඩුවේ ඉදිරි පෙළ ඉන්න මැති ඇමතිවරු කී වරක් පරාජයට පත් වුණාද කියලා. බිමල් රත්නායක මහත්මයා පරාජයට පත් වුණා. සුනිල් හඳුන්නෙත්ති මහත්මයා පරාජයට පත් වුණා. නලින්ද ජයතිස්ස මහත්මයා පරාජයට පත් වුණා. ඒ, පාර්ලිමේන්තු මහ මැතිවරණ. ඒවා පරාජයට පත් වුණු මිනිස්සුන්ට එහෙනම් මේ වගකීම් භාරගන්නත් බැහැ නේ. ඒ නිසා විහිළු කථා කියන්නේ නැතිව, මේ සම්බන්ධව වගකීම භාරගෙන මීට වඩා ආදර්ශවත් වෙන්න කියලා තමයි අපට ගරු ඇමතිතුමාට කියන්න තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ප්‍රශ්නය ගැන, බන්ධනාගාරවල තිබෙන තදබදය ගැන මීට ඉස්සරවෙලා මේ ආණ්ඩුව එනකොටත් අපි කිව්වා. ඒ තදබදය අඩු කරන එක ගැන ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් කියලා තිබුණා. මේ ආණ්ඩුව බලයට ඇවිත් දැන් අවුරුදු දෙකකට කිට්ටු වෙන්න එනවා.

මීට අවුරුද්දකට විතර ඉස්සෙල්ලා අපි බන්ධනාගාරවලට ගිහින් ඒවා පිළිබඳව සොයා බලපු වෙලාවේ ඒවායේ රැඳවියන් තමන්ට තිබෙන ප්‍රශ්න, තමන් විඳින අපා දුක, තමන් විඳින පීඩනය ගැන අපට කිව්වා මට මතකයි. ඒ අවස්ථාවේ මමත්, ගරු සුජීව සේනසිංහ මැතිතුමාත්, ගරු මනෝ ගනේසන් මැතිතුමාත් අමාත්‍යාංශයට ගිහිල්ලා අධිකරණ ඇමතිතුමා සමඟ පෞද්ගලිකව සාකච්ඡා කළා; මෙන්න මේ මේ පියවර ගන්න, බන්ධනාගාරවල තිබෙන තදබදය එතකොට අඩු කරන්න පුළුවන් කියලා. ඒ වාගේම අපි අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට පසුගිය මාසයේ යෝජනාවක් ඉදිරිපත් කළා. මත්ද්‍රව්‍ය වැරැදිවලට අදාළව ඇතුළට ගිය කට්ටිය විශාල පිරිසක් ඉන්න බව අපි කිව්වා. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් ගැනත් අපි කිව්වා. ඊට අමතරව අපි විශේෂයෙන්ම කිව්වා අභියාචනා ඉදිරිපත් කරලා තිබෙන අය ගැන. විජයදාස රාජපක්ෂ මහත්මයා අධිකරණ අමාත්‍යවරයාව සිටියදී 2024දී මේ සම්බන්ධයෙන් සංශෝධන පනත් කෙටුම්පතක් ගෙනැල්ලා සම්මත කළ බව අපි දන්නවා. ඒ, අභියාචනා ඉදිරිපත් කළත් සාධාරණයක් ඉටු නොවුණු, ඒවා ප්‍රතික්ෂේප වුණු කට්ටියට, රිමාන්ඩ් භාරයේ සිටි කාලය තම දඬුවම් කාලයෙන් අඩු කරන්න කියන එකට අදාළවයි. හැබැයි එය අදාළ වුණේ, 2024න් පසුව අභියාචනා ඉදිරිපත් කළ අය සම්බන්ධවයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය අවසානයි.

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

2024ට ඉස්සෙල්ලා සිට බන්ධනාගාරගතව ඉන්න අයට ඒ සාධාරණය ඉෂ්ට වෙලා නැහැ. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් සහ වග කිව යුතු අයගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, බන්ධනාගාරවල තිබෙන මේ තදබදය අඩු කරන්න ඕනෑ නම් 2024ට ඉස්සෙල්ලා අභියාචනා ඉදිරිපත් කළ අයට අදාළවත් ඒ විධියට දඬුවම් කාලය අඩු කරන්න අවශ්‍ය කරන නීති හදන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.03]

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි මේ ගරු සභාවේ සාකච්ඡාවට ලක් කරන්නේ මූල්‍ය පද්ධතියේ විශ්වසනීයභාවයටත්, ආර්ථිකයේ විනිවිදභාවයටත්, රටේ ජාතික ආරක්ෂාවටත් බලපාන ප්‍රධානම පනත් තුනකට සංශෝධන එකතු කිරීම ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ සියලු රටවල් අතීතයේ ඉඳලාම උත්සාහ කරනවා සාර්ව ආර්ථික දර්ශකවලට එකඟව, විධිමත්ව, සංවිධිතව සමස්ත ආර්ථිකය ගොඩ නඟා ගන්න. හැබැයි ඒ උත්සාහයන් අතරේ ඒ සෑම රටකම පාහේ කළු ආර්ථිකයන් ද ගොඩ නැඟෙමින් පැවැතුණා. අපරාධකාරී ක්‍රියාවලින් එකතු කර ගන්නා මුදල් අපි හඳුන්වනවා, කළු ආර්ථිකයක ඇති කිලුටු මුදල් විධියට. ඒ අපරාධකාරී ක්‍රියා මොනවාද කිව්වොත්, මත්ද්‍රව්‍ය වෙළෙඳාම, සංවිධානාත්මක අපරාධ, බදු වංචා, ආර්ථිකය තුළ කරන වංචා දූෂණ, මිනිස් ජාවාරම් වාගේ ගොඩක් දේවල් තිබෙනවා. ඒවා හරහා කළු සල්ලි උපයා ගෙන ඒ සල්ලි රටේ සම්මත මුදල් පද්ධතිය තුළට යොමු කරන වැඩේට තමයි අපි කළු ආර්ථිකය කියලා කියන්නේ. මේක අතීතයේ ඉඳලාම පැවතුණා. අපි මේකට ප්‍රසිද්ධ වචනය විධියට පාවිච්චි කරන්නේ "money laundering" කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1920 ගණන්වල විතර ඇමෙරිකාවේ චිකාගෝ නගරයේ ඉඳලා තිබෙනවා අල් කපෝන් කියලා අපරාධ කල්ලි නායකයෙක්. අල් කපෝන් අපරාධ කල්ලිවලින් උපයා ගත්තු මුදල් නීත්‍යනුකූල මුදල් ප්‍රවාහයට එකතු කරන්න හරි අපූරු ක්‍රමයක් යොදාගෙන තිබුණා. ඒ තමයි, ඔහු චිකාගෝ නගරයේ තිබුණු laundriesවලින් අතිමහත් බහුතරය මිල දී ගැනීම. ඉන් පසුව දිනපතා නීත්‍යනුකූලව පිරිසිදු කිරීම් මඟින්

[ගරු අජිත් අගලකඩ මහතා]

සොයා ගන්නා මුදල් එක්ක තමන් අපරාධකාරි ක්‍රමවලින් සොයා ගත්තු මුදලුත් බැංකුගත කළා. ඒ විධියට ඔහු තමන්ගේ කළු සල්ලි සුදු කළා. ඒ නිසා තමයි අපි අද "money laundering" කියන වචනය මේ ක්‍රියාවලියට පාවිච්චි කරන්නේ. ඒ අනුව මුදල් විශුද්ධිකරණය කියන්නේ, අපරාධකාරි ප්‍රභවයන්ගෙන් සොයා ගත් මුදල්වල අපරාධකාරි සම්භවය සැඟවීම මෙහිදී සිදු කරනවා. මෙහි පියවර තුනක් තිබෙනවා. ඉස්සෙල්ලාම ඒවා ප්‍රධාන මුදල් පද්ධතියේ තැන්පත් කරන්න ඕනෑ. ඊට පස්සේ ඒවා ස්ථර විධියට, වෙනත් ආකාරවලට පවත්වාගෙන යන්න ඕනෑ. ඊට පසුව ඒවා නැවත වාරයක් ඒකාබද්ධ කරලා දේපොළ, සුරැකුම්පත් ආදි පිළිගත් ක්‍රමවලට තමන්ගේ ආදායම් විධියට, වත්කම් විධියට එකතු කර ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IMF එක - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - කියනවා අවුරුද්දකට ලෝක නිෂ්පාදිතයෙන් සියයට 2-5 අතර ප්‍රමාණයක්, එනම් මුදල් අගය විධියට ගත්තොත් අතිවිශාල ප්‍රමාණයක් කිලුටු සල්ලි පිරිසිදු කිරීමේ ක්‍රියාවලියක යෙදෙනවා කියලා. මේක ලෝකයේ සියලු රටවල ආර්ථිකයන්ට අතිමහත් බලපෑමක් කරන මාතෘකාවක් බවට පත් වෙලා තිබෙනවා. අපේ ආර්ථිකයේ ස්ථාවරත්වයට, ආයෝජන පරිසරයට, ජාතික ආරක්ෂාවට, බැංකු හා මූල්‍ය ආයතනවල පිළිගැනීමට, රාජ්‍ය ආදායම් අහිමි වීමට, උද්ධමනය වැඩි වීමට වාගේම ජාත්‍යන්තර බැංකු සමඟ කරන ගනුදෙනුවලට - මේ සියල්ලටම - සෘජුව බලපානවා, යම්කිසි රටක කිලිටි සල්ලි ඒ රටේ ආර්ථිකයට එකතු වීම.

එම ප්‍රශ්නය බරපතළ විධියට සලකපු G7 සංවිධානයේ රටවල් එකතු වෙලා පිහිටුවා ගත්තා, මූල්‍ය ක්‍රියාකාරී කාර්ය සාධක බලකාය - Financial Action Task Force, FATF - නමින් සංවිධානයක්. එම කාර්ය සාධක බලකාය ලෝකයේ ඇති වෙන්න යන මේ අර්බුදය ගැන තේරුම් අරගෙන ලෝකයේ රටවලට සම්මුතීන් 40ක් - නිර්දේශ 40ක් - ඉදිරිපත් කළා, ඒවාට අනුව තමන්ගේ රටවල මුදල් විශුද්ධිකරණය පාලනය කර ගන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම සංවිධානයෙන් බලාපොරොත්තු වුණා මෙන්න මේ කියන්න යන කටයුතු තුන ඉටු කර ගන්න. එකක් තමයි, මුදල් විශුද්ධිකරණ විරෝධී හා ත්‍රස්තවාදී මූල්‍යකරණ විරෝධී ප්‍රමිතීන් නිර්වචනය කර ගන්නා එක. දෙවැනි එක, ඒ රටවල් සමඟ මේ සංවිධානය අන්‍යෝන්‍ය ඇගයීමක් - evaluation එකක් - කර ගන්නා එක. තුන්වන එක, වැළැක්වීමට අවශ්‍ය නීති ශක්තිමත් කිරීමේ ප්‍රමාණ - ඒ ඒ රටවල ගොඩනැඟිලා තිබෙන ප්‍රමාණ - මත ඒ ඒ රටවල් වර්ගීකරණය කර ගන්නා එක. එකී වර්ගීකරණයට අදාළ එක් උදාහරණයක් විධියට ගන්න පුළුවන්, මේ කියන නීති සම්බන්ධයෙන් කිසිසේත් තැකීමක් නොකරන රටවල්. ලෝකයේ දැනට එවැනි රටවල් තුනයි තිබෙන්නේ. ඒ, උතුරු කොරියාව, මියන්මාරය සහ ඉරානය. ඒ රටවල් තුන "කළු රටවල්" විධියට නම් කරලා තිබෙනවා. ඒ වාගේම මේ නීති රීති සම්බන්ධයෙන් අඩු අවධානයක් යොමු කරලා ආර්ථිකයට හානි වෙන්න ඉඩ හැරලා තිබෙන රටවල් "අළු තීරය" තුළ තිබෙන රටවල් විධියට නම් කරලා තිබෙනවා.

අපේ රට ගත්තොත්, FATF එකේ නිර්දේශ 40ටම එකඟව අපි 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතත්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතත්, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතත් සම්මත කළා. අපි ඒ පනත් සම්මත කරලා අපේ රට ඇතුළේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් යෙදවීම වැළැක්වීම කරගෙන එන එක FATF එක විසින් evaluate කළා. 2006දී අපි අළු කාණ්ඩයේ රටක් විධියට හිටියේ. 2016 evaluation එකේදීත් අපි හිටියේ අළු කාණ්ඩයේ රටක් විධියට. 2019දී තමයි අපට පුළුවන් වුණේ අළු කාණ්ඩයෙන් එළියට එන්න. දැන් අපි යම් මට්ටමක වර්ධනයක් අත්පත් කර ගෙන තිබෙනවා, අපේ රට තුළ අනීතික ක්‍රමවලින් උපයා ගන්නා මුදල් නීතිගත ක්‍රමවලට යොමු කරන එක සම්බන්ධයෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අභ්‍යන්තරවත් - අපේ රට තුළ - මේ සම්බන්ධයෙන් ඇගයීමක් කරනවා. රටක් විධියට අප කරන ඒ ඇගයීම මුදල් විශුද්ධිකරණයේ ජාතික අවදානම ගැනයි. අපේ රටේ මුදල් විශුද්ධිකරණය කොයි තරම් අවදානමක තිබෙනවාද කියන එක ගැන අපි ඇගයීම් තුනක් කරලා තිබෙනවා. පළමුවැනි එක, 2006 - 2012 කාලය සම්බන්ධයෙන්, 2014දී. දෙවැනි එක, 2015 - 2022 කාලය සම්බන්ධයෙන්, 2022දී. තුන්වැනි එක, 2023 - 2025 කාලය සම්බන්ධයෙන්, 2025දී. එලෙස ඇගයීම් තුනක් කරලා තිබෙනවා. අවසානයේ - 2025දී - කළ ඇගයීමේදී නිර්දේශ 15ක් ඉදිරිපත් වෙලා තිබෙනවා, 2026 - 2030 කාලය ඇතුළත ක්‍රියාත්මක කරලා අපේ රටේ මුදල් විශුද්ධිකරණය නතර කර ගන්න. අන්න ඒ නිර්දේශ සමඟ තමයි අද අප මේ ප්‍රධාන පනත් තුනට සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි ප්‍රධාන කාරණයක් තමයි, උපයාගත් මුදල් සම්බන්ධයෙන් වාර්තා කිරීම. එක එක ආකාරවලින් උපයා ගන්නා මුදල් තිබෙනවා. වැරැදි ආකාරයෙන් මුදල් උපයා ගන්නා මිනිසුන් එසේ මුදල් උපයන අවස්ථාවලදී හසු නොවෙන්න පුළුවන්. කුඩු ජාවාරමේ ඉන්න කෙනෙක් ඒ ජාවාරමෙන් මුදල් උපයා ගන්න කොට කුඩු ජාවාරමේ නිරත වෙලා ඉන්නවා කියලා හසු නොවෙන්න පුළුවන්. සංවිධානාත්මක අපරාධ කරලා මුදල් හොයා ගන්නා කෙනෙක් සංවිධානාත්මක අපරාධයකට සම්බන්ධ යැයි ඒ මොහොතේ හසු නොවෙන්න පුළුවන්. හැබැයි ඔවුන් එම ක්‍රියා මඟින් උපයා ගත්තු මුදල් නීතිගත මුදල් සංසරණ පද්ධතියට ඇතුළු කරන්න යන වෙලාවේදී බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට තොරතුරු සැපයීම මත, එම ගනුදෙනු වාර්තා කිරීම මත ඒ සියලු ගනුදෙනුවල සුළු මුල සමඟ අපරාධකරුවන් අනිවාර්යයෙන්ම නීතියේ රැහැනට හසු වෙන්න පුළුවන්. ඒ නිසා මුදල් ගනුදෙනු වාර්තා කිරීම කියන්නේ මේ ක්‍රියාවලියේදී ඉතාම වැදගත්, ඉතාම බරපතළ ලෙස සැලකිය යුතු කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපයාගත් මුදල් සම්බන්ධයෙන් වාර්තා කිරීම අපි මුලින්ම නීතිගත කරලා තිබුණේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම වැළැක්වීමේ අරමුණින් පමණයි. දැන් අපි සමූල ඝාතක අවි ව්‍යාප්තිය මැඩලීමට ඒ සඳහා මුදල් යෙදවීම නතර කිරීමටත් සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම, එහි සාමාන්‍ය වාර්තා තබා ගැනීමක් විතරයි බැංකු සහ මූල්‍ය ආයතනවලින් කලින් බලාපොරොත්තු වුණේ. මේ සංශෝධන තුළින් අපි බලාපොරොත්තු වනවා, වාර්තා අවුරුදු 6ක් තබා ගැනීමට. ඒ වාගේම ඉලෙක්ට්‍රොනික වාර්තා තබා ගැනීම සහ අපරාධ නඩු සඳහා ගනුදෙනු ප්‍රතිනිර්මාණය කළ හැකි පරිදි වාර්තා පවත්වා ගැනීම අනිවාර්ය කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, FIU - Financial Intelligence Unit - එක මේ කටයුතු පාලනය කරනවා. මම හිතන විධියට, මේක පරිපාලනමය වශයෙන් විතරයි ක්‍රියාත්මක වුණේ. නමුත්, මූල්‍ය බුද්ධි ඒකකයක් නීතිය මඟින් විධිමත් ලෙස ස්ථාපිත කර එහි ප්‍රධානියාගේ බලතල නිර්වචනය කරලා මේ කටයුතු පාලනය කරන්න වුවමනා ක්‍රියාමාර්ග අරගෙන යනවා. ඒ වාගේම පැවති වැරදි පමණක් ආවරණය කරලා තිබුණා. අලුතින් අපි මේකට

සමූල ඝාතක අවි සංගුණනය වීම වැළැක්වීම අරමුණු කරගෙන ඒ සඳහා මුදල් යෙදවීමත් බරපතළ වැරැද්දක් විධියට මේ පනතෙන් හඳුන්වා දෙන්න කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම පැවතුණු අපරාධවලට විතරයි දඬුවම් ලැබුණේ. පනත යටතේ දැන් දඬුවම් සංශෝධනය කර තිබෙනවා. ඉස්සෙල්ලා කියවුණා වාගේ රුපියල් ලක්ෂ 5ක්ව තිබුණු දඬුවම රුපියල් මිලියන 10 දක්වාත්, රුපියල් ලක්ෂ 10ක්ව තිබුණු දඬුවම රුපියල් මිලියන 10 දක්වාත් ආදී වශයෙන් ඉතා ඉහළ දඬුවම් ප්‍රමාණයක් පනවලා තිබෙනවා. ඒ තුළින් අපි බලාපොරොත්තු වනවා, මේ ආයතන මේ සඳහා වග වීම දරන තැනට අරගෙන එන්න. ඒ කියන්නේ, යම් කිසි බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් අපරාධකාරී ක්‍රමවලින් සොයා ගත්තා වූ ධනය විශාල ප්‍රමාණයක් බැංකුව වෙත ලබාගෙන වැරැද්දක් කළා කියන එකට සුළු දඩයකින් - රුපියල් ලක්ෂ 5ක, ලක්ෂ 10ක දඩයකින් - බේරීම මඟ හැරීම සඳහා තමයි මේ විශාල දඬුවම් නියම කර තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අජිත් අගලකඩ මහතා**
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ රට ඇතුළේ කළු සල්ලි දීලා අරගෙන අපරාධකාරයෝ සොයා ගත්ත මුදල් පිරිසිදු සල්ලි බවට පත් කරපු අය අපට සොයා ගන්න නැහැ. නමුත් අපි දන්නවා, අපරාධකාරී විධියට සොයා ගත් මුදල් පිළිබඳ තොරතුරු ගන්න එන්න කිව්වාම, නයා ගහලා කියලා hospital එකේ හිටපු අය ගැන. ඒ වාගේම අපි දන්නවා, මුදල් පිළිබඳ සොයා බැලීම්වලදී පසුගිය කාලය ඇතුළත විවිධාකාර විධියට, ඒ කියන්නේ නන්නාඳුනන පුද්ගලයන්ගෙන් මැණික් මලු ලැබිලා ධනවතුන් වූ පිරිස් ගැන. ඒ වාගේම අපට අයිතිකාරයෝ නැති, කෝටි ගණන් වටින ගෙවල් හම්බ වුණා. ඒ නිසා අපේ රට තුළත් අවදානමක් සහිත පරිසරයකයි මේක තිබෙන්නේ. මේ නීතිමය ප්‍රතිසංස්කරණ මඟින් අපි බලාපොරොත්තු වනවා, මේ ක්‍රියාවලිය විධිමත් කරලා අපේ රට අපරාධමය ක්‍රියාවලින් සොයා ගන්නා ධනයට එරෙහිව කටයුතු කරන ශක්තිමත් නීති පද්ධතියක් ඇති රටක් බවට පත් කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.15]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 3 நிமிடத்தில் எதைப் பேசுவதென்பது கஷ்டமான ஒரு விடயமாக இருந்தாலும், எங்களுடைய மாவட்டத்தில் அண்மையில் ஒரு பிரிவினர் எதிர்நோக்குகின்ற பிரச்சினை சம்பந்தமாக அவர்கள் என்னிடம் விடுத்த கோரிக்கையை இங்கே முன்வைக்கலாம் என்று நினைக்கின்றேன். அதாவது, தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்குப் பொறுப்பான அமைச்சின் கீழ் ஒப்பந்த அடிப்படையிலே பணியாற்றி வருகின்ற வருமான உதவியாளர்கள், meter readers அண்மையிலே என்னைச் சந்தித்துச் சில கோரிக்கைகளை முன்வைத்திருந்தார்கள். குறிப்பாக அவர்களுடைய நிரந்தர நியமனம் சம்பந்தமான விடயம் பல்வேறு பிரச்சினைகளுக்கு உள்ளாக்கப்பட்டதாகச் சில விடயங்களை அவர்கள் என்னுடைய கவனத்துக்குக் கொண்டுவந்தார்கள். அதாவது, மேற்படி திணைக்களத்தின் பதவிகளுக்கு விண்ணப்பங்கள் கோரப்பட்ட நிலையிலே, பல்வேறு பணியாளர் பிரிவுகள் அதிலே உள்ளடக்கப் பட்டபோதிலும், குறிப்பாக இந்த வருமான உதவியாளர்கள், meter readers மட்டும் அந்தச் செயன்முறையிலே சேர்க்கப்படவில்லை என்பது உண்மையிலே கவலைக்குரிய ஒரு விடயமாக இருக்கின்றது. நுகர்வோரிடம் இருந்து வருமானத்தை வசூலித்து, நிறுவனத்திற்கு வருமானத்தை ஈட்டித் தருவதில் முக்கிய பொறுப்பை வகித்து, நிருவாகத்திற்கு முக்கிய பங்களிப்பு வகிக்கின்றவர்களாக இப்பணியாளர்கள் இருக்கின்றார்கள்.

எனவே, இவர்களுக்கு நிரந்தர நியமனம் வழங்குவதற்கான நடவடிக்கையை மேற்கொள்ளவேண்டிய ஒரு பொறுப்பு அரசாங்கத்திடம் காணப்படுகின்றது. ஆகையால், இந்தத் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்குப் பொறுப்பான கௌரவ அமைச்சர் மற்றும் பொது முகாமையாளர் ஆகியோர் இந்த விடயத்திலே உடனடியாகக் கவனம் செலுத்தி, தங்களைத் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபைக்குக் கீழே நிரந்தர ஊழியர்களாக உள்வாங்க வேண்டும் என்ற ஒரு கோரிக்கையை அவர்கள் முன்வைக்கின்றார்கள். ஆகையால், பொறுப்பான அரசாங்கம் என்ற அடிப்படையிலே இவர்களுடைய இந்த நியாயமான கோரிக்கைக்கான முன்னெடுப்பைச் செய்யவேண்டும் என்பதை இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்றுதான், இன்று காலையிலே வாய்மூல விடைக்கான வினாக்கள் கேட்கப்பட்ட நேரத்தில் விளையாட்டுத்துறை சம்பந்தமாக நானும் ஒரு கேள்வி கேட்கவேண்டி இருந்தது. அப்போது நான் சபையில் சமுகமளித்திருக்காததனால், அந்தக் கேள்வியை நேரடியாகக் கேட்க முடியாத ஒரு சூழல் ஏற்பட்டது.

நாங்கள் இப்போது எங்களுடைய மாவட்டத்திலே கடினப்பந்து விளையாடுகின்ற விளையாட்டு வீரர்களைத் தேசிய மட்டத்திற்குக் கொண்டுசெல்லுகின்ற வேலைத் திட்டங்களை முன்னெடுத்து வருகின்றோம். உதாரணமாக, KPL- Kinniya Premier League, TPL - Thoppur Premier League - போன்றவற்றினூடாக நாங்கள் அவற்றை எங்களுடைய பிரதேசங்களிலே முன்னெடுக்கின்றோம். நாங்கள் அரசாங்கத்திடமும் விளையாட்டுத்துறைக்குப் பொறுப்பான அமைச்சரிடமும் கேட்கின்ற விடயம் என்னவென்றால், LPL போன்ற தேசிய அணிகளிலே எங்களுடைய கிழக்கு மாகாணத்தைச் சேர்ந்த சிறந்த வீரர்களை உள்வாங்குகின்ற வேலைத்திட்டங்களை நீங்கள் முன்னெடுக்க வேண்டும். இனிவரும் காலங்களிலே LPLஇல் கிழக்கு மாகாணத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அணிகளையும் இணைத்துக் கொண்டு, எங்களுடைய மாவட்டத்தை பிரதிநிதித்துவப் படுத்துகின்ற சிறந்த வீரர்களையும் உள்வாங்குவதற்கான நடவடிக்கைகளை நீங்கள் மேற்கொள்ள வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
අවසන් කරනවා.

இன்று எங்களுடைய கிண்ணியா, மூதூர், தோப்பூர், தம்பலகாமம், குச்சவெளி போன்ற பிரதேசங்களில் மிகத் திறமைவாய்ந்த விளையாட்டு வீரர்கள் இருக்கிறார்கள். ஆனால், திருகோணமலை மாவட்ட கிரிக்கெட் சங்கத்தில்கூட எங்களுடைய கழகங்கள் உள்வாங்கப்படாத ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. ஆகையால் அவர்களையும் அந்தக் கிரிக்கெட் சங்கத்தில் உள்வாங்குகின்ற நடவடிக்கைகளையும் கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டும் என்பதும் எங்களுடைய வேண்டுகோளாக இருக்கின்றது. நிச்சயமாக அதற்கான நடவடிக்கைகளையும் நீங்கள் மேற்கொள்வீர்கள் என்ற நம்பிக்கை எங்களிடம் காணப்படுகின்றது. நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[3.18 p.m.]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
Hon. Presiding Member, I rise today to speak on the proposed Amendments to the Financial Transactions Reporting Act, the Prevention of Money Laundering Act and the Convention on the Suppression of Terrorist Financing Act. At the outset, Sir, let me make one point absolutely clear: Sri Lanka has an obligation to protect the integrity of its financial system and to comply with the standards of the Financial Action Task Force - FATF. Failure to do so risks grey listing, diminished investor confidence, higher borrowing costs and further economic hardship for the people.

But, Sir, that is not the issue before us today. The issue before this House is whether these Bills genuinely implement the FATF standards or whether the FATF is being used as a justification for granting powers that the FATF itself neither requires nor recommends. That distinction is fundamental. The Government repeatedly tells us that these measures are necessary because the FATF demands them. Yet, when one examines Recommendation 8 of the FATF, one discovers something very different. The FATF does not require governments to treat every civil society organization as a potential security threat. It does not recommend blanket restrictions; it does not advocate arbitrary surveillance or unnecessary interference with legitimate organizations. Instead, the FATF repeatedly states that measures must be targeted, proportionate and risk-based. It recognizes that many non-profit organizations are inherently low risk and encourages governments to work with the civil society, not against it.

Yet, what do we see in Sri Lanka? We see organizations, particularly those working in the North and the East and those engaged in human rights work, being subjected to surveillance, repeatedly questioned by security agencies, having obstacles in opening bank accounts and facing increasing difficulty in receiving legitimate foreign funding.

The Government's own risk assessment reportedly concludes that the overall terrorist financing risk within the non-profit sector is low to medium. Yet organizations engaged in human rights work continue to face heightened scrutiny without objective evidence that they have engaged in terrorist financing or money laundering. That is not evidence-based regulation; it is regulation based on suspicion.

The consequences are already being felt. Nearly 70 per cent of the civil society organizations surveyed reported difficulties in receiving foreign funding, while half experienced difficulties in opening bank accounts. Projects have been delayed; staff salaries have gone unpaid; humanitarian programmes have been disrupted and communities have been denied services that they desperately need.

And, Sir, these Bills go much further. Their impact will not be confined to civil society organizations. They will also affect the ordinary citizens, small businesses, journalists and every person who depends upon the rule of law to protect them from arbitrary State power.

Consider a small money exchange business in Pettah. Under the proposed Amendments, the owner may face penalties up to Rs. 100 million for failing to comply with transaction thresholds that are not even contained in the Act itself, but will be determined later through rules issued by the Head of the Financial Intelligence Unit. Parliament is being asked to approve offences today, while leaving the substance of the law to be determined tomorrow through administrative directions. That is not how legislation should be enacted in a constitutional democracy.

Consider a rural microfinance institution serving women-led households and small farmers. Many of its customers may lack complete documentation because of poverty or natural disasters. Faced with uncertain legal obligations, the institution may simply refuse loans to those who need them most rather than risking severe penalties. The result is, the burden of regulatory uncertainty falls not on criminals, but on the poorest members of the society.

Consider a civil society organization that receives funding from an international donor to rebuilt a school. If the transfer is delayed because it is automatically treated with suspicion, construction would be postponed, contractors would remain unpaid, teachers cannot be compensated and the vulnerable children lose access to education. Once again, those who suffer are not criminals, but ordinary citizens.

Consider an investigative journalist who receives confidential documents exposing financial misconduct. Under these Bills, Sir, investigators may obtain access to her computer and mobile phone through an *ex parte* application without giving her an opportunity to protect confidential sources or invoke journalistic privileges. The inevitable consequence is to discourage whistle-blowers from exposing corruption and weaken press freedom and public accountability.

Or, consider a father whose bank accounts are frozen while he is merely under investigation. He may not have been even charged or convicted yet, but his family cannot pay rent, purchase food, obtain medicine or meet children's school expenses. To access his own money, he must first embark upon lengthy and expensive legal proceedings while being deprived of the very resources needed to defend himself.

Sir, those examples illustrate a common theme - the Bills before us significantly expand the executive discretion while reducing meaningful safeguards. They permit broader administrative powers; they diminish judicial oversight; they widen information sharing; they permit intrusive investigative techniques; they extend powers to freeze financial assets and increasingly replace clear statutory standards with future rules and administrative directions.

The Government presents these measures as unavoidable because the FATF requires them. But, where does the FATF require Parliament to surrender its legislative responsibility, where does the FATF require broader executive discretion without adequate judicial oversight and where does the FATF require restrictions that are neither targeted nor proportionate? The answer is simple, it does not.

Sir, this Debate, therefore, is far more than anti-money laundering legislation. It is about preserving the constitutional balance between effective law enforcement and individual liberty; it is about ensuring that the fight against financial crime is conducted within the framework of the rule of law and it is about ensuring that extraordinary powers remain subject to extraordinary safeguards.

History teaches us that powers granted in the name of security rarely remain confined to their original purpose. Today, these powers may be directed against civil society organizations; tomorrow, they may be directed against journalists and the day after, they may be directed against businesses. Ultimately, every citizen becomes vulnerable when executive discretion replaces judicial oversight and due process. That is why this House must examine these Bills with the utmost care. No one in this House is asking that Sri Lanka abandon FATF compliance. On the contrary, we should fully comply with the FATF. But, let us comply with FATF as FATF itself intended through evidence-based, proportionate and risk-based regulation. Let us not invoke the FATF as a justification for expanding executive power beyond what FATF itself requires. National security and constitutional liberty are not competing values. A democratic State worthy of the name protects both.

I, therefore, urge this House to reconsider these Bills to ensure that they faithfully reflect the FATF's own standards, strengthen rather than weaken judicial oversight and preserve the constitutional rights and democratic freedoms that Parliament has a solemn duty to protect.

I thank you, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නලින් හේවගේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.29]

**ගරු නලින් හේවගේ මහතා (වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் ஹேவகே - தொழிற்கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Hewage - Deputy Minister of Vocational Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ මේ පාර්ලිමේන්තුවේදී ඉතාම වැදගත් පනත් තුනකට සංශෝධන ගෙන එනවා. විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ අපි විශ්වාස කරනවා, අපේ රටේ ආර්ථිකයේ දැවැන්ත බිඳ වැටීමකට මේ කළු ආර්ථිකය දායක වුණා කියලා. ඒ වාගේම අපේ රට බංකොලොත් වනකොට, විශේෂයෙන්ම බංකොලොත් රටක් හැටියට ලෝකය හමුවේ අපේ රට අපකීර්තිමත් වනකොට ඒ සඳහා මේ කළු ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයත් යම් ප්‍රමාණයකට බලපෑවා කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව අධ්‍යයනය කරනකොට කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු ආර්ථික විද්‍යාඥයෙකු වන මහාචාර්ය ඒ.ඩී.වී. ද එස්. ඉන්ද්‍රරත්න මහතා වරක් සඳහන් කළා, ලංකාවේ දූෂණය, වංචාව, හොරකම හා නාස්තිය නිසා ජාතික ආදායමෙන් සියයට 8ක වාගේ ප්‍රමාණයක් අපතේ යනවා - නාස්ති වනවා - කියලා. ඒක පොඩි ප්‍රමාණයක් නොවෙයි. ඒ නිසා තමයි අද අපේ නීති පද්ධතිය ශක්තිමත් කරන්න මේ අණ පනත් ගෙනෙන්නේ. ඇරිස්ටෝටල් කියන දාර්ශනිකයා වරක් කිව්වා, නීතියට සහ ආගමට ඇති වන බය නිසා නොවන්නට, ලෝකයේ සිටින නරකම සතා මිනිසා බවට පත් වනවා කියලා. එම නිසා මේ මට්ටමින් හෝ මේ දේවල් තිබෙන්නේ නීතියට සහ ආගමට තිබෙන බය නිසා කියලාත් අපි විශ්වාස කරනවා.

අපේ නීති පද්ධතිය ශක්තිමත් කිරීමේදී එක පැත්තකින් අපට කනගාටුවක් ඇති වනවා. අපි දන්නවා, විශේෂයෙන්ම ත්‍රස්තවාදය පෝෂණය කිරීම, ඒ වාගේම අයථා ආකාරයෙන් දේපළ රැස් කිරීම සදාචාරයට පටහැනියි කියලා. ඒවා අපේ අධ්‍යාපන ක්‍රමයෙන් බැහැර කරලා තිබෙන්නේ. ලංකාවේ ප්‍රධාන ආගම් 4ක් තිබෙනවා. ඒ, බුද්ධාගම, ඉස්ලාම් ආගම, හින්දු ආගම සහ ක්‍රිස්තියානි ආගම. මේ කිසිම ආගමක කියලා නැහැ, ත්‍රස්තවාදය පෝෂණය කරන්න

[ගරු නලින් හේවගේ මහතා]

හෝ අයථා ආකාරයෙන් මුදල් සොයාගන්න කියලා. අපේ සදාචාරයේත් ඒවා නැහැ, අපේ අධ්‍යාපනයේත් ඒවා නැහැ. හැබැයි, ඒ තුළින් ඒ සියලු දේවල් පිටුදැක්කාට මේ ව්‍යසනය අද සමාජය තුළ දැවැන්ත ඛේදවාචකයක් දක්වා ගමන් කරලා තිබෙන බව අපි දකිනවා. ඒ නිසා තමයි මේ අණ පනත් ශක්තිමත් කිරීමේ ඕනෑකම තිබෙන්නේ. අපි හිතන විධියට, මේක පුද්ගලයින්ගේ වැරැද්දක් නොවෙයි. විශේෂයෙන්ම පසුගිය කාලයේ ලංකාවේ ඇති කරන ලද සමාජ, ආර්ථික ක්‍රමයේ වැරැද්දක් කියලා තමයි දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපි මේක තේරුම් ගන්නේ. විශේෂයෙන්ම 1977න් පසු නිර්මාණය කරන ලද මජර සමාජ ක්‍රමයේ නෛතික අංගයක් බවට මේ දේවල් පරිවර්තනය වුණා.

මට මතකයි, එක වෙලාවක ජේ.ආර්. ජයවර්ධන මහතා කිව්වා, "බල්ලෝ මරලා හරි සල්ලි හොයන්න, බල්ලෝ කෑ ගැහුවාට සල්ලි කෑ ගහන්නේ නැහැ" කියලා. ඒක තමයි ඒ කාලයේ තිබුණු ආර්ථික ප්‍රතිපත්තිය. කුඩු විකුණලා හරි, මිනී මරලා හරි කොහොම හරි සල්ලි හොයන්න කිව්වා. ඒ සල්ලිවලට - ධන බලයට - නිල බලයට දේශපාලන බලය එකතුවෙලා ඕනෑම දෙයක් කරන්න පුළුවන් කියලා විශ්වාස කළා. එහෙම තමයි එදා ඔවුන් කටයුතු කළේ. අද ඒකේ අවසාන ප්‍රතිඵලය වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ ගමනේ අවසාන ප්‍රතිඵලය තමයි, මේ පාර්ලිමේන්තුවේ හිටපු මැති ඇමතිවරුන් රොත්ත බුරුත්තක්ම හිරේට ගිය එක. අද මහින්දානන්ද අලුත්ගමගේ හිරේ, එස්.එම්. චන්ද්‍රසේන හිරේ, සරණ ගුණවර්ධන හිරේ. ඒක තමයි එහි අවසාන ප්‍රතිඵලය. ඔවුන් කිරි පොවලා හදපු ඒ යක්ෂ පැටව් අද ඔවුන්ම ගිලින තත්ත්වයට පරිවර්තනය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි, මේ සමාජ ක්‍රමය හදන වෙලාවේ පොල්ගහවෙල සිටියා, සුනිල් රන්ජන් ජයකොඩි කියලා මන්ත්‍රීවරයෙක්. ඒ මන්ත්‍රීවරයා දාමරික වැඩම තමයි කළේ. හැබැයි, ඒ පැත්තේ ගමේ පන්සලේ නායක හාමුදුරුවන්ට ඔහුගේ වැඩ ඇල්ලුවේ නැහැ. උන්වහන්සේ ජේආර් මහත්තයාට කිව්වා, "මෙන්න මෙහෙම කෙනෙක් ඉන්නවා, කරන්නේම මදාවි වැඩ, මට ඔබතුමාව හම්බවෙන්න වෙලාවක් දෙන්න" කියලා. ඊට පස්සේ වෙලාවක් දීලා ජේආර් මහත්තයා උන්වහන්සේව ගෙදරට ගෙන්වා ගන්නවා. ගෙන්වා ගත්තාට පස්සේ හාමුදුරුවන්ට ගිලන්පසත් පූජා කරලා ඇහුවා, "මොකද, හාමුදුරුවනේ?" කියලා. උන්වහන්සේ කිව්වා, "සුනිල් රන්ජන් ජයකොඩි කියලා මන්ත්‍රීවරයෙක් ඉන්නවා, අපේ පක්ෂයටත් අවනම්බුවක්, මේ වාගේ වැඩ තමයි ඔහු කරන්නේ" කියලා. ඊට පස්සේ ජේආර් මහත්තයා හාමුදුරුවන්ගෙන් අහනවා, "ඔහුගෙන් ඔබවහන්සේට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද?" කියලා. එතකොට උන්වහන්සේ කිව්වා, "නැහැ, ජේආර් මහත්තයා, මට නම් ප්‍රශ්නයක් නැහැ" කියලා. ඊට පස්සේ කියනවා, "මෙන්න හාමුදුරුවනේ මගේ number එක, ඔබවහන්සේට ප්‍රශ්නයක් වුණොත් මට කථා කරන්න, ඕනෑම ගව පට්ටියක අනින ගොන්නු දෙන්නෙක්, තුන්දෙනෙක් ඉන්න ඕනෑ අපේ හාමුදුරුවනේ" කියලා. එහෙම තමයි ජේආර් මහත්තයා එදා ඒ හාමුදුරුවන්ට බණ දේශනා කළේ. ඕනෑම හරක් පට්ටියක අනින ගොන්නු දෙන්නෙක්, තුන්දෙනෙක් ඉන්න ඕනෑ කියලා තමයි එදා ඒක සාධාරණීකරණය කළේ. එහෙම ආපු ගමනක් තමයි මේ තිබෙන්නේ. එහෙම ආපු ගමනක තමයි අද මහින්දානන්දලා හිරේ ඉන්නේ. ඒක නිසා මේ අණ පනත් ගෙනෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ජරාජීර්ණ දේශපාලන සංස්කෘතිය යළි ප්‍රකෘතිමත් තත්ත්වයකට ගෙන එන්නයි.

ඔබතුමා හිතන්න, පසුගිය දිනවල වෙච්ච සිදුවීම ගැන. විශේෂයෙන්ම සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ඉන්න පුද්ගලයින් ගන්නේ රුපියල් ලක්ෂ 5,000 කප්පම්. ඒ වාගේම තමන්ගේ තාත්තා අධිකරණ ඇමති වෙනකොට පුතා ගිහිල්ලා තමයි ඒ ගනුදෙනු කරන්නේ. මේ රට මොන තරම් කළු ආර්ථිකයක් තිබෙන රටක්ද? පොලිස්පතිවරයා මේකට සම්බන්ධ වනවා, බන්ධනාගාර අධිකාරි මේකට සම්බන්ධ වනවා, ආගමන විගමන පාලක ජනරාල් මේකට සම්බන්ධ වනවා, නාවික හමුදාපති මේකට සම්බන්ධ වනවා, දේශපාලන අධිකාරියේ ඉහළම අය මේකට සම්බන්ධ වනවා. මේ සිය ලුදෙනා සම්බන්ධ වෙච්ච මජර කළු ආර්ථිකයක් තමයි රටේ තිබුණේ. මේක තවත් ඉස්සරහට ගියා නම් මොකද වෙන්නේ? ඉතින්, මේ පිළිබඳව අපි සැලෙන්නේ නැහැ.

1848දී "කොමියුනිස්ට් ප්‍රකාශනය" ලිව්වා. ඒ ලියනකොට ඉතා පැහැදිලිව කිව්වා, "මේ සමාජ ක්‍රමය ඉදිරියට යනකොට ඝනීභූත වූ සියල්ල වාෂ්ප වන්නේය, ශුද්ධ වූ සියල්ල කෙලෙසෙන්නේය" කියලා. ඒ නිසා මේකට අපි කම්පා වන්නේ නැහැ. මේ, සමාජ ක්‍රමයේ ලක්ෂණ. මේවා නෛසර්ගික ලක්ෂණ. මේ සමාජ ක්‍රමය ඉස්සරහට යනකොට ඝනීභූත වූ සියල්ල වාෂ්ප වනවා. ඒක විද්‍යාව. ඒ වාගේම ශුද්ධ වූ කිසිම දෙයක් ඉතිරි වන්නේ නැහැ. ශුද්ධ වෙච්ච දේශපාලනඥයාට අද මොකක්ද වෙලා තිබෙන්නේ? කප්පම් ගන්න, හොරකම් කරන, මිනී මරන, තක්කඩිකම් කරන අය බවට පත් වෙලා තිබෙනවා. මේ සියල්ල විනාශ වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේ අණ පනත් ටික මේ විධියට හැදෙන්නේ. අද මේ අණ පනත් ගෙනෙනකොට විපක්ෂය මොකක්ද කියන්නේ?

කියන්න කනගාටුයි, උදේ විපක්ෂ නායකවරයා කථා කළා. නමුත්, මේ පනත් සම්බන්ධයෙන් එක වචනයක් කථා කළේ නැහැ. මීට ටිකකට කලින් අපේ ගාල්ල දිස්ත්‍රික්කයේ පොහොට්ටුවේ, වානක මාදුගොඩ මන්ත්‍රීවරයා කථා කළා. එතුමා විනාඩි 7ම කථා කළේ ගාල්ල බන්ධනාගාරය ගැනයි, හදන ආදාහනාගාරය ගැනයි, කොග්ගල ගාමන්ට් එකක් ගැනයි. මේ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කථා කළේ නැහැ. මොකද, ඒවා ගැන ඒගොල්ලන්ට කථා කරන්න බැහැ. ත්‍රස්තවාදය පෝෂණය කිරීම කථා කරන්න පුළුවන්ද සජිත් ප්‍රේමදාසට? ත්‍රස්තවාදය පෝෂණය කරන්න සිමෙන්ති ටික දීලා, අවිආයුධ ටික දුන්නේ සජිත් ප්‍රේමදාස මහත්තයාගේ තාත්තා. ඒ නිසා මේවා කථා කරන කොට, අර සොහොන් පිට්ටනි ළඟින් යනකොට අහක බලාගෙන යන තත්ත්වයක් වාගේ දෙයක් තමයි අද සජිත් ප්‍රේමදාස කරන්නේ. එතුමාට මේවා කථා කරන්න බැහැ. අපේ වානක මාදුගොඩ මන්ත්‍රීතුමාට මේවා කථා කරන්න බැහැ. ඒ මන්ත්‍රීතුමාගේ දේශපාලන පක්ෂයේ නායකයෝ තමයි - බැසිල් මහත්තයා තමයි - ත්‍රස්තවාදීන්ට එදා සල්ලි දුන්නේ. බන්දුල ගුණවර්ධන මහත්තයා ඒ සල්ලි දුන් චෙක්පත් අංකත් එක්ක එදා මේ පාර්ලිමේන්තුවේ කථා කළා. එහෙමයි එහා පැත්තේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ත්‍රස්තවාදීන්ට උදව් කළේ. එහෙමයි උදව් කළේ. එම නිසා අද මේ මාතෘකාව සම්බන්ධයෙන් ඒ අයට කථා කරන්න බැහැ.

අද ඒ අය කථා කරනවා, ගාල්ල බන්ධනාගාරය ගැන. අද දවසේම විපක්ෂයේ මාතෘකාව බන්ධනාගාරයයි. මේ පනත් රටට ඉතා වැදගත් ඒවා. රට විනාශ වන, කළු ආර්ථිකය ඩැහැ ගන්න වැදගත් මාතෘකාවක් අද සාකච්ඡා කරන්නේ. නමුත් අද ඒ මන්ත්‍රීතුමන්ලාගේ මාතෘකාව වුණේ බන්ධනාගාරය. අපි දන්නවා, ඉස්සරහට ඒ අයගේ ඡන්ද ලකුණත් බන්ධනාගාරය වන බව. නැත්නම් මාංචු කුට්ටම වන බව. විපක්ෂයේ බොහෝදෙනාගේ අවසාන නවාතැන් පොළ බන්ධනාගාරයයි. එම නිසා ඒ අය කථා

කරන්නේ බන්ධනාගාර සංඛ්‍යාව වැඩි කිරීම ගැන, බන්ධනාගාරවල පහසුකම් වැඩි කිරීම ගැන. අපේ ප්‍රතිපත්තිය බන්ධනාගාර වැඩි කිරීම නොවෙයි. අපේ ප්‍රතිපත්තිය වන්නේ ලංකාවේ තිබෙන බන්ධනාගාර සංඛ්‍යාව අඩු කරන්න ඕනෑ, ඒවාට යන පිරිස අඩු කරන්න ඕනෑ කියන එකයි. බන්ධනාගාර සංඛ්‍යාව වැඩි කිරීමෙන් රටේ දේශපාලනයේ සුජාතභාවයක් හැදෙන්නේ නැහැ. හැබැයි, මේ වෙලාවේ යම් ප්‍රමාණයක සංඛ්‍යාවක් වැඩි වනවා. පසුගිය කාලයේ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. දැන් තමයි කෙනා කවුද කියලා බලන්නේ නැතිව, උස්ද, මිටිද, පහත්ද, ලොකු ද, ධනය තිබෙනවාද, නැද්ද කියන ඒ සියල්ල නොසලකා නීතිය සමානව ක්‍රියාත්මක වන්නේ. එහෙම වුණාම මේ මොහොතේ යම් ප්‍රමාණයකට බන්ධනාගාරයට යන පිරිස වැඩි වනවා. මේ වෙලාවේ curve එක උඩට ගියාට අපි දන්නවා, නීති ක්‍රියාත්මක වනකොට, දේශපාලන රැකවරණය නැති වනකොට මේ curve එක පහළට එනවා කියලා. එතකොට බන්ධනාගාර අවශ්‍ය නැති වනවා.

මට මතකයි, වානක මාදුගොඩ මන්ත්‍රීතුමා කිව්වා, ගාල්ලේ මන්ත්‍රීතුමන්ලා හත්දෙනෙක් හිටියත් මේ ගැන කථා කළේ නැහැ කියලා. ගාල්ලට මේ වනකොට ගෙනෙනවා, දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියක්. එතුමා කියනවා, ගාල්ල සංචාරක පුරවරයක්, ඒ සංචාරක පුරවරයේ බන්ධනාගාර තුනක් තිබෙනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාගේ රජයන් අවුරුදු 76ක් විතර මේ රට පාලනය කළා. නාමල් මහත්තයාගේ තාත්තා හිටියා, බාප්පලා හිටියා, රමේෂ් පතිරණලා හිටියා. හැබැයි කුණු ටිකක් දාගන්න තැනක් ගාල්ල සංචාරක පුරවරයේ නැහැ. Jetwing Lighthouse කියලා දැවැන්ත හෝටලයක් තිබෙනවා. එතැන තිබෙනවා, අඩි 100ක විතර කුණු කන්දක්. ඔන්න, ගාල්ලේ කුණු දමන තැනට තිබුණු උත්තරය. Lighthouse Hotel එකේ ඉන්න බැහැ, මේ කුණු කන්ද නිසා. සංචාරක පුරවරයක් බව දැනගත්තාට කුණු ටික දාන්න නිශ්චිත වැඩ පිළිවෙළක් නැහැ. මාදුගොඩ මන්ත්‍රීතුමා කියන ගාල්ලේ බන්ධනාගාරයත් බූස්සට ගෙන යන්න අපි සාකච්ඡා කරලා තිබෙනවා. ඒවා ගැන ඒ මන්ත්‍රීතුමා කථා කළේ නැහැ. මේ ස්ථානයට ගෙන එන්නේ තාවකාලිකව. ඒක යට කරලා තමයි අද වානකලා, පොහොට්ටුව කැත දේශපාලනයක් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බන්ධනාගාරය මෙතැනට ගෙනෙන්න තීරණය කරන්නේ මීට මාස අටකට කලින්. ඒ මිනිසුන්ට බන්ධනාගාරවල ඉඩ මදියි කියලා මෙතැන මැරෙන්න හදනවා. අලුත් එකක් හදනකොටත් උසි ගන්වනවා, රෝහල තිබුණු තැනට බන්ධනාගාරය ගෙනෙනවා කියලා. මේ ජඩ දේශපාලනය නතර වෙන්න ඕනෑ. බන්ධනාගාරයේ ඉන්න බැරි නම් ඒකට උත්තරයක් හොයන කොට අද ඒකට වළ කපන්නේත් පොහොට්ටුවේ නාමල්ලාම නොවෙයි ද කියලා අපි අහනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බිල්ඩින් මාස හයක් තිස්සේ නිකම් තිබෙන්නේ. Audit queries එනවා, ඒවායෙන් මොකක්වත් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ කියලා. මාස අටකට කලින් Cabinet Paper එක දානවා, තාවකාලිකව එතැනට මේ බන්ධනාගාරය ගෙනෙන්න. මොකද ඉදිරියේදී එතැන අපි දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියක් කරනවා. ගාල්ල නගරයේ තිබෙන සියලුම රාජ්‍ය ආයතන ගෙනැල්ලා, පරිපාලන කේන්ද්‍රය හදන්න යන්නේ එතැන. එම නිසා මේ තුට්ටු දෙකේ දේශපාලනය කරන්න එපා. මේ තුට්ටු දෙකේ දේශපාලනය වෙනුවට ගෞරවනීය දේශපාලනයක් කරන්න ඕනෑ. අපි දන්නවා, විපක්ෂයට එහෙම ගෞරවනීය දේශපාලනයකට එන්න බැහැ කියලා.

අද උදේ මට තවත් කාරණයක් ඇහුණා. සජිත් ප්‍රේමදාස මැතිතුමා කියනවා, ජනාධිපති අරමුදලින් දයාසිරි ජයසේකර මහත්තයාට කරුණාසහගත දීමනාවක් දීලා කියලා. මේ දීමනා අපට නැහැ නේ. කරුණාසහගත දීමනා! කරුණාසහගත දීමනා ගැන මම කියවන්නම්, 2010 ඔක්තෝබර් මාසයේ 03වැනි දා "ලංකාදීප" ඉරිදා පත්තරයේ තිබෙන පුවතක්. මේකේ තිබෙනවා, කරුණාසහගත දීමනාවක් ගැන. ජනාධිපති අරමුදලින් රුපියල් කෝටි 84ක්, අනුමැතියකින් තොරව දීලා තිබෙනවා කියලා විගණකාධිපති කියනවා. රුපියල් ලක්ෂ පහක් දීපු එක නොවෙයි, මෙහෙමයි එදා මුදල් නාස්ති කළේ. නමුත්, අද මේවාට තමයි මේ අය වැට බඳින්න හදන්නේ. මේක තමයි වෙනස් වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ අණ පනත් ශක්තිමත් වෙන්න ඕනෑ. හිටපු අධිකරණ ඇමතිතුමන්ලාගේ පුතාලා කරපු දේවල් ගැන සමගි ජන බලවේගයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයට කථා කරන්න බැහැ, පාතාලය ගැන කථා කරන්න බැහැ. සජිත් ප්‍රේමදාස මහත්තයාට ඒවා කථා කරන්න බැහැ. පාතාලයේ "සොත්ති උපාලි" කියන කෙනා එතුමාගේ තාත්තාගේ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ හිටියේ. එම නිසා සජිත් ප්‍රේමදාස මහත්තයාට ඒ ගැන කථා කරන්න බැහැ. "බැද්දගානේ සංජීව" එදා හිටියේ චන්ද්‍රිකාගේ bodyguard විධියට. ඒ නිසා චන්ද්‍රිකාටත් ඒ ගැන කථා කරන්න බැහැ. නාමල්ට පාතාලය ගැන කථා කරන්න බැහැ. නාමල් කථා කරනකොට හම්බන්තොට රැස්වීමේ පිටුපසින් ඉන්නවා, "ජුලම්පිටියේ අමරේ." එම නිසා අද විපක්ෂයේ අයට මාතෘකාවට අනුව කථා කරන්න බැහැ. විශේෂයෙන් විපක්ෂය මොනවා හරි කාරණයක් අරගෙන මඩක් ගහන්න තමයි උත්සාහ කරන්නේ.

ඒ නිසා අපි හිතනවා, මේ නීති ශක්තිමත් වෙන්න ඕනෑ, මේ නීති සංශෝධනය වෙන්න ඕනෑ කියලා. එහෙම නැතුව දේශපාලනඥයායි, ඉහළම තන්ත්‍රයේ රාජ්‍ය නිලධාරීනුයි කියන මේ සියලුදෙනා එකතු වෙලා ඒ කළු ආර්ථිකය තුළ මේ ගමන ගියා නම් අපේ රට ඉතුරු වෙන්නේ නැහැ. ඒක නිසා තමයි අපි මේ කටයුතු කරමින් යන්නේ. මේ යන ගමන අවසානයේදී පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් හැදෙනවා කියලා අපි හිතනවා. ඒ වාගේම ආර්ථිකය හැදෙනවා. දේශපාලන සංස්කෘතියේ දැවැන්ත වෙනස්කම් ටිකක් කරනවා. ඒක තමයි මේ අවශ්‍යතාව. ඒ ආදර්ශයත් දෙමින් තමයි අපි මේ ගමන යන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නලින් හේවගේ මහතා**
(மாண்புமிகு நலின் ஹேவகே)
(The Hon. Nalin Hewage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්.

මේක අපිරිසිදු වතුර භාජනයක් නම් දැන් එහි පොඩි අපැහැදිලිතාවක් තිබෙන්න පුළුවන්. ඒ අපිරිසිදු වතුර භාජනයට අපි දැන් පිරිසිදු වතුර එකතු කරනවා. හැබැයි, දැන් ඒ භාජනයේ අපිරිසිදු ජලයයි, පිරිසිදු ජලයයි කියන දෙකම තිබෙනවා. ඒ නිසා පොඩි අපැහැදිලි චිත්‍රයක් හැදෙන්න පුළුවන්. ඒ නිසා විටෙක ගඳත් ගහනවා, විටෙක සුවඳත් එනවා, මඩ පාටත් තිබෙනවා, හොඳ පාටත් තිබෙනවා. හැබැයි, ඒගොල්ලන් දන්නවා, අපි මේ භාජනයට නොනවත්වා පිරිසිදු වතුර වක්කරනවා කියලා. හෙට අනිද්දා වනකොට මේ ජල පොකුණ පියුමක් පිපෙන සුදුම සුදු ජලාශයක් බවට පත් වෙනවා. අන්න එතකොට ඔයගොල්ලන්ගේ දේශපාලනය සදාකල්හිම විනාශ වෙලා යනවා. ඒ වෙනුවෙන් තව

[ගරු නලින් හේවගේ මහතා]

ටිකක් කෑ ගහන්න, තව ටිකක් උසිගන්වන්න, තව ටිකක් ඔයගොල්ලන්ගේ හඬ නඟන්න. ඔයගොල්ලන්ගේ දේශපාලනය මෙතැනින් ඉවරයි කියන කරුණ මතක් කරමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.42]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் பணம் தூய்தாக்கல் தடை (திருத்தம்) சட்டமூலம், நிதிசார் கொடுக்கல்வாங்கல்களை அறிக்கையிடல் (திருத்தம்) சட்டம் மூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதில் மிக்க மகிழ்ச்சியடைகின்றேன்.

முதலில், நமது நாட்டில் கடந்த 5ஆம், 6ஆம் திகதிகளில் நீர்கொழும்புச் சிறைச்சாலையில் இடம்பெற்ற வன்முறைச் சம்பவங்களில் மரணமடைந்த சிறைச்சாலை அதிகாரிகள், கைதிகள், காயமடைந்தவர்கள் அனைவருக்காகவும் ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சி சார்பில் எனது ஆழ்ந்த அனுதாபங் களைத் தெரிவித்துக் கொள்வதுடன், அவர்களுடைய இழப்பால் தவித்துக்கொண்டிருக்கின்ற அவர்களது பெற்றோர்கள் மற்றும் குடும்பத்தினருக்கும் எல்லாம் வல்ல இறைவன் பொறுமையையும் சகிப்புத் தன்மையையும் வழங்க வேண்டுமெனப் பிரார்த்திக்கின்றேன்.

இந்தச் சம்பவத்தில் மரணமடைந்த மற்றும் காயமடைந்தவர் களைத் தவிர, இன்று கிடைத்திருக்கின்ற அறிக்கையின்படி 10 கோடி ரூபாய்க்கும் அதிகமான நஷ்டம் ஏற்பட்டுள்ளதாகவும் தெரிவிக்கப்பட்டுள்ளது. நீர்கொழும்புச் சிறைச்சாலையில் இடம்பெற்ற இந்த நிகழ்வைப் பாடமாகக்கொண்டு, இந்த அசம்பாவிதம் நடைபெறுவதற்குக் காரணமான தவறுகளைத் திருத்திக்கொண்டு, எதிர்காலத்திற்கேற்ற வகையில் இந்த நாட்டுக்குத் தேவையான சிறைச்சாலைக் கட்டமைப்பை மறுசீரமைப்பதற்கு ஒற்றுமைப்பட்டுச் செயற்படவேண்டிய பாரிய பொறுப்பு நம் எல்லோருக்கும் இருக்கின்றது. அதுபோல், சிறைச்சாலைகளில் கடமையாற்றும் அதிகாரி களையும் அங்குள்ள கைதிகளையும் பாதுகாக்க வேண்டிய பாரிய பொறுப்பு அரசாங்கத்திற்கு உள்ளது. இந்தச் சம்பவம் நிகழ்ந்ததன் பின்னர்தான் நாங்கள் பல திட்டங்களைத் தீட்டுகின்றோம். எனவே, இவ்வாறான நிகழ்வுகள் நடைபெறாமல் இருப்பதற்கான நல்ல திட்டங்களை முன்கூட்டியே ஏற்பாடு செய்யவேண்டுமென்று நான் கேட்டுக் கொள்கின்றேன். சிறைச்சாலை அதிகாரிகளினதும் சிறைக் கைதிகளினதும் உயிர்களும் பெறுமதியானவை என்பதை நாம் உணர வேண்டும். நீர்கொழும்பு சம்பவத்திலே மரணமடைந்தவரர்களின் குடும்பத்தினர் வேதனைப்பட்ட காட்சிகளை நாங்கள் தொலைக்காட்சியில் கண்டோம். அவர்களுடைய வேதனையில் நாங்களும் பங்கெடுத்து, எங்களுடைய அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கிறோம். இந்த நாட்டில் உள்ள யாராக இருந்தாலும், பெறுமதிமிக்க உயிர்கள் அவ்வாறு கொலை செய்யப்பட்டது மிகவும் வருந்தத்தக்கதாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டில் 30 ஆண்டு காலமாக வட, கிழக்கு மாகாணங்களில் 'அரசாங்கக் கட்டுப்பாட்டுப் பிரதேசம்' என்றும் 'விடுதலைப் புலிகளுடைய கட்டுப்பாட்டுப் பிரதேசம்' என்றும் இரண்டு அரசாங்கங்கள் போன்று இயங்கி வந்தன. அரசாங்கத்துக்கென எவ்வாறு வங்கிகள் இருக்கின்றதோ, காரியாலயங்கள் இருக்கின்றதோ, நீதிமன்றங்கள் இருக்கின்றதோ, சிறைச் சாலைகள் இருக்கின்றதோ, அதேபோன்று விடுதலைப் புலிகளுடைய கட்டுப்பாட்டுப் பிரதேசங்களில் அவர்களுக் கென்று காரியாலயங்கள் இருந்தன, நீதிமன்றங்கள் இருந்தன, விசாரணைகள் நடைபெற்றன, சிறைச்சாலைகளும் இருந்தன. இதேபோன்றுதான், நமது நாட்டில் அமைந்துள்ள சிறைச் சாலைகளிலும் யார் விரும்பினாலும் விரும்பாவிட்டாலும் அதிகாரிகளுடைய தனி இராஜ்ஜியம் ஒன்று உருவாக்கப் பட்டிருந்தது. அதேபோன்று கைதிகளும் தனி இராஜ்ஜியம் ஒன்றை உருவாக்கி இருக்கிறார்கள். இந்த இரண்டு இராஜ்ஜியங்களும் ஒன்றிணைந்தோ அல்லது பிரிவுபட்டோ, பெறுமதிமிக்க உயிர்களையும் இந்த நாட்டுக்குரிய சொத்துக் களையும் அழித்திருக்கிறார்கள். எனவே, இந்த நாட்டில் எவ்வாறு இனவாதம் இல்லாமல் செய்யப்பட்டதோ, எவ்வாறு பயங்கரவாதம் இல்லாமல் செய்யப்பட்டதோ, அதேபோன்று சிறைச்சாலையில் இருக்கின்ற இந்தப் பழைய கலாசாரமும் இல்லாதொழிக்கப்பட வேண்டும். சிறைக்குள் போதைவஸ்து வியாபாரிகளின் தொடர்புகள் இருப்பது எங்களுக்குத் தெரியும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

அவர்கள் வெளியிலும் இருக்கிறார்கள். போதைவஸ்துக் கடத்தல்காரர்களும் இதில் சம்பந்தப்பட்டு இருக்கிறார்கள். அவர்களின் கையில்தான் சிறைச்சாலையினுடைய நிர்வாகத்தைத் தீர்மானிக்கும் அதிகாரம் இருக்கின்றது. எனவே, இந்தக் கலாசாரத்தை இல்லாமல் செய்வதற்காக நாம் ஆளும் கட்சி, எதிர்க்கட்சி என்ற பேதம் இல்லாமல் செயற்பட்டு, சிறைச்சாலை அதிகாரிகள் மற்றும் கைதிகளின் உரிமைகளை மனிதாபிமானமான அடிப்படையில் பாதுகாக் கக்கூடிய, புதிய சிறைச்சாலைக் கட்டமைப்பை ஏற்படுத்த வேண்டுமென நான் கேட்டுக் கொள்கிறேன். அதே போன்று, இதனை ஒரு பாடமாகக்கொண்டு, இந்தக் கொடிய பழைய கலாசாரத்திலிருந்து அவர்களை மீட்பதற்காக நல்ல ஆலோசனைகளை வழங்கி, இந்த நிலைமையைச் சீர்செய்யவேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.48]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)

(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අද දවසේ විවාද කරනවා. විශේෂයෙන්ම අපේ රටට, අපේ රටේ ආර්ථිකයට සහ අපේ රටේ යහ පැවැත්මට අත්‍යවශ්‍ය, ඉතා වැදගත් වන පනත් කෙටුම්පත් තුනක් පිළිබඳව තමයි අපි අද මේ සාකච්ඡා කරමින් ඉන්නේ.

මම මුලින්ම විපක්ෂයෙන් අහන්න ඕනෑ, අද දවසේ මේ විවාදයේදී අපි දකින්නේ අපේ රටේ ආර්ථිකයට, සමාජයට වැදගත්, අපේ රට ලෝකයේ ඉහළින්ම ඔසවා තබන්න අවශ්‍ය කරන නීතිරීති සම්පාදනය කරන පනත් කෙටුම්පත් දෙකක් ගැන සාකච්ඡාවක්ද එහෙම නැත්නම් ඒ ගැන වගේ වගක් නැතුව වෙන සාකච්ඡාවක්ද කියන එක. ඒක අපිට බොහෝ අයගේ කථාවලින් පැහැදිලි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අපේ රටට මේ පනත් කෙටුම්පත් දෙක මෙච්චරම වැදගත් වන්නේ ඇයි කියන එක ගැන අපි බලන්න ඕනෑ. විශේෂයෙන්ම මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත අපිට කොච්චර වැදගත්ද කියන එක පිළිබඳව අපි සොයා බලන්න ඕනෑ. මොකද, මේ පනත් කෙටුම්පත හරහා තමයි අපේ රටේ කළු ආර්ථිකය ගැන අපි කථා කරන්නේ. අපි දන්නවා, දශක ගණනක් තිස්සේ වර්ධනය වෙමින් නොවෙයි වර්ධනය කරමින්, නඩත්තු කරමින් තමයි අපේ රටේ පාලකයන් කළු ආර්ථිකය හැදුවේ කියන එක. කළු ආර්ථිකයක් නිර්මාණය කරන්න අනිවාර්යයෙන්ම කළු ආණ්ඩුවක් ඕනෑ. කළු ආණ්ඩු තිබෙනකොට තමයි කළු ආර්ථිකයක් නිර්මාණය කරන්න පුළුවන් වෙන්නේ. කළු ආණ්ඩුවක් තිබෙන්න නම් කළු පාලකයෝ ඉන්න ඕනෑ. සුදු ඇඳ ගත්තාට, සාටක දමා ගත්තාට පාලකයෝ කළු වුණොත් තමයි කළු ආණ්ඩුවක් හදන්න පුළුවන්. කළු ආණ්ඩුවක් හැදුවාම තමයි කළු ආර්ථිකයක් නිර්මාණය වෙන්නේ. අපේ රටේ මෙන්න මේ කළු ආර්ථිකය නිර්මාණය කරන වැඩේට මේ සුදු ඇඳ ගත්ත කළු පාලකයෝ දශක ගණනක් තිස්සේ අත ගැහුවා, ඒ වැඩේ කළා වාගේම ඒ වැඩේට දායක වුණා. අපිට වෙලා තිබෙන්නේ මෙන්න මේක reverse කරන්න, මේක නිවැරදි කරන්න, මේක ශක්තිමත් කරන්න සහ අපේ රට නැවත මේ කළු ආර්ථිකයෙන් ගලවා ගන්නයි.

ඇයි, අපි එහෙම කියන්නේ? අපිට මේක වැදගත් ඇයි? අපි දන්නවා, රාජ්‍ය මුදල් අවභාවිත කිරීම් ගැන. අපි දිගටම අහන, දකින, නඩු තිබෙන, මේ දවස්වල හිරේට ගාල් වෙන මේ සිද්ධි සියල්ල ඇතුළේ රාජ්‍ය මුදල් අවභාවිතාව කියන එක තිබෙනවා. නීති විරෝධී ව්‍යාපාර තිබෙනවා, හොරකම තිබෙනවා, පාතාලය තිබෙනවා, නීති විරෝධී ක්‍රියා තිබෙනවා, මත්ද්‍රව්‍ය තිබෙනවා, මුදල් විශුද්ධිකරණය තිබෙනවා. අද අපි දකින, අත්විඳින මේ ඛේදවාචක සහ මුදල් විශුද්ධිකරණය වාගේ දේවල් එක දම්වැලක පුරුක් විධියට තමයි තිබෙන්නේ. මේක වෙන එකක්, අරක තව එකක් කියලා නැහැ. එකිනෙකට ගැට ගැහිච්ච, එකකට එකක් සම්බන්ධ, එකක් විසින් අනෙක නඩත්තු කරන විධියට තමයි මේවා තිබෙන්නේ. අපේ ආර්ථිකය ඇතුළේ මේ සියල්ල ගැට ගැහෙන එක වෙනස් කරන්න නම් අනිවාර්යයෙන් මේ වාගේ පනත් අපට ශක්තිමත් කරන්න වෙනවා, මේ වාගේ පනත් තවදුරටත් පාර්ලිමේන්තුවට ගේන්න වෙනවා. මුදල් විශුද්ධිකරණයට අදාළ පනත් නැති වුණාම, ඒවා ශක්තිමත් නොවුණාම තමයි අපි කියන සියලු අපචාර, පාතාලය වැනි දේවල් නිර්මාණය වෙන්නේ.

අපේ රටේ පාතාලය නිර්මාණය වීම ගත්තොත්, එය 1977න් පස්සේ වර්ධනය වෙලා ක්‍රමානුකූලව ගලා ගෙන ආපු දෙයක්. අපි දන්න විධියට "ගෝනවල සුනිල්", "සොත්ති උපාලි" වැනි අය මේවායේ ආරම්භක සාමාජිකයින් වනවා. හැබැයි, ඒ අය අපේ තාත්තලාගේ යාළුවෝ නොවෙයි. ඒ අය අපේ තාත්තලාගේ ඡන්ද campaignsවල හිටපු කට්ටිය නොවෙයි. ඒ අය පෝෂණය කරපු, ඒ අය අපේ සමාජයට ගෙනැල්ලා මුදා හැරපු දේශපාලකයන්ගේ පුත්තු ඉන්නවා, ඒ දේශපාලනය තවම අපේ සමාජයේ තිබෙනවා. අපි ඒ අයව ඡන්ද campaignsවලට පාවිච්චි කරලා නැහැ. හැබැයි අපි දන්නවා, අපි අහලා තිබෙනවා, "ගෝනවල සුනිල්", "සොත්ති උපාලි" වාගේ කට්ටිය ගැන. ඉතිහාසයේ මුල්කිරිගල ඡන්ද ගැන, කටානේ ඡන්ද ගැන අපි අහලා තිබෙනවා. ඒ කාලයේ සමහර අයගේ තාත්තලා නිර්මාණය කරපු සමාජයේ දිගුව තමයි අපි අද වෙනස් නම්වලින්, වෙනත් රූපවලින් දකින්නේ.

මීගමුවේ සිද්ධිය ගැන කථා කළොත්, එය අපේ ආණ්ඩුව විසින් කළ මොනවා හෝ ක්‍රියාකාරකම් ටිකක් හින්දා වුණු සිද්ධියක් නොවෙයි. ඓතිහාසික ක්‍රියාකාරකම්වල, ඓතිහාසික ගොඩනැඟීම්වල, ඉතිහාසයේ හිටපු කළු පාලකයින් නිර්මාණය කරපු දේවල්වල දිගු විධියට තමයි මේ සිද්ධි නිර්මාණය වෙන්නේ. එම නිසා ඉතිහාසයේ ඒ පාලකයා, සුදු ඇඳ ගත්ත කළු පාලකයා අත් හැරලා මීගමුවේ සිද්ධිය හුදෙකලාව අරගෙන අපට ඒ ගැන කථා කරන්න බැහැ. හැබැයි, විපක්ෂය දැන් උත්සාහ ගන්නේ ඒවා අමතක කරලා මේවා නිකම් හුදු, හුදෙකලා සිද්ධි විධියට අරගෙන කථා කරලා ඇඟ බේරාගෙන යන්නයි. නමුත්, අපි ඒකට ඉඩ තියන්නේ නැහැ. අපි දන්නවා, අපේ රටේ ඉතිහාසයේ මොකක්ද වුණේ, කවුද මේවා නිර්මාණය කළේ, මේ සමාජය නිර්මාණය වෙන්න බලපෑ දේශපාලන කාරණා මොනවාද, ඒ දේශපාලන කාරණා පිටිපස්සේ හිටපු දේශපාලකයින් කවුද කියලා. ඒ දේශපාලනය මොකක්ද කියන එක අපි තේරුම් අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි මේ පනත් පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරනවා වාගේම, එයින් අපි පරද්දන්නේ අපේ රටේ මෙතෙක් පැවැති කළු ආර්ථික, කළු පාතාල නිර්මාණය කළ පාලනයන් බව කියන්න කැමැතියි. ඒ නිසා මේකෙන් වැඩ දෙකක් සිද්ධ වෙනවා. මුදල් විශුද්ධිකරණය නවත්වනවා වාගේම මුදල් විශුද්ධිකරණය පරද්දනවා වාගේම අපේ රටේ කළු පාලකයිනුත් අපි මේක ඇතුළේ පරද්දනවා. අපි ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනතින් දඩ මුදල් වෙනස් කරලා තිබෙනවා. මම දැක්කා එක දඩයක් තිබුණා, රුපියල් 50,000ක. ඒක ලක්ෂ 5ක් කරලා තිබෙනවා. තව දඩයක් තිබුණා, රුපියල් ලක්ෂයක. ඒක රුපියල් ලක්ෂ 10ක් කරලා තිබෙනවා. අපි මේ වාගේ පනතකින් දඩ මුදල් පවා වැඩි කරන්නේ ඇයි? අපි දන්නවා අපේ රටේ සමහර වැරදි සම්බන්ධයෙන් වන පනත් තිබෙනවා, ඒ අනුව දඩ නියම කරලා තිබෙනවා කියලා. ඒ දඩයම උත්තේජනයක් දෙනවා, ඒ වැරැද්ද කරන්න. මොකද, ඒ වැරැද්ද කරලා දඩය ගෙවන එක ලෙහෙසියි. වැරැද්ද ලොකුයි, දඩය ඉතා කුඩායි. මුදල් විශුද්ධි කිරීම වාගේ වැරැද්දක් කළාට පස්සේ ඒක දන්නේ නැතිව කළේ, ඉස්කෝලේ යන ළමයෙක්, එහෙම නැත්නම් ගමේ නුගත් කෙනෙක් කරපු දෙයක් කියලා කියන්න බැහැ. ඒ නිසා ඒ වාගේ දේවල්වලට දඩ නියම කරනකොට ඇත්ත, දැනෙන, රිදෙන දඩ නියම කරන්න ඕනෑ. එතකොට තමයි මේ වාගේ පනත්වල නියම ප්‍රතිඵලය සමාජයට ගන්න පුළුවන්

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

වෙන්නේ. මේ පනතින් අපි ඒ වැඩෙත් කරලා තිබෙනවා. විශාල ව්‍යාපෘතිවලට ඉතා කුඩා දඩ මුදල් නියම කරනවා වෙනුවට සමාජයක් විනාශ කරන, රටක ආර්ථිකය විනාශ කරන ක්‍රියාකාරකම්වලට ඒ බරට දඩ මුදල් නියම කරලා තිබෙනවා. මේවා තවත් වැඩි කරනවා නම් තවත් හොඳයි කියන එක තමයි මගේ අදහස.

එළෙව්වාද? හරි. මොකක් හරි වුණා. වුණාට පස්සේ එළියට ගිහිල්ලා, අපේ ලේඛන වගයක් හොරකම් කරගෙන ගියා, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්, ටිල්වින් සිල්වා සහෝදරයාගේ. බුද්ධිමය දේපළ. ඔන්න, බුද්ධිමය දේපළ පනත යටතේ අපි කටයුතු කළා. අපි එහෙම නේ. මුල පටන්ම අපි නීතිමය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. බුද්ධිමය දේපළ පනත යටතේ අපි නඩුවක් දැම්මා, කොළඹ වාණිජ මහාධිකරණයේ. 2019 ජනවාරි 11වැනි දා තීන්දුවක් ලැබුණා, අපට රුපියල් මිලියනයක් ගෙවන්න, ඊට අමතරව නඩු ගාස්තුත් ගෙවන්න කියලා. පොත සම්පූර්ණයෙන්ම තහනම් කළා. ඒගොල්ලන්ගේ ආණ්ඩු නේ ඒ කාලයේ තිබුණේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒගොල්ලන් ගියා, සිවිල් අභියාචනාධිකරණයට. ලැබුණේ එම තීන්දුවමයි. අභියාචනාධිකරණයට ගියා. ලැබුණේ එම තීන්දුවමයි. ඊට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව තිබුණා. ඒ ගොල්ලන් බැලුවා, ඒ ගොල්ලන්ගේ ආණ්ඩුව යටතේ මේවාට කල් මරමින් යන්න. කල් මරමින් තමයි ආවේ. 2019දී නේ තීන්දුව දීලා තිබෙන්නේ. දැන් 2026. 2026දී තීන්දුව ලැබිලා තිබෙනවා. මොකක්ද? එම තීන්දුවම සහතික කරලා තිබෙනවා අද දවසේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන්. සල්ලි ගෙවන්න, නඩු ගාස්තු ගෙවන්න කියා තිබෙනවා. පොත තහනම් කර තිබෙනවා. ඒක තමයි ඒ සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි ස්තුතිවන්ත වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයට. ඒ වාගේම විශේෂ ස්තුතියක් කරනවා, ඒ නඩුව වෙනුවෙන් පෙනී හිටපු සාලිය පීරිස් මහත්මයාට. තවත් විශේෂ ස්තුතියක් කරනවා, මොහොමඩ් අලි සබ්රි, හිටපු අධිකරණ ඇමතිතුමාට. එතුමා තමයි ඇත්තටම ඒ නඩුව මුලින් පැවරුවේ; පවත්වාගෙන ගියේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙන්නේ.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
හොඳයි. දැන් නම් විනාඩියෙන් නතර කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මොහොමඩ් අලි සබ්රි මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, එතුමා අධිකරණ ඇමතිත් වෙලා හිටියා. ඒ කිසිදු දේකට යට වෙන්නේ නැතුව මේ නඩුව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන ගිහිල්ලා, අද දවසේ නිර්මල තීන්දුවක් එළියට ඇවිල්ලා තිබෙනවා. ඉතාම ස්තුතිවන්ත වෙනවා, ගරු ශ්‍රේෂ්ඨාධිකරණයටත්, මේ නීතිඥ මණ්ඩලයටත්. ඒ වාගේම මේ කාරණය පවත්වාගෙන ගිය නිලන්ති පීරිස් මහත්මියටත් ඇත්ත වශයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නීතියක් භාවිතයට නඟන, නීතියක් ක්‍රියාත්මක කරන රටක වෙන්න ඕනෑ, ඒ වාගේ දේවල් නේද? මේ වල්බූත කථා කිය කියා, කිසිදු පදනමක් නැති කථා කිය කියා ඉන්න එක නොවෙයි, වැඬේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම කථාව අවසන් කරන්නයි හදන්නේ. පොහොට්ටුවේ ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා මෙතැන ඇවිල්ලා මාර විධියට මැරෙන්න හැදුවා, පුදුම විධියට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගාල්ලේ මහ මෝදර පරණ රෝහලක බන්ධනාගාරයක් හදන්න යනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභ සභාපතිතුමියනි, ඒ ගරා වැටිච්ච රෝහලක්. ඒ රෝහලේ එහෙම අවශ්‍යතාවක් නැහැ. දැන් පවතින අවශ්‍යතාව පදනම් කරගෙන මහ මෝදර රෝහල බන්ධනාගාරයක් බවට පත් කරන්න ගැසට් කරලා තිබෙනවා. ඒක ඇත්ත.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව විනාඩියක් දෙන්නම් කිව්වා, අපේ ප්‍රධාන සංවිධායකතුමා.

මගේ මිත්‍රයෙක් කියලා එවලා තිබෙනවා, මෙන්න මෙහෙම හැඟීමක් එයාට එනවා කියලා. මොකක්ද? දැන් එන්න එන්න පොහොට්ටු කණ්ඩායම බය වෙලා. මොකද, මැදමුලන වලව්ව අපි බන්ධනාගාරයකට ගනීද කියලා. මැදමුලන වලව්ව බන්ධනාගාරයකට ගත්තොත්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හරි වාසියක් තිබෙනවා. මොකක්ද, දන්නවාද? ඒකේ ඉන්න කට්ටිය වාද විවාද කරන්න වැඩිය දඟලන්නේ නැහැ. මොකද, මැදමුලනට ගියපු කට්ටිය තමයි ගොඩක් ඉන්නේ. ඒක හින්දා මැදමුලන වලව්ව කරදර කරන එකක් නැහැ ලු. පුරුදු තැනක් ලු. ඒක හින්දා මැදමුලන වලව්ව ගනී කියලා දැන් නාමල්ලා බය වෙලා ඉන්නේ. ඉතින් ඒක හින්දා අපි කියනවා, මාදුගොඩ මන්ත්‍රීතුමාට කලබල වෙන්න එපා කියලා, දැන්ම අදහසක් නැහැ, මැදමුලන වලව්ව බන්ධනාගාරයකට ගන්න. අපි බලමු, ඉල්ලීම අනුව මොකක්ද වෙන්නේ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ කිසිදු චෝදනාවකට බය දේශපාලන ව්‍යාපාරයක්වත්, ආණ්ඩුවක්වත් නොවෙයි. අපි තනි කකුලෙන් ඉන්නවා වෙනුවට කකුල් දෙකෙන් හිටගෙන ඉන්න ආණ්ඩුවක්. ඒක හින්දා ඔය කියන පදනම් විරහිත එකදු චෝදනාවක්වත් අපි භාර ගන්නෙත් නැහැ. එකදු චෝදනාවක්වත් අපි ගණන් ගන්නෙත් නැහැ. අපි යන ගමන අපි ආණ්ඩු ක්‍රියාවලිය හරියට කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! අද දින වැඩකටයුතු අවසන් වනතෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.57]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද විවාදයට ගැනෙන්නේ විශේෂයෙන්ම වැදගත් පනත් තුනක සංශෝධන කෙටුම්පත්. මේ පනත් තුන වැදගත් වෙන්නේ මේ රට ඇතුළේ නීතිමය රාමුව, ආයතනික ව්‍යුහය, ඒ වාගේම ඒ ආයෝජකයන්ට රට ඇතුළට එන්න තිබෙන විශ්වාසය ක්‍රමිකව ගොඩනගන, වඩාත් හිතකාමී පරිසරයක් නිර්මාණය කරන්න අවශ්‍ය කරන සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පත් තුනක් නිසා. මෙහිදී ඒ කරුණුවලට එන්න ප්‍රථම මම කැමැතියි, විශේෂයෙන්ම විපක්ෂයෙන් කථා කරපු මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු සමහර අදහස්, යෝජනාවල තිබුණු කරුණු පිළිබඳවත් පිළිතුරක් ලබා දෙන්නට. මීට පෙර විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, මේ cryptocurrency තහනම් කරලා තිබෙනවා, ඇමතිතුමෙකුගෙත් මේ cryptocurrency තිබෙනවා කියලා. ඉතාම පැහැදිලිව මම උදේ පිළිතුරු දෙනකොට මේ cryptocurrency, ඒ වාගේම ඒ virtual assets සම්බන්ධයෙන් තිබෙන සේවා සැපයීම සහ ඒ නීති රාමුව පිළිබඳ පැහැදිලි විස්තරයක් කළා. ඒක හිතා මතාම වැරදි විධියට අර්ථ කථනය කළාද දන්නේ නැහැ. එහිදී මම කියූ කාරණය තමයි, ලංකාවේ රුපියල තමයි නීත්‍යනුකූල ගනුදෙනු කරන්න පුළුවන් එකම මුදල් ඒකකය කියන කාරණය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, මා සඳහන් කරමින් සිටියේ ලංකාව තුළ ගනුදෙනු කරන්න තිබෙන එකම වලංගු මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල විතරක් වන බවයි. ඒ හැර cryptocurrenciesවලින් මුදල් ගෙවීම් කරන්න බැහැ. ඒක නීති විරෝධියි. ඒ වාගේම එවැනි වත්කමක් අත්පත් කර ගන්න ලංකාව තුළ තිබෙන electronic debit cards, credit cards වාගේ දෙයක් පාවිච්චි කරන්නත් බැහැ. ඒ හැර වෙනත් ආකාරයකට කෙරෙන ඩොලර් උපයා ගැනීමකදී වත්කම් අත්පත් කරගෙන තිබෙන්න පුළුවන්. ඒ තත්ත්වයන් අපේ නීති රීති රාමුවකින් ආවරණය වෙන්නේ නැහැ කියන කාරණය කියන්න ඕනෑ. දැනට එවැනි වත්කම් පවත්වා ගැනීම හෝ මිල දී ගැනීම පිළිබඳව බලපත්‍ර ලබා දීමක් හෝ නීතිමය රාමුවක් නැහැ. අප අද ඉදිරිපත් කරන ඉහත කී සංශෝධන පනත් කෙටුම්පතිනුත්, ඊයේ ඉදිරිපත් කරපු සංශෝධනවලිනුත් සිදු කළේ විශේෂයෙන්ම මේ virtual assetsවලට අදාළ සේවා සපයන අය නියාමනය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීමයි. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීතුමාගේ ඒ අදහස් දැක්වීම වැරදියි.

ඊළඟට තවත් අදහස් කිහිපයක් මතු කළා. එකක් තමයි, මූල්‍ය වෙළෙඳ පොළේ තාක්ෂණය උපයෝගී කරගෙන සිදු කරන ගනුදෙනුවලදී gaming, gambling වාගේම අතථ්‍ය මුදල් ගනුදෙනු විශාල ප්‍රමාණයෙන් සිදු වෙනවා, ඒ හේතුවෙන් විශාල බදු ආදායමක් රටට අහිමි වෙනවා, මේ ගෙනැල්ලා තිබෙන සංශෝධන ඒවා වැළැක්වීමට ප්‍රමාණවත් නැහැ කියන කාරණය. ඉස්සර වෙලාම අපි තේරුම් ගන්න ඕනෑ, අප මේ සිදු කරමින් තිබෙන්නේ මොකක්ද කියන එක. අපට අවබෝධයක් තිබෙනවා, මේ වත්කම් වෙළෙඳ පොළට, මූල්‍ය වෙළෙඳ පොළට තාක්ෂණය ඇවිල්ලා තිබෙන්නේ මොන ආකාරයෙන්ද කියලා. එය ක්‍රමයෙන් නියාමනය කිරීම සඳහා තමයි මේ ක්‍රියාමාර්ග ගන්නේ. මේ සඳහන් කරපු gaming සම්බන්ධයෙනුත්, gambling සම්බන්ධයෙනුත් අදාළ කටයුතු කිරීමට අපි දැන් Gambling Regulatory Authority එකක් හදලා තිබෙනවා. ලංකාවට මෙවැනි අත්දැකීම් කලින් තිබිලා නැති නිසා මේ අධිකාරියට අවශ්‍ය දක්ෂතා තිබෙන පුද්ගලයන් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියේ අපි ඉන්නවා. ඒකට සුදුසු පුද්ගලයන් ලංකාව තුළදී සොයා ගන්න බැරි නම්, පිට රටින් හෝ සම්බන්ධ කරගෙන ඒ වැඩ කටයුත්ත කරන්න අපට සිදු වෙනවා. ඒ කාරණා වේගයෙන් සිදු වෙමින් යනවා. ඉදිරියේදී මේ කියන gaming සහ තාක්ෂණය උපයෝගී කරගෙන කරනු ලබන සේවාවන් මෙන්න මේ අධිකාරිය යටතට එනවා. ඒ නිසා අපට ඒවා නියාමනය, පාලනය පහසු වෙනවා.

ඒ වාගේම, තවත් අය අදහස් දැක්වීමේදී ඉදිරිපත් කරපු තාක්ෂණික කරුණු ගත්තාම මහ ජනතාවටත් හිතෙන්න පුළුවන්, මේ කියන ක්ෂේත්‍ර සම්පූර්ණයෙන්ම ආවරණය කරලා නැහැ නේද, මෙතැන යම් යම් loopholes තිබෙනවා නේද කියලා. අපේ මන්ත්‍රීතුමෙක් කිව්වා, ගොඩක් loopholes තිබෙනවා, මෙහිදී ඒවා address කරලා නැහැ කියලා. අපි ඉස්සර වෙලාම තේරුම් ගන්න ඕනෑ, ඔය කියන චෝදනාව යම් ආකාරයකට වලංගු චෝදනාවක් වෙන්න පුළුවන් මොන වාගේ අවස්ථාවලදීද කියන එක. අපේ රටේ නීති රීති පද්ධතිය, ආයතන ව්‍යුහය ඉතාම විධිමත් විධියට සකස් කරලා, කාටවත් රිංගන්න බැරි loopholes තිබුණේ නැති තත්ත්වයක පවතිද්දී අප අලුතින් නීති රීති හඳුන්වා දෙන්න ගිහින් loophole එකක් ඇති වෙලා තිබෙනවා නම්, ඒ කාරණය පිළිගන්න පුළුවන්. හැබැයි, අප ඉන්නේ මොන වාගේ තත්ත්වයකද, මොන වාගේ ආර්ථිකයකද, මොන වාගේ සමාජයකද, මොන වාගේ නීති රාමුවකද කියන ඒවා ගත්තාම කාරණය ඉතාම පැහැදිලියි. අප ආණ්ඩුව භාර ගන්න කලින් මේ මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් විතරක් නොවෙයි, තාක්ෂණය සම්බන්ධයෙන් විතරක් නොවෙයි, මූල්‍ය වෙළෙඳ පොළ, කොටස් වෙළෙඳ පොළ ආදි හැම ක්ෂේත්‍රයකම කඩා වැටීමක් තිබුණේ. ගනුදෙනු සම්බන්ධයෙන් විතරක් නොවෙයි, රාජ්‍ය පාලනය, මිල දී ගැනීමේ ක්‍රියාවලිය ආදි හැම එකකම වංචාව, දූෂණය ඉහ වහා ගිය තත්ත්වයක් තිබුණේ. ඉතින් අප උත්සාහ දරන්නේ, අපි ක්‍රියාමාර්ග ගන්නේ, ආණ්ඩුකරණයේදී වංචා, දූෂණ කරන්න තිබෙන ඉඩ කඩ ක්‍රමිකව අහුරා ගැනීම, මූල්‍ය ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, ත්‍රස්තවාදයට මුදල් සැපයීම නතර කිරීම ආදි සියලු කාරණා පියවරෙන් පියවර ඉටු කර ගන්නයි. මොකද, මේ අතථ්‍ය මුදල් ගනුදෙනු, මුදල් විශුද්ධිකරණය, ඒ වාගේම තාක්ෂණය යොදාගෙන ගනුදෙනු කිරීම 2000 වර්ෂයෙන් පසුව වේගවත් වනවා. විශේෂයෙන් 2008දී ලෝක මූල්‍ය අවපාතය වැනි කාරණා, තාක්ෂණයේ දියුණු වීම් ආදිය එනකොට, මුදල් විශුද්ධිකරණයට ඉතා ලෙහෙසි පහසු පාරවල් විධියට තාක්ෂණය යොදා ගන්නවා.

ගරු කථානායකතුමනි, මා සඳහන් කරන්න කැමැතියි, අප මේ ඉෂ්ට සිද්ධ කරමින් තිබෙන්නේ කුමක්ද කියලා. හැම පැත්තකින්ම බිඳ වැටුණු නීති රාමුවක් තිබුණු, හැම පැත්තකින්ම බිඳ වැටුණු සමාජ, ආයතනික රාමුවක් තිබුණු රටක තමයි මේ නීති රීතිවලට අවශ්‍ය ප්‍රතිසංස්කරණ අප අරගෙන එන්නේ.

ඒ අනුව ගත්තාම, අප අද සම්මත කිරීමට ඉදිරිපත් කර තිබෙන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත බෙහෙවින් වැදගත් වනවා, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදින්ට මුදල් සැපයීම මැඩ පැවැත්වීම කියන කාරණාවලට අදාළවත්. අයථා ක්‍රමයකින් යම් ධනයක් උපයා ගෙන ඒ ධනය කොහේ හෝ නිශ්චිතව සඟවා තිබෙනවා නම්, එළියට එන්නේ නැත්නම් අල්ලා ගන්න අමාරුයි. එහෙම එක් රැස් කර ගත්තු ධනය, උපයා ගත්තු ධනය එළියට ගන්න නම්, අපි සාමාන්‍යයෙන් කියන කළු සල්ලි සුදු කරන ක්‍රියාවලිය සිදු කරන්න නම් ගනුදෙනු ප්‍රවාහයකට එන්නට ඕනෑ. ඒ නිසා තමයි ආරම්භයක් විධියට Financial Transactions Reporting (Amendment) Bill එක ගෙනැවිත් තිබෙන්නේ. අන්න ඒ මුදල් ගනුදෙනු වාර්තා කිරීම හරියාකාරව සිදු කර ගන්න ඕනෑ. එතැන තමයි ආරම්භක ස්ථානය. මේ තත්ත්වය ලෝක පරිමාණයෙන් තේරුම් ගත්තු නිසා තමයි Financial Action Task Force එකක් හැදෙන්නේ, G7 countries හරහා. අපිත් ඒ Financial Action Task Force එකේ සාමාජිකයෙකු බවට පත් වෙලා මුදල් විශුද්ධිකරණය පිටුදැකීම සඳහා මැදිහත් වෙලා කටයුතු කරනවා. එහිදී විශේෂයෙන්ම වාර්තාකරණයට සම්බන්ධ වන මූල්‍ය ආයතන ඉතාම වැදගත් වනවා. ඔවුන්ගේ වගකීම තමයි තමන් විසින් සිදු කරන ලද ගනුදෙනු නිසියාකාරව වාර්තා කරලා මූල්‍ය බුද්ධි ඒකකයට ලබා දීම. එම තොරතුරු මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කරන කොට ඔවුන් ඒ ගනුදෙනුකරු පිළිබඳව වගකීමකට යටත් වෙනවා. ඒ ගනුදෙනුකරුගේ ඉතිහාසය, ගනුදෙනුවේ ස්වභාවය, ඒ මුදල් උපයා ගත්තේ මොන ආකාරයෙන්ද යනුවෙන් ගනුදෙනුකරු පිළිබඳව තොරතුරු ලබා ගන්නා එකට අපි කියනවා, Know Your Customer - KYC - කියලා. ඒ තොරතුරු ලබා ගන්න සිදු වෙනවා. ඒ තොරතුරු ලබාගෙන තමයි මූල්‍ය බුද්ධි ඒකකයට ලබා දෙන්නේ. ඒ අනුව බැලුවාම, මූල්‍ය බුද්ධි ඒකකය ඉතාම වැදගත් වනවා.

ගරු කථානායකතුමනි, මට තවත් කාලය ලබා ගැනීමට අවසර ඉල්ලා සිටිනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

දැනට මහ බැංකුවේ වෙනම දෙපාර්තමේන්තුවක් යටතේ මූල්‍ය බුද්ධි ඒකකයක් තිබෙනවා. මේ කියන පනතට කරන සංශෝධනවලින් අපි ඒ මූල්‍ය බුද්ධි ඒකකය තව තවත් ස්වාධීන කරන්න, විධිමත් කරන්න සහ පාර්ලිමේන්තුවට වග කියන්න අවශ්‍ය සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත උසාවියේදී අභියෝගයට ලක් කළා මේ මූල්‍ය බුද්ධි ඒකකය තවදුරටත් මහ බැංකුව යටතේමයි තිබෙන්නේ, ඒක ස්වාධීන නැහැ කියලා. අපි කරුණු කාරණා පෙන්වා දුන්නා, ඒ තිබෙන හැකියාව මත ඔවුන්ගේ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් කියලා. හැබැයි, ඒ වාර්තා කිරීම පාර්ලිමේන්තුව දක්වා එනවා. ඒ අනුව මූල්‍ය බුද්ධි ඒකකයේ ක්‍රියාකාරකම් තුළින් මුදල් විශුද්ධිකරණය තව තවත් අඩපණ කිරීමේ ක්‍රියාවලියට දායකත්වය ලබා දෙනවා මිස කිසිදු ගැටලුවක් පැන නඟින්නේ නැහැ.

මේ සංශෝධනවල ඉතාම වැදගත් තවත් ක්ෂේත්‍රයක් තිබෙනවා. ඒ තමයි, මූල්‍ය ක්ෂේත්‍රයට modern financial technology එක ඇතුළත් වෙච්ච නිසා ඒ හරහා සිදු වන වත්කම් සහ ගනුදෙනු නිසි පරිදි විශ්ලේෂණය කර ගැනීම සහ නියාමනය කිරීම. ඒ අනුව තමයි අපි 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධනයක් ගෙන එන්නේ. අපි එයට අලුතින් එක් කොටසක් ඇතුළත් කරනවා. ඒ තමයි, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම කියන වරද. ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන කාරණය දැනට ඇතුළත් වෙලා තිබෙනවා. ඒකට එකතු කරනවා, සමූල ඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම කියන වරදත්. ඒ අනුව ඒ ක්‍රියා මැඩ පැවැත්වීමත් මේ විෂය රාමුවට ඇතුළත් වෙනවා.

වාර්තා කිරීමේ ආයතනවල විෂය පථය පුළුල් කරනවා. මූල්‍ය ව්‍යාපාර කියන්නේ කුමක්ද කියන අර්ථ කථනය පුළුල් කරලා වර්තමාන modern financial system එක යටතේ තිබෙන අථත්‍ය වත්කම් සේවා සපයන්නනුත් මේ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ ආයතනවලට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම යම් ගනුදෙනුවක් සිදු කරගෙන යන කොට, විශේෂයෙන් මුදල් විශුද්ධිකරණය වෙන්න පුළුවන්, අපරාධයකින් උත්පාදිත දේ වෙන්න පුළුවන්, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ කටයුත්තක් වෙන්න පුළුවන්, ඒ කුමන ආකාරයකින් හෝ සැක සහිත, ගැටලු සහිත පැමිණිල්ලක් ඇවිත් ඊට අදාළ පරීක්ෂණ කරගෙන යන්න දැනට තිබුණේ කැලැන්ඩර් දින 7ක කාලයක්. විශේෂයෙන් ඒවා පරීක්ෂා කරන අය සඳහන් කළා ඒ දින 7ක කාල සීමාව ඇතුළත අදාළ පරීක්ෂණ සිදු කරගෙන යන්න බැහැ කියලා. ඒ අනුව, අපි එම දින ගණන වැඩ කරන දින 14 දක්වා වැඩි කර දීලා තිබෙනවා. එයත් යම් අවස්ථාවකදී අභියෝගයට ලක් වුණා. එහි කරුණු කාරණා පෙන්වා දීලා අදාළ සංශෝධන ඉදිරිපත් කරලා තිබෙනවා. අපේ දැන් අවශ්‍යතාව තමයි, වැඩ කරන දින 14ක් එම පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීම. එතැනදී කිසිදු ආකාරය අසාධාරණයක් ඒ පැමිණිලිකරුට සිද්ධ වෙන්නේ නැහැ. හේතුව, දැන් ඔහුට පුළුවන්කම තිබෙනවා, affidavit එකක් ලබා දීලා තමුන්ගේ නිර්දෝෂීභාවය ප්‍රකාශ කරන්න. ඒ අනුව, එම පරීක්ෂණ සිදු කරගෙන යෑම කාර්යක්ෂම කරනවා, වේගවත් කරනවා. අත්හිටුවීමේ නියෝගය ක්‍රියාත්මක වන ගමන්ම affidavit එකක් ලබා ගෙන කටයුතු කිරීමේ ඉඩකඩත් පනත තුළින් ලබා දීලා තිබෙනවා.

විපක්ෂයෙන් පැන නැඟුණ තවත් අදහසක් තමයි, මේ වාගේ නීති ක්‍රියාත්මක කරනකොට, වැඩිපුර කාලයක් අරගෙන පරීක්ෂා කරනකොට වෙළෙඳ පොළේ ක්‍රියාත්මක වන සමහර අයට - විශේෂයෙන්ම NGOs වැනි ආයතනවලට - මේකෙන් අනවශ්‍ය බලපෑමක් සිද්ධ වනවාය කියන කාරණය. මෙහි ඉතාම පැහැදිලිව තිබෙනවා, NGO එකකට තමුන්ගේ පරමාර්ථය වෙනුවෙන් සිදු කරනු ලබන කිසිදු කටයුත්තකට කිසිදු ආකාරයක බාධාවක් වෙන්නේ නැහැ කියලා. මෙතැනදී NGO එකක් වාර්තා කළ යුතු ආයතනයක් විධියට අනුගත කරලා තිබෙන්නේ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා වූ සාක්ෂි තිබෙනවා නම් පමණමයි. මේ ලෝක පරිමාණයෙන් තිබෙන තත්ත්ව, ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන කාරණාවට තිබුණු සාක්ෂි මත තමයි මේ කාරණය ඇතුළත් කරලා තිබෙන්නේ. එහෙම නැතුව ඔවුන්ගේ මුදල් කටයුතු කිරීම, මුදල් විශුද්ධිකරණය හෝ වෙනත් කාරණා සම්බන්ධයෙන් ඒ කාරණය සම්බන්ධ වෙන්නේ නැහැ කියලාත් සඳහන් කරන්නට ඕනෑ.

මෙවැනි කාරණාවලදී අදාළ වගකීමට යටත් කරන ආයතන, විශේෂයෙන්ම මූල්‍ය ආයතන සැක සහිත ගනුදෙනු, මුදල් විශුද්ධිකරණය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරන්නේ නැතුව තමුන්ගේ කටයුතු සිද්ධ කරගෙන යනවා. ඒ අනුව වැරදිකරු බවට පත් වුණොත් මේ වන කල් තිබුණු දණ්ඩනය, රුපියල් මිලියනයයි; රුපියල් ලක්ෂ 10යි. සමහර අවස්ථාවලදී සමාජය පිළිබඳව තිබෙන වගකීම් විරහිතභාවය නිසා සමහර ආයතන මේ වැරදි හිතාමතා කරලා තිබෙන බව අපට සමහර අවස්ථාවලදී වාර්තා වෙලා තිබෙනවා. මීට සති දෙකකට කලින් ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවේදී එය සඳහන් කළා. ලංකාවෙන් ඩොලර් එළියට යවලා තිබෙන කාරණය ගත්තාම, ඇත්තට එය ආනයනකරුවන් විතරක් තනියම කළ වැඩක් නොවෙයි. ඒකට බැංකුත් උදවු කරලා තිබෙනවා. බැංකුවල නිලධාරිනුත් උදවු කරලා තිබෙනවා. ජාලගතව තමයි අපරාධ සහ මුදල් විශුද්ධිකරණය වෙලා තිබෙන්නේ. එම නිසා අපි එම දඩය සංශෝධනය කර තිබෙනවා. පළමුවර වැරදිකරු බවට පත් වුණොත්, දඩය රුපියල් මිලියන 100 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒක විශාල දඩයක්. මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඔවුන්ගේ භාවිතය නැවත පරීක්ෂා කරනවා, විමර්ශනය කරනවා. හැබැයි, ඒ ක්‍රියාකාරකමම ඔවුන් දෙවැනි වරටත් කළොත්, දඩය දෙගුණ කරනවා. ඒ කියන්නේ, මිලියන 200යි. ඉතාම දැඩි deterrent එකක්. ඒ කියන්නේ දණ්ඩනයක් පමුණුවනවා, ඒ වගකීමට ගෙන ඒමට, නියාමනය කිරීමට. මම හිතනවා එය ඉතා හොඳ, ප්‍රගතිශීලී සංශෝධනයක් කියලා. එවැනි දේවල් කලින් සිදු කරලා තිබුණේ නැහැ.

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම සහ සමූල ඝාතක අවි ව්‍යාප්තියට මුදල් සැපයීම කියන කාරණා මැඩ පැවැත්වීම සඳහා 2011දී පමණ ජාතික කමිටුවක් පිහිටුවලා තිබෙනවා. ඒ වෙලාවේදී දෙවැනි mutual evaluation එක Financial Action Task Force එක යටතේ ක්‍රියාත්මක වෙලා තිබුණා. ඒ වාගේම ඒ mutual evaluation එක, ලංකාවේ මොන වාගේ මූල්‍ය පරිසරයක් ද තිබෙන්නේ කියලා මිනුම් කරලා බලන ඒ evaluation එකේදී අපට අවශ්‍ය වුණා කමිටුවක් පිහිටුවා ගන්න. මොකද, 2011දී පිහිටුවන ලද කමිටුවේ දුර්වලතාවක් තිබෙනවා. ඒ දුර්වලතාව තමයි, එම කමිටුවට බලය නැහැ; බලාත්මක නැහැ. යම් බලයක් තිබෙනවා. නමුත්, මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් අපි ඉදිරිපත් කර තිබෙන අද තිබෙන සංකීර්ණතාවලට මුහුණ දීලා අදාළ ක්‍රියාමාර්ග ගන්න ප්‍රමාණවත් බලයක් තිබුණේ නැහැ.

ඒ කමිටුව ඉතා විශාලයි. එය විසිදෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක්. කැබිනට් පත්‍රිකාවක් මාර්ගයෙන් තමයි මේ කමිටුව පත් කරලා තිබුණේ. 2011 ඉඳලා දීර්ඝ කාලයක් මේ සංශෝධන සිදු වෙලා තිබුණේ නැහැ. ඒ, දේශපාලන වුවමනාව, මැදිහත්වීම නොතිබුණු නිසා වෙන්න ඇති. දැන් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, ඒ කමිටුවටත් සංශෝධන ඇතුළත් කරලා ඉතා විධිමත් බලතල සහිත කමිටුවක් මේ පනත යටතේම ගෙනෙන්න. ඒ අනුව ප්‍රධාන ලේකම්වරු පස්දෙනෙකු, මහ බැංකුවේ අධිපතිතුමා, IGP,

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා, නීතිපති යන එවැනි කණ්ඩායමකින් බලගැන්වුණු කමිටුවක් මඟින් මේ කටයුතු සිද්ධ කරමින් තිබෙනවා. ඒ වාගේම කලින් තිබුණු පනතේ ප්‍රධාන ප්‍රඥප්තියේ නිර්වචනවල තිබුණු අඩුපාඩුත් මේ සංශෝධන යටතේ අපි සකස් කර තිබෙනවා.

ඒ අනුව, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පතට අපි ඉදිරිපත් කරන ප්‍රධානම කාර්යයන් බවට පත් වෙන්නේ කාර්ය සාධක බලකායේ රාමුව යටතට ඇති කර තිබෙන ජාත්‍යන්තර බැඳීම්. මොකද, රටක් ඇතුළේ අපි නීති රීති සකස් කරනකොට අපටම ආවේණික, අපේ පරිසරයට ආවේණික කරුණු තිබෙන්න පුළුවන්. ඒ වාගේම මූල්‍ය ගනුදෙනු කියන ඒවා, මුදල් විශුද්ධිකරණය කියන දේවල්, ත්‍රස්තවාදයට මුදල් සැපයීම කියන කාරණා ජාත්‍යන්තර මට්ටමින් තිබෙන්නේ. එවැනි තත්ත්වයකදී අපට ජාත්‍යන්තර බැඳීම්, ජාත්‍යන්තර ප්‍රමිති යටතේ ඒ ආයතනත් එක්ක කටයුතු කරන්න වෙනවා. ඒ අනුව තමයි මේ සංශෝධන ඉදිරිපත් කර තිබෙන්නේ, ජාත්‍යන්තර බැඳීම් ඉටු කිරීම සඳහා. අනෙක් පැත්තෙන් මුදල් විශුද්ධිකරණය කියන කාරණාව ජාතික ආරක්ෂාවටත් බලපානවා. මේක ත්‍රස්තවාදයට මුදල් සැපයීමට පමණක් නොවෙයි, මුදල් විශුද්ධිකරණයටත්. ඒ නිසා මුදල් විශුද්ධිකරණයට අදාළ සුවිශේෂී කොටසකුත් මේකට එකතු කරලා තිබෙනවා, බදු හා සම්බන්ධ කරලා. මට මතකයි, විපක්ෂයේ මන්ත්‍රීවරයකු කිව්වා මේ බදු ගෙවන්නේ නැහැ, අහිමි වෙනවා කියන කාරණය. නමුත් අපි ඉතා නිවැරදිව මුදල් විශුද්ධිකරණයේදී බදු සම්බන්ධ වීමත් මෙතැනට ගැට ගහලා තිබෙනවා. ඒ කොහොමද? ඕනෑම රටක සැලසුම් කරන බදු අයකර ගන්න බැරි වන හේතු අතර කැමැත්තෙන්ම නොගෙවා ඉන්න එකත් තිබෙනවා. ලංකාවේත් ඒ තත්ත්වය ඉතා විශාලයි

ඊට අමතරව අපි කියනවා, බදු පැහැර හැරීම - tax evasion - කියලා. බදු ගෙවන්න පුළුවන්කම තිබෙනවා, හැකියාව තිබෙනවා. නමුත්, බදු පැහැර හරිනවා. ඇයි පැහැර හරින්නේ? එය ගෙව්වොත් තමන් ආදායම් උපයා ගත් මාර්ගය - source එක - හෙළිදරව් කරන්න සිද්ධ වනවා. ඒ නිසා ඒක අපරාධයකින් උත්පාදනය කර ගත්තාද, වෙනත් වැරදි විධියකට උත්පාදනය කර ගත්තාද, දූෂණයෙන් උත්පාදනය කර ගත්තාද කියනවා වෙනුවට බදු නොගෙවා ඉන්න බදු පැහැර හැරීම් කරනවා. ඒ නිසා බදු පැහැර හැරීම් සිදු වෙලා තිබෙනවා නම්, ඒ බදු පැහැර හැරීම් සිදු කරන්නේත් වෙනත් ආකාරයට ධනය එක් තැනකට ඒක රාශි කර ගැනීමටයි. එයත් මේ විශුද්ධිකරණය යටතට සම්බන්ධ කරලා කටයුතු කිරීමේ හැකියාව අපට නිර්මාණය වෙලා තිබෙනවා.

ඊළඟට, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතට විශේෂ කොටසක් එකතු කරනවා. ඒ තමයි, යම් ධනයක් වැරදි විධියට උත්පාදනය කර ගත්තා නම් එය සුදු බවට පත් කර ගැනීම, නීත්‍යනුකූල බවට පත් කර ගැනීමේදී දරන උත්සාහය අතරේ, අතථ්‍ය මුදල් තාක්ෂණය යොදා ගන්නා අතරේ කරන ක්‍රියාවලියක් තමයි layering process කියන එක. ඒ කියන්නේ, කෝටි ගණනක ධනයක් උපයා ගෙන ඒක කුඩා කුඩා කොටස්වලට කඩලා විවිධ වූ සමාගම්වලින් - shell companiesවලින්, නිර්නාමික සමාගම්වලින් - පවත්වාගෙන යෑම. ඒ වාගේම එක් තැනකින් තව තැනකට පරිවර්තනය කිරීම. ඒ නිසා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතට අපි ඇතුළත් කර තිබෙනවා, මේ conversions - නීති විරෝධී ක්‍රියාවලියකින් උපයා ගන්නා ලද ඕනෑම දේපළක් පරිවර්තනය කිරීම සහ ඕනෑම නීති විරෝධී ක්‍රියාකාරකමින් උපයා ගන්නා ලද දේපළක් අර්ථලාභී හිමිකාරිත්වය අත්පත් කර ගැනීම. ඒ විධියට අපි මුදල් විශුද්ධිකරණය වරදේ විෂය පථය පුළුල් කර තිබෙනවා. එක ඉතාම වැදගත්. අපේ අර්ථලාභී හිමිකාරත්වය වැදගත්. මොකද, සමාගමක් කියන්නේත් නීතිය ඉදිරියේ පුද්ගලයෙක්. ඇත්තටම මේ නීතිය ඉදිරියේ ඇත්ත ස්වාභාවික පුද්ගලයන් - නීතිමය පුද්ගලභාවය - සමාගම් පාවිච්චි කරමින් දිගින් දිගටම හැංගිලා හිටියා. ඒ ඇත්ත ස්වාභාවික පුද්ගලයාත් මේ නීති රාමුවට අපි ගෙනැල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි ක්‍රමිකව ඉදිරියට යන ගමනේදී මේ රටේ සාමාන්‍ය පුරවැසියාද, දේශීය ආයෝජකයාද, විදේශීය ආයෝජකයාද කියලා භේදයක් නැතිව කවුද රට ඇතුළට එන්නේ, ඔවුන්ට ඉතා විශ්වාසයෙන් තමන්ගේ වැඩ කටයුතු කරගෙන යෑමේ ඉඩ කඩ නිර්මාණය කිරීම තමයි සමස්තයක් වශයෙන් මේ සංශෝධනවල අවසාන ප්‍රතිඵල වෙන්නේ. ඒ වාගේම නීති විරෝධී ආකාරයට මුදල් විශුද්ධිකරණය සිදු කිරීමත්, ත්‍රස්තවාදයට මුදල් සැපයීමත් වැනි අකටයුතුකම් සිදු කරන්න බැරි වන විධියට, සියලු ඵලදායී කටයුතු සඳහා වඩාත් හොඳ පරිසරයක් නිර්මාණය කිරීමේ අවස්ථාවට අවශ්‍ය කරන සංශෝධන තමයි මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි එතැනින් නවතින්නේ නැහැ, ගරු කථානායකතුමනි. මේ සංශෝධන ඉදිරියට අරගෙන යනකොට, ව්‍යාපාර කටයුතු කිරීම සඳහා සහ අනෙකුත් කටයුතු කිරීම සඳහා වන වඩාත් හොඳ පරිසරයක් නිර්මාණය කිරීමට මේවා ඉවහල් වනු ඇතැයි කියා විශ්වාස කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම. සභාව එකඟද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් අනුව, මෙම පනත් කෙටුම්පත තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. එම නිසා ඒ අනුව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. ඒ සඳහා ඡන්දයක් අවශ්‍ය වෙනවා. බෙදීමක් නොවෙයි, ඡන්දයක් අවශ්‍ය වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි ඡන්දය විමසීමේ අවස්ථාවට යොමු වෙමු.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකිය.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීතුමන්ලා කවුරුන් හෝ සිටිනවාද?

එසේ නම් මාගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවාද?

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මාගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ගරු මන්ත්‍රීවරුන් සිටිනවාද?

**ගරු අතුල වෙළඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු අතුල වෙළඳගොඩ මහතා**
(மாண்புமிகு அதுல வெலந்தகொட)
(The Hon. Athula Welandagoda)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි අමාත්‍යතුමනි, ඔබතුමා මෙම පනත් කෙටුම්පත දෙවන වර කියවීම සම්මත කිරීමට පක්ෂ ද, විරුද්ධ ද?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ ඡන්දය ප්‍රකාශ කිරීම ඩිජිටල් පුවරුවේ සටහන් වී තිබෙනවා.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේ පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 153; විරුද්ධව 02; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 153; எதிராக 02; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 153; Noes 02; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayatissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Susil Ranasinghe | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Kumara Jayakody | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 028. Wasantha Piyathissa | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 032. Rathna Gamage | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 038. Nalin Hewage | Yes |

| | |
|---|---|
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 055. Arkam Ilyas | Yes |
| G 056. Aravinda Senarath | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Asoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 065. R.M. Gamini Rathnayake | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 068. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. Ajith Agalakada | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 073. L.M. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 078. Upul Kithsiri | Yes |
| G 079. Wasantha Pushpa Kumara | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 081. Sarath Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Darmapriya Wijesinghe | Yes |
| G 085. Thilanka U. Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. Sellaththamby Thilaganathan | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |
| G 100. Thanura Dissanayake | Yes |
| G 101. Dharmapriya Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 103. Kanthasamy Prabu | Yes |
| G 104. Susantha Kumara Nawarathna | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 110. Susantha Dodawatta | Yes |
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 013. Amirthanathan Adaikkalanathan | No |
| O 014. G.G. Ponnambalam | No |
| O 065. E. M. Basnayaka | Yes |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 069. Jagath Manuwarna | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 072. Riyas Farook | Yes |
| O 081. Danushka Ranganath | Yes |
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 086. Manoj Rajapaksha | Yes |
| O 087. Sunil Rajapaksha | Yes |
| O 088. Hasara Liyanage | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Lasith Bhashana Gamage | Yes |
| O 096. Hiruni Wijesinghe | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 099. Thilina Samarakoon | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |

| | |
|---|---|
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 109. Geetha Herath | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

*Electronic Voting Results*

**Participants:**

| | |
|---|---|
| Present | 155 |

**Votes:**

| | |
|---|---|
| Yes | 153 |
| No | 02 |
| Abstain | 0 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්ද 153යි; විරුද්ධව 02යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව පක්ෂව ඡන්දය දුන් මුළු සංඛ්‍යාව 154යි. විරුද්ධව 02යි.

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත - දෙවන වර කියවීම පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]***

*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த]*

*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Anil Jayantha]*

***කාරක සභාවෙහිදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 සිට 13 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகத்திலிருந்து 13ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 13 ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
14වන වගන්තිය විශේෂ බහුතර ඡන්දයකින් සම්මත කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත. ඒ අනුව, මෙම වගන්තිය විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කළ යුතුව තිබේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, ඒ සඳහා ඡන්දයක් පවත්වන ලෙස ඉල්ලා සිටිනවා.

***බෙදුම් සීනුව නාද වී අවසන් වූණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතේ 14වන වගන්තිය සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකිය.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවාද? එසේ නම් මාගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවා නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මාගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවා නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශය කිරීමේ කාලය දැන් අවසන්.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 154; විරුද්ධව 02; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 154; எதிராக 02; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 154; Noes 02; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayatissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Susil Ranasinghe | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Kumara Jayakody | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 028. Wasantha Piyathissa | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 032. Rathna Gamage | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 038. Nalin Hewage | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 055. Arkam Ilyas | Yes |
| G 056. Aravinda Senarath | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Asoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 065. R.M. Gamini Rathnayake | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 068. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. Ajith Agalakada | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 073. L.M. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 078. Upul Kithsiri | Yes |
| G 079. Wasantha Pushpa Kumara | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 081. Sarath Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Darmapriya Wijesinghe | Yes |
| G 085. Thilanka U. Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 096. Sellaththamby Thilaganathan | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Anushka Thilakarathne | Yes |
| G 099. Chandana Thennakoon | Yes |
| G 100. Thanura Dissanayake | Yes |

| | |
|---|---|
| G 101. Dharmapriya Dissanayake | Yes |
| G 102. Sujeewa Dissanayake | Yes |
| G 103. Kanthasamy Prabu | Yes |
| G 104. Susantha Kumara Nawarathna | Yes |
| G 105. Sena Nanayakkara | Yes |
| G 106. Aruna Panagoda | Yes |
| G 107. Nimal Palihena | Yes |
| G 108. Nishantha Perera | Yes |
| G 109. Stepni Fernando | Yes |
| G 110. Susantha Dodawatta | Yes |
| G 111. Lal Premanath | Yes |
| G 112. Nanda Bandara | Yes |
| G 113. Padmasiri Bandara | Yes |
| G 114. Ravindra Bandara | Yes |
| G 115. Sudath Balagalla | Yes |
| G 116. Sri Bavanandarajah | Yes |
| O 013. Amirthanathan Adaikkalanathan | No |
| O 014. G.G. Ponnambalam | No |
| O 065. E. M. Basnayaka | Yes |
| O 066. Wijesiri Basnayake | Yes |
| O 067. S. Sandaruwan Madarasinghe | Yes |
| O 068. Prageeth Madhuranga | Yes |
| O 069. Jagath Manuwarna | Yes |
| O 070. Ruwan Mapalagama | Yes |
| O 072. Riyas Farook | Yes |
| O 081. Danushka Ranganath | Yes |
| O 082. Sanjeewa Ranasingha | Yes |
| O 083. Sunil Rathnasiri | Yes |
| O 084. Manjula Sugath Rathnayaka | Yes |
| O 085. A.M.M.M. Rathwaththe | Yes |
| O 086. Manoj Rajapaksha | Yes |
| O 087. Sunil Rajapaksha | Yes |
| O 088. Hasara Liyanage | Yes |
| O 089. Deepthi Wasalage | Yes |
| O 090. Kanchana Welipitiya | Yes |
| O 091. R. G. Wijerathna | Yes |
| O 092. Nishantha Samaraweera | Yes |
| O 093. Priyantha Wijerathna | Yes |
| O 094. Ruwan Wijeweera | Yes |
| O 095. Lasith Bhashana Gamage | Yes |
| O 096. Hiruni Wijesinghe | Yes |
| O 097. Athula Welandagoda | Yes |
| O 098. Fasmin Sharif | Yes |
| O 099. Thilina Samarakoon | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 101. Dewananda Suraweera | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. G.D. Sooriyabandara | Yes |
| O 104. Kitnan Selvaraj | Yes |
| O 105. Janaka Senarathna | Yes |
| O 106. Chandima Hettiaratchi | Yes |
| O 107. Champika Hettiarachchi | Yes |
| O 108. Dinesh Hemantha | Yes |
| O 109. Geetha Herath | Yes |
| O 110. Bhagya Sri Herath | Yes |
| O 111. Muhammad Faizal | Yes |
| O 112. Ashoka Gunasena | Yes |
| O 113. Nandana Pathmakumara | Yes |
| O 114. Sunil Biyanwila | Yes |
| O 115. Samantha Ranasingha | Yes |

Electronic Voting Results:

**Participants:**

| | |
|---|---|
| Present | 156 |

**Votes:**

| | |
|---|---|
| Yes | 154 |
| No | 2 |
| Abstain | 0 |

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතේ 14වන වගන්තිය සම්මත කිරීමට විද්‍යුත් ඡන්ද විමසීම අනුව, පක්ෂව ඡන්ද 154යි; විරුද්ධව ඡන්ද 02යි; ඡන්දය දීමෙන් වැළකී සිටි සංඛ්‍යාව 0යි.

ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පතේ 14වන වගන්තිය පාර්ලිමේන්තුවේ විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත වූ බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

***14 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*14ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 14 ordered to stand part of the Bill.*

***15 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*15ஆம் வாசகத்திலிருந்து 17ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 15 to 17 ordered to stand part of the Bill.*

## 18වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 17අ, 17ආ, 17ඇ, 17ඈ සහ 17ඉ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම)

வாசகம் 18.- (முதன்மைச் சட்டவாக்கத்தில் 17அ, 17ஆ, 17இ, 17ஈ மற்றும் 17உ என்னும் புதிய பிரிவுகளை உட்புகுத்துதல்)

CLAUSE 18. - (*Insertion of new sections 17A, 17B, 17C, 17D and 17E in the principal enactment*)

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "18 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ආවේශ්‍ය විය යුතුය:

එසේ වුව ද, විමර්ශනයකට යටත් තැනැත්තකු විසින්, පොලිස් නිලධරයකුගේ අත්අඩංගුවේ සිටිය දී හෝ පොලිස් නිලධරයකු ඉදිරිපිට දී ලබා දුන් දිවුරුම් ප්‍රකාශයක් හෝ දිවුරා ලබා දුන් ප්‍රකාශයක් සම්බන්ධයෙන් (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.' "

(2) "18වන පිටුවේ, 28 සහ 29 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලබා දුනහොත්, එම අධිකරණය විසින්, එම නඩු විභාගය අවසන් වීමෙන් පසුව, එම සාක්ෂිකරු විනිශ්චයට ඉදිරිපත් කර, ලඝු නඩු විභාගයකින් පසු එම සාක්ෂිකරුට අධිකරණයට' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

***18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 18, as amended, ordered to stand part of the Bill.*

***19 සිට 32 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகத்திலிருந்து 32ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 19 to 32 ordered to stand part of the Bill.*

***ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

***පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.***

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

පනත් කෙටුම්පත කාරක සභාවේදී සලකා බලා සංශෝධන සහිතව හා 14වන වගන්තිය විශේෂ බහුතර ඡන්දයෙන් යුතුව සම්මත කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

පනත් කෙටුම්පත තුන්වන වර කියවීම, ගරු අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**

(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)

(The Hon. (Dr.) Anil Jayantha)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මම යෝජනා කරමි.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ සහ අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙසද ඉල්ලා සිටිමි.

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

සභාව එකඟද?

**ගරු බිමල් රත්නායක මහතා**

(மாண்புமிகு பிமல் ரத்நாயக்க)

(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයේ අවශ්‍යතාව අනුව සමස්ත පනතටත් ඡන්දයක් විමසන ලෙස ඉල්ලා සිටිනවා.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***

*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*

*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, තුන්වන වර කියවීම සංශෝධන සහිතව සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරුන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරුන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරුන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකිය.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***

*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*

*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි බලන්න.

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවාද? එසේ නම් මාගේ දකුණු අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවා නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

මාගේ වම් අත පැත්තේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු සිටිනවා නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

කිසිවෙකු නොමැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසන්.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***

*வாக்கெடுப்பின் பின் -*

*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 154; විරුද්ධව 02; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 154; எதிராக 02; விலகியிருந்தோர் 0.*

*According to Electronic Voting, Parliament divided: Ayes 154; Noes 2; Abstain 0.*

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayatissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Susil Ranasinghe | Yes |
| G 021. Rizvie Salih | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Kumara Jayakody | Yes |
| G 026. Nihal Abeysinghe | Yes |
| G 027. Namal Karunaratne | Yes |
| G 028. Wasantha Piyathissa | Yes |
| G 029. Gamagedara Dissanayake | Yes |
| G 030. R.M. Jayawardhana | Yes |
| G 031. Sunil Watagala | Yes |
| G 032. Rathna Gamage | Yes |
| G 033. Mahinda Jayasinghe | Yes |
| G 034. Chathuranga Abeysinghe | Yes |
| G 035. Eranga Gunasekara | Yes |
| G 036. Upali Samarasingha | Yes |
| G 037. T.B. Sarath | Yes |
| G 038. Nalin Hewage | Yes |
| G 039. Prasanna Gunasena | Yes |
| G 040. Anton Jayakody | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Sundaralingam Pradeep | Yes |
| G 043. Ruwan Ranasinghe | Yes |
| G 044. Muneer Mulaffer | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Kaushalya Ariyarathne | Yes |
| G 055. Arkam Ilyas | Yes |
| G 056. Aravinda Senarath | Yes |
| G 057. Dinindu Saman | Yes |
| G 058. Nishantha Jayaweera | Yes |
| G 059. Asoka Ranwala | Yes |
| G 060. Lakshman Nipuna Arachchi | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Najith Indika | Yes |
| G 063. Lakmali Hemachandra | Yes |
| G 064. Samanmali Gunasingha | Yes |
| G 065. R.M. Gamini Rathnayake | Yes |
| G 066. Manjula Suraweera Arachchi | Yes |
| G 067. K. Ilankumaran | Yes |
| G 068. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 069. Ajith Agalakada | Yes |
| G 070. Sagarika Athauda | Yes |
| G 071. Roshan Akmeemana | Yes |
| G 072. U. P. Abeywickrama | Yes |
| G 073. L.M. Abeywickrama | Yes |
| G 074. M.K.M. Aslam | Yes |
| G 075. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 076. Oshani Umanga | Yes |
| G 077. Krishnan Kalaichelvi | Yes |
| G 078. Upul Kithsiri | Yes |
| G 079. Wasantha Pushpa Kumara | Yes |
| G 080. Chaminda Lalith Kumara | Yes |
| G 081. Sarath Kumara | Yes |
| G 082. Nilanthi Kottahachchi | Yes |
| G 083. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 084. Darmapriya Wijesinghe | Yes |
| G 085. Thilanka U. Gamage | Yes |
| G 086. Nilusha Lakmali Gamage | Yes |
| G 087. Ajantha Gammeddage | Yes |
| G 088. Ajith Gihan | Yes |
| G 089. Jagath Gunawardana | Yes |
| G 090. Aboobucker Athambawa | Yes |
| G 091. Ruwanthilaka Jayakody | Yes |
| G 092. Thushari Jayasingha | Yes |
| G 093. T.K. Jayasundara | Yes |
| G 094. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 095. Rajeevan Jeyachandramoorthy | Yes |
